289 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 289 - இல. 2
Volume 289 - No. 2

2022 මාර්තු 09 වන බදාදා
2022 மார்ச் 09, புதன்கிழமை
Wednesday, 09th March, 2022

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**සිසිර ජයකොඩි සියපත පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:**
දෙවන වර කියවා ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී

**කල් තැබීමේ ප්‍රශ්න**

**කල් තැබීමේ යෝජනාව:**
කල්මුණේ - උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යෑම

---

# பிரதான உள்ளடக்கம்

**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனிப்பட்ட தரவுப் பாதுகாப்பு சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது.

**சிசிர ஜயக்கொடி சியபத மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்:**
இரண்டாம் முறை மதிப்பிடப்பட்டு, சட்டவாக்க நிலையியற் குழுவுக்குச் சாட்டப்பட்டது.

**ஒத்திவைப்பு வினாக்கள்**

**ஒத்திவைப்புப் பிரேரணை:**
கல்முனை வடக்குப் பிரதேச செயலகத்தை தடையற்று இயக்குதல்

---

# PRINCIPAL CONTENTS

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

PERSONAL DATA PROTECTION BILL:
Read a Second, and the Third time, and passed as amended

SISIRA JAYAKODY SIYAPATHA FOUNDATION (INCORPORATION) BILL:
Read a Second time, and allocated to Legislative Standing Committee

ADJOURNMENT QUESTIONS

ADJOURNMENT MOTION:
Maintaining Functions of Kalmunai North Divisional Secretariat Without Impediment

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2022* මාර්තු *09* වන බදාදා**
*2022 மார்ச் 09, புதன்கிழமை*
*Wednesday, 09th March, 2022*

**පූ. භා. 10.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு. ப. 10.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, මේ දිනවල විදුලි බලය අරපිරිමැස්මෙන් භාවිත කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ඔබගේ කාරුණික අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

පාර්ලිමේන්තු සංකීර්ණය ඇතුළත අනවශ්‍ය විදුලි පහන් නිවා දමා මෙම තත්ත්වයට මුහුණ දිය යුතු බැවින්, එදිනෙදා වැඩකටයුතුවලදී ප්‍රායෝගික අපහසුතා මතු විය හැකි අතර, ඒ සම්බන්ධව දැනුවත් වීමෙන් අපගේ වැඩකටයුතු කරගෙන යා යුතු බවට ඔබගේ කාරුණික අවධානය විශේෂයෙන් යොමු කිරීමට කැමැත්තෙමි.

එලෙසම, පාර්ලිමේන්තු සංකීර්ණය තුළදී භෝජනාගාරවල ද, සේවා සපයනු ලබන වෙනත් අංශවල ද මෙම තත්ත්වය හේතුවෙන් විවිධ අපහසුතා හෝ ප්‍රමාද ඇති වුවහොත්, ඒවාද අවබෝධ කරගෙන කටයුතු කරමින් මෙම තත්ත්වයට මුහුණ දීමට සහයෝගය ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරමි.

# ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
# சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
# PAPERS PRESENTED

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2019 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර රෝහල සහ පශ්චාත් වෛද්‍ය උපාධි පුහුණු මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*



# අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
# அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
# MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු නාමල් රාජපක්ෂ මහතා (තරුණ හා ක්‍රීඩා අමාත්‍ය, සංවර්ධන සම්බන්ධීකරණ සහ අධීක්ෂණ අමාත්‍ය සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ - இளைஞர் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரும் அபிவிருத்தி ஒருங்கிணைப்பு மேற்பார்வை அமைச்சரும் டிஜிட்டல் தொழில்நுட்பம் மற்றும் தொழில்முயற்சி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Namal Rajapaksa - Minister of Youth and Sports, Minister of Development Coordination and Monitoring and State Minister of Digital Technology and Enterprise Development)

ගරු කථානායකතුමනි, තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත;

(ii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;

(iii) 2016 වර්ෂය සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;

(iv) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(v) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

# පෙත්සම්
# மனுக்கள்
# PETITIONS

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Deputy Speaker and Chairman of Committees)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) මාවනැල්ල, උඩමුල්ල, පේරමඩුල්ල යන ලිපිනයෙහි පදිංචි එච්.ඩී. උදයකුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) පානදුර, වෑකඩ, සල්ගාදු මාවත, අංක 09 දරන ස්ථානයෙහි පදිංචි ආර්.ඩබ්ලිව්.එස්.කේ. රණවක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) අලව්ව, කහඹිලියාවල යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ. අනුර වීරසූරිය මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු දුමින්ද දිසානායක මහතා (සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க - சூரிய சக்தி, காற்று மற்றும் நீர் மின்னுற்பத்திக் கருத்திட்ட இராஜாங்க அமைச்சர்)
(The Hon. Duminda Dissanayake -State Minister of Solar Power, Wind and Hydro Power Generation Projects Development)

ගරු කථානායකතුමනි, අනුරාධපුරය, කාශ්‍යප මාවත, 3වැනි පියවර, අංක 2354 දරන ස්ථානයෙහි පදිංචි අසේල බණ්ඩාර හිප්පොල මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු අබ්දුල් හලීම් මහතා**
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)

ගරු කථානායකතුමනි, අංකුඹුර, වැලිකැටිය, අංක 39 දරන ස්ථානයෙහි පදිංචි වී.එස්. උඩවෙල මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රෝහණ දිසානායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ගරු කපිල අතුකෝරල මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ගරු අනුප පස්කුවල් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු චින්තක අමල් මායාදුන්න මහතා**
(மாண்புமிகு சிந்தக அமல் மாயாதுன்ன)
(The Hon. Chinthaka Amal Mayadunna)

ගරු කථානායකතුමනි, ආණමඩුව, පෙරියකුලම, "හර්ෂණී මිරාන් සෙවන" යන ලිපිනයෙහි පදිංචි එල්.පී. කරුණාසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -3/2022 - (2), ගරු ගයන්ත කරුණාතිලක මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

### ආයුර්වේද ශාස්ත්‍රී පාඨමාලාව: විස්තර
### ஆயுர்வேத சாஸ்த்ரீ பாடநெறி: விபரம்
### "AYURVEDA SASTHRI" COURSE: DETAILS

32/2022

**2. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) "ආයුර්වේද ශාස්ත්‍රී" පාඨමාලාව හැදෑරීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) එම පාඨමාලාව පවත්වාගෙන යනු ලබන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වන විට එම පාඨමාලාව හදාරනු ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) එම පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම මේ වන විට නවතා ඇති බවත්;

(ii) උපාධි පාඨමාලාවකට සමාන මෙම පාඨමාලාවට සිදු කරන ලද සංශෝධන මඟින් ඩිප්ලෝමා පාඨමාලාවක තත්ත්වය දක්වා පහත දමා ඇති බවත්;

(iii) එම පාඨමාලාව නවතා දැමීම සඳහා මේ වන විට කටයුතු කරමින් සිටින බවත්;

එතුමා දන්නේද?

(ඇ) (i) "ආයුර්වේද ශාස්ත්‍රී" පාඨමාලාවට උපාධි පාඨමාලාවක තත්ත්වය නැවත ලබා දීමට රජය කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඉහත උපාධිධාරින්ට අනෙකුත් ආයුර්වේද වෛද්‍යවරුන්ට හිමි වරප්‍රසාද ලබාදීමට රජය කටයුතු කරන්නේද;

(iii) එම පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම නැවත ආරම්භ කරන්නේද;

(iv) එම පාඨමාලාව නතර කිරීමට රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) "ஆயுர்வேத சாஸ்த்ரீ" பாடநெறியை பயில்வதற்குத் தேவையான கல்வித் தகைமைகள் யாவை;

(ii) மேற்படி பாடநெறி நடாத்தப்படுகின்ற நிலையங்களின் எண்ணிக்கை யாது;

(iii) தற்போது இப்பாடநெறியைப் பயிலும் மாணவர்களின் எண்ணிக்கை யாது;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி பாடநெறிக்கு மாணவர்களைச் சேர்த்துக்கொள்வது தற்போது நிறுத்தப்பட்டுள்ளதையும்;

(ii) பட்டப் பாடநெறிக்கு ஒப்பான மேற்படி பாடநெறியில் மேற்கொள்ளப்பட்டுள்ள திருத்தங்கள் காரணமாக இப்பாடநெறியானது டிப்ளோமா பாடநெறியின் நிலைக்குத் தாழ்த்தப்பட்டுள்ளதாகவும்;

(iii) மேற்படி பாடநெறியை நிறுத்துவதற்கான நடவடிக்கைகள் தற்போது மேற்கொள் ளப்பட்டு வருவதையும்;

அவர் அறிவாரா?

(இ) (i) "ஆயுர்வேத சாஸ்த்ரீ" பாடநெறிக்கு பட்டப் பாடநெறியின் அந்தஸ்தை மீளளிப்பதற்கு அரசாங்கம் நடவடிக்கை மேற்கொள்ளுமா;

(ii) ஆமெனில், மேற்படி பட்டதாரிகளுக்கு ஏனைய ஆயுர்வேத வைத்தியர்களுக்கு உரித்தான சிறப்புரிமைகளை வழங்க அரசாங்கம் நடவடிக்கை மேற்கொள்ளுமா;

(iii) மேற்படி பாடநெறிக்கு மாணவர்கள் சேர்த்துக் கொள்ளும் நடவடிக்கை மீண்டும் ஆரம்பிக்கப் படுமா;

(iv) மேற்படி பாடநெறியை நிறுத்துவதற்கு அரசாங்கம் கொள்கைரீதியான தீர்மானமொன் றை மேற்கொண்டுள்ளதா;

(v) ஆமெனில், அத்திகதி யாது;

என்பதையும் அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he state -

(i) the educational qualifications required to follow the "Ayurveda Sasthiri" course;

(ii) the number of centres where aforesaid course is conducted; and

(iii) the number of students who follow the aforesaid course by now?

(b) Is he aware that -

(i) the enrolment for aforesaid course has been stopped by now;

(ii) aforesaid course that was equal to a degree has been downgraded to a diploma level with the revisions made; and

(iii) steps are being taken to do away with aforesaid course by now?

(c) Will he also state -

(i) whether the Government will take measures to upgrade the "Ayurveda Sasthri" course to a degree level;

(ii) if so, whether Government will take measures to grant the aforesaid graduates the privileges that the other ayurvedic physicians are entitled to;

(iii) whether the enrolment for aforesaid course will be re-commenced;

(iv) whether the Government has taken a policy decision to terminate aforesaid course; and

(v) if so, the date of aforesaid decision?

(d) If not, why?

**ගරු සිසිර ජයකොඩි මහතා (දේශීය වෛද්‍ය ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு சிசிர ஜயகொடி - சுதேச வைத்திய முறைகளின் மேம்பாடு, கிராமிய மற்றும் ஆயுர்வேத வைத்தியசாலைகள் அபிவிருத்தி மற்றும் சமூக சுகாதார இராஜாங்க அமைச்சர்)

(The Hon. Sisira Jayakody - State Minister of Indigenous Medicine Promotion, Rural and Ayurvedic Hospitals Development and Community Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මෙම පාඨමාලාව සඳහා අධ්‍යාපන සුදුසුකම් පාඨමාලාව සඳහා වන ව්‍යවස්ථාව හා විෂය නිර්දේශය 4.2 ඡේදය මඟින් දක්වා ඇත.

4.2.1 අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් සිංහල භාෂාව හා ගණිතය විෂයයන් සහිතව, දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් සමත්වී සිටීම සහ අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් විෂයයන් දෙකකින් සමත්වී සිටීම.

නැතහොත් පිරිවෙන් අධ්‍යාපනයේ මූලික පිරිවෙන් අවසාන විභාගයෙන් සිංහල භාෂාව සහ ගණිතය විෂයයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකින් විෂයන් 06කින් සමත්ව සිටීම හෝ විද්‍යෝදය / විද්‍යාලංකාර පිරිවෙන් දෙකෙන් එකක ප්‍රාරම්භ පරීක්ෂණයෙන් සමත්ව සිටීම සහ පිරිවෙන් අධ්‍යාපන ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයෙන් විෂයයන් දෙකකින් සමත්ව සිටීම.

4.2.2 ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ දරුවන් හෝ ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි පැවිදි ගුරු ස්වාමීන් වහන්සේලාගේ ගෝල හිමිවරුන් සම්බන්ධයෙන්,

අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් සිංහල භාෂාව හා ගණිතය විෂයයන් සහිතව, දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් සමත්වී සිටීම;

හෝ

පිරිවෙන් අධ්‍යාපනයේ මූලික පිරිවෙන් අවසාන විභාගයෙන් සිංහල භාෂාව සහ ගණිතය විෂයයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකින් විෂයයන් 06කින් සමත්ව සිටීම;

හෝ

විද්‍යෝදය / විද්‍යාලංකාර පිරිවෙන් දෙකෙන් එකක ප්‍රාරම්භ පරීක්ෂණයෙන් සමත්ව සිටීම.

(ii) අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩල යටතේ ලියාපදිංචි වී ඇති ආයුර්වේද අධ්‍යාපනය උගන්වනු ලබන ආයුර්වේද ශාස්ත්‍රී විද්‍යාල සංඛ්‍යාව විස්සකි.

(iii) මේ වන විට "ආයුර්වේද ශාස්ත්‍රී " පාඨමාලාව හදාරනු ලබන සිසුන් සංඛ්‍යාව දෙදහසකි.

(ආ) (i) මෙම පාඨමාලාව පවත්වාගෙන යාමේදී විධිමත් සායනික පුහුණුව ලබා දීම සඳහා අවශ්‍ය පහසුකම් නොතිබීම වැනි තාක්ෂණික ගැටලු කිහිපයක් පැන නැඟීම හේතුවෙන් මෙම පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම මේ වන විට තාවකාලිකව නවතා ඇත. විශේෂයෙන් අධ්‍යයන ආයතනවල පවතින ගුණාත්මකභාවයේ ගැටලු සහ පාඨමාලා සමායෝජකයන්ගේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා වැඩ පිළිවෙළක් යොදා ඇති අතර, එම කාර්යය සාර්ථක වූ සැනින් 2018 වර්ෂයේ තාවකාලිකව නතර කරන ලද සිසුන් බඳවා ගැනීම විධිමත්ව නැවත ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

[ගරු සිසිර ජයකොඩි මහතා]

මේ සම්බන්ධව ක්‍රියා කිරීමට වෛද්‍යාචාර්යවරුන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍යවරුන් හා මාණ්ඩලික නිලධාරින්ගෙන් සමන්විත සාමාජිකයන් 10කින් යුත් විද්වත් කමිටුවක් පත් කරන ලද අතර එම කමිටුවේ, කමිටු වාර්තාව ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලයට මේ වන විට ලබා දී ඇත.

මෙම විද්වත් කමිටුවේ නිර්දේශය මත පාරම්පරික දේශීය වෛද්‍යවරුන්ගේ දරුවන් සඳහා ආයුර්වේද වෛද්‍ය සභාව හා දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය එකතුව මෙම පාඨමාලාව නැවත ආරම්භ කිරීමට දැනට කටයුතු යොදමින් සිටී.

(ii) මෙම පාඨමාලාවේ ව්‍යවස්ථාව සහ විෂය නිර්දේශයට අනුව ශිෂ්‍යයන් බඳවාගනු ලබන අධ්‍යාපන සුදුසුකම් උපාධි පාඨමාලාවකට අඩු තත්ත්වයක් යටතේ වීමත් උපාධි පිරිනැමිය හැක්කේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් ආයතනයකට බැවින්, ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් නියාමනය වන ආයතනයක් නොවීමත් හේතුවෙන් මෙය උපාධි පාඨමාලාවකට සමාන පාඨමාලාවක් නොවේ.

(iii) පාඨමාලාවේ සහ පාඨමාලාව පවත්වාගෙන යනු ලබන විද්‍යාලවල ගුණාත්මකභාවය විධිමත්ව දියුණු කිරීම සඳහා 2018 වර්ෂයේ සිට මෙම පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම තාවකාලිකව නතර කර ඇත.

(ඇ) (i) මෙම පාඨමාලාව උපාධි මට්ටමට ගැනීම සිදු කළ නොහැක.

(ii) රජයේ විශ්වවිද්‍යාලවලින් බිහි වන රාජ්‍ය සේවයට බැඳුණු උපාධිධාරි ආයුර්වේද වෛද්‍යවරුන්ට හිමි වරප්‍රසාද ආයුර්වේද ශාස්ත්‍රී පාඨමාලාව හදාරනු ලැබූවන් හට ලබා දීමට කටයුතු කළ නොහැක.

(iii) ආයුර්වේද වෛද්‍ය සභාව හා දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය ඒකාබද්ධව පාරම්පරික දේශීය වෛද්‍යවරුන්ගේ දරුවන් සඳහා මෙම පාඨමාලාව ආරම්භ කිරීමට කටයුතු යොදමින් පවතී.

(iv) මෙම පාඨමාලාව නතර කිරීම සඳහා රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන නොමැත.

(v) පැන නොනඟී.

(ඈ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ප්‍රශ්නයට පරිපූර්ණ පිළිතුරක් ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ඔබතුමා සමහර විට දන්නවා ඇති, ලංකාවේ MBBS වෛද්‍ය උපාධිධාරින් තෘප්ත වන කොට සහකාර වෛද්‍යවරු -ගම්වල අය ඇපොතිකරි දොස්තරලා කියපු අය- සඳහා වූ පුහුණු පාඨමාලාව සම්පූර්ණයෙන් අතහැර දමනු ලැබූ බව.

දැන් ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ සිද්ධ, යුනානි සමස්ත ක්ෂේත්‍රයට අදාළවත් මේ වාගේ මතවාද දෙකක් ඇති වෙලා තිබෙනවා. ඉන් එකක් තමයි, ලංකාවේ ආයුර්වේද සිද්ධ, යුනානි උපාධිධාරින් බිහිවන නිසා ශාස්ත්‍රී පාඨමාලාව තවදුරටත් පවත්වාගෙන යුතු නැහැ කියන එක. අනෙක් මතය තමයි, ඒක එක්තරා ගුණාත්මක මට්ටමකින් පවත්වාගෙන යන්න ඕනෑය කියන එක. එම පාඨමාලාව පිළිබඳ තීරණය මේ මතවාද දෙක අතර දෝලනය වෙද්දී, මේ සම්බන්ධයෙන් රජයේ පැහැදිලි, නිරවුල් ක්‍රියා මාර්ගය මොකක්ද කියලා ඔබතුමාගේ අමාත්‍යාංශය පැත්තෙන් නිශ්චිත, පැහැදිලි පිළිතුරක් දෙන්න පුළුවන්ද? බටහිර වෛද්‍යවරුන්ගේ ඒ ක්‍රමවේදය අනුගමනය කර ඇපොතිකරිවරුන් නැති කළා හා සමානව ඔය තාවකාලික තීන්දුවත් ස්ථිර තීන්දුවක් වෙයිද, එහෙම නැත්නම්, ඔය පත් කළ කමිටුව හරහා ගන්නා තීන්දුව එක්ක මේ පාඨමාලා දෙකම සමගාමීව ක්‍රියාත්මක වෙනවාද, ගරු රාජ්‍ය ඇමතිතුමනි?

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නය ඇසීම ගැන ගරු බුද්ධික පතිරණ මැතිතුමාට මා බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම දේශීය වෛද්‍ය විද්‍යායතනයෙන්, කොළඹ විශ්වවිද්‍යාලයෙන්, ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට පත්වුණු යක්කල විශ්වවිද්‍යාලයෙන්, ඒ වාගේම යාපනය සහ නැගෙනහිර විශ්වවිද්‍යාල මුල් කරගෙන පවත්වන යුනානි සහ සිද්ධ පාඨමාලාවලින් උපාධිධාරි ආයුර්වේද වෛද්‍යවරු විශාල සංඛ්‍යාවක් අපේ වෛද්‍ය ක්ෂේත්‍රයට එකතු වෙනවා. නමුත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පවත්වන බඳවා ගැනීම්වලදී උසස් පෙළ ලකුණු මට්ටම තමයි සැලකිල්ලට ගන්නේ. ඔබතුමා ප්‍රකාශ කරනවා වාගේම, මේ රටේ පාරම්පරික වෛද්‍යවරු සහ මේ ක්ෂේත්‍රය ප්‍රිය කරන අය -උසස් පෙළ විභාගයෙන් ඒ මූලික සුදුසුකම නොලැබුවත්- එවැනිම පාඨමාලාවක් හදාරා වෛද්‍ය ක්ෂේත්‍රයට ඇතුළත් වීමට විශාල උනන්දුවක් දක්වනවා. නමුත්, පසුගිය කාලයේ ඒ සම්බන්ධයෙන් ගොඩනැඟුණු ආයතනවල ගුණාත්මකභාවය පිළිබඳ ඇති වුණු ගැටලු රාශියක් නිසා තමයි මේ පාඨමාලාව 2017 වර්ෂයේදී නවත්වනු ලැබුවේ.

ඒක අපි කළ දෙයක් නොවෙයි. 2018 වර්ෂයේදී තමයි එය නවත්වනු ලැබුවේ. ඒ සඳහා විවිධ කාරණා බලපෑවා. 2021 අප්‍රේල් මාසයේදී නැවත වතාවක් අපි ඒ විභාගය - repeat exam එක - පැවැත්වුවා, වරක් විභාගයට පෙනී සිට අඩු ලකුණු සංඛ්‍යාවක් ලැබූ, ලියාපදිංචි වුණු ශිෂ්‍යයන් 317දෙනෙකු වෙනුවෙන්. අපි නැවත වතාවක් සැලසුම් කර තිබෙනවා, අප්‍රේල් මාසයේදී සහ මැයි මාසයේදී 2,000කට ආසන්න සිසුන් ප්‍රමාණයක් බඳවා ගන්න. මෙහිදී විභාග තුනක් තිබෙනවා. ඒ විභාග තුනම DA පාඨමාලාවට ඇතුළත් වන සිසුන් සඳහා පවත්වනවා. විභාග පැවැත්වීමෙන් අනතුරුව විධිමත්ව, ගුණාත්මකභාවයෙන් යුතුව එම පාඨමාලාව ලබා දීමට අවශ්‍ය කටයුතු දැනට අපේ විද්වත් කමිටුවක් මඟින් සකස් කරමින් පවතිනවා. එය සකස් කිරීමෙන් අනතුරුව එම පාඨමාලාවට සිසුන් බඳවා ගන්න කටයුතු කරනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන් ශ්‍රී ලංකාව, ඉන්දියාව, නේපාලය, භූතානය ඇතුළු දකුණු ආසියානු කලාපය තුළ සාම්ප්‍රදායික වෛද්‍ය ක්ෂේත්‍රයට ඓතිහාසික පසුබිමක් තිබෙනවා වාගේම එය අද ලෝකය තුළ සංචාරකයන්ගේ ආකර්ෂණය දිනා ගන්නත් සමත් වෙලා තිබෙනවා. ඒකත් එක්ක බැඳුණු භාවනා ක්‍රම, ඒ වාගේම යෝගා සහ සමහර අය එකඟ නොවන සමහර තන්ත්‍ර තිබෙනවා. විශේෂයෙන් මේ ක්ෂේත්‍රය තුළ අද තිබෙන ලොකුම අර්බුදයක් තමයි ඔබතුමාත් සඳහන් කළ පරිදි රාජ්‍ය අධ්‍යාපන ආයතනවලින් මේ ක්ෂේත්‍රයට අදාළව සමු ගන්නා උපාධිධාරීන්ට කඩිනමින් පත්වීම් නොලැබීම. අපි දන්නවා, බටහිර වෛද්‍ය උපාධිධාරියෙක් ඒ අධ්‍යාපන ආයතනවලින් සමු ගත්තාම ඔහුට ඉතා කඩිනමින් පත්වීම හම්බ වන බව. නමුත් මේ ක්ෂේත්‍රය ප්‍රසාරණය කරන්න නොහැකි වීම තුළ ආයුර්වේද වෛද්‍ය උපාධිධාරියාත් ගැටලුවකට මුහුණ පා තිබෙනවා. මම මේ කථා

කරන්නේ ශාස්ත්‍රී, පාරම්පරික වෛද්‍ය ක්‍රම ගැන නොවෙයි. ඒ ගැන අපි වෙනම කථා කරමු.

මම මේ කියන්නේ ආයුර්වේද, සිද්ධ, යුනානි උපාධිධාරීන්ට තිබෙන ගැටලුව පිළිබඳවයි. මේ ගැටලුවට කඩිනම් විසඳුම් අවශ්‍යයි. ඒ වාගේම, කඩිනමින් ඔවුන් රාජ්‍ය සේවයට වාගේම අනෙකුත් ක්ෂේත්‍රයන්ට ඇතුළත් කර ගන්නා ක්‍රමවේදය හදන්න ඕනෑ. විශේෂ ප්‍රමුඛතාව දීලා ආයුර්වේද ශාස්ත්‍රී ක්‍රමවේදය හදනවා වාගේම ආයුර්වේද වෛද්‍ය පරිපාලන සේවය -රෝහල් පරිපාලන කටයුත්ත- විධිමත් කරන්නත්, මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය දක්වා ගැළපෙන අය පත් කරන්නත් කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම සංචාරක ව්‍යාපාරයේ ආකර්ෂණය දිනා ගන්න පුළුවන් විධියට හෝටල් සහ පහළ මට්ටම දක්වාම මේ ක්ෂේත්‍රය ව්‍යාප්ත කරන්න ඕනෑ. එහෙම නොකළ නිසා තමයි සම්බාහන මධ්‍යස්ථාන නමින් ගණිකා ව්‍යාපාර ඇති වීම වැනි තත්ත්වයන් එන්නේ. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මෙන්න මේ කාරණා සම්බන්ධයෙනුත් අර හා සමානවම අමාත්‍යාංශයේ දැක්මක් සහ වැඩ පිළිවෙළක් තිබෙනවා ද කියලා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමතියි.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
අනිවාර්යයෙන්ම තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු කථානායකතුමනි, විශේෂයෙන් ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් දහසකට ආසන්න ප්‍රමාණයක් සිටිනවා රැකියා විරහිතව. ඒ වාගේම පසුගිය කාල පරිච්ඡේදය තුළ සිදු වුණු සංචාරක ව්‍යාපාරයේ බිඳ වැටීමත් එක්ක ආයුර්වේද ක්ෂේත්‍රයේ රජයේ රැකියා අපේක්ෂා කළ පිරිස ඉහළ ගිහිල්ලා තිබෙනවා. පෞද්ගලික අංශයේ ඔවුන්ගේ වෘත්තීයමය කටයුතු විශාල ලෙස අහිමිවීම් සිදු වෙලා තිබෙනවා. ඒ වෙනුවෙන්, අපේ සංචාරක හෝටල් පද්ධතිය තුළ ආයුර්වේද වෛද්‍යවරුන්ගේ මැදිහත්වීම මත නැවත ප්‍රතිකාර ඒකක ගොඩ නැඟීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් අපේ අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ වාගේම විදේශ රටවලින් ඉල්ලුම් කර තිබෙන ආයතනවල රැකියා සඳහා, ප්‍රතිකාර ඒකක පිහිටුවීම සඳහා දැනටමත් අපි වෛද්‍යවරු කිහිප දෙනෙක් ඔවුන්ගේ වෘත්තීන් වෙනුවෙන් යොදවා තිබෙනවා. ඒ වාගේම සංචාරක ක්ෂේත්‍රයේ, විශේෂයෙන් පෞද්ගලික ක්ෂේත්‍රවලත්, විදේශ රටවල එක් එක් ක්ෂේත්‍රවලත් අපේ උපාධිධාරී ආයුර්වේද වෛද්‍යවරුන්ට අවස්ථාව ලබා දෙන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම රජය වශයෙන් අපි කටයුතු කරගෙන යනවා, දැනට පුරප්පාඩු පවතින ආයතනවලට සහ ග්‍රාමීය රෝහල් පද්ධතියට ආයුර්වේද වෛද්‍යවරු අනුයුක්ත කරන්න.

## ජාතික පාසල් ස්ථාපනය කිරීම: රත්නපුර දිස්ත්‍රික්කය
## தேசிய பாடசாலைகளை உருவாக்குதல்: இரத்தினபுரி மாவட்டம்
## ESTABLISHMENT OF NATIONAL SCHOOLS: RATNAPURA DISTRICT

251/2022

**3. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ස්ථාපනය කර ඇති ජාතික පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) රත්නපුර දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා සමානව බෙදී යන අයුරින් ජාතික පාසල් ස්ථාපනය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்தில் அமைந்துள்ள தேசிய பாடசாலைகளின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் ஒவ்வொரு பிரதேச செயலகப் பிரிவுகளுக்கமைவாக வெவ்வேறாக யாவையென்பதையும்;

(ii) இரத்தினபுரி மாவட்டத்திலுள்ள சகல பிரதேச செயலகப் பிரிவுகளுக்கும் சமமாகப் பிரிந்து செல் லக்கூடிய வகையில் தேசிய பாடசாலைகளை உருவாக்குவதற்கு மேற்கொள்ளும் நடவடிக் கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the number of National Schools established in Ratnapura District and their names in relation to each Divisional Secretary's Division, separately; and

(ii) the measures to be adopted to establish National Schools in an equitable manner in all Divisional Secretaries' Divisions in Ratnapura District?

(b) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Education and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ස්ථාපනය කර ඇති ජාතික පාසල් සංඛ්‍යාව 15කි. ඒවායේ නම් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව පහත පරිදි වේ.

| අනු අංකය | ජාතික පාසලේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
|---|---|---|
| 01 | ඇහැලියගොඩ මධ්‍ය ම.වි | ඇහැලියගොඩ |
| 02 | ෆර්ගසන් උසස් විද්‍යාලය | රත්නපුර |
| 03 | සුමන බාලිකා විද්‍යාලය | රත්නපුර |
| 04 | ශාන්ත ඇලෝසියස් විද්‍යාලය | රත්නපුර |
| 05 | ජේසු බිළිඳාගේ කන්‍යාරාමය | රත්නපුර |
| 06 | සීවලී මධ්‍ය මහා විද්‍යාලය | රත්නපුර |
| 07 | ගන්කන්ද මධ්‍ය මහා විද්‍යාලය | පැල්මඩුල්ල |
| 08 | ආනන්ද මෛත්‍රී මධ්‍ය මහා විද්‍යාලය | බලංගොඩ |
| 09 | රාහුල මධ්‍ය මහා විද්‍යාලය | ගොඩකවෙල |

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

| අනු අංකය | ජාතික පාසලේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
|---|---|---|
| 10 | ශාන්ත ජෝන් දෙමළ මහා විද්‍යාලය | ගොඩකවෙල |
| 11 | කරවිට මධ්‍ය මහා විද්‍යාලය | නිවිතිගල |
| 12 | කලවාන මධ්‍ය මහා විද්‍යාලය | කලවාන |
| 13 | කොලොන්න මධ්‍ය මහා විද්‍යාලය | කොලොන්න |
| 14 | ඇඹිලිපිටිය ජනාධිපති විද්‍යාලය | ඇඹිලිපිටිය |
| 15 | කුරුවිට මධ්‍ය මහා විද්‍යාලය | කුරුවිට |

ඊට අතිරේකව අපි ගිය මාසයේ ගොඩකවෙල ශාන්ත ජෝන් දෙමළ මහා විද්‍යාලය ජාතික පාසලක් ලෙස ප්‍රකාශයට පත් කර තිබෙනවා.

(ii) ඔව්.

රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 19ක් සඳහා බෙදී යන පරිදි ඉදිරියේදී ජාතික පාසල් ලෙස උසස් කිරීමට යෝජිත පාසල් සංඛ්‍යාව 63කි. එම විස්තර ඇතුළත් ඇමුණුම **සභාගත*** කරමි.

එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 19 හා එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට ජාතික පාසලක් වශයෙන් උසස් කිරීමට යෝජිත පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් පහත පරිදි වේ.

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පාසල් ගණන |
|---|---|---|
| 01 | අයගම | 01 |
| 02 | ඇඹිලිපිටිය | 07 |
| 03 | ඇලපාත | 01 |
| 04 | ඇහැලියගොඩ | 05 |
| 05 | ඉඹුල්පේ | 03 |
| 06 | ඕපනායක | 02 |
| 07 | කල්තොට | 01 |
| 08 | කහවත්ත | 05 |
| 09 | කැගල්ල | 02 |
| 10 | කිරිඇල්ල | 03 |
| 11 | කුරුවිට | 04 |
| 12 | කොලොන්න | 03 |
| 13 | ගොඩකවෙල | 04 |
| 14 | නිවිතිගල | 02 |
| 15 | පැල්මඩුල්ල | 04 |
| 16 | බලංගොඩ | 05 |
| 17 | රත්නපුර | 06 |
| 18 | වරකාපොල | 04 |
| 19 | වැලිගෙපොල | 01 |
| එකතුව | | 63 |

(ආ) අදාළ නොවේ.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ස්තුතියි, ගරු ඇමතිතුමනි. ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

මම මේ කියන්න යන කාරණය ඔබතුමා කිව්වාද කියා මට මතක නැහැ, ගරු ඇමතිතුමනි. 2020 අප්‍රේල් මාසය අවසාන වෙන කොට මේ රටේ පාසල් 1,000ක් රජය විසින් නම් කරලා ඒවා ජාතික පාසල් විධියට ක්‍රියාත්මක වෙන්න අවශ්‍ය වටපිටාව හදනවා කියලා එවකට හිටපු අමාත්‍යවරයා ප්‍රකාශ කළා.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා ඒ අවස්ථාවේ ඒ මතයේ සිටියාද කියලා මට මතක නැහැ. රක්වාන St. John's College එක ගැනත් ඔබතුමා කථා කළා. මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. ගරු ඇමතිතුමනි, මා දන්නා තරමින් රේඛීය අමාත්‍යාංශයට පළාත් පාසලක් එකතු කර ගන්න නම් ස්ථාවර නියෝග 50 අනුව චක්‍රලේඛයක් නිකුත් කරන්න ඕනෑ. මේ වන කොට එය නිකුත් කර තිබෙනවාද නැද්ද කියන කාරණය මා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල පෙරේරා මහතා 2022.01.27වන දා සියලු පළාත් අධ්‍යක්ෂවරුන්ට ලිපියක් නිකුත් කරමින් කියනවා, "මේ රටේ ජාතික පාසල් විධියට නම් කරපු කිසිම පාසලක් ජාතික පාසලක් විධියට වැඩ කටයුතු ආරම්භ කරන්න එපා, එය ආරම්භ කරන දින ඉදිරියේදී දැනුම් දෙන්නම්, මේ වන තෙක් අදාළ නියෝග අනුව කටයුතු කර නැහැ" කියලා.

ගරු ඇමතිතුමනි, රටේ සමහර ඇමතිවරු, මන්ත්‍රීවරු කියනවා, ඒවා ජාතික පාසල් බව. නමුත්, අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙනත් ප්‍රකාශයක් කරනවා. එතුමා යවපු ලිපියේ copy එකක් මා සතුව තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, ඒ පාසල් ජාතික පාසල් විධියට මේ වන කොට නම් කර තිබෙනවාද, එහෙම නැත්නම් ඉදිරියේදී එසේ කිරීමට කටයුතු කරනවාද කියලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ජනවරම ලැබුණු අවස්ථාවේදී සහ පාර්ලිමේන්තුවේදීත් ප්‍රකාශ කළ පරිදි, මේ රටේ අඩු පහසුකම් සහිත පාසල්වලට අවශ්‍ය පහසුකම් ලබා දීලා ජාතික පාසල් නොවන පාසල් ජාතික පාසල් බවට පරිවර්තනය කිරීම සඳහා "ජාතික පාසල් 1,000" වැඩ පිළිවෙළ ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඒ අනුව යමින්, හිටපු අධ්‍යාපන අමාත්‍ය ගරු ජී.එල්. පීරිස් මැතිතුමා ඒ වෙනුවෙන් ගත් පළමුවන පියවර මේ ගරු සභාවට ප්‍රකාශ කළා. කොවිඩ් -19 වසංගත කාලයේ පාසල් බොහොමයක් වසා තිබුණා. විභාග පැවැත්වීමත් කල් දමන්න අපට සිදු වුණා. ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරණය ඔබතුමා හොඳින් දන්නවා. එසේ කල් දැමූ අපොස උසස් පෙළ විභාගය පසුගිය සතියේ තමයි පවත්වා හමාර කළේ. අප ආණ්ඩුව භාර ගන්නා අවස්ථාවේ පැවැති 373ක් වූ ජාතික පාසල් සංඛ්‍යාව 1,000 දක්වා වැඩි කිරීමේ සැලැස්ම සකස් කරලා ඊට අදාළ වැඩ කටයුතු අරඹා තිබෙනවා. පළාත් සභා සමඟ සාකච්ඡා වාර පවත්වා විෂයය ධාරා අනුව ගුරුවරුන් ස්ථානගත කිරීමේ වැඩ පිළිවෙළ සකස් කර තිබෙනවා. ඒ වාගේම අලුත් ආයෝජනයන් අවශ්‍ය පාසල්වලට ගරු මුදල් ඇමතිතුමා අය වැය ලේඛනයෙන් මේ වසර සඳහා මුදල් ලබා දීලා තිබෙනවා. ඒ අනුව අතිගරු ජනාධිපතිතුමා පසුගිය ජනවාරි 08වන දා පළාත් නවය තුළ පාසල් 09ක් ජාතික පාසල් ලෙස ප්‍රකාශයට පත් කළා. එහිදී සියඹලාණ්ඩුව මහා විද්‍යාලයත් ජාතික පාසලක් බවට පත් කළා. ඉන් පසුව, මා සඳහන් කළ රක්වාන දෙමළ විද්‍යාලයත් ජාතික පාසලක් බවට පත් කළා. ජාත්‍යන්තර කාන්තා

දිනය යෙදුණු ඊයේ දිනයේ ගරු අග්‍රාමාත්‍යතුමා ලංකාවේ බාලිකා විද්‍යාල 8ක් ද ඇතුළුව පාසල් 10ක් ජාතික පාසල් ලෙස ප්‍රකාශයට පත් කළා. මේ ආකාරයට ජූනි මාසයේ 01වන දාට ප්‍රථම පාසල් 542ක් ජාතික පාසල් බවට පත් කිරීමේ කටයුත්ත හමාර කිරීමට සැලසුම් කරලා වැඩසටහන් ආරම්භ කර තිබෙනවා. ඒ අනුව, ගුරුවරුන් අඩු පාසල්වලට -විද්‍යා ගුරුවරුන්ද ඇතුළුව- විෂය ධාරා අනුව ගුරුවරුන් ස්ථානගත කරමින් යනවා. තොරතුරු තාක්ෂණ අංශ අවශ්‍ය ස්ථානවල ස්ථානගත කරමින් යනවා. පළාත් සභා සමඟ සාකච්ඡා කරමින් තමයි, මේ පළමුවන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරමින් සිටින්නේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය අසනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි, ජාතික පාසල් සම්බන්ධයෙන් ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා දැක්වූ අදහස්වලට පොඩි අදහසක් එකතු කරලා මගේ අතුරු ප්‍රශ්නය අහන්නම්. ජාතික පාසලක් නම් කරන කොට, ඒ සඳහා සුදුසු නිර්ණායක තිබෙනවා. ඒවා කාලයක් තිස්සේ පැවතෙමින් එන ඒවා. මගේ පෞද්ගලික අදහස නම්, ජාතික පාසල් සහ පළාත් සභා පාසල් කියා දෙවිධියකට නැතිව හැම පාසලකටම එක විධියකට සලකන්න පුළුවන් නම් සැමට සම අධ්‍යාපනයක් ලැබෙනවා කියන එකයි.

පසුගිය කාලයේ ජාතික පාසල් නම් කිරීම සම්බන්ධයෙන් අප දුටු දෙයක් තිබෙනවා. ඒවා නගරයටම කොටු වෙලා තිබෙන පාසල්. නගරයේ පාසල්වලට දරුවන් ඇදී යන එක නවත්වන්න ඕනෑ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පාසල්වලට අවශ්‍ය පහසුකම් වැඩි කර දුන්නා නම් දරුවන් නගරයට ඇදී යන එක නතර වෙලා, තම ප්‍රදේශවල පාසල්වලම රැඳී ඉන්න ඉඩ තිබෙනවා කියලා මම හිතනවා. ගරු ඇමතිතුමනි, ඔය බොහෝ ජාතික පාසල් නගරබද පාසල්. ඔබතුමා ඒ ගැන සොයා බලන්න. උදාහරණයක් විධියට මාතලේ ගන්නම්. මාතලේ නගරයේ පාසල් 8ක් විතර තිබෙනවා. තවත් පාසල් නගරයටම එකතු වෙලා තිබෙනවා. නමුත් ලග්ගල මැතිවරණ කොට්ඨාසයටම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4ටම තිබෙන්නේ එක ජාතික පාසලයි. ගරු ඇමතිතුමනි, මා කියන්නේ, පාසල්වල සම්පත් බෙදී යෑමේ විෂමතාවක් තිබෙන නිසා ඒ පිළිබඳ ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා. හැබැයි, මේ පාසල් 1,000 වැඩසටහන තුළ පාසල් කිහිපයක් ජාතික පාසල් ලෙස නම් කරලා තිබෙනවා තමයි. මම ඔබතුමාට කියන්නේ දරුවන් නගරයේ පාසල්වලට ඇදී යෑම නැවැත්වීම සඳහා ග්‍රාමීය ප්‍රදේශවල පාසල් දියුණු කරන්න වැඩි ප්‍රමුඛතාවක් ලබා දෙන්න කියලායි.

ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, ඔබතුමා අධ්‍යාපන ඇමති ධුරයේ තවදුරටත් සිටිනවා දකින්නට ලැබීම ගැන මම සතුටු වෙනවා. මොකද, ඇමතිවරයෙකු ඇවිල්ලා තම විෂයය පිළිබඳ හතර සීමාව දැන ගන්න කොටම ආයෙත් අලුතෙන් කෙනෙක් එනවා නේ. එහෙම වෙයි කියලා බයෙන් සිටියේ. එහෙම නොවී ඔබතුමා එම ධුරයේ තවදුරටත් සිටින එක ගැන මම සතුටු වෙනවා.

ගරු ඇමතිතුමනි, අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. දවසකවත් විවාදයක් ඕනෑ වෙනවා, අධ්‍යාපනයේ තිබෙන ප්‍රශ්න ගැන කථා කරන්න. අධ්‍යාපන විද්‍යා පීඨවලට අදාළ ප්‍රශ්නයක් තමයි මම ඔබතුමාගෙන් අහන්නේ. මේ ඩිප්ලෝමාව උපාධියක් බවට පත් කරනවා කියලා ඔබතුමන්ලාගේ මැතිවරණ ප්‍රකාශයේ තිබුණා. ඒ පිළිබඳව ශිෂ්‍යයන්ගෙත් ඉල්ලීමක් තිබෙනවා. මේක දෙන්නේ NIE එක හරහා ද, එහෙම නැත්නම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා ද කියන ගැටලුව තිබෙනවා. ගරු ඇමතිතුමනි, 2017-2019 තෙවැනි වසර කණ්ඩායමේ සීමාවාසික පුහුණුව 2021 අගෝස්තු 01වැනි දායින් අවසන් වෙලා තිබෙනවා. මාස හයක් ගත වෙලා තිබුණත් තවම ඒ අයට ස්ථිර පත්වීම් ලබා දී නැහැ, ගරු ඇමතිතුමනි. මේ වන විට ගුරු හිඟය 30,000කට ආසන්නයි. අනෙක් කාරණය තමයි, මේ ගුරු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට දෙන්නේ මසකට රුපියල් 5,000ක දීමනාවක් පමණයි. ඒ අය තුන්වේල කාලා ඉන්නත් ඕනෑ. ඒ වාගේම ඒ අයගේ ඉගෙනුම් කටයුතු සඳහා අවශ්‍ය දේවල් සපයා ගන්නත් ඕනෑ. ඒවාට යන වියදම රුපියල් 5,000න් පිරිමසා ගන්න ඒ අයට බැරිවෙලා තිබෙනවා. 2019-2020 කණ්ඩායම බඳවා ගන්න මේ වනතුරු ගැසට් එක නිකුත් කරලාත් නැහැ. විද්‍යා පීඨ සම්බන්ධයෙන් මම එක ප්‍රශ්නයක් ඇතුළේ ප්‍රශ්න හතරක් ගොනු කර තිබෙනවා. ඒවාට ඔබතුමාගේ පිළිතුර ලබා දෙන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමියට ගෞරවයක් වශයෙන් මට පිළිතුරු දෙන්න පුළුවන්. අද දහවල් 2.00ට අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව රැස් වෙනවා. ඔබතුමිය රැයට සහභාගි වෙන්න. අහන ලද ප්‍රධාන ප්‍රශ්නයට සම්බන්ධ නැති ප්‍රශ්නවලට තමයි ඔබතුමා මේ ඉඩ දෙන්නේ, ගරු කථානායකතුමනි. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව අපි කාලය වෙන් කරන්නේ ඒ අදාළ කාරණයට සම්බන්ධ අතිරේක ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒක අහන්න නේ.

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය කියූ පරිදි ජාතික පාසල් නගරවලට කේන්ද්‍රවීම වෙනස් කොට, ග්‍රාමීය වශයෙන් ඇති කිරීම සඳහායි ජනාධිපතිතුමා ජාතික පාසලක් නැති හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම ජාතික පාසලක් ඇති කිරීමේ වැඩ පිළිවෙළට ප්‍රමුඛත්වය දෙන්න කියන්නේ. ඒක ඉතාම වැදගත්. ඔබතුමියත් දැන් ඒ ගැන සඳහන් කළා. අපි ඒ ඉලක්කය ඉෂ්ට කරමින් තමයි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ. එතැනදී අඩු පාඩුකම් බලන්න ඕනෑ. හිටපු ඇමතිතුමන්ලා ඒ ඒ කාලවල යම් යම් නිර්දේශ කර තිබෙනවා. මට ඒවා තනියම වෙනස් කරන්න බැහැ. ඒවා අමාත්‍ය මණ්ඩලයට යොමු කරන්න ඕනෑ. ඒ ගැන දැන් සාකච්ඡා කරමින් ඉන්නවා. පළාත් සභා පාසල් පවරා ගැනීමේදී තිබෙන ගැටලු පළාත් සභාව එක්ක සාකච්ඡා කරන්න ඕනෑ. ඒ අනුව තමයි ඒවා මධ්‍යම රජයට පවරා ගන්න පුළුවන් වෙන්නේ. ඒ අනුව අපි එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. මම මේ විස්තර යළි කියන්න උත්සාහ දරන්නේ නැහැ.

අවුරුදු 24ක් මේ රටේ ගුරුවරුන්, විදුහල්පතිවරුන් මුහුණ දුන් වැටුප් ප්‍රශ්නය අපි විසඳුවා. මේ තරම් කෝටි සම්භාරයක මුදලක් -බිලියන 30කට වැඩි මුදලක්- ආයෝජනය කර තිබියදී, රටේ ගුරු පරම්පරාවගේ ප්‍රශ්න විසඳන්නේ නැහැ කියා මේ රජයට චෝදනා කිරීමේ කිසිම සාධාරණත්වයක් නැහැ. පසුගිය කාලවල ඇතිකර තිබුණු අවුල් එකින් එක විසඳීමේ ක්‍රියාමාර්ගයක් අපි ක්‍රියාත්මක කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමිය අතිරේක ප්‍රශ්න මතු කරමින් මේ ප්‍රශ්නයට අදාළ නැති දෙයකුත් සඳහන් කළා, අධ්‍යාපන අමාත්‍ය ධුරය ගැන. මම ඒකට උත්තර දෙන්න යන්නේ නැහැ. හොඳ හිතින් වෙන්න ඇති නේ ඒ ගැන කිව්වේ. හොඳ හිතින් කියන ඒවාට උත්තර දෙන්න කාලයක් නැහැ. මම ඔබතුමියට ආරාධනා කරනවා, අපේ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට පැමිණෙන්න කියලා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, මම එක ඉල්ලීමක් කරනවා. - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකරලා ඔය කාරණය දැන් අවසන් කරන්න. *[බාධා කිරීමක්]*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් මට පොඩි පැහැදිලි කර ගැනීමක් කරගන්න ඕනෑ. මම ඉතාම කෙටියෙන් කියන්නම්.

ගරු ඇමතිතුමනි, රජය ඉන්දියාවට පොරොන්දුවක් දීලා තිබෙනවා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරනවා කියලා. එතකොට, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පළාත් සභාවලට දීලා තිබෙන පාසල් රජයට පවරා ගන්න එක හරිද කියලා මම අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, විලම්බීත කථාවලට උත්තර දෙන්න ගියාම වෙලාව ගත වෙනවා. මේ ආණ්ඩුව මොකක්ද කළේ? වි.ජ.මු. ලොකුබණ්ඩාර හිටපු අමාත්‍යතුමා එදා මොකක්ද කළේ? පළමුවෙන්ම එතුමා තේ පාසල් සිය ගණනක් පවරා ගත්තේ. ඒක වැරදි නැහැ. ගමට සම්බන්ධ දරුවන්ගේ අධ්‍යාපනය දියුණුවට විශේෂ මැදිහත්වීමක් කරන්න ඕනෑ, සාකච්ඡා මාර්ගයෙන් සහ පළාත් සභා එකඟ වීමෙන්. එහෙම නැතිව ඉස්සර වාගේ ගැසට් එක ගහලා පාසල් පවරාගෙන නැහැ. ගරු මන්ත්‍රීතුමා, නිකම් බොළඳ කථා, විලම්බීත කථා කියන්න එපා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒක වෙනම වේදිකාවක කථා කළ යුතු දෙයක්. වෙනම තැනක කථා කරන්න ඕනෑ ප්‍රශ්නයක් ඔබතුමා මේ කථා කරන්නේ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මට පැහැදිලි කර ගැනීමක් කරගන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තවදුරටත් අවස්ථාව දෙන්න බැහැ. ගරු ඇමතිතුමා ඔබතුමියට පැහැදිලි කළා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ඒක ගැන තමයි කථා කර ගන්න තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක උපදේශක කාරක සභාවට ගිහින් කථා කර ගන්න.

## බදුල්ල දිස්ත්‍රික්කයේ රටකජු වගා ව්‍යාපෘතිය: විස්තර
## பதுளை மாவட்டத்தில் நிலக்கடலை பயிர்ச்செய்கை கருத்திட்டம்: விபரம்
## PEANUT CULTIVATION PROJECT IN BADULLA DISTRICT: DETAILS

571/2022

**4. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ, මහියංගන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රටකජු වගා කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන ඇති ඉඩම් ප්‍රමාණය සහ පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පවුල් සඳහා රජය විසින් ලබා දෙනු ලබන සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பதுளை மாவட்டத்தின், மஹியங்கனை பிரதேச செயலாளர் பிரிவில் நிலக்கடலை பயிர்ச்செய்கை கருத்திட்டமொன்று ஆரம்பிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) மேற்படி கருத்திட்டத்திற்காகத் தெரிவுசெய்யப் பட்டுள்ள காணியின் அளவு மற்றும் குடும்பங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

(iii) அக்குடும்பங்களுக்காக அரசாங்கத்தினால் வழங் கப்படும் சலுகைகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் தெரிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture :

(a) Will he inform this House -

(i) whether a project to cultivate peanuts in Mahiyanganaya Divisional Secretary's Division within Badulla District has been commenced;

(ii) separately, of the total land area and number of families selected for the project; and

(iii) the subsidies that will be provided by the Government to the aforesaid families?

(b) If not, why?

**ගරු ඩී.බී. හේරත් මහතා (පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு டீ.பி. ஹேரத் - கால்நடை வளங்கள், பண்ணைகள் மேம்பாடு, பால் மற்றும் முட்டை சார்ந்த கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. D.B. Herath - State Minister of Livestock, Farm Promotion and Dairy and Egg Related Industries)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

රටකජු වගා ව්‍යාපෘතිය බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2021 යල කන්නය තුළ ආරම්භ කර ඇති අතර, 2021/22 මහ කන්නය දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක විය.

(ii) 2021 යල කන්නයේ ගොවි පවුල් 50ක් තෝරාගෙන ඇති අතර, එමඟින් ආවරණය වන රටකජු වගා භූමි ප්‍රමාණය අක්කර 38කි. 2021/22 කාලය තුළ ගොවි පවුල් 247ක් රටකජු වගා කර අක්කර 284.5ක භූමි ප්‍රමාණයක් ආවරණය කර ඇත. ඒ අනුව මහියංගන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අක්කර 322.5ක් ආවරණය වන පරිදි ගොවි පවුල් 297ක් තෝරා ගන්නා ලදී.

(iii) භෝග නිසි ලෙස කළමනාකරණය කළ තෝරාගත් ගොවි පවුල් සඳහා රජයේ ගැළපුම් ප්‍රදානය හරහා පහත අයිතම ලැබෙනු ඇත.

1. අක්කරයකට රටකජු ඇට කිලෝග්‍රෑම් 40ක් වශයෙන්.
2. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන අන්තර් වගා යන්ත්‍රය.
3. කුඩා පරිමාණ රටකජු කරල් බෙදුම් යන්ත්‍රය.

රජයෙන් ලැබෙන මුළු දායකත්වය ගොවි පවුලකට දළ වශයෙන් රුපියල් 91,600කි.

රටකජු බීජ නිෂ්පාදනය සඳහා තෝරාගත් පවුල් 50කට ඉහත අයිතමවලට අමතරව ජල පොම්පයක් සහ ඉසින වාරි පහසුකම් ලැබේ. රටකජු බීජ නිපදවන ගොවි පවුලකට රජයෙන් ලැබෙන සම්පූර්ණ දායකත්වය සඳහා ආසන්න වශයෙන් රුපියල් 241,400ක ගැළපුම් ප්‍රධාන ආධාරයක් ලැබේ.

(ආ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ස්තුතියි, ගරු රාජ්‍ය ඇමතිතුමනි. ඔබතුමාගේ පිළිතුරේ සඳහන් වන පරිදි රට කජු වගාව තුළින් විශාල ආදායමක් උත්පාදනය කළ හැකියි කියන කාරණය තහවුරු වෙනවා. හැබැයි, ඔබතුමා කියපු ඔය භූමි ප්‍රමාණය දැන් නැහැ. ඔබතුමා මාධ්‍ය තුළින් දකින්න ඇති, සීනි කර්මාන්තශාලාවක් හදන්න ඕනෑ නිසා එක්තරා සමාගමකින් මහ දවල් ඇවිල්ලා එම භූමියේ අක්කර 6,500ක ප්‍රමාණයක් විනාශ කරලා කජු වගාවට අමතරව තවත් වගාවන් ගණනාවක් විනාශ කළ ආකාරය. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඔය කියන සහන සැපයූ, සහන සපයනවා කියපු, විශාල ආදායමක් උපයා ගන්නවා කියපු පවුල් මේ වෙනකොට ඉන්නේ මහ පාරේ. ඒ ගැන හොයලා බලන්න. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒවා රජයේ ඉඩම්. හැබැයි, ඔවුන් දීර්ඝ කාලයක් තිස්සේ -පරම්පරා 4කට එහා ප්‍රමාණයක්- බුක්ති විඳපු ඉඩම්, ඒවා. එම ඉඩම්වල තමයි කජු වගාව ඇතුළු තවත් ආර්ථිකමය භෝග ගණනාවක් හදලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ නිසා තමයි ගරු ජනාධිපතිතුමා හල්දුම්මුල්ලට ආ වෙලාවේ පිරිසක් ගිහිල්ලා එතුමාගෙන් ඒ අයිතිය ඉල්លුවේ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට මතක ඇති, ඒ වෙලාවේ ජනාධිපතිතුමා කිව්වා, "මගේ කට වචනය තමයි ගැසට් එක, මේ ඉඩම්වල දීර්ඝ කාලයක් පදිංචි වෙලා සිටින උදවියට ඒවා නීත්‍යානුකූලව ලබා දෙන්න" කියලා. මහියංගනයේ, දෙහිගම කජු ඉඩම් සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන ප්‍රශ්නය ගැන මම මේ කියන්නේ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් මාධ්‍යවලින් දකින්න ඇති, ජනාධිපතිතුමාගේ එම නියෝගය නොතකා ගිය මාසයේ සතියක පමණ කාලයක් ඇතුළත එම ඉඩම් සම්පූර්ණයෙන්ම ඩෝසර් කරලා විනාශ කර තිබෙන ආකාරය. ඒ කජු වගාව -අවුරුදු ගණනාවක් තිස්සේ වගා කරපු කජු ගස් සියල්ල- පොළොවට සමතලා කර තිබෙනවා. එ් අනුව, එක පැත්තකින් ජනාධිපතිතුමාගේ එම නියෝගය ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ වාගේම ඔබතුමා ඔය කියන සහන දෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන එම කජු වගාව විනාශ කරන්න ඒ කොම්පැනියට අවස්ථාවකුත් දීලා තිබෙනවා. අපේ ආණ්ඩුව කාලයේදීත් එම ඉඩම ඔය කොම්පැනියට දෙන්න ගිහිල්ලා නතර වුණා. ඒ වාගේම තවත් ආණ්ඩුවක් පැවැති කාලයකදීත් එම ඉඩම කොම්පැනියකට දෙන්න ගිහිල්ලා නතර වුණා. මේ සම්බන්ධයෙන් අත යට සිදුවන විවිධ ගනුදෙනු තිබුණා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, එම නිසා අපට පෙනෙන විධියට ඔබතුමාත් නොදැනුවත්ව, ඔබතුමාගේ ඔය සාර්ථක ව්‍යාපාරය කඩාකප්පල් කරලා ඒ ජනතාව මහ පාරට ඇද දමලා, අත යට සිදුවන යම් ගනුදෙනුවකට කොම්පැනියක් ඉදිකරන්න එම ඉඩම ලබා දීලා තිබෙනවා. ඒ පිළිබඳව ඔබතුමා දන්නා තොරතුරු මොනවාද කියා මම දැනගන්න කැමැතියි.

**ගරු ඩී.බී. හේරත් මහතා**
(மாண்புமிகு டீ.பி. ஹேரத்)
(The Hon. D.B. Herath)

ගරු කථානායකතුමනි, බදුල්ලේ රටකජු වගාව සහ එම ඉඩම් පිළිබඳව තමයි චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා මුල් ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ. එම නිසා එතුමා දැන් අහපු අතුරු ප්‍රශ්නයට අදාළ තොරතුරු පරීක්ෂා කර බලා පිළිතුරු සපයන්න මම අපේක්ෂා කරනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, සභානායක ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා කිව්වා, අදාළ ප්‍රශ්න විතරක් අහන්න කියලා. මම අදාළ කර ගත්තේ, කජු වගා කරන ඉඩමේ ගස් කපා දැමීම පිළිබඳ තොරතුරු. එතකොට, ඒ අදාළ ප්‍රශ්නය අදාළ රාජ්‍ය ඇමතිවරයා දන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා රීති පෙන්නලා, ඒ රීති අනුව කටයුතු කරන්න කියලා කියනවා. එතකොට, රීතිය අනුව කජු වගා කරපු ඉඩම, ජනාධිපතිවරයා ජනතාවට දෙන්න කියපු ඉඩම, ගරු රාජ්‍ය ඇමතිතුමා ආයෝජනය සඳහා මුදල් වෙන් කරපු ඉඩම විනාශ කළා කිව්වාම රාජ්‍ය ඇමතිතුමා කියනවා, ඒක අදාළ නැති ප්‍රශ්නයක් කියලා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම දන්නේ නැහැ, ඔබතුමා මේ ආණ්ඩුවේ,- *[බාධා කිරීමක්]* ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමන්ලා ඇත්ත කියන්න භයයි. ඇත්ත කිව්වොත් දොට්ට දමනවා. උදය ගම්මන්පිල හිටපු ඇමතිතුමා වාගේ හැදෙන්න කෝ. බලන්න කෝ, ඇමතිකම දාලා ඇවිල්ලා පසු පෙළට වෙලා එතුමා නිර්භීතව ඉන්නවා. මෙහෙම කරන්න ඉඩ දෙන්න එපා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අතුරු ප්‍රශ්නය අහන්න, කාලය නාස්ති කරන්න එපා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මෙතුමන්ලා සල්ලි දුන්නා කියපු ඉඩමේ කජු ගස් ටික කපා දාලා තිබෙනවා. ඒ පිළිබඳව මාධ්‍යවලත් පළ වුණා. දෙහිගම මිනිස්සු දැන් මහ පාරේ. නමුත්, ගරු රාජ්‍ය ඇමතිතුමා කියනවා, ඒ ගැන දන්නේ නැහැ කියලා. අතුරු ප්‍රශ්නයක් විධියට එතුමා දන්නේ නැති ප්‍රශ්නයක් අහලා වැඩක් නැහැ නේ? ගරු රාජ්‍ය ඇමතිතුමනි, කෘෂිකර්මයට සම්බන්ධ ප්‍රශ්නයක් කොතැනින් ඇහුවත්, ඒකට පිළිතුරු දෙන්න කෘෂිකර්ම ඇමතිවරයාට දක්ෂතාව තිබෙන්න ඕනෑ. ඒ වාගේම අධ්‍යාපන ඇමතිතුමාගෙන් අධ්‍යාපනයට සම්බන්ධ ප්‍රශ්නයක් ඇහුවාම, "ඒක අදාළ නැහැ" කියන එක අධ්‍යාපන ඇමතිතුමාට ගැළපෙන්නෙත් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5. ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම් වැල්වටාරම් නැතුව ඉක්මනට ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අදාළ ප්‍රශ්නයක් ඇහුවාම ඒකට උත්තර දෙන්නේ නැත්නම් වැල්වටාරම්වලට යන්න වෙනවා නේ, ගරු කථානායකතුමනි. සමාවෙන්න.

ගරු රාජ්‍ය ඇමතිතුමා, අපනයන ආදායමක් උත්පාදනය කරන්න පුළුවන් වගාවක් තමයි කජු වගාව. මහියංගනයේ පමණක් නොවෙයි, කාලගුණික, දේශගුණික බලපෑම් එක්ක කජු හොඳ සරු සාරව වගා කරන්න පුළුවන් ප්‍රදේශ සහ වැඩ පිළිවෙළක් තිබෙනවාය කියා මම විශ්වාස කරනවා. මා හිතන හැටියට ඒ වැඩ පිළිවෙළ පිළිබඳව අමාත්‍යාංශයේ වැඩි අවධානයක් යොමු වෙලා නැහැ. කජු ගස් තිබෙනවා නම්, ඒවායේ කජු හැදිලා තිබෙනවා නම් ඒ වගාකරුවන්ට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න පමණයි අමාත්‍යාංශය මැදිහත්වීමක් කර තිබෙන්නේ. මීට වඩා වගා කළ හැකි, මීට වඩා ඵලදාවක් ගන්න පුළුවන් සහ අපනයනය හරහා ඩොලර් ඉපැයීම සඳහා යම් සහයෝගයක් ලබා දෙන්න පුළුවන් සාර්ථක වැඩ පිළිවෙළක් දිගින් දිගටම යෝජනා වෙලා තිබෙනවා. හැබැයි, එහෙම කටයුත්තක් අමාත්‍යාංශය කරන්නේ නැහැ. සමහර විට ඒ දිස්ත්‍රික්කයේ ඉන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට අවශ්‍ය විධියට වගාකරුවන්ට මුදල් ටිකක් බෙදලා දෙනවා. නමුත් බදුල්ල දිස්ත්‍රික්කයේ, මහියංගනය ඇතුළු ප්‍රදේශවල ඊට වඩා ඵලදායී වැඩ පිළිවෙළක් මේ වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා ඔබතුමන්ලා යම් වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න සූදානමක ඉන්නවාද ගරු රාජ්‍ය ඇමතිතුමනි?

**ගරු ඩී.බී. හේරත් මහතා**
(மாண்புமிகு டீ.பி. ஹேரத்)
(The Hon. D.B. Herath)
ගරු කථානායකතුමනි, රට කජු ගැන ප්‍රශ්නයක් අහලා, කජු පිළිබඳව කථා කරන චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, ඊළඟට මේ ගරු සභාවේ අවධානය යොමු කරන්නේ ඉඩම් ගැටලුවක් පිළිබඳව. විපක්ෂයේ මන්ත්‍රීවරයාට උඩ යට මාරු වෙලා, අනවශ්‍ය ප්‍රශ්න තමයි අහන්නේ. එතුමාට එවන් ප්‍රශ්නයක් අහන්න අවශ්‍ය නම් නැවත ප්‍රශ්නයක් විධියට එය අහන්න පුළුවන්. රට කජු ගැන ප්‍රශ්නයක් අහලා, එතුමා කජු ගැන කථා කරනවා; නැවත ඉඩම් ගැන කථා කරනවා. එතුමා අහපු ප්‍රශ්නයට සහමුලින්ම පටහැනිව තමයි අතුරු ප්‍රශ්න අහන්නේ. අවශ්‍ය නම් ඒ ඉඩම් ගැටලු පිළිබඳ ප්‍රශ්නයට අපි උත්තර දෙන්න ලෑස්තියි. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඇවිළෙන්න අවශ්‍ය නැහැ, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ගරු රාජ්‍ය ඇමතිතුමා උත්තරයක් දුන්නා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, රාජ්‍ය ඇමතිතුමා නේ බයිලා ගැහුවේ, මම අහපු පළමුවැනි අතුරු ප්‍රශ්නයට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්න දෙකම ඇහුවා නේ. ඔබතුමාගේ අතුරු ප්‍රශ්න දෙකම අහලා ඉවරයි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මට පොඩි කාරණයක් පැහැදිලි කරන්න අවස්ථාව ලබා දෙන්න, ගරු කථානායකතුමනි. එහෙම කරන්න එපා. ඔබතුමා මට පොඩි කාරණයක් පැහැදිලි කරන්න අවස්ථාව ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට අතුරු ප්‍රශ්න දෙකම අහන්න අවස්ථාව ලබා දුන්නා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, එතුමා මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයට බයිලා ගැහුවා. වෙන උත්තරයක් දීලා,- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා ඔබතුමාගේ අතුරු ප්‍රශ්නයට උත්තර දීම ප්‍රතික්ෂේප කළා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අපට අසාධාරණයක් කරන්න එපා, ගරු කථානායකතුමනි. ඔබතුමා හැම දාම ආණ්ඩු පක්ෂයට පක්ෂව කටයුතු කරන කථානායකවරයෙක් විධියට තමයි සමාජය පිළිගෙන තිබෙන්නේ. එහෙම කරන්න එපා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමා ඔබතුමා අහපු අතුරු ප්‍රශ්නයට උත්තර දීම ප්‍රතික්ෂේප කළා.

## ජාතික ශිෂ්‍ය භට බලකාය: විස්තර
## தேசிய பயிலிளவல் படையணி: விபரம்
## NATIONAL CADET CORPS: DETAILS

1024/2022

**5. ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

අග්‍රාමාත්‍ය සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ජාතික ශිෂ්‍ය භට බලකාය, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින බව එතුමා පිළිගන්නේද?

(ආ) (i) එම බලකාය යටතේ පවතින බල ඇණි සංඛ්‍යාව කොපමණද;

(ii) ජාතික ශිෂ්‍ය භට බලකාය සඳහා 2021 වර්ෂයේ වෙන් කර තිබූ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) මේ වනවිට ජාතික ශිෂ්‍ය භට බලකාය යටතේ පවතින පාසල් ඛණ්ඩ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඛණ්ඩ සංඛ්‍යාව යුද, ගුවන්, නාවික සහ පොලිස් යනාදී වශයෙන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඈ) (i) පාසල් ශිෂ්‍ය භට බලකාවල කටයුතු විධිමත් කිරීමට නව පියවර අනුගමනය කරන්නේද;

(ii) ජාතික ශිෂ්‍ය භට බලකායේ ප්‍රධාන පුහුණු මධ්‍යස්ථානය වන රන්ටැඹේ පුහුණු මධ්‍යස්ථානයේ පවතින අඩුපාඩු සඳහා පිළියම් යෙදීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பொருளாதாரக் கொள்கைகள் மற்றும் திட்டச் செயற்படுத்துகை அமைச்சரும் புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) தேசிய பயிலிளவல் படையணி பாதுகாப்பு அமைச் சின்கீழ் உள்ளதென்பதை அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) மேற்படி படையணியின் கீழுள்ள அணிப்பிரிவு களின் எண்ணிக்கை யாது;

(ii) தேசிய பயிலிளவல் படையணிக்காக 2021ஆம் ஆண்டில் ஒதுக்கீடு செய்யப்பட்டிருந்த நிதித் தொகை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) தற்போது தேசிய பயிலிளவல் படையணியின்கீழ் காணப்படும் பாடசாலைப் படைப்பிரிவுகளின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி படைப்பிரிவுகளின் எண்ணிக்கை தரைப்படை, விமானப்படை, கடற்படை மற்றும் பொலிஸ் என்ற வகையில் வெவ்வேறாக யாது;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) (i) பாடசாலைப் பயிலிளவல் படையணிகளின் நடவடிக்கைகளை முறைப்படுத்துவதற்கான புதிய நடவடிக்கைகள் பின்பற்றப்படு கின்றனவா;

(ii) தேசிய பயிலிளவல் படையணியின் தலைமைப் பயிற்சி நிலையமான ரன்டம்பே பயிற்சி நிலையத்தில் காணப்படும் குறைபாடுகளுக்குத் தீர்வு காண்பதற்கான நடவடிக்கைகளை மேற்கொள்வாரா;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Economic Policies and Plan Implementation, Minister of Buddhasasana, Religious and Cultural Affairs and Minister of Urban Development and Housing:

(a) Will he admit the fact that the National Cadet Corps comes under the Ministry of Defence?

(b) Will he inform this House -

(i) the number of battalions that comes under that Corps; and

(ii) the amount of money that had been allocated for the National Cadet Corps in 2021?

(c) Will he state -

(i) the number of school platoons that comes under the National Cadet Corps at present; and

(ii) the number of such platoons in relation to the Army, the Air Force, the Navy and the Police, separately?

(d) Will he also inform this House -

(i) whether new steps would be followed to formalize the activities of the school cadet corps; and

(ii) whether steps would be taken to rectify the shortcomings in the Rantambe Training Centre, which is the main training centre of the National Cadet Corps?

(e) If not, why?

**ගරු චමල් රාජපක්ෂ මහතා (වාරිමාර්ග අමාත්‍ය, ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ - நீர்ப்பாசன அமைச்சரும் பாதுகாப்பு இராஜாங்க அமைச்சரும் மற்றும் உள்நாட்டலுவல்கள் இராஜாங்க அமைச்சரும்)
(The Hon. Chamal Rajapaksa - Minister of Irrigation, State Minister of Defence and State Minister of Home Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) බලඇණි 38කි.

(ii) රුපියල් මිලියන 483,100,000කි.

(ඇ) (i) ශිෂ්‍යභට ඛණ්ඩ 3,570ක් ඇත. (2021 දෙසැම්බර් 31 දිනට)

(ii) යුද්ධ, නාවික, ගුවන් වශයෙන් වෙන් කර නොමැති අතර, ඛණ්ඩ සංඛ්‍යාව පහත සඳහන් පරිදි වෙන් වෙන් වශයෙන් දක්වා ඇත.

[ගරු චමල් රාජපක්ෂ මහතා]

| | | |
|---|---|---|
| ආරක්ෂක ශිෂ්‍යභට බාලක, බාලිකා බණ්ඩ | - | 1,706 |
| පොලිස් ශිෂ්‍යභට බාලක, බාලිකා බණ්ඩ | - | 597 |
| පෙරදිග අපරදිග තූර්ය වාදන ශිෂ්‍යභට බාලක, බාලිකා බණ්ඩ | - | 228 |
| කනිෂ්ඨ ශිෂ්‍යභට බාලක, බාලිකා බණ්ඩ | - | 1,039 |
| එකතුව | - | 3,570 |

(ඈ) (i) ඔව්.

- කොවිඩ් වසංගත තත්ත්වය උත්සන්න වන කාලවලදී වුවද, ශිෂ්‍යභට කටයුතු කෙරෙහි ඇති නැඹුරුව අඩාළ වන්නට ඉඩ නොදී මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ශිෂ්‍යභට විෂය නිර්දේශය හා මාර්ගෝපදේශ ආවරණ වැඩසටහන් සහ ඉංග්‍රීසි භාෂා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ශිෂ්‍යභටයන් පුහුණු කිරීම සඳහා යුද්ධ, නාවික, ගුවන් හා පොලිස් පුහුණු උපදේශකයන් සඳහා සංස්කරණ පාඨමාලා පැවැත්වීම හා වසංගත තත්ත්වය හමුවේ නව සෞඛ්‍ය මාර්ගෝපදේශ යටතේ ශිෂ්‍යභටයන් පුහුණු කරන විකල්ප පුහුණු ක්‍රමවේද හඳුන්වා දීම.
- ශිෂ්‍යභටයන්ගේ නායකත්ව හැකියා, දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම සඳහා 2022 වර්ෂය සඳහා වාර්ෂික පුහුණු සැලසුම් විධිමත්ව සකස් කොට පුහුණු කඳවුරු හා පාඨමාලා සංවිධාන කිරීම හා පැවැත්වීම.
- ශිෂ්‍යභටයන් පුහුණු කටයුතු මෙහෙයවීම හා නියාමනය කිරීම සඳහා වාර්ෂිකව පාසල් ගුරු මහත්ම මහත්මීන් ආධුනික නිලධාරින් නිලධාරිනියන් ලෙස බලකායට බඳවා ගැනීම හා පුහුණු කිරීම.
- නිලධාරින්ගේ වෘත්තීමය ධාරිතා සංවර්ධනය හා සම්පත් කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර හා බාහිර පුහුණු පාඨමාලා හා වැඩසටහන් සඳහා අවස්ථාව සලසා දෙමින් ඒ සඳහා සහභාගි කරවීම.
- ඇතැම් දුෂ්කර පාසල්වල ආර්ථික දුෂ්කරතා සහිත අධ්‍යාපනය ලබන ශිෂ්‍යභට බාලක, බාලිකාවන් තෝරාගෙන ඔවුන්ගේ අධ්‍යාපනික අවශ්‍යතා සපුරාලීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පළාත් මට්ටමින් හා බලඇණි මට්ටමින් ප්‍රායෝගික ජීවන අභියෝග හමුවේ හා හදිසි අවස්ථාවලට මුහුණදීමට අවශ්‍ය ශක්තිය ලබාදීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සම්බන්ධීකරණයෙන් ව්‍යසන කළමනාකරණ පිළිබඳව මත් ද්‍රව්‍ය නිවාරණ හා අන්තරායකර ඖෂධ පාලන ජාතික මණ්ඩලය මෙහෙයවීමෙන් මත් ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම හා ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ මෙහෙයවීමෙන් ශිෂ්‍යභටයන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

(ii) ඔව්. (ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ලබාදී ඇති ප්‍රතිපාදන අනුව)

(ඉ) අදාළ නොවේ.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා එම ප්‍රශ්නයට පිළිතුර ලබාදීම සම්බන්ධයෙන්. විශේෂයෙන්ම ජාතික ශිෂ්‍යභට බලකාය අපේ රට වෙනුවෙන් අතිවිශාල සේවාවක් කරනවා. ඒ පිළිබඳව අපි බොහොම ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ. මමත් ශිෂ්‍යභටයෙක් හැටියට පුහුණුව ලැබූ කෙනකු වශයෙන් විශේෂයෙන්ම කියන්න ඕනෑ, ශිෂ්‍ය ජීවිතයේ ඉතාම වැදගත් අත්දැකීම් බොහොමයක් ශිෂ්‍යභටයකු ලෙස කටයුතු කිරීම තුළින් ලැබෙන බව.

ගරු අමාත්‍යතුමනි, මේ සම්බන්ධයෙන් දැන් පාසල්වල විශාල උනන්දුවක් තිබෙනවා. නමුත්, තිබෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි ශිෂ්‍යභට නිලධාරින්ගේ හිඟය. සාමාන්‍යයෙන් උප ගුරුවරයෙක් නැත්නම් පාසලේ ගුරුවරයෙක් ශිෂ්‍යභට බලකා බණ්ඩය භාරව ඉන්නවා. ඒ අය අවශ්‍ය පුහුණුව ලබලා, ඒ අවශ්‍ය දැනුම ලබාගෙන කටයුතු කරනවා. නමුත්, දැන් තිබෙන ප්‍රධාන ප්‍රශ්නය මෙයයි. මේ ප්‍රශ්නය ගැන මා සොයා බැලුවා. ශිෂ්‍යභට පුහුණුව ලබාදෙන නිලධාරින්ගේ විශාල හිඟයක් අධ්‍යාපන කලාපවල තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරලා, ඒ සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා ද කියලා දැනගන්න කැමැතියි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

ගරු මන්ත්‍රීතුමනි, ජාතික ශිෂ්‍යභට බලකාය ආරම්භ කරලා තිබෙන්නේ 1881දී කොළඹ රාජකීය විද්‍යාලයේ එවකට හිටපු විදුහල්පතිවරයෙක්. මේ බලකාය ආරම්භ කරලා දැනට වසර 140ක් විතර වෙනවා. මෙම බලකායේ මූලික තේමා පාඨය වන්නේ, "සූදානම් නොවී නොසිටිනු" යන්නයි. මේ පුහුණු පාඨමාලාව තුළින් ශිෂ්‍යභටයන් තුළ චරිතවත් බව, චිත්ත ධෛර්යය, ක්‍රීඩාශීලී බව, ආත්ම විශ්වාසය, ස්වයං විනය, ප්‍රජා හැඟීම, වික්‍රමාන්විත හැඟීම, වගකීම් දැරීම, සුහදශීලී බව යන ගුණාංග වර්ධනය කර ජාතියේ සේවය සඳහා යෙදවිය හැකි ඕනෑම ජීවන පැවැත්මකට නායකත්වය දිය හැකි තරුණ පරපුරක් බිහි කරමින් සුවිශාල ජාතික කර්තව්‍යයක් ඉටු කරනවා. එවැනි අය මේ පාර්ලිමේන්තුවට ආවොත් හොඳයි. එතකොට මේ ප්‍රශ්න ඇති වන්නේත් නැහැ. ඒ වාගේම පාසල් ගුරු මහත්ම මහත්මීන් මේ සඳහා බඳවා ගන්නවා. කැමති අය ඉන්නවා නම්, අපි සූදානම් ඒ අය බඳවා ගෙන මේ කටයුතු පුළුල් කරන්නට. පසුගිය අවුරුදු දෙකේ කොවිඩ් වසංගතය නිසා ඒ කටයුතු යම් පසුබෑමකට ලක් වුණා. දැන් නැවත වරක් ඒ සඳහා අවධානය යොමු කරලා කටයුතු කරනවා.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු ඇමතිතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ඔබතුමා කියූ පරිදි උතුම් ගුණාංග රාශියක් මේ ශිෂ්‍යභට ව්‍යාපාරය තුළ තිබෙනවා. මම ශිෂ්‍යභට බණ්ඩයක් භාරව සැරයන්වරයෙකු හැටියටත් වැඩ කළා. ඒ වාගේම මාණ්ඩලික සැරයන්වරයෙකු වශයෙනුත් හතරවන බලකායේ කටයුතු කරපු කෙනෙක්. ගරු ඇමතිතුමනි, ඒ කාලයේදී තිබුණේ යුද හමුදා පුහුණුව පමණයි. නමුත් දැන් ඒක පුළුල් කරලා තිබෙනවා. ඒක ඉතාම හොඳයි. අධ්‍යාපන ඇමතිතුමාත් මේ සභාවේ ඉන්න මොහොතක මම ඔබතුමාගෙන් මේ ප්‍රශ්නය අහනවා. අද උපාධිධාරින් විශාල පිරිසක් ඉන්නවා ස්ථානගත කර ගන්න බැරිව. ඔවුන්ට හරියට රාජකාරි ලැයිස්තුවකුත් නැහැ. මේ වාගේ දක්ෂ උපාධිධාරින් අරගෙන විධිමත් පුහුණුවක් ලබා දුන්නොත් හොඳයි. ඒ උපාධිධාරින් අතර පාසල් කාලයේ ශිෂ්‍යභට පුහුණුව ලැබූ අයත්

ඇති. ඒ අය අරගෙන විධිමත් පුහුණුවක් ලබාදීලා ඔවුන් පාසල්වලට අන්තර්ග්‍රහණය කරන්න කටයුතු කළොත් වැදගත්. අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා මේ කටයුතු කරන්න පුළුවන් වෙයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා ම කියපු විධියට අද හැම තැනටම විනය අවශ්‍යයි. විනයගරුක පිරිසක් රටට බිහි කරන්න නම්, මේ අවශ්‍යතාව අපි සම්පූර්ණ කරන්න ඕනෑ. මේ කටයුතු සඳහා විශාල වියදමක් රජය දරනවා. හැම රජයක්ම මේ සම්බන්ධව අතිවිශාල වියදමක් දරනවා. නමුත් ඒවා නියමාකාරයෙන් නියම අරමුණ ඉටු කර ගැනීම සඳහා යොදවා ගන්න අවශ්‍යයි. දැන් අපට සම්පත් තිබෙන නිසා ඒ සම්පත් කළමනාකරණය කර ගනිමින් මේ ශිෂ්‍යභට ගුරුවරුන්, නැත්නම් නිලධාරීන් ලබාදීමේ කඩිනම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියන කාරණය ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

ගරු කථානායකතුමනි, මේ පිළිබඳව නව පනත් කෙටුම්පතක් සම්මත කර ගැනීම සඳහා ඉදිරිපත් කරලා තිබෙනවා. එම පනත් කෙටුම්පත සම්මතවීම මඟින් ශිෂ්‍යභට කටයුතු කෙරෙහි බලපාන බාධක සහ අභියෝග සියල්ලක්ම විසඳා ගන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගේ ඉල්ලීමට ඇහුම්කන් දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6 -1175/2022 - (2), ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා.

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා (සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு செஹான் சேமசிங்க - சமுர்த்தி, உள்ளக பொருளாதார, நுண்நிதிய, சுயதொழில், தொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Samurdhi, Household Economy, Micro Finance, Self-employment and Business Development)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 7 -1187/2022- (2), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කොවිඩ්-19 මර්දනය සඳහා වූ එන්නත්කරණය: විස්තර

'கொவிட்-19' எதிர்ப்புத் தடுப்பூசியேற்றல்: விபரம்
VACCINATION DRIVE TO COMBAT COVID-19: DETAILS

1314/2022

**8. ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොවිඩ්-19 රෝගය මර්දනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ එන්නත්කරණය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) මේ දක්වා එන්නත්කරණයට ලක් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ ලබා දී ඇති එන්නත් මාත්‍රාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සංඛ්‍යාව, ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ එන්නත්කරණය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 'கொவிட்-19' தொற்றுநோயை ஒழிப்பதற்கு இலங்கையில் தடுப்பூசியேற்றும் நடவடிக்கைகள் ஆரம்பிக்கப்பட்ட திகதி யாதென்பதையும்;

(ii) இதுவரை தடுப்பூசியேற்றப்பட்ட ஆட்களின் எண்ணிக்கை வழங்கப்பட்ட தடுப்பூசி மருந்தளவு களின் (டோஸ்களின்)பிரகாரம் வெவ்வேறாக எவ்வளவென்பதையும்;

(iii) மேற்படி எண்ணிக்கை இலங்கையின் மொத்த சனத்தொகையின் சதவீத அடிப்படையில் எவ்வளவென்பதையும்;

(iv) இலங்கையில் தடுப்பூசியேற்றும் நடவடிக்கை களுக்குச் செலவிடப்பட்ட தொகை எவ்வள வென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Heath:

(a) Will he inform this House -

(i) the date on which vaccination was started in Sri Lanka to combat the COVID-19 pandemic;

[ගරු මොහමඩ් මුසම්මිල් මහතා]

(ii) the number of persons vaccinated so far and the number of doses administered in relation to each type of vaccine;

(iii) that number as a percentage of the total population of Sri Lanka; and

(iv) the total amount of money spent on the vaccination drive in Sri Lanka?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා (ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன - ஔடத உற்பத்திகள், வழங்குகைகள் மற்றும் ஒழுங்குறுத்துகை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Prof.) Channa Jayasumana - State Minister of Production, Supply and Regulation of Pharmaceuticals)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) කොවිඩ්-19 රෝගය මර්දනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ එන්නත්කරණය ආරම්භ කරනු ලැබුවේ 2021.01.29 වන දිනයි.

(ii) 2022.03.06 දින දක්වා එන්නත්කරණයට ලක් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ ලබා දී ඇති එන්නත් මාත්‍රාව අනුව වෙන් වෙන් වශයෙන් පහත දැක්වේ.

| එන්නත් වර්ගය | පළමු මාත්‍රාව | දෙවන මාත්‍රාව | තෙවන මාත්‍රාව | එකතුව |
|---|---|---|---|---|
| Astra-Zeneca | 1,479,631 | 1,418,593 | | 2,898,224 |
| Si-nopharm | 12,025,126 | 11,102,786 | | 23,127,912 |
| Sputnik V | 159,110 | 155,812 | | 314,922 |
| Pfizer | 2,459,695 | 744,203 | 7,317,106 | 10,521,004 |
| Moderna | 804,801 | 787,361 | | 1,592,162 |
| එන්නත් කර ඇති මුළු ප්‍රමාණය | 16,928,363 | 14,208,755 | 7,317,106 | 38,454,224 |

(iii) කුමන හෝ එන්නත් වර්ගයක පළමු, දෙවන හා තෙවන මාත්‍රා ලබාගත් සංඛ්‍යාව සමස්ත ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස සැලකූ විට පහත පරිදි වේ.

- පළමු මාත්‍රාව ලබාගත් සංඛ්‍යාව - සියයට 77.2
- දෙවන මාත්‍රාව ලබාගත් සංඛ්‍යාව- සියයට 64.8
- තෙවන මාත්‍රාව ලබාගත් සංඛ්‍යාව - සියයට 33.5

(iv) 2022.01.18 දින දක්වා ශ්‍රී ලංකාවේ එන්නත්කරණය සඳහා වැය කරන ලද මුදල පහත දැක්වේ.

| එන්නත් වර්ගය | මුළු මාත්‍රා ප්‍රමාණය | එන්නත්හි මුළු වටිනාකම (රු.) (ආධාර නොමැතිව) |
|---|---|---|
| Sinopharm | 23,000,000 | 39,178,767,558.00 |
| Sputnik V | 330,000 | 670,013,620.00 |
| Pfizer | 18,999,630 | 26,034,243,007.50 |
| Covishield | 500,000 | 515,362,890.00 |
| Total | 42,829,630 | 66,398,387,075.50 |

(ආ) පැන නොනඟී.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ ලබා දෙන එන්නත්වල ප්‍රතිඵලදායකත්වය පිළිබඳව සොයා බලන්න සමහර වෛද්‍යවරු නිර්දේශ කරනවා, antibody level එක පිළිබඳ පරීක්ෂණයක්. මම දන්නා කිහිප දෙනෙකුත් එම පරීක්ෂණය කරන්න ගියාම ඒ labsවලින් දැනුම් දී තිබෙනවා, මුදල් අරගෙන ඒ ප්‍රතිදේහ පරීක්ෂණය කළාට එහි report එක ලිඛිතව ලබා දෙන්නේ නැහැ කියලා. ඒ අය එහෙම කියා තිබෙන්නේ මෙන්න මේ නිසා. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් හෝ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයක් මඟින් දැනුම් දී තිබෙනවා ලු, ඒ වාර්තාව ලිඛිතව දෙන්න එපා කියලා. ඒ නිසා ඔවුන් ඒ වාර්තාව ලිඛිතව දෙන්නේ නැහැ. නමුත් ගරු රාජ්‍ය ඇමතිතුමනි, මහ ජනතාවට මේ එන්නත්වල ප්‍රතිඵලදායකත්වය පිළිබඳව දැන ගැනීමේ අයිතියක් තිබෙනවා. ඒ report එක ලිඛිතව ලබා දෙන්න එපා කියලා ඔබතුමන්ලා උපදෙස් දී තිබෙනවාද? එහෙම නැත්නම්, ඕනෑම කෙනෙකුට එම report එක ලිඛිතව ලබා ගැනීමේ හැකියාවක් තිබෙනවා ද?

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)
ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් antigen පරීක්ෂාවක් තමයි සිදු කරන්නේ. විශේෂ අවශ්‍යතාවක් තිබෙනවා නම්, antibody සඳහාත් පරීක්ෂාවක් සිදු කරන්න පුළුවන්. එම පරීක්ෂණයේ ප්‍රතිඵල ලබා දෙන්න එපා කියලා කිසිදු අවස්ථාවක සෞඛ්‍ය අමාත්‍යාංශය නිල වශයෙන් දැනුම් දී නැහැ. යම් පුද්ගලයකු එහෙම ප්‍රශ්නයකට මුහුණ දී තිබෙනවා නම් ඔබතුමා මට ඒ විස්තර ලබා දෙන්න. මට ඒ පිළිබඳව පෞද්ගලිකව සොයා බලන්න පුළුවන්.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

රජය මේ වන විට ජනතාවගෙන් විශාල පිරිසක් එන්නත්කරණයට ලක් කර තිබෙනවා. මේ vaccinesවල ප්‍රතිශක්තිකරණය, ප්‍රතිදේහ වර්ධනය වීමේ ප්‍රවණතාව පිළිබඳව

සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ රජයේ ආයතනවලින් අධ්‍යයනයක් කර තිබෙනවාද? අධ්‍යයනයක් කර තිබෙනවා නම් ඒ සඳහා කුමන, කොපමණ නියැදි ප්‍රමාණයක් පාවිච්චි කර තිබෙනවාද? ඒ අධ්‍යයනවලින් හෙළිදරව් කර ගත්ත තොරතුරු මහජනයාට ප්‍රසිද්ධ - publish - කරන්න ඔබතුමන්ලා බලාපොරොත්තු වනවාද?

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)

මේ වනකොට ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කරන්නේ රාජ්‍ය විශ්වවිද්‍යාලයක් වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අණුක ජීව විද්‍යා ආයතනය මඟින්. මහාචාර්ය නීලිකා මලවිගේ මහත්මිය සහ ආචාර්ය චන්දිම ජීවන්දර මහත්මයා තමයි ඒ පරීක්ෂණ සිදු කරන්නේ. ඒ සඳහා අවශ්‍ය වන උපකරණ සහ රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා අපි අනුග්‍රහය දක්වනවා. ඔවුන්ගේ පර්යේෂණවල ප්‍රතිඵල වරින් වර සෞඛ්‍ය අමාත්‍යාංශයට ලබා දෙනවා. ඒවා අපි ප්‍රසිද්ධ කරනවා. ඊට අමතරව ඔවුන් අන්තර්ජාතික පර්යේෂණ පත්‍රිකාවල ඒ සම්බන්ධයෙන් පළ කිරීම් කර තිබෙනවා. මීට අමතරව, ශ්‍රී ලංකාව තුළ එන්නත් ලබා ගැනීමෙන් පසුව කොයි ආකාරයටද ප්‍රතිදේහ - antibodies - ඇතිවෙලා තිබෙන්නේ, ඒවා කොපමණ කලක් පවතිනවාද කියන කාරණය පිළිබඳව වෙනම ම පරීක්ෂණයක් කර ගෙන යාම සඳහා අවශ්‍ය වැඩ කටයුතු මේ වනකොට වසංගත රෝග විද්‍යා ඒකකය මඟින් ආරම්භ කර තිබෙනවා. මේ කියන ස්ථාන දෙකේ තමයි COVID-19 රෝගයට අදාළ එන්නත්කරණය සම්බන්ධයෙන් පර්යේෂණ කටයුතු සිදු කෙරෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. *[බාධා කිරීමක්]*

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, ආණ්ඩුවෙන් අපට පොරොන්දු වුණා IMF වාර්තාව ලබා දෙනවා කියලා. විශේෂයෙන්ම මම දැනගන්න කැමැතියි, ඒක සභාගත කරනවාද කියලා. මොකද, ඒක සභාගත කරනවා නම්, අපි කියන්නේ එයට අදාළ සංඛ්‍යාලේඛනත් ලබා දෙන්න කියලා. ඊළඟට, මූලික වාර්තාව සංශෝධනය කරන්න කියා මහ බැංකුවෙන් ලියා තිබෙන ලිපි ටිකත් අපට ලබා දෙනවා නම්, අපට ඒක පදනම් කර ගෙන ඊළඟ සාකච්ඡාව සිදු කරන්න පුළුවන්, අපට විවාදයක් පවත්වන්න පුළුවන්. සර්ව පාක්ෂික සම්මන්ත්‍රණය පවත්වනවා නම්, එතැනටත් මේවා අවශ්‍ය වෙන්න පුළුවන්. ඒ ලේඛන ටික දුන්නාම පක්ෂ නායකයින්ට ඉතිරි ටික සාකච්ඡා කර තීරණයක් ගන්න පුළුවන්. ඒ ලේඛන ටික මේ සතියේ අපට ලබා දෙන්න ආණ්ඩුවට පුළුවන්ද? ඒක අපට කියන්න. මොකද, විශේෂයෙන්ම දැනුම් දීලා තිබුණා මේ වාර්තාව ලබා දෙනවා කියලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, හිටපු අගමැතිතුමා යළිත් වරක් නඟන කාරණය සම්බන්ධව මීට පෙර අපි පිළිතුරක් ලබා දුන්නා.

The relevant documents prepared under Article IV were tabled before the Board only last week. Now, we can make the relevant observations and any other comments. If you want it tabled before Parliament, we will be meeting again only on the 21st. At the All Party Conference that His Excellency the President has summoned - it will be communicated to all the political parties - also we can take it up. But, we will make it available -

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)

Even through Parliament, the public gets it. Then, the Chambers of Commerce, all other professional associations and even trade unions can get ready. Otherwise, we would be going without the Report; we are just wasting time.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

First, the Report had to be officially tabled before the Board. It was tabled and has now been officially released. So, we can make it available to the Leaders of the political parties and others. There is nothing to hide. It is available now; it is in the open. But, if the former Prime Minister wants it, we will have it delivered specially to the Leaders of political parties and MPs also. ඒක කරන්නම්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)

Sir, what is available is the summary. The full Report has been given only to two agencies, as the general practice: to the Ministry of Finance and the Central Bank.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Correct.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremasinghe)

So, we would like to have it together with all the statistics on the balance of payments, exchange rate and everything at least as at end of February this year. So, if you can give it this week, then we can get ready for any discussion.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

We will get it delivered before the All Party Conference.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Okay. Thank you.

අද දිනට නියමිත කටයුතු. න්‍යාය පත්‍රයේ විෂය අංක 1, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත - දෙවන වර කියවීම.

## පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත
## தனிப்பட்ட தரவுப் பாதுகாப்பு சட்டமூலம்
## PERSONAL DATA PROTECTION BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[පූ.භා. 10.53]

**ගරු නාමල් රාජපක්ෂ මහතා (තරුණ හා ක්‍රීඩා අමාත්‍ය, සංවර්ධන සම්බන්ධීකරණ සහ අධීක්ෂණ අමාත්‍ය සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ - இளைஞர் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரும் அபிவிருத்தி ஒருங் கிணைப்பு மேற்பார்வை அமைச்சரும் டிஜிட்டல் தொழில் நுட்பம் மற்றும் தொழில்முயற்சி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Namal Rajapaksa - Minister of Youth and Sports, Minister of Development Coordination and Monitoring and State Minister of Digital Technology and Enterprise Development)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, අපේ විරුද්ධත්වය සටහන් කර ගන්න කියලා මා ඉල්ලීමක් කරනවා. පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවල ආංශික අධීක්ෂණ කාරක සභා ගැන සඳහන් වෙනවා. නමුත් එම ස්ථාවර නියෝග අත්හිටුවලා, ආංශික අධීක්ෂණ කාරක සභා මඟ හැරලා අද මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙනවා. පළමුවැනි කාරණය ඒක. ඊළඟට, මාධ්‍ය සංවිධාන සියල්ල මේ පනත් කෙටුම්පතට විරුද්ධයි. ඒ අයට මේ ගැන සාකච්ඡා කරන්න වෙලාවක්වත් දීලා නැහැ. අනෙක් එක, 2015 වසරට කලින් මාධ්‍යවේදීන් පහළොස්දෙනෙක් විතර ඝාතනය වූ ආණ්ඩුවේ උරුමක්කාරයින්ට මේ වාගේ බලතල දුන්නොත්, ඒක මාධ්‍යවේදීන්ගේ විනාශයයි කියන එක මම පැහැදිලිව කියනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. ඔබතුමාගේ විරුද්ධත්වය අපි සටහන් කර ගන්නවා.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු කථානායකතුමනි, මා කනගාටු වෙනවා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා මේ පනත් කෙටුම්පතේ මුල් පිටුවවත් කියවන්නේ නැතුව තමයි මේ විරෝධතාව සටහන් කළේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා වාගේ ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයෙක් මීට වඩා වගකීමෙන් කටයුතු කළොත් හොඳයි කියලා මා හිතනවා.

ගරු කථානායකතුමනි, 2019 මාර්තු මාසයේ තමයි මේ පනත් කෙටුම්පත යෝජනා වුණේ. 2019 ඉඳලා අද වනකොට හත් වතාවක් public consultationsවලට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙනවා. රටේ ජනතාවට, industry එකේ අයට අවස්ථා හතක් ලබා දීලා තිබෙනවා මේ ගැන ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කරන්න. ඒ විතරක් නොවෙයි, ICTA එක ඇතුළු තාක්ෂණ අමාත්‍යාංශයේ website එකේ මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් සම්පූර්ණ දත්ත සඳහන් කරලා, මහ ජනතාවට 2019 මාර්තු මාසයේ ඉඳලා අද වෙනකල් අවස්ථාව දීලා තිබුණා, ඔවුන්ගේ අදහස් හා යෝජනා ඉදිරිපත් කරන්න. ඊළඟට, අපි එතැනින් එහාට යමු. උසාවි යන්න සති දෙකක් තිබුණා නේ, ගරු කථානායකතුමනි. ඕනෑම කෙනෙකුට උසාවියට ගිහිල්ලා මේ ගැන තමන්ගේ විරෝධතාව ප්‍රකාශ කරන්න සති දෙකක කාල සීමාවක් තිබුණා. හැබැයි, ඒ සති දෙක ඇතුළත කිසි කෙනෙක් උසාවියට ගියේ නැහැ. ඒ දින 14 පහුවෙලා දෙදෙනෙක් උසාවියේ නඩු පැවරුවා. ගරු කථානායකතුමනි, දින 14ක් පහුවෙලා උසාවියට යනවා කියන එකෙන්ම පැහැදිලි වෙන්නේ, ඒ පිළිබඳව ඔවුන්ට interest එකක්, එහෙම නැත්නම් වුවමනාවක් නැහැ කියන එකයි. මෙතුමන්ලාට අවුරුදු එකහමාරක් තිස්සේ මේ ගැන තමන්ගේ විරෝධතාව ප්‍රකාශ කරන්න තිබුණා. එහෙම අය, මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ විවාද වෙන්න කලින් දවසේ කථා කරලා, "මෙන්න මේ හේතු නිසා මේ පනත් කෙටුම්පතට අපි විරුද්ධයි" කියලා කියන කොට, මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එතුමන්ලාට අවබෝධයක් නැති බවත්, ඒ වාගේම මේක ගැන එතුමන්ලාට එතරම් වුවමනාවක් නැති බවත් අපට පැහැදිලියි. නැත්නම් ඒ දවස් 14 ඇතුළත උසාවියට යන්න තිබුණා නේ. හැම පනත් කෙටුම්පතකටම උසාවියේ නඩුවක්, දෙකක් දමන විපක්ෂයක් සිටින රටක් නේ මේක, ගරු කථානායකතුමනි. මේ පනත් කෙටුම්පත සකස් කිරීමේදී, draft කිරීමේදී අපේ ආයතන විනිවිදභාවයකින් යුතුව - transparency ඇතිව - කටයුතු කර තිබෙනවා කියන කාරණය මා පැහැදිලිව ප්‍රකාශ කරනවා. ගරු කථානායකතුමනි, එතැනින් එහාට GDPR - General Data Protection Regulation - එක, Asia-Pacific Economic Cooperation - APEC - එක වාගේම සිංගප්පූරුව, ඕස්ට්‍රේලියාව, ඉන්දියාවේ draft Bill එක, California Consumer Privacy Act එක,- *[බාධා කිරීමක්]*

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

ගරු අමාත්‍යතුමනි, මම මේ ඔබතුමාට බාධා කරනවා නොවෙයි. ඊයේ රැස් වුණු කමිටුවේදීත් මේ පනත් කෙටුම්පත පිළිබඳව අපේ විරෝධතාව පෙන්නුවා. ඒ වාගේම අපි ඉල්ලීමක් කළා, අද මේ පනත් කෙටුම්පත විවාදයට ගන්නේ නැතිව වෙනත් දවසකට යොදා ගන්න කියලා. මොකද, ඊයේ කමිටුවේ දී ප්‍රකාශ කළ පරිදි, ගොඩාක් අය මේ පනත් කෙටුම්පතට විරුද්ධයි. ඒ ගොල්ලන් කැමැතියි ගරු ඇමතිතුමා සහ ඒ කමිටුවේ සාමාජිකයන් හමුවෙලා ඒ අයගේ අදහස් හා යෝජනා ඉදිරිපත් කරන්න. ඒකට අවස්ථාවක් ලබා දෙන්න කියලා ඊයේ පැවැති කමිටුවේ දී මම ඉල්ලීමක් කළා.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු කථානායකතුමනි, ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මොකද, අවංකවම එතුමා ඊයේ එම කමිටුවට සහභාගි වුණා. හැබැයි, එතුමාගේ ඒ ප්‍රශ්න සියල්ලටම අවශ්‍ය කාරණා අපි ඊයේ පැහැදිලි කර දුන්නා. ඒ වාගේම එතුමා ම ඊයේ පිළිගත්තා උසාවි යන්න අමතක වුණා කියලා. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, අපි මෙහෙම කරමුකෝ. ඔබතුමා ඉස්සෙල්ලාම ගරු සභාවේ කථා කරන්න අවස්ථාවක් ඉල්ලා ගන්නකෝ. අද ඔබතුමාට කථාවක් කරන්න වෙලාව දීලා නැහැ නේ. ඔබතුමා තමයි පක්ෂය නියෝජනය කරමින් ඊයේ අපේ

කමිටුවට ආවේ. මට තේරෙනවා ඔබතුමාට මේ පිළිබඳ හොඳ අවබෝධයක් තිබෙන බව. ඉතින් ගරු කථානායකතුමනි, පනත් කෙටුම්පත ගැන අවබෝධයක් තිබෙන මන්ත්‍රීවරයකුට ඒ ගැන කථා කිරීමට අවස්ථාවක්වත් දීලා නැත්නම්, විපක්ෂයට මේ පිළිබඳ තිබෙන උනන්දුව පැහැදිලියි නේ.

ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමනි, මම ඔබතුමා ගැන වරදක් කියනවා නොවෙයි. මමත් කැමැතියි ඔබතුමා ඇවිල්ලා අදහස් ඉදිරිපත් කරනවාට. මොකද, ඊයේ ඔබතුමා හොඳ අදහස් ටිකක් ප්‍රකාශ කළා. හැබැයි, ඒ අදහස් මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න ඕනෑ. ඉතින් ඒ සඳහාවත් අවස්ථාවක් දීලා නැත්නම් එතැනින් එහාට අපි කථා කරලා ඵලක් වෙන්නේ නැහැ.

පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත හරහා අපි කරන්න අපි බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා අපි මේ රටේ දැවැන්ත digitalization වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන බව. ඒ වාගේම මේ රටේ සමස්ත රාජ්‍ය සේවය සහ citizen services තාක්ෂණය එක්ක බද්ධ කර කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ලෝකයේ බොහෝ රටවල රාජ්‍ය යන්ත්‍රණය ඩිජිටල්කරණය කරන කොට, citizen services ඩිජිටල්කරණය කරන කොට ඒ රටවල තිබෙන ඒ හා සම්බන්ධ අණ පනත්වල වූ අඩු පාඩුකම් නිසා සමහර වෙලාවට ඒ කාරණා සාර්ථකව ක්‍රියාත්මක කරගෙන යන්න අපහසු තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. හැබැයි, අපි මේ පිළිබඳව අවබෝධ කරගත්තා. මාස 30ක digital campaign එකක් තුළින් රටේ digital transformation එක කරනකොට ඒ digital transformation එකට අවශ්‍ය නීතිමය පසුබිම හැදීම ප්‍රධාන කාරණයක් වෙනවා. ගරු කථානායකතුමනි, ඒ නීතිමය පසුබිම හදන්නේ නැතිව, තාක්ෂණය කොතරම් දුරට හඳුන්වා දුන්නත් එහි ඵල ප්‍රයෝජන අපේ රටේ දරුවන්ට ලබා ගන්න හම්බ වෙන්නේ නැහැ.

අද ලෝකයම කථා කරන්නේ data ගැන; Big Data ගැන. එහෙම නම් ඒ Big Data සම්බන්ධව value එකක් තිබෙනවා. ඒ value එක අපේ රටේ අනාගතය වෙනුවෙන් පාවිච්චි කරන්නේ කොහොමද? අද දත්ත පිළිබඳව කථා වෙනවා. සමහර ආයතනවල දත්ත නැති වුණා කියලා කෑ කෝ ගහනවා අපි දැක්කා. ඉතින්, ඒ දත්ත ආරක්ෂා කරන්න අවශ්‍ය නීතිමය පසුබිම මොකක්ද? ගරු කථානායකතුමනි, ඒ අවශ්‍ය නීතිමය පසුබිම හදන්නේ නැතිව අපි ඩිජිටල්කරණයේ කොතරම් ඉහළට ගමන් කළත් ඒකෙන් ප්‍රයෝජනයක් අපේ රටට ලැබෙන්නේ නැහැ. අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා තමයි මෙහි විෂය භාර අමාත්‍යවරයා. එතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ එක් ප්‍රධාන වගකීමක් තමයි මේ රට ඩිජිටල්කරණය කරා ගමන් කරවීම. ඒ ගමනේදී අපි, මේ ගරු මන්ත්‍රීවරු සියලු දෙනා අවබෝධ කරගත යුතු කාරණා කිහිපයක් තිබෙනවා. මේකේ එක පැත්තක් තමයි, ඩිජිටල්කරණය සඳහා අවශ්‍ය නීතිමය පසුබිම නිර්මාණය කිරීම. ඒක තමයි Data Protection Authority එක නම් කිරීමත් ඇතුළත් මේ Personal Data Protection Bill එක සම්මත කිරීමෙන් අපි බලාපොරොත්තු වෙන්නේ. මෙය, ඒ සඳහා ගෙනාපු එක් නීතිමය පනත් කෙටුම්පතක් පමණයි. මෙවැනි අණපනත් බොහොමයක් තව ගෙනෙන්න තිබෙනවා. Cyber Security Bill එක ඉදිරිපත් කරන්න තිබෙනවා. On-line Falsehood Bill එක ඉදිරිපත් කරන්න තිබෙනවා. ජනතාවගේ දත්ත ජනතාව රාජ්‍ය ආයතනයකට ලබා දෙනවා නම්, පෞද්ගලික බැංකුවකට ලබා දෙනවා නම්, telecommunication ආයතනයකට ලබා දෙනවා නම්, ඒ ලබා දෙන දත්ත පාවිච්චි කරන්නේ මොන කාරණයටද, ඒ දත්ත පාවිච්චි කරන්නේ තමන් ලබා දීපු වගකීමට පමණක්ද, එහෙම නැත්නම් ඒ දත්ත පාවිච්චි කරන්නේ කොහොමද කියන එක පිළිබඳව ආරක්ෂණයක් මේ රටේ ජනතාවට ලබා දිය යුතුයි කියලා අපි විශ්වාස කරනවා, ගරු කථානායකතුමනි. ඒ නිසා තමයි මේ පනත් කෙටුම්පත ඉතාම වැදගත් එකක් විධියට අපි හඳුන්වා දෙන්නේ. ඒ, එක කාරණයක්.

ඊළඟට, ඩිජිටල්කරණය සඳහා යාමේදී අවශ්‍ය අනෙක් කාරණය තමයි, රාජ්‍ය සේවා ඩිජිටල්කරණය කිරීම. ගරු කථානායකතුමනි, රාජ්‍ය සේවා ඩිජිටල්කරණය කිරීමේදී ප්‍රමුඛතම කාර්යය තමයි, UID එක -unique Digital Identity Card එක- ලබා දීම. ඒ සඳහා මේ වෙන කොටත් කැබිනට් අනුමැතිය ලැබී තිබෙනවා. අපි ඉන්දියානු රජයත් එක්ක සාකච්ඡා කර තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා ඒ සඳහා අවශ්‍ය මූල්‍යමය දායකත්වය ලබා දෙන්න කටයුතු කරනවා. මාස 30ක් ඇතුළත ඒ platform එක හදලා මේ අවුරුද්ද අවසන් වෙන කොට unique Digital Identity Card එක ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

එහිදී National Identity Card එකක් පමණක් නොවෙයි, citizen services බද්ධ කරපු, එහෙම නැත්නම් citizen services ලබා දෙන්න පුළුවන් platform එකක් විධියටයි මේ ID Card එක develop වෙන්නේ. ඒ තුළ passport එක, driving licence එක, බැංකු ගිණුම් ටික, වරිපනම් බදු, tax file එක, health card එක, fertilizer card එක, soil card එක ආදී මේ සියල්ලම digital wallet එක ඇතුළට ගෙන එන වැඩ පිළිවෙළක් තමයි ගරු කථානායකතුමනි අපි ක්‍රියාත්මක කරන්නේ. ඒ තුළට ජනතාවගේ පෞද්ගලික දත්ත අපි ඇතුළත් කරනවා. ඒ සඳහා යම් ආරක්ෂණයක් අපි ලබා දෙන්න ඕනෑ.

ඒ වාගේම e-Grama Niladhari Project එක ක්‍රියාත්මක කරන්න ඕනෑ. එදා විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම්, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යවරයා විධියට කටයුතු කළ හරින් ප්‍රනාන්දු මැතිතුමාත් උත්සාහ කළා e-Grama Niladhari Project එක ගේන්න. E-Grama Niladhari Project එක අලුත් දෙයක් නොවෙයි.

මේ කියන එකක්වත් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාවත්, නාමල් රාජපක්ෂ ඇමතිතුමාවත් ආවාට පසුව කරන ඒවා නොවෙයි. මේවා අවුරුදු 20ක, 30ක සිට කථා කරපු දේවල්. ඒ ව්‍යාපෘති මීට පෙර හිටපු මේ විෂයය සම්බන්ධ කටයුතු කරපු හැම අමාත්‍යවරයෙක්ම ක්‍රියාත්මක කරන්න උත්සාහ අරගෙන තිබෙනවා. නමුත් ක්‍රියාත්මක කරන්න බැරි වෙලා තිබෙන්නේ ඇයි? ඒකට හේතුව තමයි ඒ සඳහා අවශ්‍ය අණ පනත් ටික නොමැති වීම. ඒකට අවශ්‍ය නීතිමය සහයෝගය නොමැති වීම.

ඒ e-Grama Niladhari Project එක හරහා මේ රටේ ග්‍රාම නිලධාරි මහතාගේ සේවා සියල්ලම ඩිජිටල් පද්ධතියට ගේන්න අපි බලාපොරොත්තු වෙනවා. ගමේ හැම පුරවැසියෙක්ම තමන්ගේ පෞද්ගලික දත්ත ග්‍රාම නිලධාරි මහතාට දෙනවා. අදටත් ඒ ක්‍රමය තිබෙනවා. නමුත්, ඒ දත්ත කොහේටද යන්නේ, ඒවාට මොකක්ද වෙන්නේ කියන එක පිළිබඳව නිවැරදි අවබෝධයක් කාටවත් නැහැ. අද ඒකට challenge කරන්නත් බැහැ; උසාවියට ගිහිල්ලා නඩුවක් දමන්නත් බැහැ. ඇයි ඒ? ඒ දත්ත කවුද දුන්නේ, කාටද දුන්නේ කියලා ඔප්පු කරන්න බැහැ. සමහර වෙලාවට අපේ ගම්වල භාෂාවෙන් කියනවා, file ගිනි ගන්නවා කියලා. කොළ කෑලි අතුරුදහන් වෙලා, මැද කොළය ඉරලා කියනවා. මේ සියල්ලම නැති කරන්න පුළුවන් එකම ක්‍රමය තමයි දත්ත ඩිජිටල්කරණය කිරීම. හැබැයි, ඩිජිටල්කරණයට අපේ දත්ත ඇතුළත් කරන කොට ඒ දත්තවලට ආරක්ෂාවක් තිබෙන්න ඕනෑ. ඒ දත්තවලට මොකක්ද වෙන්නේ කියලා අපි දැන ගන්න ඕනෑ.

ඊළඟට, තවත් ව්‍යාපෘතියක් තමයි e-Court, court automation ව්‍යාපෘතිය. ඒ කියන්නේ, අධිකරණ පද්ධතිය digitalize කරන ව්‍යාපෘතිය. මේ වෙන කොට අලි සබ්රි අමාත්‍යතුමා විසින් ඒ සඳහා අවශ්‍ය සියලු වැඩ කටයුතු අවසන් කර, ගිවිසුම් අත්සන් කර තිබෙනවා. ඒ තුළින් අධිකරණ පද්ධතිය digitalize කෙරෙනවා.

[ගරු නාමල් රාජපක්ෂ මහතා]

තවත් පැත්තකින් ප්‍රාදේශීය සභා - local authorities - ටික මේ වැඩපිළිවෙළට ඇතුළත් කරන්න අපි බලාපොරොත්තු වනවා. වරිපනම් බදු ගෙවන්න, වීථි රේඛා අනුමැතිය ගන්න, කඩ කුලී ගෙවන්න, පොළ බදු ගෙවන්න -මේ සියල්ලම- digital platformsවලට ගේන්න මේ අවුරුද්ද ඇතුළත අපි කටයුතු කරනවා. ඒ සඳහා හඳුනා ගත් ප්‍රාදේශීය සභා කිහිපයක් තුළ අපි කටයුතු කරනවා. මෙහිදී ගම්පහ මහ නගර සභාව ගැන අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මේ වෙන කොට ගම්පහ මහ නගර සභාවේ vehicle parking කටයුතුත් mobile app එකක් හරහා ක්‍රියාත්මක කරන තත්ත්වයට පත් කර තිබෙනවා. ගම්පහ මහ නගර සභාවේ සම්පූර්ණ payment gateway කටයුතු සිදු කෙරෙන්නේ QR codesවලින්. ඒ ආයතනයේ කරලා තිබෙන ව්‍යාපෘතිය pilot project එක විධියට අරගෙන ප්‍රාදේශීය සභා ටික digitalize කිරීමේ වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කරනවා. මේ සියල්ලම එකතු කරලා ජාතික හැඳුනුම්පතත් සමඟ citizen services digitalize කරන්න අපි කටයුතු කරනවා.

අද අපි දකිනවා, එක තැනක පාස්පෝර්ට් ගන්න පෝලිමක් තිබෙනවා, තවත් තැනක National Identity Cards ගන්න පෝලිමක් තිබෙනවා, තවත් තැනක ග්‍රාම නිලධාරි සහතික ගන්න පෝලිමක් තිබෙනවා. ඒ වාගේම Consular Affairs Division එකේ පෝලිමක් හැදෙන්නේ ඇයි? ගරු කථානායකතුමනි, එතැනට ස්ථාන 5කින් හෝ 6කින් ලියුම් එකතු කරගෙන එන්න ඕනෑ. මේ වනකොට අපි ඒ කටයුතු යාවත්කාලීන කරලා, පුළුවන් තරම් පෝලිම් අඩු කරලා තිබෙනවා. දැන් අන්තර්ජාලය හරහා police report එක ගන්න පුළුවන්; උප්පැන්න සහතිකය ගන්න පුළුවන්. ගරු චමල් රාජපක්ෂ ඇමතිතුමාගේ අමාත්‍යාංශය හරහා අන්තර්ජාලය මඟින් Police Headquartersවලින් police report එක ගන්න පුළුවන්. මේ සියල්ලම integrate කරලා එක system එකකට ගෙනෙන්න ඕනෑ. Citizen services digitalize කළොත් විතරයි, මේ රටේ ජනතාවට පහසු වන ආකාරයට රාජ්‍ය සේවය ලබා දෙන්න පුළුවන් වන්නේ කියන එක මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි.

මා පොඩි උදාහරණයක් කියන්නම්. විදේශ රැකියාවකට යන අයෙක් ඉස්සෙල්ලාම පොලිස් වාර්තාවක් ගන්න ඕනෑ. ඒ සඳහා පොලිසියට යන්න ඕනෑ. අධ්‍යාපන සහතික ටික එකතු කරගන්න අධ්‍යාපන අමාත්‍යාංශයට යන්න ඕනෑ. ඊට පස්සේ Consular Affairs Division එකට යන්න ඕනෑ, ඒ ආයතනයෙන් අවශ්‍ය වාර්තා ටික එකතු කර ගන්න. ඒ වාගේම Foreign Employment Bureau එකට යන්න ඕනෑ, ඒ ආයතනයේ fee එක ගෙවන්න. එතැනින් එහාට ඒජන්සි එකට යන්න ඕනෑ, ඉතුරු වැඩ ටික කරගන්න. මෙරටට විදේශ විනිමය ගෙනෙනන්න යන කෙනාත් මාස 4ක් හෝ 5ක් මේ රටේ රස්තියාදු වෙන්න ඕනෑ, පිට රට රැකියාවකට යන්න. මේ කටයුතු පැයකින් දෙකකින් කරගන්න පුළුවන් ආකාරයට, ඇඟිලි තුඩුවලින් කරන්න පුළුවන් ආකාරයට අවශ්‍ය තාක්ෂණය අද ලෝකයේ තිබෙනවා. මේ වනකොට ඒ කටයුත්ත කිරීමට අවශ්‍ය procurements කැඳවා තිබෙනවා. ඒකට අවශ්‍ය පරිසරය ICTA එකෙන් සකස් කරගෙන යනවා. ඒක ක්‍රියාත්මක කරන්න ඕනෑ. හැබැයි, ඒක ක්‍රියාත්මක කිරීමේදී අපට නීතිමය බාධා බලපානවා.

Auditor-General's Report එක ඇතුළුව audit system එකට online platform තාක්ෂණය හඳුන්වා දුන්නාට වැඩක් වෙන්නේ නැහැ. මොකද, අවසානයේ audit file එක දෙන්න ඕනෑ file එකක් විධියටයි. මොකද, Commission to Investigate Allegations of Bribery or Corruption මඟින් audit file එක ගෙනෙන්න කිව්වොත්, ගිහින් දෙන්න ඕනෑ file එකක් විධියට. ඒ නිසා මේවාට අදාළ පනත් වෙනස් වෙන්න ඕනෑ; යාවත්කාලීන වෙන්න ඕනෑ. ඒ යාවත්කාලීන වීම තුළින් අපි බලාපොරොත්තු වන්නේ, මේ රටේ රාජ්‍ය සේවය කාර්යක්ෂම රාජ්‍ය සේවයක් කරන්න වාගේම, ජනතාවට අවශ්‍ය සේවා පහසුවෙන් ලබාගත හැකි ආකාරයට කටයුතු සකස් කර දෙන්නයි.

ගරු කථානායකතුමනි, අද ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා ජාතික පාසල් සම්බන්ධයෙන් මතක් කළා. පාසල් 1,000ක් fibre-optic cablesවලින් සම්බන්ධ වෙනවා නේ, ගරු මන්ත්‍රීතුමනි. ජාතික පාසලක් වශයෙන් නම් කරන කොට එයටත් විරුද්ධ වෙච්ච විපක්ෂයක් නේ ඉන්නේ, ගරු කථානායකතුමනි. අපි පළාත් සභා ශක්තිමත් කරනවා. පළාත් සභාවලට මේ ආණ්ඩුවෙන් තරම් මුදල් දුන්නේ නැහැ, වෙන ආණ්ඩුවකින්. ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා, ප්‍රාදේශීය සභා හරහා ග්‍රාම නිලධාරි වසමකට රුපියල් ලක්ෂ 30ක් යවලා, ඒ ග්‍රාම නිලධාරි වසමේ රුපියල් ලක්ෂ 30ක සංවර්ධන වැඩ කටයුතු කරපු ආණ්ඩුවක් තමයි, මේ ආණ්ඩුව. හැබැයි, විපක්ෂය අද මොකක්ද කරන්නේ? ජාතික පාසල් 1,000ක් හදනකොට ඒකටත් විරුද්ධ වන තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. හැබැයි, අපි ජාතික පාසල් 1,000ක් හදනවා විතරක් නොවෙයි, මේ රටේ පාසල් 10,000ක් high-speed Internetවලින් සම්බන්ධ කිරීමේ වැඩ පිළිවෙළකුත් ආරම්භ කර තිබෙන බවත් මා මතක් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම තමයි "e-thaksalawa" platform එක. එය හරහා මේ වනවිටත් දරුවන්ට නොමිලේ අධ්‍යාපනය හදාරන්න පුළුවන්. ලංකාවේ සියලු "telco" ආයතන ඉදිරියට ඇවිල්ලා තිබෙනවා "e-thaksalawa" platform එක හරහා data charges නැතිව දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්න. අපි ඒ ගැන සතුටු වෙන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මේවා ක්‍රියාත්මක කිරීමේදී අපි පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ දෙයක් තිබෙනවා. ඒ තමයි, citizen services digitalize කරනවා නම්, privacy එකට - පෞද්ගලික දත්ත ආරක්ෂණය කියන කාරණයට - අප ප්‍රමුඛතාව ලබා දිය යුතුයි කියන එක.

ගරු මන්ත්‍රීවරුනි, අපි වගකීමෙන් ප්‍රකාශ කරනවා, මේ පනත මඟින් මාධ්‍යවේදීන්ගේ අයිතිවාසිකම් කිසිසේත් කප්පාදු වන්නේ නැහැ කියන එක. මෙමඟින් මාධ්‍යවේදීන්ගේ අයිතිවාසිකම් කිසිසේත් කප්පාදු වෙන්නේ නැහැ. හැබැයි, ඊට එහාට ගිහින් ඒ අයගේ වගකීම් තහවුරු වෙනවා. ඒ කොහොමද? මේ පනත් කෙටුම්පත සම්මත වෙලා මාස 18ත් 36ත් අතර කාල සීමාව තුළ අප කළ යුතු දේවල් තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙය ක්‍රියාත්මක වෙන්නේ මාස 18ත් 36ත් අතර කාල සීමාවක් තුළ. අපි එක් පැත්තකින්, අපේ digitalization campaign එක කරන්න ඕනෑ; අනෙක් පැත්තෙන්, Data Protection Authority එක පිහිටුවන්න ඕනෑ. ඒ Data Protection Authority එකට තමයි බලය තිබෙන්නේ මෙකට අවශ්‍ය Regulations ටික හදන්න. මේ පනත් කෙටුම්පතේ Clause 43 අනුව, -43වෙනි වගන්තිය අනුව- Regulations හැදුවාට පස්සේ ඒ Regulations ටික website එකේ publish කරන්න ඕනෑ. Website එකේ publish කළ ඒ Regulations ටික පසුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පසුව තමයි Data Protection Authority එකට බලය ලැබෙන්නේ, ඒ රෙගුලාසි - Regulations - ක්‍රියාත්මක කරන්න.

ඊළඟට, checks and balances. මේ Data Protection Authority එකට අත්තනෝමතිකව හැසිරෙන්න බැහැ, අත්තනෝමතිකව තීන්දු තීරණ ගන්න බැහැ. හැබැයි, Clause 43 යටතේ හදන Regulations ටික publish කරන්න, public opinion ගන්න ඒ අයට පුළුවන්. ඒ public opinion විමසුවාට පසුව ඒක පාර්ලිමේන්තුවට ගෙන එන්න ඕනෑ. ගරු කථානායකතුමනි, එය පාර්ලිමේන්තුවට ගෙනාවාට පසුව තමයි ඒ Authority එකට බලය ලැබෙන්නේ, ඒවා ක්‍රියාත්මක කරන්න.

Data Protection Authority එකේ වගකීම මොකක්ද? ඒ තමයි පෞද්ගලික දත්ත පරිහරණය පිළිබඳ රෙගුලාසි හදන එක. කාටද දත්ත පාවිච්චි කරන්න පුළුවන්, මොන කාරණය මතද ඒ දත්ත පාවිච්චි කරන්න පුළුවන් කියා තීරණය කරන්න, ඒ දත්තවලින් යම්කිසි ව්‍යාපාරයක්, ඉපයීමක් කරනවා නම් ඒ ව්‍යාපාරය licensed ව්‍යාපාරයක් බවට පත් කරන්න පුළුවන්. ඒ තුළ Data Protection Authority එක self-sufficient authority එකක් බවට පත් වෙනවා. ආණ්ඩුවේ අය වැයෙන් මුදල් ගන්නා Authority එකක් බවට එය පත් වන්නේ නැහැ. එහෙම මුදල් ගන්නේ නැති තාක් ඒ Authority එකට ස්වාධීනව කටයුතු කරන්න පුළුවන්. ඒ අයට බලය ලැබෙනවා, licences issue කරන්න. ඒ අයට බලය ලැබෙනවා, Regulations හදන්න.

මේ Personal Data Protection Bill එක මඟින් මේ රටේ ජනතාවගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරවන්න ඕනෑ, ගරු කථානායකතුමනි. මේ පනත් කෙටුම්පත කිසිසේත් තොරතුරු දැනගැනීමේ පනත අභිභවා යන්නේ නැහැ. ඒක පැහැදිලිව කියන්න ඕනෑ. මෙය තොරතුරු දැනගැනීමේ පනත අභිභවා යන්නේ නැහැ. මෙය මාධ්‍යවේදීන්ගේ නිදහස කප්පාදු වන පනත් කෙටුම්පතක් නොවෙයි, ගරු කථානායකතුමනි.

මෙහිදී අපි මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. යම්කිසි මාධ්‍යවේදියෙකු තමන්ගේ තොරතුරු, දත්ත පිළිබඳ වගකීම භාර ගන්නවා නම්, මේ මොන පනත ආවත් ප්‍රශ්නයක් නැහැ. හැබැයි, hearsay අනුව යනවා නම්, "අරයා මට කියපු හින්දා මම ලියනවා", "මම අහපු හින්දා ලියා තිබෙනවා", "මට හීනෙන් කියපු හින්දා මම ලිව්වා" කියලා ලිව්වොත්, ඒ අය සම්බන්ධයෙන් අධිකරණයට යන්න පුළුවන්, මේ පනත සම්මත නොවුණත්. ගරු කථානායකතුමනි, මේ රටේ බහුතරයක් මාධ්‍යවේදීන් තමන්ගේ මාධ්‍ය කර්තව්‍යය හදවතට එකඟව, නිර්භීතව, අවංකව කරනවා. ඒ නිසා මම හිතන්නේ නැහැ, මේ පනත් කෙටුම්පත තුළින් ඒ අයගේ අයිතීන් කිසිසේත් කප්පාදු වනවා කියලා. ඒ වාගේම, මේ රටේ දැනට පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අමතර ප්‍රතිලාභයක් දීලාත් නැහැ. ගරු කථානායකතුමනි, අමතර ප්‍රතිලාභයක් දීලා තිබෙනවා නම් තමයි මේ පනතින් කප්පාදු වෙන්න දෙයක් තිබෙන්නේ.

ඒ නිසා අපි වග කීමකින් කියනවා, මේ පනත නිසා මේ රටේ IT-BPM industry එකට booster එකක් ලැබෙන බව. මෙමඟින් මේ රටේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයෙන් විදේශ විනිමය උත්පාදනයට, දරුවන්ගේ රැකියා උත්පාදනයට අවස්ථාව ලැබෙනවා. මේ පනත ගෙන ඒම නිසා අපේ රටේ අලුත් වෙළෙඳ ව්‍යාපාර බිහි වෙනවා. ඒ අයට වෙළෙඳ ව්‍යාපාරවලට අවස්ථා ලැබෙනවා. Industry එකේ ලොකු වුවමනාවක් අපට තිබෙනවා, ගරු කථානායකතුමනි. අද ලෝකයේ බොහෝ රටවල industry එකේ growth එක නතර වෙලා තිබෙනවා, අවශ්‍ය නීති රීති හදපු නැති නිසා. නමුත් අද අපි බලාපොරොත්තු වන්නේ, industry එකත් එක්ක එකතු වෙලා, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයත් එක්ක එකතු වෙලා ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කරගන්න පුළුවන් ආකාරයට මේ විධියේ අණ පනත් නිර්මාණය කර දෙන්නයි. ඒ තුළ එක පැත්තකින්, මේ රටේ ජනතාවගේ පෞද්ගලික දත්ත ආරක්ෂා වෙනවා; පෞද්ගලිකත්වය ආරක්ෂා වෙනවා. අනෙක් පැත්තෙන්, ඒ තුළින් අපි industry එකක් හදනවා; නව ව්‍යාපාරයක් හදනවා. ඒ තුළින් නව ආර්ථික ප්‍රතිලාභ අපේ රටට ලැබෙනවා. දරුවන් අන්තර්ජාලය හරහා වෙන්න පුළුවන්, Facebook හරහා වෙන්න පුළුවන්, Twitter හරහා වෙන්න පුළුවන්, Instagram හරහා වෙන්න පුළුවන්, e-commerce platforms හරහා වෙන්න පුළුවන් තමන්ගේ නිෂ්පාදන ලෝකයට විකුණන කොට ඒ නිෂ්පාදනවලට වගකීමක් ලැබෙන්න ඕනෑ. ඒ වාගේම, ඒකට අයිතියක් තිබෙන්න ඕනෑ, ඒකට ආරක්ෂණයක් තිබෙන්න ඕනෑ. ගරු කථානායකතුමනි, දැන් අපි එක පියවරක් ඉදිරියට ගිහින් තිබෙනවා. දැන් අපි බලන්නේ metaverseවලින් අපේ රටට ආර්ථික ප්‍රතිලාභ ගෙනෙන්නේ කොහොමද, NFT එකෙන් අපේ රටට ආර්ථික ප්‍රතිලාභ ගෙනෙන්නේ කොහොමද කියලායි. මේ වන කොට අපි LPL ක්‍රිකට් තරගාවලිය metaverseවලට ගෙන යන්න බලාපොරොත්තු වනවා. Metaverseවලට ගෙන ගියාට පසුව ඒ තුළ අලුත් industry එකක් හැදෙනවා; blockchain-related supporting industries ටික අපේ රටේ හැදෙනවා. ඒ අතර අපේ designersලාට, fashion designersලාට, coding කරන අයට, software developersලාට, gaming කරන අයට අලුත් industry එකක් හැදෙනවා. ඒ industries අලුතින් හදන්න නම්, වෙළෙඳ ව්‍යාපාර අවස්ථා අපේ රටේ අලුතින් නිර්මාණය කරන්න නම් මෙවැනි අණ පනත්වලින් අපි ඒ අයට ආරක්ෂාව ලබා දෙන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමනි. මේ පනත් කෙටුම්පත ගෙන එන්න එක හේතුවක් තමයි ඒක.

ගරු කථානායකතුමනි, පසුගිය ආණ්ඩුව කාලයේ පනත් කෙටුම්පත් ගෙනාවා, සමහර ක්ෂේත්‍ර හිර කරන්න. ඔබතුමන්ලා ව්‍යවස්ථා සංශෝධනයකුත් ගෙනාවා නේ, එක්කෙනෙකුට, දෙදෙනෙකුට ඡන්දය ඉල්ලන්න බැරි වෙන්න. ඒ වාගේම සමහර පනත් ගෙනාවා, සමහර ව්‍යාපාර හිර කරන්න. හැබැයි, අපට එහෙම වුවමනාවක් නැහැ. අපට ulterior motive එකක් නැහැ. ගරු කථානායකතුමනි, අපේ එකම බලාපොරොත්තුව තමයි මේ රටේ රාජ්‍ය සේවය සහ මේ රටේ citizen services digitalize කරන එක. මේ රටේ ඩිජිටල් ආර්ථිකයක් හදන එක; ඒ ඩිජිටල් ආර්ථිකය තුළ අලුත් පරම්පරාවට අලුත් රැකීරක්ෂා අවස්ථා උත්පාදනය කරන එක; අලුත් tech start-ups, non-tech start-ups global market එකට අරගෙන යන්න පුළුවන් පරිසරය අපේ රටේ හදන එක. ඒ තුළ තමයි ඊළඟ පරම්පරාව බලාපොරොත්තු වන ලෝකය නිර්මාණය වෙන්නේ. Metaverse වාගේ, NFT වාගේ අලුත් ලෝකවල අවස්ථා අපේ ගම්වල දරුවන්ට ලබා දෙන්න ඕනෑ. එසේ ලබා දෙන්න ඕනෑ නිසා තමයි, ඒ අවශ්‍ය පරිසරය හදන්න ඕනෑ නිසා තමයි අය වැයෙන් කෝටි ගණනක් වෙන් කරලා පාසල් 10,000කට fibre-optic cables යවන්නේ.

විපක්ෂය විධියට ඔබතුමන්ලා මේ පනත් කෙටුම්පතට විරුද්ධ වීම ගැන මම කනගාටු වෙනවා. 2019 මාර්තු සිට ඔබතුමන්ලාට ඕනෑ තරම් කාලය තිබුණා, මේ ගැන කථා කරන්න. අඩු ගණනේ ඊයේ මේ පිළිබඳව සාකච්ඡා කළ කාරක සභාවට ආවේත් ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා විතරයි. අද එතුමාට කථාවකුත් නැහැ. එතුමා විතරයි මෙය කියවා ඇවිත් තිබුණේ. සමහර විට විපක්ෂ නායකතුමාගේ පරණ ප්‍රශ්න තිබෙනවාද දන්නේ නැහැ. අද එතුමාට කථාවකුත් නැහැ.

කෙසේ වෙතත්, අපි විපක්ෂයේ ඔබතුමන්ලාට කියන්නේ මෙකයි. ඔබතුමන්ලාගේ පැත්තේ තරුණ මන්ත්‍රීවරු ඉන්නවා. ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා මෙතැන ඉන්නවා. එතුමා තරුණ මන්ත්‍රීවරයෙක්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ දෙස විවෘත මනසකින් බලන්න; දේශපාලන කෝණයකින් බලන්න එපා. අපි මේ දෙස විවෘත මනසකින් බලමු. විවෘත මනසකින් බලා ඊළඟ පරම්පරාවට අවශ්‍ය නීති පද්ධතිය අපි හදා දෙමු. මේ දෙස දේශපාලනික කෝණයෙන් බලන්නේ නැතිව රටේ අවශ්‍යතාවට සහ ගෝලීය අවශ්‍යතාවට අනුව අපේ රට සූදානම් කරවීමේ පරමාර්ථයෙන් මේ පනත් කෙටුම්පත දිහා බලන්න කියන ගෞරවනීය හා ආදරණීය ඉල්ලීම කරමින් මේ පනත් කෙටුම්පතට ඔබතුමන්ලාගේ සහයෝගය ලබා දෙන්න කියන ඉල්ලීමත් කරමින් මා නිහඬ වෙනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා.

[පූ.භා. 11.16]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියි.

අපේ ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කළ ආකාරයට පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත වර්තමානයේ මේ රටේ උද්ගත වී තිබෙන තත්ත්වයට අදාළ වෙනවාද කියන කාරණය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

විශේෂයෙන් digitalization, data collection යන සියල්ලක්ම සිදුවිය යුතුයි. හැබැයි, වර්තමානයේ රටේ උද්ගත වෙලා තිබෙන තත්ත්වය, විශේෂයෙන්ම ආර්ථික වශයෙන් අපේ රට පත් වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව අපි තේරුම්ගත යුතුයි, ගරු කථානායකතුමනි. අද අපේ රටේ බහුතරයක් ජනතාවට පාරේ ඉන්න සිදුවෙලා තිබෙනවා. තාත්තා තෙල් පෝලිමේ ඉන්නකොට, අම්මා ගෑස් පෝලිමේ ඉන්නවා. අනෙක් පැත්තෙන් රටේ විදුලිය කපනවා. විශේෂයෙන්ම රටේ දැවැන්ත ඩොලර් හිඟයක් තිබෙනවා. ඒ වාගේම අද වනවිට මේ රටේ අහිංසක ගොවියා පොහොර නැතිව, මේ රටේ අහිංසක ධීවරයා මුහුදු යන්න තෙල් නැතිව මහ පාරේ රස්තියාදු වෙනවා. අද රටේ එවැනි තත්ත්වයක් තිබියදී තමයි මේ පාර්ලිමේන්තුව රැස් වෙන්නේ.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව රැස්වෙනකොට මේ රටේ බඩගින්නෙන් පෙළෙන ජනතාවගේ බඩගින්න නිවන්නේ කොහොමද, මේ පෝලිම් ටික අඩු කරන්නේ කොහොමද, මේ රටට විදේශ සංචිත ගේන්නේ කොහොමද, ඒත් එක්කම මේ රටේ ආර්ථිකය ගොඩ ගන්නේ කොහොමද, මේ රටේ ආර්ථිකය ගොඩ ගැනීමේ සැලැස්ම මොකක්ද කියන කාරණා පිළිබඳව අපට කතිකාවක් ගොඩනඟන්න පුළුවන් නම් අපි කැමතියි. මේ තොරතුරු, දත්ත පිළිබඳව අපට ඉදිරියේදී කටයුතු කරන්න පුළුවන්. හැබැයි, වර්තමානයේ ගොඩනැඟිලා තිබෙන ආර්ථිකමය ප්‍රශ්නයට අපි මුල්තැන ලබා දිය යුතුයි. දැන් අවුරුදු දෙකක් තිස්සේ රජය මේ රටේ සිදුවන හැම දෙයකටම හේතුව ලෙස පැහැදිලිව කිව්වේ, "කොරෝනා වසංගතය" කියලායි.

ගරු කථානායකතුමනි, දැන් තෙල් මිල ඉහළ යනකොටත් කියයි, "යුක්රේනය සහ රුසියාව යුද වදිනවා, ඒ නිසා තමයි අපට මේ විධියට මේ රටේ විදුලි බිල වැඩි කරන්න වෙලා තිබෙන්නේ. ඒ වාගේම තෙල් මිල වැඩි කරන්න වෙන්නේ" කියලා. අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා, "බදු වැඩි කරන්න වෙනවා, විදුලි බිල් වැඩි කරන්න වෙනවා, තෙල් මිල වැඩි කරන්න වෙනවා" කියලා කියනවා අපි දැක්කා. අද මේ රටේ මිනිසුන්ගේ ආර්ථිකය කඩා වැටිලා තිබෙනවා නම්, මේ රටේ මිනිසුන්ගේ ආදායම අඩු වෙලා තිබෙනවා නම්, මේ රටේ මිනිසුන්ගේ වියදම වැඩි වෙලා තිබෙනවා නම්, අද අපි දුගී දුප්පත් අසරණභාවයෙන් පෙළෙනවා ගරු කථානායකතුමනි. ඒකට වැඩ පිළිවෙළක් කොහේද අපි ළඟ තිබෙන්නේ? මේ රජය ඒකට වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා තිබෙනවාද කියලා අපි ප්‍රශ්න කරනවා.

මේ පනත් කෙටුම්පත ගැන කථා කරනකොට ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමා කිව්වා, "මාධ්‍යවේදීන්ට බලපෑම් එල්ල වෙන්නේ නැහැ" කියලා. නමුත් මා ළඟ තිබෙනවා, තරුණ මාධ්‍යවේදීන්ගේ සංගමය ඉදිරිපත් කළ තොරතුරු සහ වාර්තා. ඒ අය සම්පූර්ණයෙන් මේකට විරුද්ධ වෙලා තිබෙනවා. ඉතිහාසයේ විශේෂයෙන් 'සිරස' නාළිකාවට, 'සියත' නාළිකාවට වගේම මාධ්‍යවේදීන්ට එල්ල වෙච්ච ප්‍රහාර ගැන අපට මතකයි. ඒත් එක්කම අසීමිත බලයක් ස්වාධීන නොවන ආයතනයකට ලැබීමත් එක්ක යම් ආකාරයේ බයක්, සැකයක් ඇති වෙනවාය කියන එකත් අපි දන්නවා. ඒත් එක්කම ස්වාධීන නොවන අධිකරණයකදී මේ අයට පැමිණිලි විභාග කරන්න, දඬුවම් දෙන්න පුළුවන් අවස්ථාව ලැබෙනවාය කියන එක පිළිබඳව මේ මාධ්‍යවේදීන් ප්‍රශ්න කරනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, මේ අයගේ අදහස් උදහස් අරගෙන මේ අණපනත් ක්‍රියාත්මක කරනවා නම් හොඳයි කියන එක තමයි අපේ ප්‍රායෝගික ඉල්ලීම බවට පත් වෙලා තිබෙන්නේ. ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී රටවල් තිබෙනවා. ගරු කථානායකතුමනි, අද ඒ රටවල මෙවැනි අණපනත් ක්‍රියාත්මක වෙනවා. නමුත් ඔබතුමා දන්නවා, අපේ රටේ ආයතන මොන තරම් ස්වාධීනද නැද්ද කියන එක ගැන ප්‍රශ්නාර්ථයක් තිබෙන බව. ඒත් එක්කම ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ මොනතරම් රාජ්‍ය ආයතන සහ සංස්ථා ක්‍රියාත්මක වෙනවාද කියන එක පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා. මේ රටේ බහුතරයක් ආයතන අද අතිශයින් දේශපාලනීකරණය වෙලා තිබෙනවා කියන-

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු කථානායකතුමනි, අපේ කාලයේ ඔය මොනවත් සිදුවෙලා නැහැ. කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා සඳහන් කළා, තරුණ මාධ්‍යවේදීන්ගේ සංවිධානයක් පිළිබඳව. ගරු මන්ත්‍රීතුමනි, ඒ මාධ්‍යවේදී සංවිධානයේ නමයි, ඒ අය දීපු වාර්තාවයි මට දෙන්න කෝ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මම ඒක **සභාගත*** කරන්නම්.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
එම සංවිධානයේ නම මොකක්ද?

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
Young Journalists' Association.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
එම සංවිධානය ලියාපදිංචි වෙලා තිබෙන්නේ කොයි කාලයේද?

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මගේ ළඟ තොරතුරු තිබෙනවා. මම ඒ තොරතුරු සභාගත කරලා ඔබතුමාට ලැබෙන්න සලස්වන්නම්.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු මන්ත්‍රීතුමනි, ඒ අයට දවස් 14ක් උසාවි යන්න තිබුණා. මාධ්‍යවේදීන් එක්ක අපි consultations 7ක් සිදු කළා. ඒ කියන කට්ටිය ඒ එකකටවත් ඇවිල්ලා නැති හින්දායි මම මේ බැලුවේ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

මම මේ වාර්තාව ඔබතුමාට ලැබෙන්න සලස්වන්නම්. අද උදේ ඒ අය මට මේක email කළා.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

අපරාදේ! ඒ අය අපිත් එක්ක සම්බන්ධ වුණා නම්, අපට ඒ අය කියන දේ අහන්න තිබුණා නේ. ඒත් ඒ අය ඇවිල්ලා නැහැ නේ. ඒක නේ. දැන් මොනවා කරන්නද?

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු කථානායකතුමනි, අපි පැහැදිලිව කියන්නේ අපි මේ රටේ ඇත්ත ප්‍රශ්න හඳුනාගෙන කටයුතු කරන්න ඕනෑ කියන එකයි. මම මීගමුව ආසනය නියෝජනය කරන මන්ත්‍රීවරයා හැටියට, මීගමුව ආසනයේ සංවිධායකවරයා හැටියටයි මේ කාරණා කියන්නේ. මේ රටේ අහිංසක ධීවරයාට අද අත්වෙලා තිබෙන ඉරණම බලන්න. ගරු කථානායකතුමනි, අද ඩීසල් ටික ගන්න විධියක් නැහැ; ලාම්පුතෙල් ටික ගන්න විධියක් නැහැ. ඒ වාගේම ඒවාට අධික මිලක් ගෙවන්න වෙලා තිබෙනවා; පෝලිමේ ඉන්න සිදුවෙලා තිබෙනවා. ඒ නිසා ධීවර ක්ෂේත්‍රය අද කඩාගෙන වැටිලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මීගමුව ආසනය ගත්තාම, සංචාරක ක්ෂේත්‍රය ව්‍යාප්ත වුණු ආසනයක්. අද මේ රටට සංචාරකයන් එනවා. ඒ අතරේ පැය 7ක් විදුලිය කපනවා. සමහර හෝටල්වල ජෙනරේටර් තිබෙනවා. ගරු කථානායකතුමනි, හැබැයි ඒ ජෙනරේටර්වලටවත් තෙල් ටිකක් දා ගන්න විධියක් නැහැ. එතකොට සමස්ත රටට විදේශ විනිමය ගෙනෙන සංචාරක ක්ෂේත්‍රය අඩපණ වෙනවා. ගරු කථානායකතුමනි, ධීවර ක්ෂේත්‍රයේ නිෂ්පාදන දැවැන්ත ප්‍රමාණයක් අපනයනය කරන බව ඔබතුමාත් දන්නවා. ඒ වාගේම සංචාරක ක්ෂේත්‍රයත් අපට විදේශ විනිමය ගෙනෙන එක ක්‍රමවේදයක්. අපට ඩොලර් හිඟයක් තිබෙන වෙලාවක මේ විධියට අදූරදර්ශී විධියට රට පාලනය කිරීමත් එක්ක අපි දැවැන්ත කඩා වැටීමකට ලක් වෙනවා. අපි ඒකට අවධානය යොමු කරලා තිබෙන්නේ කොහොමද, මේ ප්‍රශ්න නිරාකරණය කරන්නේ කොහොමද කියන කතිකාවත ගොඩ නැඟෙන්නට අවශ්‍යයි.

ඒ විතරක් නොවෙයි. ගරු කථානායකතුමනි, මේ වෙනකොට නැවත වතාවක් රටේ ගෑස් හිඟයක් ඇතිවෙලා තිබෙන බව ඔබතුමාත් දන්නවා. මේ ගෑස් හිඟයත් එක්ක මහ පාරේ තිබෙන කොත්තු කඩ පවා වහන තත්ත්වයට දැන් පත් වෙලා තිබෙනවා. අද කෑම පාර්සලයක් මිල දී ගන්න බැරි තත්ත්වයට පත්වෙලා තිබෙනවා. එතකොට, අපි මේ රටේ සංවර්ධනය දකින්නේ කොහොමද? මේ සියලු දේ අතර, අපේ රටේ එදිනෙදා ජන ජීවිතයත් ඉදිරියට යන්නට අවශ්‍යයි. ඒ සඳහා අවශ්‍ය පරිසරය අද නිර්මාණය වෙලා නැහැ, ගරු කථානායකතුමනි.

පොහොර ප්‍රශ්නය ගැනත් අපි දිගින් දිගටම, දිගින් දිගටම කිව්වා. පොහොර ප්‍රශ්නය ගැන කියද්දී අපට හිනා වුණා. නමුත් අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද හෙක්ටයාරයකට රුපියල් 50,000 ගණනේ ගොවීන්ට වන්දි ගෙවන්න සිද්ධවෙලා තිබෙනවා. මේ ගෙවන්නේ කාගේ සල්ලිද? ගරු කථානායකතුමනි, මේ ගෙවන්නේත් මේ රටේ බදු ගෙවන අහිංසක ජනතාවගේ සල්ලි.

ගරු කථානායකතුමනි, චීනයෙන් පොහොර ගෙනාවා. අපි ඒ පොහොර ඇටයක්වත් දැක්කේ නැහැ. ඒ පොහොරවලට ඇමෙරිකානු ඩොලර් මිලියන 6.9ක් ගෙව්වා. ඒ වාගේම, "නයිට්‍රෝ රජාත්" අසාර්ථක වුණා. මේ රටේ ගොවියා ඒක ප්‍රතික්ෂේප කරන්න පටන් ගත්තා. ගරු කථානායකතුමනි, ඒවාට ගෙවීමෙන් මේ රටේ බදු ගෙවන අහිංසක ජනතාවගේ, විදෙස් ශ්‍රමිකයන්ගේ මුදල් තමයි අපට අහිමි වුණේ කියන එක මම මේ අවස්ථාවේ සඳහන් කරන්නට කැමැතියි. රට තුළ මේ ආකාරයේ ප්‍රශ්න තිබෙනවා.

විශේෂයෙන්ම මේ රජයේ සැලැස්ම බවට පත්වෙලා තිබුණේ, රටේ ආර්ථිකය ශක්තිමත් කරලා අපනයන ආර්ථිකයක් ගොඩනැඟීමයි. හැබැයි, ඒ වෙනුවට අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද හාල් ටිකත් පිට රටින් ගේන්න සිද්ධවෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. මේ තත්ත්වය පිළිබඳව අපි සමඟි ජන බලවේගය විධියට ප්‍රශ්න කරනකොට, මේවාට එරෙහිව සමඟි ජන බලවේගය සටන් කරනකොට සමඟි ජන බලවේගයට මැර ප්‍රහාර එල්ලා කරනවා. යම් පිරිසක් එකතුවෙලා සමඟි ජන බලවේගයේ කාර්යාලයට ඇවිල්ලා බිත්තර ගහලා යම් තර්ජනයක් කළා. ගරු කථානායකතුමනි, මේ රටේ දුක් විඳින ජනතාව මේ මාසයේ 15වැනි දා කොළඹට එන්න සූදානම් කියන එක අපි පැහැදිලිව කියනවා. මේ රටේ දුක් විඳින ජනතාව තමන්ගේ පීඩනය, තමන්ගේ වේදනාව, පෝලිම්වල ගත කරන්න සිදු වීමත් එක්ක ඔවුන්ට අහිමි වන වටිනා කාලය පිළිබඳව ඇති වන මානසික පීඩනය, ඒ වාගේම ආර්ථික පීඩනය කියන මේ සියලු දේවල් අරගෙන ලබන 15වැනි දා හවස 2.00ට අනිවාර්යයෙන්ම කොළඹට එනවා. බිත්තර ගැහුවා වගේ නොවෙයි, ඊට ඔබ්බට ගිය සෙල්ලමක් එදාට ඒ අයට කරන්න සිද්ධ වෙයි. මොකද, මේ රටේ බඩගින්නේ සිටින අහිංසක ජනතාව තමයි ඒ විධියට මහ පාරට එන්නේ කියන එක අපි පැහැදිලිව කියනවා. ඒ වාගේම,-

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, අපේ තරුණ මන්ත්‍රීතුමා කිව්වා, යම් පිරිසක් එතුමන්ලාගේ කාර්යාලයට ඇවිල්ලා ප්‍රශ්නයක් ඇති කළා කියලා. ඉතින්, ඔබතුමන්ලාගේ අර කාන්තාවන්ගේ නායිකාව නේ "අපේ ගෙවල්වලට ගහන්න" කියන ආරාධනාව කළේ. අපි ඔබතුමන්ලාගේ කාර්යාලයටම එවලා ටිකක් පෙන්නුවා. එම නිසා, ඔබතුමන්ලා ගන්නා වූ තීන්දු තීරණවලට අනුව අපටත් වැඩ කටයුතු කරන්න පුළුවන් කියන ටික විතරක් මතක තියාගන්න.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමනි.

ගරු කථානායකතුමනි, මේ රටේ ප්‍රශ්න ගැනයි අපි දැන් කථා කරන්නේ. මේ රටේ තවත් දැවෙන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය තමයි, පාස්කු ඉරිදා අපේ ජනතාවට එල්ල වූ ප්‍රහාරය. මේ ප්‍රශ්නය ගැන සොයා බැලීම සඳහා ජනාධිපති විමර්ශන කොමිසමක් පත් කළා. ඒ කොමිසමේ වාර්තාව ඔබතුමාට ලැබුණා. ඔබතුමා තවමත් ඒක මේ පාර්ලිමේන්තුවේ සභාගත කරලා නැහැ, ගරු කථානායකතුමනි. ඒක තිබෙන්නේ පුස්තකාලයේ. පුස්තකාලයෙන් අපට ඒකේ කොපියක්වත් ගන්න පුළුවන්කමක් නැහැ. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, පාස්කු ඉරුදින එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරය පිළිබඳව විමර්ශනය කිරීම සඳහා මේ රටේ අහිංසක ජනතාවගේ බදු මුදල් වියදම් කරලා ක්‍රියාත්මක කරන ලද ජනාධිපති විමර්ශන කොමිසම විසින් හදපු ඒ වාර්තාව මේ පාර්ලිමේන්තුවේ සභාගත කරන්න කියලා. මොකද, එම වාර්තාවේ අඩංගු කරුණු මොනවාද කියලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පමණක් නොවෙයි, රටේ සමස්ත ජනතාවම දැනගත යුතුයි. ගරු කථානායකතුමනි, එම නිසා අපි මේ ඉල්ලීම දිගින් දිගටම

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

කරනවා. එදා මේ රටේ අහිංසක මිනිසුන්ගේ ජීවිත අහිමි වුණා. ඒ අයට සාධාරණත්වයක් ඉෂ්ට වෙන්න ඕනෑ, ඒ වින්දිතයන්ට සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑ. ඒ වෙනුවෙන් කළ යුතු දේ කරන්න අවශ්‍ය බලය ජනතාව මේ රජයට ලබා දීලා තිබෙනවා. එම නිසා ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න කියන ඉල්ලීම අපි දිගින් දිගටම කරනවා.

ගරු කථානායකතුමනි, මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. තමන්ට තිබෙන වේදනාව, පීඩනය වෙනුවෙන් 15වැනි දා අපිත් එක්ක - සමඟි ජන බලවේගයත් එක්ක - කොළඹට එක්රැස් වෙන්න කියලා මේ රටේ සමස්ත ලක්වැසි ජනතාවට මම ආරාධනා කරනවා. මේ ආකාරයට රජය ජනතාව අමතක කරලා දාලා, ජනතාවගේ ආර්ථිකය පාගා දමලා තිබෙන මොහොතක ඒ ජනතාව වෙනුවෙන් පෙනී සිටින එකම පක්ෂය හැටියට අද සමඟි ජන බලවේගය ඉදිරියට ඇවිල්ලා තිබෙනවා; අපේ පක්ෂයේ නායකතුමා ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. එතුමාත් එක්ක ඔබ සියලුදෙනාටම එක්කාසු වෙන්න කියන ඉල්ලීම කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා. *[සභා ගර්භය තුළ නැත.]*

Then, the Hon. (Dr.) (Ms.) Harini Amarasuriya.

[11.27 a.m.]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
Hon. Speaker, thank you for giving me time to make some remarks on this very important Bill. In principle, we have no objection to this Bill. This is something which is necessary and in principle, we support it. But, we need to ensure that the Bill does not have any impact on the right to expression, especially on journalism and media freedom. I think there are specific areas in this Bill which are of concern and which could be addressed to make this Bill stronger.

Obviously, in this age where data is used so widely, protection of data from being subject to abuse is absolutely essential and there is no doubt about that. However, there are three specific concerns that have been raised by journalists, media persons as well as activists in the field of right to information, which, I think, should be considered more seriously. One is that there are certain restrictions that have been imposed with regard to how journalists can access and use media, especially when processing data, and on how media actually use data for reporting. That is something which is causing concerns among journalists about how personal data can then be used for journalistic purposes. So, some definition as to the use of data for journalistic purposes could be included in this Bill because that will make this area much more clearer so that for journalistic purposes, data can be used freely.

The other concern is, of course, on the independence of the Data Protection Authority. Currently, all powers relating to the Authority, including appointing members to the Authority, come under the Minister. Now, the way the Bill is currently formulated, there is a greater chance or room for abuse of powers given to the Minister. The current Minister may say that he will assure us of the independence of the Authority. But, you, Hon. Minister, are not going to be the Minister-in-charge of this Act for its lifetime. So, when we draft a Bill, we cannot think of the Bill in terms of the current Minister or the lifetime of this particular Parliament. These Acts stand for years and changes may occur with the people who are interpreting these Bills. So, the important thing is to actually ensure that the Bill itself is drafted in a way that reduces the possibility of abuse, that it does not leave room for interpretation of clauses in ways that are detrimental to the public and the public interest. So, in this regard, the level of independence of the Data Protection Authority is something that is questionable. There is a greater possibility that the Data Protection Authority could be used for political purposes. For instance, it is not a judicial body, but it has powers for investigation and to impose penalties. In that context, the composition of this Authority must ensure that there are sufficient independent persons involved in this decision-making. And also, we feel that the powers of this Authority to actually investigate and impose penalties on those who seem to be in violation of the Act need to be considered very carefully. There needs to be enough protection, that we cannot leave room for any loopholes where political interference can undermine some of the other rights that are also enshrined in our Constitution and in other Acts.

There are also legitimate fears that have been raised with regard to the impact on the right to information. Now, the Hon. Minister assured us that that will not happen, but if you look at page 3 of the Bill, Clause 3(2) states, "In the event of any inconsistency between the provisions of this Act and the provisions of such written law, the provisions of this Act shall prevail". So, that suggests that this Act overrides or prevails over all other existing Acts. So, how can we assure that the right to information would not be compromised by the enactment of this Act? There are several other rights that are enshrined through other Acts and the Constitution, including the right to freedom of expression.

So, how do we ensure that this Bill does not restrict any of those existing rights and does not override the prevailing rights which have been enshrined through other Acts? The words of the Hon. Minister are not sufficient to give us confidence that this Bill would not undermine those existing rights. Rather, reforms are necessary, revisions are essential to make sure that there are no loopholes, that there is no possibility for this Bill to actually infringe on those other existing rights.

In conclusion, Sir, what we feel is that this Bill is necessary; there is no argument about that. The need to protect data subjects from infringement of privacy, especially by State authorities, is something that is quite essential. There is no doubt about that. However, given the current political situation where media is feeling some

level of threat, where media rights have been curtailed to some extent, where media people have been attacked for their work especially with regard to use of media in the digital space, there are legitimate fears that this Bill can infringe on the right to expression and also on the right to information. So, as long as this Bill can accommodate those concerns, can be revised in relation to enhancing protection of the right to expression as well as the right to information, there is no argument at all about the need or the logic behind enacting this kind of Bill in this day and age.

Thank you very much.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

Hon. Speaker, first, I must thank the Hon. Member for accepting the need to bring a Bill of this nature and also contributing in a very progressive manner on the Bill, unlike my other Colleagues who made it very political. The Hon. Minister of Justice will also brief at the end of the day regarding the concerns of the Bill. The Data Protection Authority will make regulations under Section 43 of the Act, those will be published and also brought before Parliament. So, the regulations can be drafted in a way that they would not override the Right to Information Act. The Hon. Minister of Justice Minister will give you a detailed briefing on that during his speech at the end of the day.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The Hon. Tharaka Balasuriya, please. - *[Not in the Chamber.]*

The next speaker is the Hon. Shehan Semasinghe.

[පූ.භා. 11.35]

**ගරු ශෙහාන් සේමසිංහ මහතා (සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு செஹான் சேமசிங்க - சமுர்த்தி, உள்ளக பொருளாதார, நுண்நிதிய, சுயதொழில், தொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Samurdhi, Household Economy, Micro Finance, Self-employment and Business Development)

ගරු කථානායකතුමනි, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවේ ඒ පිළිබඳව අදහස් දක්වන්න ලැබීම පිළිබඳව මම සතුටු වනවා.

විශේෂයෙන්ම විරුද්ධ පක්ෂය බොහෝ දුරට මේ Personal Data Protection Bill එකේ තිබෙන වැදගත්කම ගැන කථා කරනවාට වඩා, විවිධ සන්දර්ශනවලට සූදානම් වනවා කියන කාරණය තමයි අද එතුමන්ලාගේ කථා තුළින් මට පෙනෙන්න තිබෙන්නේ, ගරු කථානායකතුමනි. අපේ රටට පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පතක අවශ්‍යතාවක් අද තිබෙනවා. එහි අන්තර්ගතය පිළිබඳව අපට මේ පාර්ලිමේන්තුව තුළදීත්, කාරක සභා අවස්ථාව තුළදීත් සාකච්ඡා කරන්න පුළුවන්. මේ පෞද්ගලික දත්ත ආරක්ෂණ පද්ධතිවලට අදාළ කටයුතු ජාත්‍යන්තර වශයෙන් පුළුල් වනවා නම්, ලංකාවටත් එම අවශ්‍යතාව සපයා ගැනීමට අවශ්‍ය වනවා.

ගරු කථානායකතුමනි, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණා. ඊට පස්සේ බොහෝ අය එම පනත හරහා විවිධ පෞද්ගලික තොරතුරු ලබා ගැනීමට උත්සාහ කළා මිසක්, පොදුවේ ඉන් බලාපොරොත්තු වෙච්ච කාරණාව ඉටු කර ගැනීමට කටයුතු නොකරන බව අපට පෙනෙන්න තිබෙනවා. රාජ්‍ය ආයතනවලින් තොරතුරු ලබා ගැනීම සඳහා බොහෝ දුරට උත්සාහ කරන්නේ, විවිධ පෞද්ගලික මතිමතාන්තර තුළ සිටිමින් තමන් දරන පෞද්ගලික මතය සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමටයි. හැබැයි, මේ පනත් කෙටුම්පත හරහා ඒක නොවෙයි සිදු වන්නේ. ඒ නිසා විශේෂයෙන්ම ගරු ඇමතිතුමා මේ පෞද්ගලික දත්ත ආරක්ෂණය කියන කාරණය පිළිබඳව රටේ ජනතාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් කීපයක් ඉදිරියේදී මෙහෙයවයි කියා මම හිතනවා. එලෙස ජනතාව දැනුවත් කිරීම වැදගත් වනවා, ගරු කථානායකතුමනි. එහෙම නැති වුණොත් ජාත්‍යන්තර වශයෙන් ලෝකයේ අනිකුත් රටවල් මෙවැනි පනත් හරහා වාසියක් ගනිද්දී, අපට රජයක් හැටියට ඒ වාසිය ලබා ගන්න බැරි වනවා. මේ පනත් කෙටුම්පත හරහා අපි කිසිම පිරිසක් මර්දනයට සූදානම් වන්නේ නැහැ, ගරු කථානායකතුමනි. විශේෂයෙන්ම ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ පාලන කාලය තුළදී අපි මේ රටේ කිසිදු පාර්ශ්වයක් මර්දනයට කිසිම අවස්ථාවක කටයුතු කරලා නැහැ. ඒ නිසා මාධ්‍ය මර්දනය සඳහා අපි මේ පනත් භාවිත කරනවා කියලා විරුද්ධ පක්ෂය නිර්මාණය කරන්න හදන මතය අපි ප්‍රතික්ෂේප කරනවා. ඒ වාගේම මේ පනත හරහා සත්‍ය තොරතුරු ලබා දීමේ වගකීමක් අපි සියලුදෙනාටම තිබෙනවා. අසත්‍ය තොරතුරු ප්‍රචාරය කරලා, අසත්‍ය තොරතුරු මත ප්‍රකාශ නිකුත් කරලා, අසත්‍ය තොරතුරු මත යම්කිසි පැවැත්මක් ගෙන යන්න කවුරු හෝ කටයුතු කරනවා නම්, අන්න එවැනි පුද්ගලයන්ට මේ පනත් කෙටුම්පතට විරුද්ධ වෙන්න පුළුවන්. ඒ වාගේම මේ පනත් කෙටුම්පත තුළින් යම්කිසි ආකාරයකින් ඔවුන් පාලනය කිරීමක් සිදු වනවා කියාත් අර්ථ කථනය කරන්න පුළුවන්. අසත්‍ය තොරතුරු මත පදනම් වෙච්ච කරුණු කාරණා හෙළිදරව් කිරීම වෙනුවට, සත්‍ය තොරතුරු මත කරුණු කාරණා හෙළිදරව් කිරීම මේ පනත හරහා අපි බලාපොරොත්තු වනවා. ඒ නිසා අපි නැවත නැවතත් කියන්න ඕනෑ, අපේ ආණ්ඩුවක් යටතේ මාධ්‍ය මර්දනයට කිසිදු ආකාරයක ඉඩක් නැති බව ගරු කථානායකතුමනි. ලෝකයේ පවතින ආර්ථික අර්බුදය අනුව අපටත් විවිධ ප්‍රශ්නවලට මුහුණ දෙන්න වෙලා තිබෙනවා. ලෝක වසංගත තත්ත්වය තුළ අපටත් ඒ අර්බුදවලට මුහුණ දෙන්න වෙලා තිබෙනවා. විරුද්ධ පක්ෂය දිගින් දිගටම මේ අර්බුද හුවා දක්වමින්, මේ අර්බුද ප්‍රයෝජනයට ගත්තා, තමන්ගේ දේශපාලන මතවාදය ඉදිරියට අරගෙන යන්න. තමන්ගෙන් ගිලිහී ගිය ජනතා ආකර්ෂණය නැවත ලබා ගන්න පුළුවන්ද කියලා විරුද්ධ පක්ෂය විවිධ තැන්වල උද්ඝෝෂණය කරලා බැලුවා. විවිධ තැන්වලට උද්ඝෝෂණ රැල්ලක් අරගෙන ගිහිල්ලා, විරෝධතා අරගෙන ගිහිල්ලා බැලුවා ඒක කරගන්න පුළුවන් ද කියලා. ඒ හින්දා ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම අපි මේ කාරණය කියන්න ඕනෑ. අද මේ රටේ අර්බුද ඇවිල්ලා තිබෙනවා. නමුත්, ඒ අර්බුද තාවකාලිකයි. මේ අර්බුදවල නිර්මාතෘවරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජයේ අය නොවෙයි. මේ අර්බුදවල නිර්මාතෘවරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ පෙර පැවති රජයේ අය නොවෙයි. හැබැයි, විවිධ රටවල් එක්ක ඇතිවෙන ගැටලු තුළ ගෝලීය වශයෙන් මේ අර්බුද නිර්මාණය වෙද්දී, මේ රටේ පාලකයා බවට පත්වුණේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා. ඒ හින්දා අපි නිරන්තරයෙන්ම කියන කාරණයක් තමයි, අද විරුද්ධ පක්ෂය කියන විධියට කිසිම අවස්ථාවක රජයක් හැටියට අපි මේ රටේ ගැටලු නිර්මාණය කරලා නැහැ කියන එක. ඒ ඇති වෙච්ච ගැටලුවලට විසඳුම් ලබා දෙන්න තමයි අපි කටයුතු කරලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! Will an Hon. Member propose the Hon. (Dr.) Suren Raghavan to the Chair?

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
Sir, I propose that the Hon. (Dr.) Suren Raghavan do now take the Chair**.**

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්,* ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා *මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* THE HON. (DR.) SUREN RAGHAVAN *took the Chair.*

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට, තව එක කාරණයක් සම්බන්ධයෙන් අදහස් මතු වුණා. "මේ ඒජන්සි එක පත් කිරීමේ බලය ඇමතිවරයා සතු වෙනවා, ඒ බලය තුළ මෙහි ස්වාධීනත්වය අහිමි වෙනවා, ඒ තුළ මේක දේශපාලනීකරණය කරනවා" කියන පදනම මත අද අදහස් ඉදිරිපත් වුණා. හැබැයි අපි ඉතා පැහැදිලිව කියන්න ඕනෑ, මේක ස්වාධීනව කටයුතු කරන, ජනාධිපතිවරයා විසින් පත් කරන ඒජන්සියක් බවට පත් වෙන බව. ඒ හින්දා මෙහි පත් කිරීමේ බලධාරියා ඇමතිවරයා නොව, ජනාධිපතිවරයායි. ඒ හරහා මෙහි ස්වාධීනත්වය ආරක්ෂා කරන්න රජය කටයුතු කරනවා.

ඊළඟට, විශේෂයෙන්ම ඩිජිටල්කරණය ගැනත් කියන්න ඕනෑ. නාමල් රාජපක්ෂ මැතිතුමා විෂය භාර ඇමතිවරයා හැටියට ඩිජිටල්කරණයට ප්‍රමුඛතාව ලබාදීලා කටයුතු කිරීම ගැන අපි සතුටු වෙනවා. බොහෝ අවස්ථාවලදී ජනතාවගෙන් චෝදනාවක් තිබෙනවා, රාජ්‍ය ආයතනයකට ගියාට පස්සේ ඒ රාජ්‍ය ආයතනයෙන් බලාපොරොත්තු වන සේවාව ඉටු කර ගැනීමට බොහෝ කාලයක් ගත වෙනවා කියලා. එහෙම නැත්නම්, අවශ්‍ය ආකාරයට තමන්ගේ ගැටලු නිරාකරණය කර ගන්න බැහැ කියන චෝදනාව මතු වෙනවා. ඒ චෝදනාව රාජ්‍ය සේවකයාට එල්ල වුණාට, ඒ රාජ්‍ය සේවකයන්ටත් ඔවුන්ගේ පැතතෙන් ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, ඩිජිටල්කරණයට කිසිම රජයක් අවධානය යොමු කරන්නේ නැති නිසා, මේ පිළිබඳ කරුණු කාරණා ලිපිගොනු සියල්ල සොයා බලා, ප්‍රශ්නයක් විසඳා ගන්න එන කෙනාට විසඳුමක් ලබා දෙන්න ඔවුන්ටත් සිද්ධ වෙනවා. ඒ හින්දා දැන් ඩිජිටල්කරණය වේගවත්වීම අත්‍යවශ්‍ය කාරණයක්. ඒ සඳහා අවශ්‍ය පසුබිම ගරු ඇමතිතුමා සහ රජය අද නිර්මාණය කරලා තිබෙනවා. ඒ හරහා අපි පළමුව බලාපොරොත්තු වන්නේ, ජනතාව බලාපොරොත්තු වන ගැටලුවලට ක්ෂණිකව, කඩිනමින් විසඳුම් ලබාදීමයි. දෙවැනි කාරණය තමයි, ඒකට විසඳුමක් දෙන්න පුළුවන් ද, බැරි ද කියන කාරණයවත් පුද්ගලයා දැනගන්නට සැලැස්වීම. ඊළඟ කාරණය තමයි, රාජ්‍ය සේවකයා වඩාත් කාර්යක්ෂමව තමන්ගේ සේවාව ජනතාව වෙනුවෙන් ඉටු කිරීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩිජිටල්කරණය කියන කාරණාවේදී රාජ්‍ය අමාත්‍යාංශය හැටියට අපට පුළුවන් වුණා, යුරෝපීය සංගමයත් එක්ක එකතු වෙලා මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න. මේ වෙනකොට ප්‍රධාන වශයෙන් දිස්ත්‍රික්ක 4ක් කේන්ද්‍රගත කරමින් මේ කටයුතු කරන්න අපට හැකියාව ලැබී තිබෙනවා. මොනරාගල, බදුල්ල, නුවරඑළිය, මාතලේ කියන දිස්ත්‍රික්ක පදනම් කරගෙන මේ ව්‍යාපාර සේවා මධ්‍යස්ථාන 4ක් නිර්මාණය කරන්න අපට පුළුවන් වුණා. මේ ව්‍යාපාර සේවා මධ්‍යස්ථාන 4 තුළින් විශේෂයෙන්ම අපි බලාපොරොත්තු වන දෙයක් තිබෙනවා. අපේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට, කුඩා ව්‍යාපාරිකයන්ට, ක්ෂුද්‍ර ව්‍යාපාරිකයන්ට අද බොහෝ ගැටලු ඇතිවෙලා තිබෙනවා. මොකද, ඔවුන් ලියාපදිංචි වෙච්ච පිළිගත් ව්‍යාපාරයක් කරන කෙනෙකු හැටියට පිළිගන්නේ නැහැ. ඒකට හේතුව වෙලා තිබෙන්නේ අපේ රටේ ව්‍යාපාර ලියාපදිංචිය සඳහා ගතවන කාලයයි. ඒ සඳහා බොහෝ අවස්ථාවලදී මාස 3කට, 4කට වඩා වැඩි කාලයක් ගත වෙනවා. හැබැයි, මේ ව්‍යාපාරික සේවා මධ්‍යස්ථාන ඩිජිටල්කණය හරහා අපට පුළුවන් වෙලා තිබෙනවා, මේ සේවාව දවස් 3කින්, 4කින් අවසන් කරලා, ඒ පුද්ගලයා විධිමත් ක්‍රමවේදයකට අරගෙන එන්න. මේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපරිකයා, සුළු ව්‍යාපාරිකයා විධිමත් ක්‍රමවේදයකට නොයෑම තුළ ඔවුන්ට මූල්‍ය පහසුකම් ලබා ගැනීමේදී ප්‍රශ්න ඇති වෙනවා. ඔවුන් විධිමත් ක්‍රමය තුළ නැති හින්දා කිසිදු මූල්‍ය ආයතනයක් ඔවුන් පිළිගන්නේ නැහැ. ඔවුන්ට ණයක් ලබා ගන්න බැහැ; වෙනත් මූල්‍ය සහනයක් ලබා ගන්න බැහැ. මූල්‍ය පහසුකමක් ලබා ගැනීමේ අපහසුතාව ඔවුන්ට තිබෙනවා. ඒ නිසා අපට පුළුවන් වුණා, මාස 4ක් ගත වෙන එක දින තුනකට අඩු කරලා ඒ සේවා පහසුකම් සපයන්න. අපේ රටේ රාජ්‍ය ආයතන, මූල්‍ය පහසුකම් සපයන ආයතන කියන සියල්ල ඒකාබද්ධ කරලා උපදේශන සේවාව, පුහුණුවීම් ඇතුළු අනෙක් කටයුතු කරගෙන යද්දී ඩිජිටල්කරණය හරහා ඔවුන්ට ඒ පහසුකම් ලබා දෙන්න අපට පුළුවන් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයෝ අපේ රටේ ජාතික ආර්ථිකයට සියයට 54කට වැඩි දායකත්වයක් ලබා දෙන බව. අපේ රටේ සේවා නියුක්තිය ගත්තොත්, සියයට 50කට ආසන්න සේවා නියුක්තියකට ඔවුන් වගකීම භාරගෙන තිබෙනවා. අපට පුළුවන් වුණා, ඩිජිටල්කරණය හරහා ප්‍රධාන වශයෙන් දිස්ත්‍රික්ක හතරක් කේන්ද්‍ර කරගෙන මේ ව්‍යාපාර සේවා මධ්‍යස්ථාන ඇති කරන්න. අපි මේ වෙනකොට කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම ආරම්භ කරලා තිබෙනවා. අපි ඊළඟට බලාපොරොත්තු වෙනවා, අනුරාධපුර දිස්ත්‍රික්කයේ මේ ව්‍යාපාර සේවා මධ්‍යස්ථානය ඇති කරන්න. මේ තුළින් සිදු වෙන්නේ මේ සියලු දෙනා විධිමත් ක්‍රමවේදයට ඇවිල්ලා ඔවුන් හා අනෙකුත් ආයතන අතර සම්බන්ධීකරණයක් සිද්ධවීමයි. ඩිජිටල්කරණයේ එක පැතිකඩක්, අත්‍යවශ්‍ය කාරණයක් තමයි මේ Personal Data Protection Bill එක. එම නිසා මේ පනත් කෙටුම්පතේ අන්තර්ගතය වැරදි ආකාරයට විග්‍රහ කිරීම මම හිතන විධියට සාධාරණ නැහැ. යම් යම් කණ්ඩායම් ඊට විරුද්ධව පාර්ලිමේන්තුවේදි කථා කළාට, අපි සාමාන්‍ය මහ ජනතාව අතරට ගිහින් ඔවුන්ගේ අදහස් විමසා බැලුවොත් පෙනෙනවා, ඔවුන් බලාපොරොත්තු වෙන්නේ කඩිනම් සේවාවක් ලබා ගැනීම බව. ඔවුන්ට අවශ්‍ය ක්ෂණිකව තමන්ගේ අවශ්‍යතාව ඉටු කර ගැනීමටයි. ඒකට පිටුවහලක් වෙනවා මෙවැනි අත්‍යවශ්‍ය පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. අපි නවීකරණය වෙලා, ලෝකයේ අනික් රටවල් එක්ක ඒකාබද්ධ වෙලා කඩිනම් සේවාවක් ලබා දීම වෙනුවෙන් කටයුතු කිරීම වැදගත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කිසිම අවස්ථාවක කොවිඩ් තත්ත්වය නිසා හෝ ලෝකයේ අනික් රටවල් එක්ක ඇති වෙන අර්බුද නිසා හෝ පසුගිය යහ පාලන ආණ්ඩුව නිර්මාණය කරපු අර්බුද නිසා හෝ රටේ ජනතාවට අසරණ වෙන්න ඉඩ තියන්නේ නැහැ. අපි දන්නවා, ජනතාවත් අපහසුතාවට පත් වෙන කාරණා තිබෙන බව. නමුත්, අපි ඒ කාරණාවලට විසඳුම් ලබා දෙනවා. අද විරුද්ධ පක්ෂයේ ඉඳගෙන එතුමන්ලාට ආණ්ඩුව විවේචනය කරන්න ලෙහෙසියි. හැබැයි, එතුමන්ලා කණ්ණාඩියක්

ඉස්සරහට ගිහිල්ලා ඒ විවේචන දිහා බැලුවොත්, එතුමන්ලාටම තේරුම් යාවි ඔවුන් ආණ්ඩුවක් කරලා, ඒ ආණ්ඩුව දුර්වල වෙලා, ඒ ආණ්ඩුව අසාර්ථක වෙලා, ඒ ආණ්ඩුව වැරදි ප්‍රතිපත්ති අරගෙන ගිහිල්ලා, දේශපාලන දඩයම් වෙනුවෙන් පමණක් තමන්ගේ අවධානය යොමු කිරීම නිසා මේ රට මෙවැනි අසරණ තත්ත්වයකට පත් වුණා කියන කාරණය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු තේනුක විදානගමගේ රාජ්‍ය ඇමතිතුමාගේ කාලයත් ලබා ගන්න කියලා එතුමා කියා තිබෙනවා. එතුමාගේ කාලයත් මගේ වෙලාවට එකතු කරන්න.

අද මේ ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව යම් කෙනෙක් විවේචනයක් එල්ල කරනවා නම්, ඒ පුද්ගලයා විරුද්ධ පක්ෂයේ සාමාජිකයෙක් නම්, ඔහු ඉස්සර වෙලාම කණ්ණාඩියක් ඉදිරියට ගිහිල්ලා ඒ විවේචනය එල්ල කරලා බලන්න ඕනෑ. එතකොට ඒ පුද්ගලයාට තේරෙයි එහි වගකීම දැරිය යුතු කණ්ඩායම කවුද කියලා. ඒ නිසා මේ වෙලාවේ අපි දේශපාලනය කිරීම නොවෙයි කළ යුත්තේ. මේක, ජනතාව අපහසුතාවට පත් වෙලා ඉන්න අවස්ථාවක්. ඒ අය අපෙන් බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? පාර්ලිමේන්තුවේ අපි සියලු දෙනා එකට අත්වැල් බැඳගෙන මේ ගැටලුවලට විසඳුම් ලබා දෙයි කියලා ජනතාව බලාපොරොත්තු වෙනවා. නමුත් ඒ වෙනුවට අපි දකින්නේ මොකක්ද? මම කලින් කිව්වා වාගේ, උද්ඝෝෂණ රැලි පවත්වනවා; විවිධ විරෝධතා පවත්වනවා. ඒ හරහා මේ අය මොකක්ද බලාපොරොත්තු වෙන්නේ? රටේ ආර්ථික ක්‍රියාවලිය අඩපණ කිරීමයි. රටේ ආර්ථික ක්‍රියාවලිය අඩපණ වුණාම එතුමන්ලාට මේ සභාවට ඇවිල්ලා කියනවා, මෙන්න උද්ධමනය වැඩි වෙලා තිබෙනවා, මෙන්න මේ කණ්ඩායම අපහසුතාවට පත් වෙලා තිබෙනවා කියලා. මේ උපක්‍රම දෙක තමයි අද විරුද්ධ පක්ෂය භාවිත කරන්නේ. අනික් රටවල නම් සියලු පක්ෂ එකතු වෙලා ඔවුන්ගේ කාර්ය භාරය ඉටු කරද්දී, අපේ රටේ විරුද්ධ පක්ෂය කටයුතු කරන්නේ මෙහෙමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි මාධ්‍යයට උපරිම නිදහස ලබා දීලා තිබෙනවා. ඒ නිදහස ආරක්ෂා කිරීමට අපි බැඳිලා ඉන්නවා. අපි දැක්කා, ඉතිහාසයේ මාධ්‍යවේදීන්ට සලකපු විධිය. මාධ්‍යවේදීන් පැවති රජයට විරුද්ධව විවේචනයක් එල්ල කරද්දී, ඒ මාධ්‍යවේදීන්ට අත්වෙච්ච ඉරණම, ඒ මාධ්‍යවේදීන්ගේ ජීවිත අහිමි වෙච්ච විධිය, ඒ අයගේ පවුල්වල අයට සිදුවෙච්ච කරදර අපි හොඳට දැක්කා. හැබැයි, අද සියලු මාධ්‍ය ආයතනවලට, සියලු මාධ්‍යවේදීන්ට ජනාධිපතිතුමා සහ අගමැතිතුමාගේ ඉඳලා රජයේ ඕනෑම කෙනෙක්, ඕනෑම අවස්ථාවක විවේචනය කිරීමේ හැකියාව තිබෙනවා. ඒ නිදහස අද ඔවුන්ට තිබෙනවා. යම් යම් හුදෙකලා සිද්ධි වාර්තාවෙලා තිබෙනවා. එවැනි සිද්ධි වාර්තා වුණාම නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන මැදිහත් කරවලා, ඒ පරීක්ෂණ කටයුතු කඩිනම් කිරීමේ වගකීමත් රජය භාරගෙන තිබෙනවා. ඒ නිසා මේ පනත් කෙටුම්පතේ වැදගත්කම පිළිබඳව කථා කරනවා විනා, මාධ්‍යවේදීන්ට එළව එළවා පහර දීලා මාධ්‍ය නිදහස අමු අමුවේ උල්ලංඝනය කරපු කණ්ඩායමක් විසින් මාධ්‍ය නිදහස ගැන කථා කිරීම මම හිතන විධියට එක්තරා ආකාරයකින් විහිළු සහගත තත්ත්වයක්.

මේ වන කොට අපේ රටේ සියලු තොරතුරු ජනතාව දන්නවා. අපි රජයක් හැටියට කිසිම තොරතුරක් වසන් කරලා නැහැ. මොකද, එහෙම වසන් කරන්න අපට අවශ්‍යතාවක් නැහැ. තොරතුරු වසන් කරන්න අවශ්‍ය අපි යම්කිසි නීත්‍යානුකූල හෝ සදාචාරාත්මක නොවන කටයුත්තක යෙදිලා තිබුණොත් විතරයි. ඒ නිසා අපි විශ්වාස කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පත සම්මත වීම හරහා අපේ රටේ අයිතියත්, ජනතාවගේ අයිතියත් තවත් සුරක්ෂිත වනවා වාගේම, ජනතාවට තමන්ගේ ප්‍රශ්න ඉතා කඩිනමින් විසඳා ගන්න පුළුවන් පදනමත් නිර්මාණය වන බව. ඒ නිසා අපි විශේෂයෙන්ම විරුද්ධ පක්ෂයෙන් ඉල්ලීමක් කරනවා, මේ අවස්ථාවේ බිල්ලෝ මැවීමෙන් වළකින ලෙස. කරුණු කාරණා නොදැන බිල්ලෝ මැවීමෙන් වැළකුණොත් මම හිතනවා, විපක්ෂයටත් ඒක හොඳයි කියලා. ආණ්ඩුවට වඩා, බිල්ලෝ මැවීම නතර කළොත් හොඳ වෙන්නේ විපක්ෂයටයි. මොකද, ඔවුන් කළා වාගේ, බිල්ලෝ මවලා ආණ්ඩුව ගෙන යන්න අපි කටයුතු කරන්නේ නැහැ. මම හිතනවා විරුද්ධ පක්ෂය බිල්ලෝ මැවීමෙන් වැළකුණොත් ඔවුන් අද ඉන්න තත්ත්වයට වඩා හොඳ තත්ත්වයකට එන්න පුළුවන් වෙයි කියලා. මොකද, අසත්‍ය ප්‍රකාශ කරලා ජයග්‍රහණ කළ විරුද්ධ පක්ෂයක් ලෙස වාගේම, අසත්‍ය ප්‍රකාශ කරලා විනාශ වුණ විරුද්ධ පක්ෂයක් බවට ඔබතුමන්ලා පත්වන දිනය වැඩි ඈතක නැති බවත් අපි විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. අසත්‍ය ප්‍රකාශ කියලා, නැති දේවල් කියලා, බිල්ලෝ මවලා තමුන්නාන්සේලා 2015දී ආණ්ඩු බලය ගත්තා. නමුත්, තමුන්නාන්සේලාට ඒ ආණ්ඩුව පවත්වාගෙන යන්න බැරිව 2019 දී ඒක කඩා වැටුණා. නැවත ඔබතුමන්ලා අසත්‍ය ප්‍රකාශ කියලා, බිල්ලෝ මවලා ආණ්ඩු බලය ගන්න උත්සාහ කරනවා නම්, තමුන්නාන්සේලාට අද විපක්ෂයවත් පවත්වාගෙන යන්න බැරි වනවා. අද වෙලා තිබෙන්නේ ඒක නේ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. බිල්ලෝ මවන්න ඕනෑ නැහැ නේ. ඔය ඉන්නේ! ආණ්ඩුව තිබෙද්දී බිල්ලෝ මවපු අය ඔය ඉන්නේ. ආණ්ඩුව තිබෙන කාලයේ ඔබතුමන්ලා බිල්ලෝ මවපු හැටි අපි දැක්කා නේ. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමන්ලා ඉස්සර බිල්ලෝ මවපු තරම කොච්චර ද කිව්වොත්, ඔබතුමන්ලාගේ වගකීම වෙලා තිබුණේ බිල්ලෝ මැවීම විතරයි. ඔබතුමන්ලා පාතාලය පාවිච්චි කරපු විධිය, එදා ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ඇමතිවරු පාතාලය රැකපු විධිය, පාතාලයට රැකවරණය දීපු විධිය අපෙන් අහ ගන්න එපා. අපි ඒවා කථා කරන්න කැමැති නැහැ. අප ලවා ඒ දේවල් කියවා ගන්න හදන්න එපා. මාධ්‍ය ආයතනවලට, මාධ්‍යවේදීන්ට මෙතැන කොහොමද එදා තර්ජනය කළේ? තමුන්නාන්සේලාගේ ඉදිරි පෙළේ අය මාධ්‍යවේදීන්ගේ නම් කියලා තර්ජනය කළ හැටි එදා අපි දැක්කා නේ. තමුන්නාන්සේලා එහෙම තර්ජනය කරලායි මාධ්‍ය නිහඬ කරන්න හැදුවේ. අද අපට තේරෙනවා, අපි රජයක් හැටියට සද්භාවයෙන් ඉදිරිපත් කරන පනත් කෙටුම්පත්, යෝජනා දිහා තමුන්නාන්සේලා තමුන්නාන්සේලාගේ දෘෂ්ටි කෝණයෙන් බලන බව. තමුන්නාන්සේලා ඒ ගැන බලන්නේ, තමුන්නාන්සේලාගේ දෘෂ්ටි කෝණයෙන්. තමුන්නාන්සේලා බලයේ හිටියා නම් තමුන්නාන්සේලා මේ පනත් පාවිච්චි කරන ආකාරය අනුව තමයි මේ අදහස් ප්‍රකාශ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාවගේ නිදහස උපරිම වශයෙන් ආරක්ෂා කරන්න අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ මේ රජය බැඳිලා ඉන්නවා. ඒ වාගේම මාධ්‍ය ආයතන සහ මාධ්‍යවේදීන්ට තිබෙන නිදහස උපරිම වශයෙන් ආරක්ෂා කරන්න අපේ රජය බැඳිලා ඉන්න බවට අපි නැවතත් සහතික වනවා. ඒ නිදහස, අපි සෘජුව ගෙනෙන පනත්වලින් හෝ අනියමින් අහිමි කරන්න කිසිම සූදානමක් නැහැ කියලා මම ඉතා වගකීමෙන් ප්‍රකාශ කරනවා. මෙය රටටත්, ජනතාවටත් සේවා සපයා ගැනීමේදී සහ රටක් හැටියට ජාත්‍යන්තරය ඉදිරියට යද්දී විශාල පිළිගැනීමක් ලැබෙන පනත් කෙටුම්පතක් බව සඳහන් කරමින්, මෙම පනත් කෙටුම්පතට සම්මත කර ගැනීමට ඔබ සියලුදෙනාගේ සහයෝගය ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින්, මා නිහඬ වනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன் அவர்கள்! உங்களுக்கு 10 நிமிடங்கள் உண்டு.

[மு.ப. 11.55]

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறுகின்ற தனிப்பட்ட தரவுப் பாதுகாப்பு சட்டமூலம் மீதான விவாதத்திலே எனக்கும் பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன். முதலாவதாக ஓர் அஞ்சலியைச் செலுத்த விரும்புகின்றேன். மன்னார், பேசாலையைச் சேர்ந்த முன்னாள் அதிபர் ஞானப்பிரகாசம் அன்ரன் பச்செக் அவர்கள் நேற்றையதினம் இறைபதம் அடைந்தார். அவர் நீண்டகாலமாக இலங்கைத் தமிழரசுக் கட்சியினுடைய உறுப்பினராகவும், தந்தை செல்வநாயகம் அவர்கள் மன்னாருக்கு வருகின்றபோது அவருடைய பேச்சாளராகவும் இருந்தவர். யூலைக்கலவரம் இடம்பெற்ற காலப்பகுதியில்கூட, அவர் மக்களுடைய தேவைகள்கருதி மன்னாரிலிருந்து கொழும்புக்கு வந்து சென்றிருக்கிறார். அவருக்கு எனது அஞ்சலியை இந்த சபையினூடாகச் செலுத்திக் கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, இந்த தனிப்பட்ட தரவுப் பாதுகாப்பு சட்டம் என்பது தேவையான ஒரு விடயமாக இருந்தாலும், டிஜிட்டல் மயப்படுத்தப்படுகின்றபோது, அவற்றை ஆட்சியாளர்கள் தங்களுடைய தேவைகளுக்குப் பயன்படுத்தாமல் இருந்தால், இந்தச் சட்டம் உண்மையில் பெறுமதியானதாக இருக்கும் என்பதை நான் இந்த நேரத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

தற்பொழுது இந்த நாட்டிலுள்ள மக்கள் ஒரு போராட்ட வாழ்க்கைக்குள் தள்ளப்பட்டிருக்கிறார்கள். குறிப்பாக, ரஷ்யா - உக்ரைன் மோதல் தொடங்குவதற்கு முன்னரே, எங்களுடைய மக்கள் போராட்டமிக்க ஒரு வாழ்க்கை முறைக்குள் தள்ளப்பட்டிருக்கிறார்கள். அதன் தொடர்ச்சியாக இன்று மக்கள் நீண்ட வரிசைகளில் நின்றுதான் ஒவ்வொரு பொருளையும் பெற்றுக்கொள்ள வேண்டுமென்ற சூழ்நிலை உருவாகியிருக்கிறது.

இதற்குப் பிரதான காரணம், அரசாங்கத்தினுடைய தவறான கொள்கை வகுப்பு என்பதை நான் இந்த நேரத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன். அமைச்சரவை அந்தஸ்துள்ள அமைச்சர்கள் அரசாங்கத்தினுடைய கொள்கை ரீதியான தவறுகளைச் சுட்டிக்காட்டுகின்றபோது, அவர்களைப் பதவி நீக்கம் செய்கின்ற ஓர் அரசாங்கமாக தற்பொழுது இந்த அரசாங்கம் செயற்பட்டுக்கொண்டிருக்கிறது என்பதை நான் இந்த நேரத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன். இதனால், அமைச்சர்கள் மற்றும் அரசாங்கத் தரப்புப் பாராளுமன்ற உறுப்பினர்கள்கூட, அரசாங்கத்தினுடைய தவறான கொள்கை தொடர்பில் வெளிப்படையாகக் கருத்துச் சொல்லமுடியாத ஒரு சூழ்நிலைக்குத் தள்ளப்பட்டிருக்கிறார்கள். நாங்கள் அவர்களுடன் தனிப்பட்ட ரீதியாகக் கதைக்கும்போது, "நீங்கள் எப்படியிருக்கின்றீர்கள்?" என்று கேட்டால், "இந்த நாடு தற்போது இருக்கின்ற சூழ்நிலையில் நாங்கள் எப்படி நன்றாக இருக்கமுடியும்?" என்று பதில் சொல்கிறார்கள். ஆகவே, அரசாங்கத்தினுடைய கொள்கை வகுப்பாளர்கள் நாட்டு மக்களுடைய நலன்கருதிச் சிந்திக்கவேண்டும் என்று நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நேற்றைய தினம் பொதுநிர்வாக அமைச்சால் ஒரு சுற்றறிக்கை வெளியிடப் பட்டிருக்கிறது. அதில் அரச உத்தியோகத்தர்களுக்கு மாதாந்தம் கொடுக்கப்படுகின்ற மேலதிக எரிபொருள் கொடுப்பனவு முற்றாக நீக்கப்படுவதாகக் குறிப்பிடப்பட்டுள்ளது. இந்த நாட்டுக்குப் பலமாக இருக்கின்ற அரச சேவையாளர்கள் மிகவும் கஷ்டமான சூழ்நிலையில் தங்களுடைய சேவையைச் செய்கின்றபோது, தங்களுக்குக் கொடுக்கப்படுகின்ற மேலதிக எரிபொருள் கொடுப்பனவை நிறுத்துவதென்பது அவர்களுக்கு மிகுந்த ஏமாற்றத்தையும் சுமையையும் கொடுக்கின்றது. ஆகவே, அரச உத்தியோகத்தர்களுக்கு மாதாந்தம் கொடுக்கப்படுகின்ற மேலதிக எரிபொருள் கொடுப்பனவை நீக்குவதான இச்சுற்றறிக்கையை மீள்பரிசீலனை செய்ய வேண்டுமென்று நான் இந்த நேரத்தில் கௌரவ அமைச்சர் நாமல் ராஜபக்ஷ அவர்களைக் கேட்டுக்கொள்கின்றேன்.

தற்பொழுது எங்களுடைய வட பகுதி மீனவர்கள் இந்திய இழுவைப் படகுகளின் செயற்பாட்டால் மிகவும் கஷ்டமான சூழ்நிலையை எதிர்நோக்கியிருக்கிறார்கள். அவர்களால் தங்களுடைய வாழ்க்கையைக் கொண்டுநடாத்த முடியாதிருக் கின்றது. இந்த விடயம் தொடர்பாக நாங்கள் தொடர்ச்சியாக பாராளுமன்றத்தில் கதைத்து வருகின்றோம். அப்போ தெல்லாம், "இவ்விடயம் தொடர்பில் இந்தியப் பிரதமருடன் கதைத்து, உரிய தீர்வைப் பெற்றுத்தருவோம்" என்று கடற்றொழில் அமைச்சர் இங்கே வாக்குறுதி வழங்குவார். எனினும், அது தொடர்பில் எந்த முயற்சியும் எடுக்கப் பட்டதாகத் தெரியவில்லை. இந்திய இழுவைப் படகுகளின் பிரச்சினை விடயத்தில் எங்களுடைய மக்கள் தொடர்ச்சியாக ஏமாற்றப்பட்டுக்கொண்டு இருக்கிறார்கள். அதைவிட, கடற்றொழில் அமைச்சருடைய சில செயற்பாடுகள் மக்கள் மத்தியில் விசனத்தை ஏற்படுத்தியுள்ளதோடு, அதனால் சில பிரச்சினைகளும் எழுந்திருக்கின்றன. கௌரவ மஹிந்த அமரவீர அவர்கள் கடற்றொழில் அமைச்சராக இருந்தபோது கூட, இப்படியான பிரச்சினைகள் ஏற்பட்டன. அப்பொழுது அவர், இப்பிரச்சினையைச் சரியான முறையில் அணுகி, கடற்படையினரின் உதவியுடன் எங்களுடைய மீனவர்கள் கடற்றொழிலில் ஈடுபடுவதற்குரிய வழிவகைகளை ஏற்படுத்திக் கொடுத்திருந்தார். ஆனால், தற்போதைய கடற்றொழில் அமைச்சருக்கு எதிராக அதிகாரிகள் கதைத்தால், அவர் அந்த நிர்வாகத்தையே மாற்றுகின்ற ஒரு சூழ்நிலை காணப்படு கின்றது. எனவே, இப்பிரச்சினையை வெளிநாட்டு அலுவல்கள் அமைச்சர் கௌரவ ஜீ.எல். பீரிஸ் அவர்கள் கையாண்டு, அதற்கு உரிய தீர்வைப் பெற்றுத்தருவதற்கு முயற்சி எடுக்கவேண்டுமென்று நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
Hon. Member, regarding that issue of Indian fishermen, the Hon. Minister of Fisheries has been speaking in the Cabinet and also with his counterpart of India to come to an understanding and find a solution for that. So, I request you also, when you meet your friends on that side, without having coffee and tea, to take up this issue with them so that we all can come to an understanding.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you, Hon. Minister.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
கௌரவ அமைச்சர் அவர்களே, நாங்கள் இந்தப் பிரச்சினை தொடர்பில் தொடர்ச்சியாகக் கூறி வருகிறோம். ஆனால், அதைத் தீர்த்துவைக்கக்கூடிய நிலைமையில் கடற்றொழில் அமைச்சர் அவர்கள் இல்லை. இந்த விடயத்தை வேறோர் அமைச்சர் கையாள வேண்டும் என்பதுதான் என்னுடைய கோரிக்கையாக இருக்கிறது. இராஜாங்க அமைச்சர் கஞ்சன விஜேசேகர அவர்களிடமும் நான் இந்த விடயம் தொடர்பில் கூறியிருக்கிறேன். கடற்றொழில் அமைச்சரின் பிழையான அணுகுமுறை காரணமாகத்தான் வடக்கு மீனவர்களுடைய இப்பிரச்சினை மென்மேலும் அதிகரித்துச் செல்கிறது என்பதை நான் இந்த நேரத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன். பிராந்திய உறவு நடவடிக்கைகள் இராஜாங்க அமைச்சர் கௌரவ தாரக பாலசூரிய அவர்கள் இங்கு இருக்கின்றார். இந்த விடயத்தை வெளிநாட்டு அமைச்சு கையாள வேண்டுமென்று நான் வெளிநாட்டு அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்திலும் கூறியிருக்கிறேன்.

அடுத்து, எங்களுடைய விவசாயிகள் தொடர்பாகக் கூற விரும்புகின்றேன். சேதனப் பசளை தொடர்பிலான அரசாங்கத்தினுடைய கொள்கை காரணமாக விவசாயிகள் பல பிரச்சினைகளை எதிர்கொள்கிறார்கள். அவர்கள் கொள்கையளவில் அதை ஏற்றுக்கொண்டாலும், அதனை நடைமுறைப்படுத்துவதற்கு அரசாங்கம் முன்னெடுத்த நடவடிக்கைகளால் தான் அவர்கள் பிரச்சினைகளை எதிர்கொள்கிறார்கள். அது மாத்திரமல்லாமல், உரிய விளைச்சல் கிடைக்காததன் பாதிப்பை தற்பொழுது அவர்கள் அனுபவித்துக் கொண்டிருக்கிறார்கள். யூரியாவை வழங்குவதற்கு அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டுமென்பது அவர்களுடைய கோரிக்கையாக இருக்கிறது. கமத்தொழில் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் யூரியாவை இறக்குமதி செய்வதற்கு அரசாங்கம் அனுமதி வழங்கியிருப்பதாகக் கூறப்பட்டது. விவசாயிகள் யூரியாவை என்ன விலைக்குப் பெற்றுக்கொள்ள முடியும்? என்று நான் அந்தக் கூட்டத்தில் கேட்டிருந்தேன். ஆனால், அதற்குரிய பதில் கிடைக்கப் பெறவில்லை. கௌரவ அமைச்சர் அவர்களே, விவசாயிகள் சாதாரண விலைக்கு யூரியாவைப் பெற்றுக்கொள்வதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். ஏனென்றால், அதனை விற்பனை செய்வதற்கு தனியாருக்கு அனுமதி வழங்கப்பட்டிருக்கிறது. அவர்கள் நினைத்த விலைக்கு அதனை விற்கிறார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது. உரையை முடித்துக்கொள்ளுங்கள்!

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
இன்று ஒவ்வொரு பொருளும் அதனுடன் சம்பந்தப்பட்ட சங்கங்கள் தீர்மானிக்கின்ற விலைக்கு விற்பனை செய்யப்படுகின்ற நிலைமையே இருக்கின்றது. யூரியாவின் விலையிலும் அப்படி நடக்காமல், சாதாரண விவசாயிகளும் அவற்றைப் பெற்றுக்கொள்ளக்கூடிய வகையில், அதன் விலை அமைய வேண்டுமென்று நான் இந்த அரசாங்கத்தைக் கேட்டுக்கொள்கிறேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Tharaka Balasuriya. You have 15 minutes.

[අ.භා. 12.05]

**ගරු තාරක බාලසූරිය මහතා (කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தாரக பாலசூரிய - பிராந்திய உறவு நடவடிக்கைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Tharaka Balasuriya - State Minister of Regional Co-operation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Personal Data Protection Bill එක පිළිබඳව කථා කරන්න විනාඩි 15ක් වාගේ කාලයක් ලබා දීම ගැන ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේක ඉතාම වැදගත් පනත් කෙටුම්පතක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෑතකදී දියුණු වුණු රටවල් දෙස බැලුවොත් අපට පෙනෙනවා ඒ රටවල digitalization process එක සෑහෙන තරම් ඉදිරියට ගිහින් තිබෙන බව. පසුගිය පාර්ලිමේන්තු සැසිවාරය පැවැති කාල සීමාවේදී අපේ පාර්ලිමේන්තුවේ කණ්ඩායමක් එස්තෝනියාවට යැව්වා. මමත් එයට සහභාගි වුණා. ඒ අවස්ථාවේදී digitalization ගැන කථා කරද්දී, එස්තෝනියාව වාගේ රටවල digitalization process එක කොයි තරම් ඉදිරියට ගිහින් තිබෙනවාද කියන කාරණය ගැන මම ඇත්ත වශයෙන්ම පුදුම වුණා.

මේකේ භයානක පැත්තකුත් තිබෙනවා. "The Great Hack" කියා film එකක් තිබෙනවා. ඒ film එක බැලුවොත් අපට තේරුම් ගන්න පුළුවන් වෙනවා, Big Data, එහෙම නැත්නම් තොරතුරුවලින් රටක් වුණත් පාලනය කරන්න, නැත්නම් රටක ආණ්ඩුවක් වුණත් වෙනස් කරන්න හැකියාවක් ලැබෙන්නේ කොහොමද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා එයට උදාහරණයක් දෙන්නම්. Facebook වාගේ පාවිච්චි කළොත්, දවසකට එක පුද්ගලයෙකුගේ data points 5,000ක් රඳවා ගන්නවා. ඒ කට්ටිය බලාපොරොත්තු වෙනවා ඉදිරියේදී එය දවසකට data points 70,000ක් විතර ප්‍රමාණයකට වැඩි කරන්න. එතකොට ඕනෑම කෙනෙකුගේ තොරතුරු අරගෙන ඔහු යම්කිසි මට්ටමකට පොළඹවන්න පුළුවන්, ඔහු කැමැති නැති දෙයක් වුණත් කරන්න. මා තවත් උදාහරණයක් ගන්නම්. අපි දන්නවා බොහෝ mobile phonesවල facial recognition වාගේ පහසුකම් තිබෙන බව. දැන් අලුතින් තිබෙන Apple iPhone වර්ගයේත් facial recognition පහසුකම් තිබෙනවා. නැත්නම් thumb එක තියන්නයි තිබෙන්නේ. ඉදිරියේදී හැකියාවක් ලැබෙනවා phone එකට මුහුණ තැබුවාට පසු ඒ පුද්ගලයා සතුටින් සිටිනවාද, දුකින් සිටිනවාද, නැත්නම් තරහින්ද සිටින්නේ කියා biometrics බලන්න. මේ අනුව බැලුවාම, මෙවැනි පනත් ගෙන ඒම විශේෂයෙන්ම වැදගත් වනවා.

මෙවැනි පනත් කෙටුම්පතක් ගෙන ඒමේදී විශේෂයෙන්ම ප්‍රතිපත්තිමය කාරණා 5ක්, 6ක් සම්බන්ධව අනිවාර්යයෙන් කල්පනා කරන්න අපට සිදු වෙනවා. එක කාරණාවක් තමයි, ඒ තිබෙන දත්ත ඒ කාරණාවට පමණයි පාවිච්චි කරන්නේ කියන එක යම්කිසි විධියකට මේ පනතින් සුරක්ෂා වීම. If we take the purpose of this Bill, there are a few areas which need to be covered. One of the underlying principles is that data should

[ගරු තාරක බාලසූරිය මහතා]

only be used in specifically stated ways. Another principle is that data is not to be stored for a longer period than necessary. Otherwise, in this digital age, data can be stored for a very long period of time and can be used for other purposes. Another guiding principle that has been included in this Bill is that data has to be used in the relevant, aforesaid ways and that data has to be kept safe and secure. So, all those aspects have been looked after by this particular Bill.

විපක්ෂයේ මන්ත්‍රීවරු සාධාරණ කාරණා කිහිපයක් ඉදිරිපත් කළා. මම අපේ ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමා සමඟත් එම කාරණා පිළිබඳව සාකච්ඡා කළා. එකක් තමයි, මෙම පනත් කෙටුම්පත, තොරතුරු දැනගැනීමේ පනත සමඟ ගැටෙනවාද කියන කාරණය. ඒ සම්බන්ධව අපේ ගරු ඇමතිතුමා පැහැදිලිව කිව්වා, එහෙම ගැටීමක් සිදු වන්නේ නැහැ කියලා. තොරතුරු දැනගැනීමේ පනතේ Section 4 යටතේ පැහැදිලිව කියා තිබෙනවා අනෙක් පනත් ඒ පනතින් supersede වෙනවා කියලා; අනෙක් පනත් සමඟ ගැටීමක් ඇති වුණොත්, තොරතුරු දැනගැනීමේ පනත තමයි වැදගත් වන්නේ කියන කාරණය සඳහන් කර තිබෙනවා. එහෙම නම්, මේ ගැන එවැනි අනවශ්‍ය බියක් මවන්න වුවමනාවක් නැහැ.

අනෙක් කාරණාව තමයි, මේ ගරු සභාවේදී විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කිව්වා, මෙම පනත් කෙටුම්පතේ සඳහන්ව තිබෙන Authority එක ස්වාධීන එකක් වෙන්න ඕනෑ කියලා. ඔක්කොම ස්වාධීන කරන්න ඕනෑ කියන කථාව අපි පසුගිය යහ පාලන ආණ්ඩුව කාලයේදීත් ඇහුවා මට මතකයි. හැබැයි, අන්තිමට මොකද වුණේ? බල කේන්ද්‍ර කිහිපයක් ඇති වුණා. මේ පනත් කෙටුම්පතේ සඳහන් ආකාරයට නම්, ඒ අධිකාරිය මොනවා හෝ නිර්දේශ ඉදිරිපත් කරනවා නම්, අවසානයේදී ඒවා මේ පාර්ලිමේන්තුවේ අනුමත වෙන්න ඕනෑ. ඒ නිසා ඒ මොන නිර්දේශ ඉදිරිපත් කළත් මේ පාර්ලිමේන්තුවට යටත්ව තමයි ඒවා ක්‍රියාත්මක වන්නේ. ආයතන ස්වාධීන වෙන්න ඕනෑ කියන කථාව හැම දාම කිව්වාට, ඇත්ත වශයෙන්ම එහි තිබෙන ගැටලු යහ පාලන ආණ්ඩුව කාලය තුළ අපි අත් දැක්කා. බල කේන්ද්‍ර කිහිපයක් ඇති වෙලා ඒවා අතර ගැටුම්කාරී තත්ත්වයක් ඇති වනවා කියන කාරණාව තමයි අපි එහිදී දැක්කේ.

මේ පනත් කෙටුම්පතට අනුව දත්ත ආරක්ෂණ අධිකාරියට පුද්ගලයන් පත් කරන්නේ ගරු ඇමතිතුමායි. නමුත්, ඇමතිවරු සුදුසු පුද්ගලයන් පත් කරනවා නම්, එතැනදී ගැටලුවක් ඇති වන්නේ නැහැ. අපි උදාහරණයකට ගනිමු, අපේ 1990 Ambulance Service එක. අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමන්ලා පත් කළ කණ්ඩායම තමයි තවදුරටත් එය ක්‍රියාත්මක කරන්නේ. හරියට වැඩේ කරනවා නම්, ඒවා වෙනස් කරන්න වුවමනාවක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඇත්ත වශයෙන්ම මේ පනත් කෙටුම්පතේ මූලික අරමුණ වී තිබෙන්නේ, දත්ත ආරක්ෂා කිරීම. මෙහිදී තවත් ගැටලුවක් මතු වෙනවා, දත්ත අයිති කාටද කියලා. මගේ පෞද්ගලික මතය අනුව නම් ඇත්ත වශයෙන්ම දත්ත අයිති වෙන්න ඕනෑ ආණ්ඩුවටවත්, කොම්පැනිවලටවත් නොවෙයි. අදාළ පුද්ගලයාට තමයි ඒ දත්ත අයිති වෙන්න ඕනෑ. ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමා පැහැදිලිව කිව්වා, "මේ පනත් කෙටුම්පතේ තවත් මොනවා හරි අඩු පාඩු තිබෙනවා නම් ඒවා යෝජනා හැටියට එවන්න. එතකොට ඒ යෝජනා සලකා බලා, තවත් මොනවා හරි වෙනස්කම් කරන්න ඕනෑ නම්, ඒ වෙනස්කම් කරන්නත් මේ රජය බැඳී ඉන්නවා" කියලා. කෙසේ වෙතත්, අපි digitalization process එක ක්‍රියාත්මක කරනවා නම්, මෙම පනත් කෙටුම්පත සම්මත කරගැනීම අපට අනිවාර්යයෙන් වැදගත් වෙනවා. රජයේ ආයතනයකට ගියාම ඒකෙන් මොකක් හෝ වැඩක් කරගන්න වෙන්නේ බොහොම අමාරුවෙන් බව අපි දන්නවා. ඒ සඳහා එක්කෝ යම්කිසි බලයක් පාවිච්චි කරන්න වෙනවා; එහෙම නැත්නම් යම්කිසි මුදලක් දෙන්න වෙනවා. ඉතින් ඒ ක්‍රමය වෙනස් කරන්න නම්, අනිවාර්යයෙන් digitalization process එකට යන්න ඕනෑ.

පහසුව අතින් බැලුවත් මෙය වැදගත්. අපට National Identity Card එකක් ගන්න ඕනෑ වුණොත්, පොලිස් වාර්තාව, වෙනත් වාර්තා ඇතුළු තොරතුරු විශාල ප්‍රමාණයක් දෙන්න වෙනවා. Passport එක ගන්න කොටත් ඒ තොරතුරු ටිකම තමයි ඒ ආයතනයට දෙන්න ඕනෑ. එහෙම නම්, ඒ ටික එකිනෙක සම්බන්ධ කරගත්තොත් - link කළොත් - digital ID එක විතරක් පාවිච්චි කරලා, ගෙදර ඉඳගෙනම request එකක් කරලා අලුත් passport එකක් ලබා ගැනීම වුණත්, අලුත් National Identity Card එකක් ලබා ගැනීම වුණත්, එහෙම නැත්නම් වෙනත් සේවාවක් ලබා ගැනීම වුණත් ලෙහෙසියෙන්ම කරගන්න ජනතාවට පුළුවන් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මා හිතනවා, මෙය ඉතාම හොඳ පනත් කෙටුම්පතක් බව. මේ පනත් කෙටුම්පතේ අඩු පාඩු තිබෙනවා නම්, ඒ අඩු පාඩු නිවැරදි කරගැනීම සඳහා කටයුතු කරන්නත් මේ රජය සූදානම්.

විශේෂයෙන්ම Big Data ගැනත් මා මෙතැනදී වචනයක් දෙකක් හෝ කථා කරන්න ඕනෑ. හුඟක් වෙලාවට පෞද්ගලික ආයතන තමයි ඒ තොරතුරු සල්ලිවලට ගන්නේ. මෙහිදී හැමෝම වාගේ ඇහුවා, ඇමෙරිකානු මැතිවරණයේදී Cambridge Analytica කියන කොම්පැනිය ඒ තොරතුරු පාවිච්චි කළේ කොහොමද කියලා. ඇමෙරිකාවේ තිබුණු ඒ මැතිවරණයේදී විතරක් නොවෙයි, ආර්ජන්ටිනාවේ, හයිටිවල තිබුණු මැතිවරණවලදීත් Cambridge Analytica වාගේ companies ගිහිල්ලා තොරතුරු ගත්තා. ඒ තොරතුරුවලින් යම්කිසි ආකාරයට පුද්ගලයෙකු පොළඹවන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධයෙන් සූක්ෂ්මව සොයා බලා ඒ අනුව කටයුතු කරන්න ඒ අයට පුළුවන් වුණා. අපි මෙවැනි උදාහරණයකුත් ගනිමු. අපි Facebook, නැත්නම් Google Maps පාවිච්චි කරලා ළඟම තිබෙන කෝපි කඩේ කොතැනද කියලා බැලුවොත්, Facebook එකේ වුණත්, YouTube එකේ වුණත් ඒ හැම එකකින්ම අපට බලන්න සිදු වන්නේ, කෝපි පිළිබඳවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරියේදී අපි ලෝකය යන පැත්ත දෙසත් බලන්න වුවමනායි කියා මම හිතනවා. විශේෂයෙන්ම චීනයේ Shenzhen වාගේ නගරවල අද තිබෙන්නේ digital wallet එකක්. Mobile phone එකෙන් තමයි ඒ අය ඔක්කොම දේවල් කරන්නේ. ඒ අය මුදල් භාවිතාවක් නැහැ. ඒ අය අයිස්ක්‍රීම් එකක් ගන්න එක වුණත් ඒ විධියටයි කරන්නේ. ඒ නගරයේ අයිස්ක්‍රීම් වෙළෙන්දෙකු ඉන්නවා නම්, අදාළ barcode එක ඇතුළත් කරනවා. එතකොට ගත්තු අයිස්ක්‍රීම්වලට අදාළ මුදල් ප්‍රමාණය තමන්ගේ account එකෙන් අඩු වෙනවා. ලෝකය ඒ පැත්තට යනවා නම්, අපට ඒක වෙනස් කරන්න බැහැ. ඇත්ත වශයෙන්ම ඒ ක්‍රම මඟින් ජනතාවට විශාල සේවාවක්, පහසුවක් ලැබෙනවා. එහෙම නම්, දත්ත ආරක්ෂා කරගන්න මූලික නීති හදන්න අපටත් සිදු වෙනවා.

මේ පනත් කෙටුම්පත ඉතා වැදගත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙවැනි පනත් කෙටුම්පතක් ගෙනාපු එක ගැන විශේෂයෙන්ම ගරු ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. විපක්ෂයටත් මේ සම්බන්ධයෙන් මොනවා හෝ සාධාරණ විවේචන තිබෙනවා නම් ඒ විවේචනත් අපි සැලකිල්ලට ගන්නවා. ඉදිරියේ දී මේ පනත් කෙටුම්පතට amendments ගෙනෙනවා නම් ඒ සඳහාත් අපේ කිසිම විරෝධතාවක් නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.17]

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாகிர் மாகார்)
(The Hon. Imthiaz Bakeer Markar)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලික දත්ත ආරක්ෂණ නීතියක අවශ්‍යතාව ගැන කාගෙවත් විවාදයක් නැහැ, මතභේදයක් නැහැ කියලා මම හිතනවා. එය කවුරුත් පිළිගන්නා කරුණක්. විශේෂයෙන් අද වාගේ ඩිජිටල් යුගයක මෙවැනි පනත් කෙටුම්පතක අවශ්‍යතාව අවිවාදයෙන් පිළිගත යුතු කාරණයක්. නමුත්, මේ ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මිනිසුන්ගේ නිදහස් උරුමයන් අභියෝගයට ලක්වීමක් ගැන, තර්ජනයට ලක්වීමක් ගැන, අදාළ පාර්ශ්ව රාශියකින් බිය, සැක, සංකා පළ වෙලා තිබෙනවා. දෙවැන්න නම්, මාධ්‍ය නිදහස අහිමි කිරීම පිළිබඳව, තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ තිබෙන අභියෝග ගැන කරුණු ඉදිරිපත් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ අවුරුදු 5කට සැරයක් ඡන්දයෙන් මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීම විතරක් නොවෙයි. විවිධ ප්‍රශ්න පිළිබඳ තීන්දු තීරණ ගන්නා වෙලාවට ඒ කරුණු පිළිබඳ අදාළ සියලු පාර්ශ්වවල අදහස් ගැන සැලකිල්ලක් දැක්වීම, උනන්දු වීම, සම්මුතියකට ඒම, එකඟත්වයකට ඒම ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක තිබෙන්න ඕනෑ කාරණයක්. ඒ අදහස් මායිම් කරන්නේ නැතිව අපි උද්ධච්ඡ විධියට වැඩ කරනවා නම්, අධිපතිවාදී විධියට වැඩ කරනවා නම් ඒක ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට ගැළපෙන්නේ නැහැ. මේ කරුණ ගැන ඊයේ “Daily Mirror” පුවත්පතේ සඳහන් කරලා තිබුණා. මේ රටේ මාධ්‍ය සමාජයම මේ සඳහා විරුද්ධත්වය පළ කරලා තිබෙනවා. මේ රටේ ප්‍රධාන පැරණි මාධ්‍ය සංවිධාන සියල්ලත් විරුද්ධත්වය පළ කර තිබෙනවා. මම ඒ සංවිධානවල නම් ටික කියන්න කැමතියි. මම එම නම් ටික “Daily Mirror” පුවත් පතෙන් උපුටා දක්වන්නම්: Newspaper Society - ජනමාධ්‍ය හිමිකරුවන්ගේ සංගමය, Free Media Movement - නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, Sri Lanka Working Journalists Association, Tamil Media Alliance, Sri Lanka Muslim Media Forum, Federation of Media Employees’ Trade Unions, South Asian Free Media Association and SLPI යනාදී පුවත්පත් ආයතන සියල්ල අත්සන් කරලා, තමන්ට තිබෙන එම තර්ජනයන් පිළිබඳව කරුණු ඉදිරිපත් කර තිබෙනවා. මීට අමතරව තරුණ වෘත්තීයවේදීන්ගේ සංවිධානය විස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරලා තිබුණා. Transparency International Sri Lanka මේ සම්බන්ධව කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. ඇයි? ඒ ගොල්ලන් ඉල්ලීමක් කරනවා, අදාළ පාර්ශ්ව එක්ක සාකච්ඡා කරන්න ඕනෑ කියලා. මෙරටේ පුරවැසි අයිතිවාසිකම් ගැන උනන්දු වන, මෙවැනි විරෝධතා දක්වන සංවිධාන එක්ක සාකච්ඡාවකට යන්න ආණ්ඩුව මැළි වෙන්න හොඳ නැහැ. අපට පුළුවන් මේක කල් දාලා ඒ ගොල්ලන් එක්ක සාකච්ඡා කරන්න. ඒ ගොල්ලන්ගේ අදහස්වලට සාවධානව ඇහුම්කන් දීමක් කරන්න පුළුවන්. ඒ අනුව සම්මුතියකට එන්න පුළුවන්කමක් තිබෙනවා. මම ඉල්ලා සිටිනවා කරුණාකර කලබල වෙන්නේ නැතිව ඒ වාගේ තත්ත්වයට යන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි තව පනත් ලෝකයේ ඉදිරිපත් කර තිබෙනවා. මුලින්ම යුරෝපා සංගමය ගෙනාවා. ඊට පස්සේ එක්සත් රාජධානිය මෙවැනි පනතක් ගෙනාවා. ඉන්දියාව ගෙනාවා. ඉන්දියාවේ පනත කෙටුම්පත් කිරීමේ දී ජනමාධ්‍ය නිදහස සම්බන්ධයෙන් සඳහන් කරලා තිබුණා. නමුත්, ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ උදවිය ඒකෙන් සෑහීමකට පත් වෙලා නැහැ. අදත් අරගළ කරනවා. ඉතින් මේ තත්ත්වය යටතේ ලංකාවේ ඉතිහාසය දිහා බලද්දි, මාධ්‍ය නිදහස්වාදය ගැන කල්පනා කරනකොට, වර්ෂ 2003, 2004 වාගේ කාලයේ දී සාපරාධී අපහාසය පිළිබඳව දණ්ඩ නීති සංග්‍රහයේ වගන්තිය ඉවත් කරන්න එදා ආණ්ඩුව කටයුතු කළ ආකාරය මට කල්පනා වෙනවා. විත්ති කූඩුවට, පොලිස් උසාවියට මාධ්‍යකරුවන්ව ගෙනයන තත්ත්වය එකෙන් අහෝසි කළා. පුවත්පත් මණ්ඩලය පනත සංශෝධනය කළා. දණ්ඩ නීති සංග්‍රහය, අපරාධ නීතිය සංශෝධනය කළා. ඒ වාගේම 2004දී තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ඉදිරිපත් කරන්න මූල බීජය පටන් ගත්තා; කරුණු ඉදිරිපත් කළා. නමුත්, 2004 දී අනපේක්ෂිත විධියට ඒ ආණ්ඩුව පරාජයට පත් වුණා. පරාජයට පත් වුණාට පස්සේ, 2016 වෙනතුරුම තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනත ගෙනෙන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ කරුණ සම්බන්ධයෙන් ආණ්ඩුව පස්ස ගැහුවා. 2016දී පැවැති පසුගිය ආණ්ඩුව විසින් තමයි ඒක ගෙනාවේ. අද ඒ තුළින් මොකක්ද වුණේ? ප්‍රජාතන්ත්‍රවාදී ලෝකය තුළ ශ්‍රී ලංකාවේ කීර්ති නාමය ආරක්ෂා වුණා. මම හිතන විධියට, ඒ දවස්වල මහින්ද රාජපක්ෂ මහත්මයා තමයි මානව අයිතිවාසිකම් පිළිබඳව කථා කරන්න ජිනීවාවලට ගියේ. ඊට පස්සේ උතුරේ ජනතාව ගියා. දැන් මේ රටේ හැම ජන කොටසක්ම ඒකට යනවා. කතෝලික ජනතාව යනවා, දේශපාලන නායකයෝ යනවා. සිංහල, දෙමළ කියලා භේදයක් නැහැ, උතුර, දකුණ කියලා භේදයක් නැහැ හැමෝම යනවා. ඇයි එහෙම වෙන්නේ? මේ තීන්දු - තීරණ සාධාරණව කොළඹදී ගන්න; ලංකාවේදී ගන්න. අපේ ජනතාව, සංවිධාන තල්ලු කරන්න එපා, ජිනීවාවලට යන්න; බ්‍රසල්ස්වලට යන්න. සාධාරණය, යුක්තිය ඉල්ලාගෙන තමයි කාදිනල්තුමා ජිනීවාවලට යන්නේ. මේ තත්ත්වය භයානකයි. අනෙක, මේ රටේ අද ලොකු කලකිරීමක් තිබෙනවා. අද මේ රටේ ආර්ථික ප්‍රශ්න ගැන මිනිසුන්ගේ වේදනාවක් තිබෙනවා. ජනතාවට එළවලු ටිකක් ගන්න පුළුවන්කමක් නැහැ, හාල් ටිකක් ගන්න පුළුවන්කමක් නැහැ, ගෑස් ගන්න පුළුවන්කමක් නැහැ, පෙට්‍රල් ටිකක් ගන්න පුළුවන්කමක් නැහැ, භූමිතෙල් ටික ගන්න පුළුවන්කමක් නැහැ. මිනිස්සු පුදුම දුකක් විඳින්නේ. මිනිසුන්ට රස්සාවට යන්න පුළුවන්කමක් නැහැ. ගමනක් ගියොත් ආපසු එන්න විධියක් නැහැ. ඒ ගිය තැන්වල දවස් ගණන් ලඟින්න වෙනවා. මිනිසුන්ගේ මේ දුක, වේදනාව රජය තේරුම් ගත යුතුයි. සුරංගනා කථා කියනවා. සුන්දර කථා කියනවා. 5වැනි දායින් පස්සේ ලයිට් කපන්නේ නැහැ කියනවා. නමුත් නැවත ලයිට් කපනවා. මට මේ වෙලාවේ ධම්ම පදයේ ගාථාවක් මතක් වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම ඒ ගාථාව කථාව අවසානයේදී කියන්නයි හිටියේ. නමුත්, මම කැමැතියි දැන් ඒක උපුටා දක්වන්න. ධම්ම පදයේ ඒ ගාථාව මම කියන්නම්.

"අසාරේ සාරමතිනෝ - සාරේ චා සාර දස්සිනෝ
තේ සාරං නාධිගච්ඡන්ති - මිච්ඡා සංකප්ප ගෝචරා"

"නිසරු දෙය සරු වශයෙන් අවබෝධ කරගත්, සරු දෙය නිසරු ලෙස අවබෝධ කරගත්, මිථ්‍යා සංකල්පනාවන්ට ගොදුරු වූවෝ නිසරු ප්‍රතිඵල ලබන්නාහුය" කියන එක තමයි එහි තේරුම, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද ආණ්ඩු පක්ෂය තුළ අපි දකිමින් සිටින මේ නාය යෑම තුළින් කියවෙන්නේ මේ ගාථාවේ කියැවෙන දේ බව මම සිහිපත් කරන්න කැමැතියි. ඒ නිසා තමුන්නාන්සේලා සරුදේ, නිවැරැදි දේ හරියට තෝරාගෙන තමන්ගේ යටි සිත කියන දේට අවනත වෙලා හරි පාරට එන්න. මේ විධියට මේ රටට යන්න පුළුවන්කමක් නැහැ. සමහර උදවිය කියනවා, "තුන්වේල නොවෙයි, දෙවේල කන්න ලෑස්ති වෙන්න. රට වෙනුවෙන් පරිත්‍යාගයන් කරන්න" කියලා. මේ අය කොයි ලෝකයේ ඉන්නවාද මම දන්නේ නැහැ. මේ තත්ත්වය අවබෝධ කරගන්න ඒ උදවිය සඳළුතලවලින් බිමට බහින්න ඕනෑ. ඒ ප්‍රශ්නවලට උත්තර දෙන්න බැරි වෙන කොට මර්දනය තමයි පිළිතුර. මේ පනත් කෙටුම්පත ගෙන ඒම තුළත් මම දකින්නේත් එයයි. මේ අධිකාරිය පත් කරනවා. ජනාධිපතිතුමාගේ අභිමතය තමයි ඒක තුළ පෙනෙන්නේ. මේක ස්වාධීන ආයතනයක්ද කියන ප්‍රශ්නාර්ථය මේ සියලු සංවිධාන මතු කරනවා. එහෙම යන්න බැහැ.

[ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා]

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් අපි මේ රට ගෙන ගියේ කොතැනටද? කලින් තිබුණු ස්වාධීන කොමිෂන් සභා අහෝසි කළා. ඉහළ අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ වෘත්තිමය අනාගතය අද වෙනකොට නැති කරලා දාලා තිබෙනවා. ඒ ජ්‍යෙෂ්ඨ උදවිය සිටියදී ඊට වඩා පහළ උදවිය ඉස්සරහට අරගෙන තිබෙනවා. මේ තීන්දු - තීරණ අධිකරණයේ ස්වාධීනත්වයට බලපානවා. මේ තීන්දු - තීරණ අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට කැළැලක්; නිගාවක්. මේ තත්ත්වයන් නිසා අපි ලෝකයේ හුදෙකලා වෙනවා. මේ ස්වාධීන කොමිෂන් සභා අහිමිවීම තුළින් මැතිවරණ කොමිසම තමන්ට අභිමත පරිදි පත් කරනවා. මේ අධිකාරියත් ජනාධිපතිතුමාට අවශ්‍ය උදවිය පත් කරන්නයි යන්නේ. ඒක වැරැදියි. ඒක නිසා මම ඉල්ලීමක් කරනවා, කරුණාකර මේ තත්ත්වයට යන්න එපා කියලා. අපි ලෝකයෙන් කොන් වෙලා තිබෙනවා. ශ්‍රී ලංකාවේ කීර්තිනාමය කෙලෙසිලා තිබෙනවා. එදා තොරතුරු දැනගැනීමේ පනත ගෙනැල්ලා, ඒ වාගේම සාපරාධී අපහාසය පිළිබඳ වගන්තිය ඉවත් කිරීම තුළ අපි හොඳ ගමනක් ආවා; ප්‍රගතිශීලී ගමනකට අවතීර්ණ වෙලා තිබුණා. අද සම්පූර්ණයෙන්ම ආපස්සට යාමක් සිදුවනවා. මේවාට ඇහුම්කන් දෙන්න ලැහැස්ති නැත්නම් මේ පනත් කෙටුම්පත සම්මත කරන එක තාවකාලිකව කල් දමන්න. ඒ ගොල්ලන්ට ඇහුම්කන් දීලා, ඒ ගොල්ලන්ව තේරුම් අරගෙන තමුන්නාන්සේලා සම්මුතියකට එන්න සූදානම් නැත්නම්, ඔබතුමන්ලා කාදිනල්තුමාව තල්ලු කළා වාගේ මේ රටේ මාධ්‍ය සමාජයත් තල්ලු කරනවා, ලංකාවේ සාධාරණය බලාපොරොත්තු වෙන්න බැහැ ජීනීවාවලට යන්න කියලා; ජාත්‍යන්තරයට යන්න කියලා. ඒ තත්ත්වය ඇති කරන්න එපා. ඒක මේ රටට හොඳ නැහැ. අපේ රටේ ඉදිරි ගමනට, අනාගතයට ඒක අහිතකර විධියට බලපානවා. ඒක නිසා මීට වඩා කල්පනාකාරීව වැඩ කරන්න කියලා ආණ්ඩුවෙන් මම ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දක්ෂ කථිකයෙක්. ඒ වාගේම සිංහල භාෂාව පිළිබඳව හොඳ හැසිරීමක් තිබෙන නිසා මම ඔබතුමාට කථා කරන්නට තව විනාඩි තුනක් ලබා දෙනවා.

**ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා**
(மாண்புமிகு இம்தியாஸ் பாகிர் மாகார்)
(The Hon. Imthiaz Bakeer Markar)
මම කථාව අවසන් කරන්න හිටියේ, බොහොම ස්තුතියි. ඔබතුමා තරම්ම මම දක්ෂ නැහැ. ඔබතුමා ආණ්ඩුකාරතුමා විධියට කටයුතු කරපු කාලයේ කළ සිංහල කථාවන්ට මම ඇහුම්කන් දීලා තිබෙනවා. බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට එල්ල වෙලා තිබෙන මේ අභියෝගවලට විරුද්ධව, ඒ වාගේම මේ රටේ ජනතාව මුහුණ දීලා තිබෙන ජීවත් වීමේ අරගළය පිළිබඳව, මේ දුෂ්කරතා පිළිබඳව ජනතාවගේ විරෝධය රටට එළිකරන්න හා පාලකයන්ට දැනුම් දෙන්න සමගි ජන බලවේගය ප්‍රජාතන්ත්‍රවාදී විධියට 15වැනි දා විරෝධයක් සංවිධානය කරලා තිබෙනවා. සමගි ජන බලවේගය කියන්නේ මේ රටේ පාර්ලිමේන්තුවේ ප්‍රධාන විපක්ෂ බලවේගය. එය ප්‍රධාන විපක්ෂ බලවේගය බවට පත් කළේ, මේ රටේ ජනතාව. ඒක නිසා සමගි ජන බලවේගය සංවිධානය කරන ඒ විරෝධය ප්‍රජාතන්ත්‍රවාදී අරගළයක්. නිදහස් උරුමයන් වළ දැමීමට විරුද්ධව, ජනතාවගේ දැවෙන ප්‍රශ්නවලට සංවේදී නොවීම පිළිබඳව පාලකයන්ට දැනුම් දීමට තමයි මේ විරෝධය පවත්වන්නේ. ඒ විරෝධයටත් සහභාගී වෙන්න කියලා මා ඉල්ලා සිටිනවා. තමන්ගේ යටි හිත කියන දේවල්වලට අවනත වෙන්න. මේ ආණ්ඩුව තුළ සිදුවන නාය යෑම ඉදිරියේදී තව තවත් වැඩි වෙනවා. තවත් කල් බලාගෙන ඉන්නේ නැතිව ජනතාව වෙනුවෙන් නිවැරදි පාරට එන්න කියලා ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ට ආරාධනා කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු පස්වරු 1.30 දක්වා තාවකාලිකව අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 1.30ට නියෝජ්‍ය කාරක සභාපතිතුමාගේ (ගරු අංගජන් රාමනාදන් මහතා) සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed,* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] *in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Hon. Wasantha Yapabandara. You have 10 minutes.

[අ.භා. 1.30]

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන අද, ඒ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මාධ්‍යවේදීන් කවුද, මාධ්‍යවේදීන් නොවන අය කවුද කියන කාරණය පිළිබඳව ප්‍රශ්නාර්ථයක් නඟන තැනකට පත් වෙලා තිබෙන කාලයක තමයි මේ සාකච්ඡාවට එළඹෙන්නේ. ඇත්ත වශයෙන්ම මේ රටේ මාධ්‍යවේදියා පිළිබඳව තිබෙන ඉතිහාසය ඉතා ප්‍රශංසනීය වාගේම, මාධ්‍යවේදීන්ට එරෙහිව ඇති වුණු සමහර අමිහිරි තත්ත්ව සමඟ අපි කම්පනයට පත් වුණු අවස්ථා ගණනාවක්ද තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, smartphone එකක් තිබෙන හැම කෙනෙකුම මාධ්‍යවේදීන් විධියට හුවා දක්වන්න උත්සාහ කරනවා කියලා අද කොටසක් හිතනවා. අද මුහුණු පොත හරහා සාමාන්‍ය මිනිසුන්ට වාගේම සමාජයේ යම් කාර්යභාරයක් කරන අයගේ චරිත විකෘති කරන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අන්තර්ජාලය හරහා සැරිසරන තොරතුරු, මුහුණු පොත්වල සැරිසරන තොරතුරු සම්පූර්ණයෙන්ම සාවද්‍යයි. කිසිම වග විභාගයකින් තොරව ඒ තොරතුරු හුවමාරු වෙනවා. සිවිල් චරිතවලට එරෙහිව ගෙන යන මේ තොරතුරු අපහරණය පිළිබඳව ලෝකයේ සමහර රටවල Anti Cyberbullying Act වාගේ අණ පනත් ක්‍රියාත්මක වෙනවා. ඇත්තටම ශ්‍රී ලංකාව තුළ ඒ පිළිබඳව තවමත් නීතියක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මුහුණු පොත හරහා ක්‍රියා කරන මේ අය රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වෙලාද මේ කටයුත්ත කරන්නේ කියලා මම ගරු ඇමතිතුමාගෙන් අහනවා. තොරතුරු විකෘති කිරීමට එරෙහිවත්, පෞද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම පිළිබඳවත් පනත් කෙටුම්පතක් ගෙන ඒමට ක්‍රියා කිරීම පිළිබඳව ගරු අධිකරණ අමාත්‍යතුමාටත්, ගරු නාමල් රාජපක්ෂ අමාත්‍යතුමාටත් අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, මේ තොරතුරු තමයි සමහර අපහරණවලට අද හේතු වෙලා තිබෙන්නේ.

අද බැංකුවල වේවා, යම් කිසි තොග ගබඩාවල වේවා රාජ්‍ය ආයතන සම්බන්ධිතව සාකච්ඡා වෙන සමහර දෑ පිළිබඳව බැංකු ක්‍රමය තුළ චකිතයක් ඇති වෙනවා. ඒකට අපි කියනවා banking panic එකක් කියලා. සමහර මාධ්‍ය ආයතන -වගකීම් විරහිත තොරතුරු සපයන්නන්- විසින් බැංකුවල තිබෙන වත්කම් ප්‍රමාණය මෙච්චරයි, තෙල් ගබඩාවල තිබෙන තෙල් ප්‍රමාණය මෙච්චරයි, තව පැය කිහිපයකට තමයි තෙල් ඉතිරි වෙලා තිබෙන්නේ, තව දින කිහිපයකින් තෙල් අර්බුදයක් හට ගන්නවා යනාදී වශයෙන් වහ වහා තොරතුරු විකෘති කිරීම තුළින් සිදු වන්නේ කුමක්ද?

"බැංකුවක තැන්පත් කර තිබෙන අරමුදල් අතිශය අවදානම් සහගතයි, තව නොබෝ වේලාවකින් මේ බැංකුවේ අරමුදල් අවසානයට පත් වෙනවා" කියලා තැන්පතුකරුවන්ට සංශයක් - සැකයක්- ඇති කළොත් මොකද වෙන්නේ? ඒ මුදල් ටික තැන්පතුකරුවන් වහ වහා බැංකුවලින් ඉවත් කර - withdraw - ගන්නවා. මේක තමයි තෙල් ගබඩා සම්බන්ධයෙනුත් සිදු වන්නේ. වහ වහා තෙල් ඉවත් කර ගන්නකොට සිදු වන්නේ මොකක්ද? ස්වාභාවිකවම තෙල් හිඟයකට මුහුණ දෙනවා. ඒ විධියට බැංකුවක අරමුදල් වහ වහා withdraw කර ගන්න ගියොත්, මේ වාගේ සංශයක් ඇති කිරීම තුළ අහිංසක තැන්පතුකරුවන් මුදල් ඉවත් කර ගන්නවා. අවසානයේදී වෙන්නේ, ද්‍රවශීලතා හිඟයකට බැංකුව මුහුණ දෙන එක. මේ වෙලාවේදී එක බැංකුවක් කඩා ගෙන වැටෙනවා නම්, එක බැංකුවක කඩා වැටීම සියලු බැංකු කඩා වැටීමේ මූලාරම්භය විධියට තමයි බැංකු ක්‍රමයේදී සලකන්නේ. ඒ නිසා මේ තොරතුරු විකෘති කිරීමට එරෙහිව අප යම්කිසි නියාමන පද්ධතියකට පිවිසීම අතිශය වැදගත් වෙනවා. එහෙම නොවුණොත් යම් ප්‍රතිපත්තියක් මත, යම් කිසි නීතිමය රාමුවක් මත, ආචාර ධර්ම පද්ධතියක් - code of ethics - තුළ ක්‍රියාත්මක වන මාධ්‍යවේදියාටත් ඇත්ත වශයෙන්ම අද ගැටලුවක් පැන නඟිනවා. මොකද, smartphone එකක් තියාගෙන අන්තර්ජාලය හරහා සමහර තොරතුරු නිර්මාණය කරන උදවිය අද මාධ්‍යවේදීන් විධියට තමයි ක්‍රියා කරන්නේ. එමඟින් සිවිල් චරිතවලට වන අපහරණය ගැනත් හිතන්න කියලා මේ ගෞරවනීය සභාවේදී මම කියනවා.

එක තොරතුරක් මා උදාහරණයකට ගන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ පාර්ලිමේන්තුවේදී මා ප්‍රකාශයක් කළා, ගිරාගම සෞන්දර්ය අධ්‍යාපන ගුරු විද්‍යාලය පිළිබඳව. මීට අවුරුදු 30කට හෝ අවුරුදු 40කට කලින් මේ ගිරාගම සෞන්දර්ය අධ්‍යාපන ගුරු විද්‍යාලය සලකනු ලැබුවේ දකුණු ආසියාවේ තිබෙන අග්‍රගණ්‍ය සෞන්දර්ය ගුරු විද්‍යාලයක් විධියට. මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළ අවස්ථා ගණනාවකදී මා කියා සිටියා, "මෙය රැක ගත යුතුයි. මෙය රැක ගැනීම වෙනුවෙන් අපි වැඩ පිළිවෙළක් ආරම්භ කළ යුතුයි" කියලා. එවකට හිටපු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගෙන් මා ඉල්ලීමක් කළා, "ඔබතුමා මේ ගැන දන්නවා. මෙය ආරක්ෂා කර ගැනීමට අපි වැඩ කටයුත්තක් කරමු" කියලා. එතුමා ඒ සම්බන්ධයෙන් එකඟතාවකට පැමිණියා. මා යෝජනා කළේ, "මෙය සෞන්දර්ය ගුරු විද්‍යාලයක් විධියට දියුණු කර ගැනීමට වහාම කටයුතු කරමු. මෙය අක්කර 18ක පමණ භූමි භාගයක විසිරී තිබෙනවා. මාම්පිටිය දිසාව ආරක්ෂා කරපු, දායාද කරපු මේ ගුරු විද්‍යාලය රැක ගනිමු" කියලායි. නමුත් මාධ්‍ය මේ තොරතුර අයිති කරගෙන, එය මාධ්‍ය තුළ ප්‍රචාරය වුණේ කොහොමද? මා ළඟ තිබෙන මේ පුවත් පත් වාර්තාව මම **සභාගත*** කරනවා.

මේ පුවත් පත් වාර්තාවට අනුව, ගුරු සේවා සංගමයේ මධ්‍යම පළාත් ලේකම් කියනවා, "ගිරාගම සෞන්දර්ය ගුරු විදුහල වසා දැමීමේ කුමන්ත්‍රණයක්" කියලා. මේ තොරතුර විකෘති කරලා පත්‍රයේ සඳහන් කරලා තිබෙනවා. මේක තමයි, තොරතුරු විකෘති කිරීම කියන්නේ. අවුරුදු 40කට කලින් ගුරු ශිෂ්‍යයන් 600ක් හිටපු ගුරු විද්‍යාලයේ අද ශිෂ්‍යයන් සංඛ්‍යාව 30කට බැහැලා තිබෙනවා. මීට වඩා පරිහානියක් මොකක්ද ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? ඒ නිසා මේ තොරතුරු විකෘති කිරීම පිළිබඳව අපේ අවධානය යොමු විය යුතුයි කියලා මා කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමා හැඳුනුම් පත පිළිබඳව ප්‍රකාශ කළා. UID එක අතිශය වැදගත් කියලා මා හිතනවා. මොකද, unique National Identity Card එකක් අපට තිබෙනවා නම්, රාජ්‍ය සේවය අතිශය කාර්යක්ෂම වෙනවා. ඊයේ Consular Affairs Division එකේ කලබලයක් ඇති වුණා. Consular Affairs Division එකට වේවා, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට වේවා, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට වේවා මෙවැනි රාජ්‍ය ආයතනවලට උප්පැන්න සහතිකය, Identity Card එක, ඒ වාගේම විවිධ හැඳුනුම් පත් සහ එවැනි වෙනත් කාඩ් පත් ආදී දෑ ඉදිරිපත් කිරීමෙන් තමයි සමහර රාජ්‍ය සේවා අපට ලබාගන්න පුළුවන් වෙන්නේ. අපේ tax file එක වේවා, health card එක වේවා, soil card එක වේවා, passport එක වේවා, බැංකු කාඩ් පත වේවා, පුද්ගලයකු හා සම්බන්ධිතව තිබෙන මෙවැනි විවිධාකාර කාඩ්පත් සියල්ල ඉදිරිපත් කිරීම තුළින් කාල ප්‍රමාදයක් ඇති වෙනවා කියලා ඔබතුමන්ලා දන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාල ප්‍රමාදය අකාර්යක්ෂමතාවක් විධියටයි අපට නම් කරන්න සිද්ධ වෙන්නේ. ඒ නිසා ඩිජිටල්කරණය පිළිබඳව ගත්ත පියවර ඉතාම නිර්භීත තීන්දුවක් විධියට වහාම ඉදිරියට ගෙන යෑමට රජය කටයුතු කිරීම පිළිබඳව නවක මන්ත්‍රීවරුන් විධියට අපි ඇත්ත වශයෙන්ම සන්තෝෂ වෙනවා. අද රාජකාරියක් කර ගන්න රාජ්‍ය ආයතනයකට යන සාමාන්‍ය මිනිසකුට ඒ කටයුත්ත කර ගන්න මාස ගණන් කල් මරන්න වෙන්නේ ඇයි? ඒ, මෙවැනි Identity Card එකක් නොමැති වීම නිසායි.

විදේශ රටවල වාහන ධාවනය කිරීමේදී සාමාන්‍යයෙන් ඩබල් ඉර කපන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ අය ඩබල් ඉර කපන්නේ නැත්තේ විනය ගරුකභාවය නිසා හෝ වෙනත් කාරණයක් නිසා නොවෙයි. යම්කිසි පුද්ගලයකු ඩබල් ඉර කැපූ ගමන්ම ඔහුගේ වාහනයේ එය indicate වෙනවා. ඒ වාගේම වර්ෂය අවසානයේදී ඒ ඩබල් ඉර කපපු වාර ගණනට සමානව දඩයක් නියම කරලා එය ගෙවන්න කියලා ලිපියක් තැපෑලෙන් නිවසටම ලැබෙනවා. ඒ නිසා විදේශ රටවල මේ රටේ වාගේ හොරා පොලිස් සෙල්ලම් කරන්න ඕනෑ නැහැ. ස්වාභාවිකවම ඩබල් ඉර කපන්නේ නැති තත්ත්වයට පත් වෙනවා. මේ ඩිජිටල්කරණ ක්‍රියාවලිය හරහා මේ රටේ දූෂණය සහ වංචාව මුළුමනින්ම කෙසේ වෙතත් අතිශය ඉහළ මට්ටමකින් වළක්වා ගැනීමට හැකියාවක් අපට තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පියවර ඉතාම වැදගත් පියවරක් විධියට මා අගය කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පතේ සඳහන් එක කාරණාවක් පිළිබඳව අවධානය යොමු කරන්න මා කැමැතියි. මේ පනත් කෙටුම්පතේ 33වන වගන්තියේ දඬුවම් පැනවීම පිළිබඳව සඳහන් කරලා තිබෙනවා. අභියාචනයක් ඉදිරිපත් කරනවා නම් යම් මුදලක් තැන්පත් කරන්න ඕනෑය කියලා සඳහන් කර තිබෙනවා. මේ කරුණ පිළිබඳව නැවත රජයේ අවධානය යොමු කරන්න කියලා මා ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. මොකද, ඒ තැන්පත් කළ යුතු මුදල නිසා මාධ්‍ය ආයතනවලටත්, තවත් ආයතනවලටත් විශාල හිරිහැරයකට ලක්වෙන්න ඉඩ තිබෙනවා. අභියාචනාධිකරණයේදී වරදට දඬුවම දෙන නිසා ඒ මුදල තැන්පත් කිරීම නතර කරන්නය කියා ගෞරවයෙන් ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. (Dr.) V. Radhakrishnan. You have eight minutes.

[பி.ப. 1.40]

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று இச்சபையில் கொண்டுவரப்பட்டிருக்கின்ற சட்டமூலத்தின் மூலம் தனிப்பட்ட தரவுப் பாதுகாப்பு தொடர்பில் ஒரு விசேட authorityஐ அமைப்பதற்கு நடவடிக்கை எடுக்கப்பட்டிருக்கிறது. இது முற்றிலும் நல்லதொரு விடயமாகும். வெளிநாடுகளில் தனிநபருடைய தரவுகள் unique Identity Card என்று சொல்லப்படுகின்ற cardஇல் கொடுக்கப்பட்டிருக்கின்றன. இலங்கையிலும் அவ்வாறு செய்தால், நிச்சயமாக நாங்கள் சந்தோசப்படுவோம். ஏனென்றால், பல cardsஐக் கொண்டு செல்ல வேண்டிய அவசியம் ஏற்படாது. சம்பந்தப் பட்ட அமைச்சர் அவர்கள் இங்கே இல்லை. இருந்தாலும், இந்தச் சந்தர்ப்பத்திலே ஒன்றைச் சொல்லிவைக்க விரும்புகின்றேன். unique identity card கொடுக்கின்ற இத்திட்டம் நாட்டின் எல்லாப் பகுதிகளிலும் நடைமுறைப் படுத்தப்பட இருக்கின்றது. எனினும், மலையகப் பகுதியில் இதனை நடைமுறைப்படுத்தும் போது பல சிக்கல்கள் எழக்கூடும். ஏனெனில், இன்றும் அங்குள்ள தொழிலாளர்கள் தங்களுடைய பிறப்புச் சான்றிதழை - birth certificate - பெற்றுக்கொள்வதற்கான வாய்ப்பு மிகவும் குறைவாகவே இருக்கின்றது. அவற்றை வழங்குவதில் கால இழுத்தடிப்புச் செய்யப்படுகின்றது. அதே போல, இன்று அங்கு மக்களுக்கு Identity Card வழங்குவதற் கென பல நடமாடும் சேவைகள் நடத்தப்பட்டாலும், இன்னும் அச்செயற்பாடு முழுமைபெறவில்லை. அதேபோல, EPF, ETF நிதியைப் பெற்றுக்கொள்வதற்குத் தேவையான தஸ்தா வேஜுகளைப் பெற்றுக்கொள்வதற்கான வாய்ப்புக்களும் மிகவும் குறைவாகவே இருக்கின்றன. ஆகவே, அந்த மக்கள் இந்த ஆவணங்களைப் பெற்றுக்கொள்வதற்கான வாய்ப் புக்களை உறுதிப்படுத்திவிட்டு, நீங்கள் இந்தத் திட்டத்தை நடைமுறைப்படுத்தினால் நல்ல பலன்களைப் பெறலாம். அந்த எதிர்பார்ப்பு எங்களுக்கும் இருக்கின்றது.

அதேநேரத்தில், இவை எல்லாவற்றையும் மேற்கொள் வதற்கு உதவி அரசாங்க அதிபர் காரியாலயம் - AGA office - கட்டாயம் தேவை. அதன்மூலம்தான் அந்தத் தரவுகளைப் பெற்றுக்கொள்ள முடியும். 2019.10.29ஆம் திகதி வெளியிடப் பட்ட gazetteஇன்படி, நுவரெலியா மாவட்டத்தில் 05 பிரதேச செயலகங்களும் காலி மாவட்டத்திலே 03 பிரதேச செயலகங்களும் என மொத்தம் 08 புதிய பிரதேச செயலகங்கள் உருவாக்கப்பட வேண்டும். காலி மாவட்டத்துக்கென வழங்கப் பட்ட மூன்று புதிய பிரதேச செயலகங்களும் இப்பொழுது செயற்படுகின்றன. ஆனால், நுவரெலியா மாவட்டத்தில் அவ்வாறு நடைபெறவில்லை.

இப்பொழுது அங்கு உப காரியாலயங்கள் உருவாக்கப் பட்டிருக்கின்றன. நாங்கள் உப உப காரியாலயங்கங்களைக் கேட்கவில்லை. மாறாக, பிரதேச செயலகங்களைத்தான் கேட்கிறோம். பிரதேச செயலகங்கள் மூலம்தான் இவ்வாறான தரவுகளைப் பெற்றுக்கொள்ள முடியும். அந்தத் தரவுகள் மூலமாகத்தான் Identity Card வழங்கமுடியும். இன்று Identity Card பெறுவதென்றால், அது தொடர்பான ஆவணங்களில் கிராம சேவகர் மற்றும் AGA sign பண்ண வேண்டும். பிரதேச செயலகங்கள் இல்லாமல் நாங்கள் எப்படி இதைப் பெற்றுக்கொள்வது? என்ற கேள்வியை இங்கே கேட்க வேண்டிய கட்டாயம் இருக்கின்றது.

கிட்டத்தட்ட 525,000 பேர் வாழ்கின்ற மாத்தளை மாவட்டத்தில் 11 பிரதேச செயலகங்கள் இருக்கின்றன. கிட்டத்தட்ட 4 இலட்சம் பேர் வாழ்கின்ற திருகோணமலை மாவட்டத்தில் 11 பிரதேச செயலகங்கள் இருக்கின்றன. ஆனால், கிட்டத்தட்ட 7 இலட்சம் பேர் வாழ்கின்ற நுவரெலியா மாவட்டத்திலே 5 பிரதேச செயலகங்கள்தான் இருக்கின்றன. இது என்ன நியாயம்? இதை யாரிடம் கேட்பது? கடந்த அரசாங்க காலத்தில் நுவரெலியா மாவட்டத்தில் ஐந்து புதிய பிரதேச செயலகங்களை உருவாக்குவதற்கு அனுமதி கொடுக் கப்பட்டபோதிலும், அவற்றை உருவாக்காமல் இருப்பது யாருடைய தப்பு? அந்த மக்களை நீங்கள் இரண்டாந்தரப் பிரஜைகளாகப் பார்க்கின்றீர்கள் என்பதை நாங்கள் இந்த இடத்திலே சொல்லவேண்டிய கட்டாயம் இருக்கின்றது. இன்று நுவரெலியா மாவட்டத்திலே 14,000 பேருக்கு ஒரு கிராம சேவகர் பிரிவும் 10,000 பேருக்கு ஒரு கிராம சேவகர் பிரிவும் இருக்கின்றது. அந்த மக்களின் அடிப்படை உரிமைகள் மீறப்படுகின்றன; அவர்களுடைய தேவைகள் பூர்த்திசெய்யப் படாமலிருக்கின்றன. இன்று ஒரு கிராம சேவகர் பிரிவுக்கு 3 மில்லியன் ரூபாய் கொடுக்கப்படுகின்றது. நுவரெலிய பிரதேச செயலகப் பிரிவிலே 72 கிராம சேவகர் பிரிவுகள்தான் இருக்கின்றன. அங்கு 2 இலட்சத்துக்கும் மேற்பட்ட மக்கள் வசிக்கின்றார்கள். ஆனால், ஹங்குராங்கத்தையில் 131 கிராம சேவகர் பிரிவுகள் இருக்கின்றன. அங்கு சனத்தொகையும் குறைவு. இந்த அரசாங்கம் பாகுபாடற்ற முறையில் இதைச் செய்யுமேயானால், நிச்சயமாக நாங்களும் அதற்கு ஆதரவு கொடுப்போம் என்பதை இந்த நேரத்திலே சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

அண்மையிலே தலவாக்கலை - நுவரெலியா வீதியில் ஒரு மரம் அறுக்கப்பட்டபோது, அதன் கிளைகள் விழுந்து மகேஸ்வரன் என்ற ஒரு கணித ஆசிரியர் இறந்திருக்கிறார். அவருடைய குடும்பத்தினருக்கு எங்களுடைய ஆழ்ந்த அனுதாபத்தைத் தெரிவித்துக்கொள்கின்றோம். எந்தவிதமான முற்பாதுகாப்பு ஏற்பாட்டையும் செய்யாமல், அந்த மரத்தை வெட்டியதன் காரணமாக இன்று நாங்கள் ஓர் ஆசிரியரை இழந்திருக்கின்றோம். இப்பொழுது, அங்கு புதிதாக ஒரு பிரச்சினை ஏற்பட்டிருக்கிறது. அதாவது, அந்த மரத்துக்குக் கீழேயிருக்கின்ற சிறிய இந்துக் கோவிலை மாற்றினத்தவர்கள் பரிபாலனம் செய்வதற்கு நடவடிக்கை எடுக்கப்பட்டிருக்கிறது. தலவாக்கலைப் பகுதியிலே மீண்டும் ஓர் இனக்கலவரத்தை ஏற்படுத்தக்கூடிய ஒரு சூழ்நிலையை இது உருவாக்கும். 1990களிலே தலவாக்கலையில் ஏற்பட்ட பிரச்சினைதான் இந்த நாட்டினுடைய இனப்பிரச்சினைக்கு ஒரு முக்கிய காரணமாக அமைந்தது என்பது உங்களுக்குத் தெரியும்! ஆகவே, இவ்வாறான பிரச்சினைகள் உருவாகாமல் இருப்பதற்கு அந்த சிறிய கோவிலை தலவாக்கலை நகரத்திலிருக்கின்ற கதிரேசன் கோவில் நிர்வாகத்தினரிடம் கொடுங்கள்! அவர்கள் அதைப் பரிபாலனம் செய்வார்கள். அந்தக் கோவிலையும் அந்த இடத்தையும் அபகரிப்பதற்குச் சில பிரமுகர்கள் எத்தனிக் கின்றார்கள் என்பதை நான் தெட்டத்தெளிவாக இந்தச் சபைக்குச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். அந்த வகையில், இதற்கான மாற்று நடவடிக்கையை உடனடியாக இந்த அரசாங்கம் எடுக்கவேண்டும். இல்லையேல், எதிர் காலத்தில் அங்கும் பிரச்சினைகள் உருவாகலாம்! எனவே, சிங்கள, தமிழ், முஸ்லிம் மக்கள் ஒன்றாக வாழ்கின்ற தலவாக்கலைப் பகுதியிலே பிரச்சினை ஏற்படாமலிருப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமென்று நான் இந்தச்

சபையினூடாக அரசாங்கத்தைக் கேட்டுக்கொள்கின்றேன். சமூகங்களுக்கிடையில் ஒற்றுமை நிலவவேண்டுமானால், இவ்வாறான பிரச்சினைகள் தீர்க்கப்பட வேண்டும். இறுதியாக, தலவாக்கலையிலே இறந்த ஆசிரியர் மகேஸ் வரனது குடும்பத்தாருக்குக் கொடுக்கப்படவேண்டிய கொடுப் பனவுகள் இதுவரைக்கும் கொடுக்கப்படவில்லை. எனவே, அதைக் கொடுப்பதற்கான நடவடிக்கைகளையும் சம்பந்தப் பட்ட அதிகாரிகள் எடுக்கவேண்டும் என்பதையும் தெரிவித்துக் கொண்டு உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Thenuka Vidanagamage.

**ගරු තේනුක විදානගමගේ මහතා (ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தேனுக விதானகமகே - கிராமிய மற்றும் பாடசாலை விளையாட்டு உட்கட்டமைப்பு வசதிகள் மேம் பாட்டு இராஜாங்க அமைச்சர்)
(The Hon. Thenuka Vidanagamage - State Minister of Rural and School Sports Infrastructure Improvement)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට ten minutes නැහැ නේද?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Five minutes has already been taken by the Hon. Shehan Semasinghe. So, you have only five minutes.

[අ.භා. 1.48]

**ගරු තේනුක විදානගමගේ මහතා**
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
Thank you.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ මගේ අදහස් ප්‍රකාශ කරන්න ලැබීම අගය කරනවා.

අපේ අවධානයට යොමු වුණු, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට බලපෑ කරුණු රැසක් තිබෙනවා. දත්ත හිමියන්ට ඒ දත්තවලට තිබෙන පෞද්ගලික අයිතිවාසිකම් ආරක්ෂා කර දීමට අවශ්‍ය නිසාත්, ඒ වාගේම ඒ ආශ්‍රිතව ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය වර්ධනය කිරීමට සහ නවීකරණයට අවශ්‍ය වී තිබෙන නිසාත් මෙම පනත් කෙටුම්පත සම්මත කර ගැනීම අවශ්‍යව තිබුණා. ඒ වාගේම, පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීමට බැඳී සිටින, බලයක් සහිත අධිකාරී ආයතනවල සහයෝගිතාව ශක්තිමත් කිරීමට අවශ්‍ය වීමත්, විශේෂයෙන් දත්ත ආරක්ෂා කිරීම සඳහා රටවල් අතර සහයෝගිතාව වර්ධනය කිරීමට අවශ්‍යවීමත් මෙහිදී සලකා බලා තිබෙන බව ප්‍රකාශ කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දේශීය ලිඛිත නීති සහ ජාත්‍යන්තරව පිළිගත් නීති රීතිවලට ගරු කරමින්, පාරිභෝගික විශ්වාසය හා පෞද්ගලිකත්වය තහවුරු කර ගනිමින් ඔවුන්ගේ දත්ත ආරක්ෂා කර දෙන නීතිමය රාමුවක් සකස් කිරීමට ශ්‍රී ලංකා රජයට අවශ්‍ය වූ නිසාත් තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම පනත් කෙටුම්පත අපට වාගේම ජාත්‍යන්තර වශයෙන්ද වැදගත් වන පනත් කෙටුම්පතක් බව ප්‍රකාශ කරන්නට ඕනෑ. ඒ නිසා මෙය කෙටුම්පත් කිරීමේදී ඕස්ට්‍රේලියාව, සිංගප්පූරුව, එක්සත් රාජධානිය, ඉන්දියාව වැනි රටවල පනවා තිබෙන නීති රීති ද අධ්‍යයනය කළ බව වාර්තා වෙනවා. මේ පනත් කෙටුම්පත සකස් කිරීමේදී කෙටුම්පත් කමිටුව විසින් යුරෝපා කොමිසමේ සාමාන්‍ය දත්ත ආරක්ෂණ සම්මුතිය, යුරෝපා කොමිසමේ සාමාන්‍ය දත්ත ආරක්ෂණ රෙගුලාසි ඇතුළු අන්තර්ජාතිකව වැදගත් වන විවිධ සංවිධානවල සම්මත නීති රීති අධ්‍යයනය කර තිබෙනවා. මෙම පනත් කෙටුම්පත කෙටුම්පත් කළ කමිටුව පාර්ශ්වකරුවන්ගේ අදහස් ලබා ගන්න සාකච්ඡා වට 7ක් පැවැත්වූ බව ප්‍රකාශ කරන්නට ඕනෑ. ඒ වාගේම, බැංකු ක්ෂේත්‍රය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය දත්ත විශේෂඥයන් සමඟ සාකච්ඡා වට කිහිපයක් පවත්වා තිබුණා. මේ අනුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පත සකස් කර තිබෙන්නේ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් නිර්ණායක, ප්‍රමිති සැලකිල්ලට අරගෙන බව ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ වාගේම ශ්‍රී ලංකාවේ මෙවැනි පෞද්ගලික දත්ත පිළිබඳ වගකීම දරන ආයතන, පුද්ගලයන් වෙතින් යෝජනා ලබාගෙන, ස්වාධීන විශ්ලේෂණ මණ්ඩලයක නිර්දේශද ලබාගෙන තිබෙනවා.

මේ පනත් කෙටුම්පත සම්මත වූ පසු ඉදිරියේදී අදාළ කටයුතු කිරීමට දත්ත ආරක්ෂණ අධිකාරියක් පිහිටුවීමට අපේක්ෂිතයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ නීතිමය ආවරණයක් නැතිව තිබූ ක්ෂේත්‍රයක් ආවරණ කරන නීති රීති මේ පනත් කෙටුම්පත තුළින් සකස් වෙන බව ප්‍රකාශ කරන්න කැමැතියි.

ප්‍රධානතම නීති සම්පාදක ආයතනය ලෙස මේ උත්තරීතර පාර්ලිමේන්තුව අනාගතයට ගැළපෙන, අත්‍යවශ්‍ය නීතියක් මේ පනත් කෙටුම්පත මඟින් සම්පාදනය කරන බවත් සිහිපත් කරන්නට ඕනෑ. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමාත්, ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාත් ඉදිරියේදී ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වන ඩිජිටල්කරණ වැඩ පිළිවෙළ සඳහා මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීම අවශ්‍ය වෙලා තිබෙනවා.

ඒ නිසා මෙය සම්මත කරගැනීම මඟින් අපේ රජයේ බලාපොරොත්තු ඉෂ්ට කරගන්න අවස්ථාවක් ලැබෙනවා කියන එක මම මතක් කරනවා. මට කාලය ලබා දීම පිළිබඳව ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත්, ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Mayantha Dissanayake. You have eight minutes.

[අ.භා. 1.52]

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින විවාදයට ගෙන තිබෙන මේ පනත් කෙටුම්පත ඉතා වැදගත් පනත් කෙටුම්පතක්. ඊයේ අපේ ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති එම උපදේශක කාරක සභාවේදී මේ පනත් කෙටුම්පත පිළිබඳව අපි සාකච්ඡා කළා. ඒ අවස්ථාවේදී ඒ කාරක සභාවේ සාමාජිකයකු හැටියටත්, විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු හැටියටත්, සමගි ජන බලවේගය වෙනුවෙනුත් මා යෝජනා කිහිපයක් ඉදිරිපත් කළා. අද අපට ලැබී තිබෙනවා, ඊයේ එම උපදේශක කාරක සභාවේ Minutes. කනගාටුයි කියන්න, ඒ Minutesවල අපි ඉදිරිපත් කළ යෝජනා සහ අපේ විරෝධතාව සඳහන් වෙලා නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මා දැන් පැවසූ පරිදි මේ ගෙනෙන්න යන පනත මේ රටට ඉතා වැදගත් වන පනතක්. මේකට අපි විරුද්ධ වන්නේ ඇයි? අපි ඉදිරිපත් කරන යෝජනා

[ගරු මයන්ත දිසානායක මහතා]

මේ පනත් කෙටුම්පතට ඇතුළත් කරන්න කියන ඉල්ලීමයි අපි කරන්නේ. හැබැයි, ගරු ඇමතිතුමා අපේ ඉල්ලීම් සලකන්නේ නැතිව මේ පනත් කෙටුම්පත අද මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ පිළිබඳ අපි කනගාටු වෙනවා. ගරු ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ සිටින නිසා මා මේ කාරණය කියන්න කැමැතියි. ඇත්තෙන්ම මේ පනත් කෙටුම්පතට අපි  කියන සුළු සංශෝධන කිහිපය ඇතුළත් කළා නම් විපක්ෂයටත් මේකට එකඟ වන්න පුළුවන්. We only require some small changes made especially from the point of view of the journalists, from the point of view of freedom and from the point of view of the right to information.  If you agree to make these very small amendments, අපට අවශ්‍ය කරන ඒ සංශෝධන ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමාගේ අවසරය පරිදි මේ අවස්ථාවේදී මට සභාගත කරන්න පුළුවන්. තමුන්නාන්සේලාට මේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලය තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒ නිසා ඕනෑම පනත් කෙටුම්පතක් සම්මත කරගන්න පුළුවන්. නමුත්, මේ පාර්ලිමේන්තුවේ පළමුවරට ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය එකඟ වෙලා මේ පනත් කෙටුම්පත සම්මත කරගන්න පුළුවන්, අපි ඉදිරිපත් කරන සංශෝධනවලට ඔබතුමන්ලා එකඟ නම්. ඉතා සුළු සංශෝධන කිහිපයක් තමයි කරන්න තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඔබතුමාගේ අවසරය පරිදි, මා ඒ සංශෝධන **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂයෙන් චෝදනාවක් නඟනවා, අපිට උසාවි යන්න තිබුණා නේද කියලා. මේ පනත් කෙටුම්පත present කළාට පස්සේ උසාවි යන්න දින හතයි තිබුණේ. උසාවි ගියත්, we could only challenge the constitutionality of this Bill.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු මන්ත්‍රීතුමා, -

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
මගේ වෙලාව ගන්න එපා, ගරු ඇමතිතුමා.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
මගේ වෙලාවෙන් ගන්නේ. ඔබතුමාගේ වෙලාවෙන් නොවෙයි.

ගරු මන්ත්‍රීතුමනි, ඔය සංශෝධන ටික මගේ ළඟටත් එවනවා නම් හොඳයි. මම ඔබතුමාට මතක් කරන්න ඕනෑ, 2019 සිටම මෙයට සංශෝධන ඉදිරිපත් කරන්න අවස්ථාව තිබුණ බව. හැබැයි ඔබතුමන්ලා අන්තිම මොහොතේ තමයි කලබල වෙලා ඇවිල්ලා සංශෝධන ඉදිරිපත් කරන්නේ. එක පැත්තකින් මම සතුටු වෙනවා, ඔබතුමාට අද කථාවක් කරන්න අවස්ථාව දුන්නු එක ගැන.  සජිත් ප්‍රේමදාස මහත්මයා සාමාන්‍යයෙන් ඔබතුමාට එහෙම අවස්ථාව දෙන්නේ නැහැ. මගේ ඉල්ලීම පරිදි ඔබතුමාට කථා කරන්න අවස්ථාව දීලා තිබෙනවා. ඒ ගැන මම සතුටු වෙනවා. [බාධා කිරීමක්] අපි දැක්කා, list එකේ ඔබතුමාගේ නම තිබෙනවා. කථික ලැයිස්තුව අපි ළඟත් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you, Hon. Minister.

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
ගරු ඇමතිතුමනි, - අධිකරණ ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. අපි උත්සාහ කරන්නේ, to actually get this Bill passed so that the people of this country, the interested parties, the journalists and all can back this Bill. Otherwise, again you will have issues coming up from this Bill after it is passed and after the Authority is established because there are genuine concerns. There are absolutely genuine concerns, Hon. Minister.  ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්තෙන්ම සාධාරණ මත තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ; they are absolutely genuine. We are not trying to do politics here. We want this Bill to be passed in the right format. So, you, as a young and upcoming Minister, have the opportunity here to get the support of the Opposition also for the first time in this Parliament. We have opposed many Bills; we have not supported them. හැබැයි, මේ පනත් කෙටුම්පතට අපි මේ කියන සුළු සංශෝධන ටික ඇතුළත් කරනවා නම් අපිට මේ පනත් කෙටුම්පතට එකඟ වෙන්න පුළුවන්. මොකද, ඒක රටේ අනාගතයට බලපාන දෙයක්.  Especially, there are grave concerns in terms of appointing the Authority. If the Authority is appointed and the Authority is seen to be favouring the Government in every way in the future, again there will be problems in this country.  විශේෂයෙන් මේ දිහා ජාත්‍යන්තරයත් - අනෙක් රටවලුත් - බලාගෙන ඉන්නේ. ඊයේ මම කාරක සභාවේදී පැවසූ පරිදි, මේ පනත් කෙටුම්පතට අපි ඉදිරිපත් කරන සුළු සංශෝධන ටික ඇතුළත් කර, පක්ෂ විපක්ෂ දෙපාර්ශ්වයේම එකඟතාවෙන් මෙය සම්මත කර ගන්න පුළුවන් නම්, අපි මෙහි වරදක් දකින්නේ නැහැ. මොකද, මේක අවශ්‍ය කරන පනත් කෙටුම්පතක්; this Bill is needed. Every country in the world is having Data Protection Acts passed in their Parliaments. But, what generally happens is - I have seen this in several countries - for a broader time period, the Bill is debated, the interested parties are called in and their opinions are taken into consideration and the Government generally passes it with the agreement of both sides of the aisle.

මේ පනත් කෙටුම්පත පිළිබඳව අද උදේ ඉඳලා අපි සාකච්ඡා කළා, තර්ක කළා. ඇත්තෙන්ම මේකට අපි ඉදිරිපත් කරන සංශෝධන ටික ඇතුළත් කළා නම්, මෙය ඉතා හොඳ පනත් කෙටුම්පතක් කියලා අපිට පිළිගන්න පුළුවන්.  එහෙම නැතිව, මේ තිබෙන ආකාරයටම මේ පනත් කෙටුම්පත ඔබතුමන්ලා සම්මත කරනවා නම්, අපට එසේ පිළිගන්න හැකියාවක් නැහැ. I really appeal to the two Ministers, please consider the need and the request of the country to adopt these amendments and pass this Bill.

තමුන්නාන්සේලාට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් තිබෙනවා. අපි උසාවියට ගියත්, ඒ තුනෙන් දෙකේ බලය පාවිච්චි කරලා හෝ තමුන්නාන්සේලාට පුළුවන් මෙය සම්මත කරගන්න. හැබැයි, මේ අවස්ථාවේදී අපි විශේෂයෙන්ම රටක් හැටියට අනාගතය දිහා බලා වැඩ කරන්න ඕනෑ. අද මේ රටේ විශාල ප්‍රශ්න තිබෙනවා; ආර්ථික ප්‍රශ්න තිබෙනවා, දේශපාලන ප්‍රශ්න තිබෙනවා, සමාජයීය ප්‍රශ්න තිබෙනවා.  So, we have so many issues. මිනිස්සු කියනවා, "දවල් පෙට්‍රල්, ඩීසල් පෝලිමේ. රෑට

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

කළුවරේ" කියලා. අපි මේවා විහිළුවට කියනවා නොවෙයි. අපි මේවා සරලව ගන්නවාත් නොවෙයි. ඇත්තෙන්ම අපි මේ රට තුළ දැවැන්ත ප්‍රශ්නවලට මුහුණ දෙමින් සිටිනවා. මේ දවස්වල කථා කරනවා, ජාතික ආණ්ඩුවක් ගෙන ඒම පිළිබඳත්. ඒ ගැන කියන්න මම දන්නේ නැහැ.

මම ඊයේ විශේෂයෙන්ම ඉල්ලීමක් කළා, මේ පනත් කෙටුම්පත විවාදයට ගන්න එක තව මාස තුනකට පමණ කල් දමන්න කියලා. හැබැයි, හරි හෝ වැරදි ඇමතිතුමා අපට කිව්වා; අපව දැනුවත් කළා මේ පනත් කෙටුම්පත අනිවාර්යයෙන් සම්මත කරගන්න ඕනෑ, හදිසියක් තිබෙනවා කියලා. ඒ කෙසේ වෙතත්, මේ රට තුළ මේ ආණ්ඩුව කටයුතු කරන්න යන්නේ මේ විධියට නම්, තනි මතයකට හිටගන්න යනවා නම් එය හොඳ තත්ත්වයක් නොවෙයි. මේ විෂයයට අදාළ අමාත්‍යාංශය භාරව ඉන්නේ අතිගරු ජනාධිපතිතුමා බව මතක තබාගන්න.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Minister Namal Rajapaksa?

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු මන්ත්‍රීතුමනි, මේක තනි මතයට හදපු පනත් කෙටුම්පතක් නොවෙයි. ඔබතුමන්ලා තමයි මේ කටයුත්ත පටන් ගත්තේ. නමුත් ඔබතුමන්ලාට කරගන්න බැරි වුණා. Consultations හතක් industry එකත් එක්ක පවත්වා තිබෙනවා. ඔබතුමන්ලා අන්තිම මොහොතේ මේ පනත් කෙටුම්පත කියවලා, අර මොකක්ද ගිනි අරගෙන දඟලනවා වාගේ අන්තිම මොහොතේ කෑගැහුවාට, මේකට අදාළ සියලු පාර්ශ්ව එක්ක අපි සාකච්ඡා කළා. ඒ වාගේම තමයි ඔබතුමන්ලාගේ ඔය ඕනෑම පාර්ශ්වයකට උසාවි යන්නත් අවසරය තිබුණා; කාල සීමාව තිබුණා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ එක වතාවක් දේශපාලනයේ කාන්තා නියෝජනය ගැන හදිසියේ පනත් කෙටුම්පතක් ගෙනැල්ලා සංශෝධනවලට වෙනත් එකක් ඉදිරිපත් කළා නේ. නමුත් එහෙම පනත් කෙටුම්පතක් නොවෙයි, මේක.

ඔබතුමා වග කිව යුතු මන්ත්‍රීවරයෙක්; උගත් මන්ත්‍රීවරයෙක්. අපට පෙනෙනවා, මේ පනත් කෙටුම්පත පිළිබඳව ඔබතුමා තුළ අවංක හැඟීමක් තිබෙන බව. ඒ හින්දා මා කියනවා, මේ ගරු සභාව නොමඟ යවන්න එපා කියලා. මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පසුව එයින් ප්‍රයෝජන ගන්නේ මේ රටේ මහ ජනතාව. ඉතින් ඒ අය නොමඟ යවන විධියට කථා කරන්න එපා. ඔබතුමා ඊයේ ඇවිත් කිව්වා, සංශෝධන තිබෙනවා කියලා. ඊයේද දැනගත්තේ, මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙන එනවා කියලා? මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙන එනවා කියලා ඔබතුමා ඊයේ නොවෙයි නේ දැනගත්තේ, ගරු මන්ත්‍රීතුමනි. එහෙම නම්, අන්තිම මොහොතේ ඇවිල්ලා ඕහොම කියන්නේ ඇයි? අපි පැහැදිලිව කියනවා, මේ පනත් කෙටුම්පත හැම පාර්ශ්වයක් එක්කම සාකච්ඡා කරලා ගොඩනැගූ පනත් කෙටුම්පතක් බව. ඒ වාගේම තමයි ඔබතුමා කියන හැම concern එකක්ම අපි මේ තුළ address කර තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you.

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
Sir, how many minutes do I have left?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
You are left with 30 seconds.

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
ඒ තත්පර 30 තුළ මා මේ කාරණය කියන්න කැමැතියි. මම පසුගිය පාර්ලිමේන්තුවේ ඉඳන්ම මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. මම කවදාවත් වැරදි දෙයක් වෙනුවෙන් කථා කරලා නැහැ. නිවැරදි දෙයක් කරන්න තමයි මම කටයුතු කළේ. විශේෂයෙන්ම මගේ සීයාගේ -අත්තාගේ- කාලයේ ඉඳලාම අපේ පවුල්වල අය මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. මම කවදාවත් වැරදි දෙයක් වෙනුවෙන් කථා කරලා නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ සීයාගේ කාලයේ ඉඳන්ම ඔබතුමාගේ පවුල්වල අයත් පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. ඔබතුමාගේ තාත්තාත් අද අගමැති හැටියට පාර්ලිමේන්තුවේ කටයුතු කරනවා.

තරුණ ඇමතිවරයෙකු, අනාගතයක් තිබෙන ඇමතිවරයෙකු වන ඔබතුමාට මා විශේෂයෙන්ම කියන්නේ මෙයයි. අපි මේ පනත් කෙටුම්පතට ඉදිරිපත් කරන්නේ සුළු සංශෝධන ටිකක්, ගරු ඇමතිතුමනි. ඒ සුළු සංශෝධන ටික තමුන්නාන්සේලා පිළිගත්තොත්, මේ පනත් කෙටුම්පත සම්පූර්ණයෙන් වෙනස් වෙලා මේක මේ රටේ ජනතාවට, මාධ්‍යයට, විපක්ෂයට, සියලු දෙනාට පිළිගන්න පුළුවන් පනතක් බවට පත් වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. K.P.S. Kumarasiri. You have ten minutes.

[අ.භා. 2.02]

**ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා**
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත දෙවැනිවර කියවීමේ විවාදය පැවැත්වෙන මේ වෙලාවේ මට පුදුම හිතෙනවා අපේ ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා කියපු සමහර කාරණා ගැන. එතුමා ඉතාම පැහැදිලිව පිළිගත්තා මේ පනත් කෙටුම්පත මේ රටට ඉතාම වැදගත්ය කියන කාරණය. ඒ වාගේම මේ වෙලාවේ මේ පනත් කෙටුම්පත ගෙන ඒමත් සුදුසු බව විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු හැටියට එතුමා ඉතාම පැහැදිලිව පිළිගත්තා. හැබැයි, හාස්‍යයට කාරණාව මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2019 ඉඳලාම එතුමන්ලාට මේ පනත් කෙටුම්පතට සංශෝධන ගෙනෙන්න ඕනෑ තරම් අවස්ථාව තබුණා. ඒ වාගේම, මේ පනත් කෙටුම්පත පිළිබඳ යම් ගැටලුවක් තිබෙනවා නම්, ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් උසාවි යන්නත් අවස්ථාව තිබුණා. නමුත්, මෙයට සංශෝධන ඉදිරිපත් කරන්න තිබෙනවා කියලා ඊයේ තමයි එතුමන්ලා කියන්නේ. මේක හාස්‍යයට කාරණයක්. ඒ නිසා අපට පෙනෙනවා, විපක්ෂය අද මේ පනත් කෙටුම්පත පිළිබඳ අවබෝධයෙන් නොවෙයි කටයුතු කරන්නේ කියලා. මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පසුව ජනතාවට ලැබෙන වරප්‍රසාද

[ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා]

පිළිබඳව නොවෙයි එතුමන්ලා අද මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ කථා කරන්නේ. ඩීසල් නැති එක, විදුලිය නැති එක, ගෑස් අර්බුදය ගැන තමයි එතුමන්ලා කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා විශේෂයෙන් කියන්න ඕනෑ මේ පනත් කෙටුම්පත සම්මත වීම තුළින් වන යහපත. මා නියෝජනය කරන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කය. ඒ වාගේ දුෂ්කර දිස්ත්‍රික්කයක් නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට මා විශේෂයෙන්ම කියන්න කැමැතියි, මේ පනත් කෙටුම්පත සම්මත වුණාම ඒ මඟින් ජනතාවට ලැබෙන වරප්‍රසාද, වරදාන පිළිබඳව අපි බොහොම කල්පනාවෙන් කටයුතු කරන්න ඕනෑ බව.

මේ පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය ආරම්භයේදීම ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමා කියපු කාරණාවක් තිබෙනවා. අපි උදාහරණයක් ලෙස හිතමු, හැඳුනුම් පතක් හදා ගැනීමක්. හැඳුනුම් පත හදාගන්න පදවිය පැත්තේ ඉඳලා, කැබිතිගොල්ලෑව පැත්තේ ඉඳලා එන අය දත්ත පිළිබඳ ප්‍රශ්න නිසා පුදුම විධියේ අපහසුතාවන්ට පත් වෙනවා. අපේ ප්‍රදේශවල අය යම් කාරණාවක් ඉටු කරගන්න මෙහාට ආවාම, පැය 24කින්, පැය 12කින්, පැය 10කින් කරගන්න පුළුවන් ඒ කටයුත්ත කර ගන්න ඒ අයට දවස් දෙකක්, තුනක් බලා ඉන්න සිදු වන බව අපි දන්නවා. ඒ නිසා රාජ්‍ය යන්ත්‍රණය ඩිජිටල්කරණය කළොත් මේ රටේ ජනතාව බලාපොරොත්තු වන තමන්ගේ කාර්ය භාරය, තමන්ට රාජකාරිමය පැත්තෙන් කරවා ගන්න තිබෙන කටයුතු ඉතාම හොඳින් කර ගන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා. ඒ කටයුත්ත කරගන්න තිබෙන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් වෙන්න පුළුවන්; ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් වෙන්න පුළුවන්; එහෙම නැත්නම් වෙනත් ආයතනයකින් වෙන්නත් පුළුවන්.

අතිගරු ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළ යටතේ කරගෙන යන තවත් කටයුත්තක් ගැන මා කියන්න ඕනෑ. ග්‍රාමීය ජනතාවගේ ශුභ සිද්ධිය සඳහා ග්‍රාම නිලධාරි වසමකට පොලිසියට අනුයුක්තව රාජකාරි කරන නිලධාරින් දෙදෙනෙකු බඳවා ගන්න මේ වන විට කටයුතු කරමින් සිටිනවා. ඒ අය හරහාත් අපට දත්ත ඒක රාශි කරන්න පුළුවන්කම තිබෙනවා. අපි දන්නවා, ග්‍රාම නිලධාරි වසමක ග්‍රාම නිලධාරි ද ඇතුළුව ක්ෂේත්‍ර නිලධාරින් 5දෙනෙකු සිටින බව. ඒ අය හරහා සමස්ත රටේ ජනතාවගේ දත්ත ඒක රාශී කරලා ඒවා ආරක්ෂා කර ගැනීමේ ඉතාම වැදගත් වැඩ පිළිවෙළක් තමයි අද ක්‍රියාත්මක වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පතේ යම් යම් කාරණා පිළිබඳව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය යෝජනා 5ක් ඉදිරිපත් කළා. හැබැයි, වැදගත්ම කාරණාව තමයි ඔවුන් ඉදිරිපත් කළ ඒ යෝජනා 5 ම මේ පනත් කෙටුම්පතේ අන්තර්ගත වෙලා තිබීම. මේ පනත් කෙටුම්පත කොච්චර සාධාරණද, මේ පනත් කෙටුම්පත කොයි විධියටද සකස් කරලා තිබෙන්නේ කියන කාරණාව ඒ ආයතනය පවා අද ඉතාම හොඳින් පිළිගෙන තිබෙන බව පැහැදිලිව පෙනෙනවා. ඒ නිසා අපි විපක්ෂයට කියන්න ඕනෑ, කන්න හිතුණාම කබරගොයා, තලගොයා කර ගන්න න්‍යායෙන් අයින් වෙලා, හොඳ දේ දිහා හොඳ විධියට බලා කටයුතු කරන්න කියලා. තමුන්නාන්සේලා පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා රටේ ජනතාවට අසත්‍ය කියන්න එපා. මේ පනත තුළින් මාධ්‍යවේදීන්ට යම් අසාධාරණයක් සිදු වෙනවා කියලා මෙතැනට ආ වෙලාවේ ඉඳන්ම විපක්ෂයේ අය කියනවා මම දැක්කා. අපි අහනවා, මේකෙන් මාධ්‍යවේදීන්ට සිදුවන අසාධාරණය මොකක්ද කියලා. බොහොම ශක්තිමත් පනත් කෙටුම්පතක් මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. විශේෂයෙන් අමාත්‍යවරයා විධියට රටේ ජනාධිපතිවරයා තමයි දත්ත ආරක්ෂණ අධිකාරිය පත් කරන්නේ. ඒ පත් කිරීම ඒ තරම් සාධාරණ වන කොට මාධ්‍යවේදීන්ට වන අසාධාරණය මොකක්ද කියන ප්‍රශ්නය අපි විපක්ෂයෙන් අහනවා.

අපේ ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමා කිව්වා, සියලු පාර්ශ්ව එක්ක සාකච්ඡා කරලායි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ කියලා. මේ යුගය බැලුම් උඩ යවන යුගයක් නොවෙයි. අපි එය විශේෂයෙන්ම කියන්න ඕනෑ. පසුගිය ආණ්ඩුව කාලයේ ඩිජිටල්කරණය කරන්න ගියේ කොහොමද කියලා අපි දැක්කා. බැලුම් ඇරපු හැටි, ඒ බැලුම් කඩාගෙන වැටිච්ච හැටි අපි දැක්කා. අපි ආණ්ඩුවක් හැටියට විශේෂයෙන්ම කියනවා, ඉතාම කාලෝචිත, මේ අවස්ථාවේ රටට ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් සම්මත කරගැනීම සඳහා තමයි අපේ ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා අද දවසේ කටයුතු කර තිබෙන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පෞද්ගලික දත්ත සුරක්ෂිත කිරීම, තොරතුරුවල රහස්‍යභාවය පවත්වාගෙන යෑම සහ පෞද්ගලික දත්ත සැකසීම නියාමනය කිරීම ආදිය වෙනුවෙන් සම්පාදිත පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පතේ සාර්ථකත්වය මනාව පැහැදිලි වනවා. මේ පනත් කෙටුම්පත ඉතාම වටිනා එකක්. ඒ වාගේම, පුරවැසියන්ට සවියක් මෙන්ම අවියක් ද වෙමින්, මෙම පසුබිම තුළ පෞද්ගලික තොරතුරුවල සුරක්ෂිතභාවය සඳහා නීතිමය රාමුවක් මෙසේ නිර්මාණය වීම අයිතිවාසිකම් ආරක්ෂා වීමක් සහ පුරවැසියන් ලැබූ ජයග්‍රහණයක් කියායි මා විශ්වාස කරන්නේ. ඒ නිසා පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීමට ගත් මේ උත්සාහය පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාටත්, අපේ ගරු නාමල් රාජපක්ෂ අමාත්‍යතුමාටත් අපි ස්තුතිවන්ත වෙනවා.

අද රටේ තිබෙන තත්ත්වයත් එක්ක මේ මොහොතේ මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ඉතාම වැදගත්. විපක්ෂය අද උදේ ඉඳන් මේ පනත් කෙටුම්පත පිළිබඳව එක වචනයක්වත් කථා නොකර, ඒ ගොල්ලන්ගේ උද්ඝෝෂණයකට සහභාගි වීම ගැන කථා කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙච්චර වැදගත් පනත් කෙටුම්පතක් ගැන සාකච්ඡා කරන වෙලාවේ විපක්ෂයේ මාතෘකාව බවට පත් වෙලා තිබෙන්නේ එතුමන්ලාගේ උද්ඝෝෂණය සඳහා ජනතාව සහභාගි කරවීමයි. ඒක තමයි අද මේ පාර්ලිමේන්තුවේදී එතුමන්ලාගේ කතිකාව බවට පත් වෙලා තිබෙන්නේ. අපට ලජ්ජයි. තාක්ෂණය දියුණු වෙමින් තිබෙන අවස්ථාවක, ලෝකයත් එක්ක ගනුදෙනු කරන තරුණ තරුණියන් වෙනුවෙන් මේ රටේ රාජ්‍ය යාන්ත්‍රණය සඳහා මෙවැනි වැදගත් පනත් කෙටුම්පතක් ගෙනෙන වෙලාවේ අද මෙතුමන්ලා කථා කරන්නේ මොනවාද කියන එක ගැන අපි ලජ්ජාවට පත් වෙනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම වැඩ පිළිවෙළේ තිබිච්ච කාරණා දෙකක් තමයි මේ රටේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීම සහ ඩිජිටල් තාක්ෂණය මේ රට පුරාම ගෙනයෑම කියන කාරණා. අද ඒ කටයුතු කිරීමට ඉතා වැදගත් විධියට රාජ්‍ය අමාත්‍යවරයෙක් පත් කරලා තිබෙනවා. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ යහ පාලනය කාලයේ වාගේ උඩ යවපු බැලුම් කඩාගෙන වැටෙන්න නොදී, අද ඉතා වැදගත් විධියට මේ රටේ ඩිජිටල්කරණ කටයුතු කිරීමට මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා, ඒ තුළින් මේ රටේ ජනතාවට සත්‍ය තොරතුරු ලබාදීමට කටයුතු කිරීම පිළිබඳව ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමාට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

මම අවසාන වශයෙන් අපේ විපක්ෂයෙන් ඉල්ලීමක් කරනවා. ඉතා වැදගත් පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු වෙලාවේ ඒකට ඔබතුමන්ලාගේ සහයෝගයත් ලබා දීලා, එය සම්මත කර ගන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා විපක්ෂයෙන් මා ඉල්ලා සිටිනවා.

මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Ajith Mannapperuma. You have eight minutes.

[අ.භා. 2.11]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත ඉතා වැදගත් පනතක්; අවශ්‍ය පනතක්. එය ගෙන ඒමට ප්‍රමාද වුණා වැඩියි කියන එක තමයි මගේ අදහස. හැබැයි මේකේ තිබෙන ප්‍රශ්නය තමයි, මේක හරියට නිකම් විස පොවපු කේක් ගෙඩියක් අයිසින් කරලා වාගේයි. මේ පනත් කෙටුම්පත ගැන ලස්සන කථා ටිකක් තිබෙනවා. ඒක අස්සෙන් වෙන ගේම් එකක් යනවා. අන්න ඒ ගේම් එක නැති කරලා නිවැරදි දිසාවට මේ පනත් කෙටුම්පත ගෙනියන්න තමයි විපක්ෂයක් වශයෙන් අපි උත්සාහ කරන්නේ. අද ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ කනස්සල්ල පළ කරලා 'ලංකාදීප' පත්තරයේ ලිපියක් තිබෙනවා. මම එම ලිපිය **සභාගත*** කරනවා.

මේ ගැන කා එක්කවත් සාකච්ඡා කරන්න ඕනෑ නැහැ. අඩු ගණනේ මේ පත්තරවල ඉන්න කර්තෘලාත් එක්ක සාකච්ඡා කළා නම්, මේ පනත් කෙටුම්පතේ සංශෝධනය කරන්න ඕනෑ මොනවාද කියලා තේරුම් ගන්න පුළුවන් වෙනවා. ඒ වාගේම, ජනමාධ්‍යවේදීන්ගේ සංවිධාන ගණනාවකුත් ඒකාබද්ධ ලිපියක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේවා සැලකිල්ලට අරගෙන මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්නවා නම් වටිනවා කියලා මම කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ දේශපාලනඥයෝ ගොඩක් හොරකම් කරන බව අපි දන්නවා. මේ හොරකම් හෙළි වෙනවා. මාධ්‍යවේදීන් තමයි මේවා හෙළි කරන්නේ. Pandora Papers මඟින් මේ රටේ දේශපාලනඥයෝ කරපු හොරකම් හෙළිදරවු කළා. ඊයේ පෙරේදා Swiss Bank එකේ දත්ත අනුව හෙළි වෙලා තිබෙනවා, ලංකාවේ 9 දෙනෙකුගේ සල්ලි ඩොලර් වශයෙන් තැන්පත් වෙලා තිබෙනවා කියලා. ජනමාධ්‍ය හරහා මේ වාගේ දේවල් හෙළිදරවු වෙද්දී, මේ පනත් කෙටුම්පත ගෙන ඒම තුළින් ජනමාධ්‍ය යම් පාලනයකට ලක් වෙනවා. අපි දන්නවා, එදා ලසන්ත වික්‍රමතුංග වාගේ ජනමාධ්‍යවේදීන් ඝාතනය කළ බව. තමුන්ගේ හොරකම් හෙළි කළාය කියලා ඒ ඝාතනය කළා කියලා අපි දන්නවා. තමුන්ගේ තොරතුරු හොළි කළාය කියලා තමුන්නාන්සේලා එක්නැලිගොඩ අතුරුදහන් කළා. ඒ වාගේ ප්‍රශ්න තියෙද්දි -

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Namal Rajapakse?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ වෙලාවද ගන්නේ, මගේ වෙලාවද?

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
මගේ වෙලාවෙන් අඩු කරන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය කියන ජනමාධ්‍යවේදීන්ගේ නිදහසට බාධා වන මේ පනතේ තිබෙන වගන්තිය පෙන්වන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මෙහෙමයි, ගරු ඇමතිතුමනි.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
නැහැ, ඒ වගන්තිය පෙන්වන්න කෝ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
වගන්තිය නොවෙයි, ගරු ඇමතිතුමනි. ඔබතුමාට ඒක හරි ලස්සනට පැහැදිලි කරන්න පුළුවන්. ඒකයි මම කිව්වේ, මේක විස පොවපු, ලස්සනට අයිසින් කරපු කේක් ගෙඩියක් කියලා. මේකේ තිබෙනවා, -

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ඔබතුමාගේ ගැටලුවට අපට විසඳුමක් දෙන්න පුළුවන්. ඒක මොන වගන්තියද කියලා පෙන්වන්න කෝ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
හරි, මම පෙන්වන්නම්. මට වෙලාව දෙන්න.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
හරි, කියන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු ඇමතිතුමනි, මගේ කථාව අහගෙන ඉන්න කෝ. මේ ආණ්ඩුවේ පාර්ශ්වය තමයි මේ දත්ත ආරක්ෂණ අධිකාරිය පිහිටුවන්නේ. දඩුවම් දීමේ බලය තිබෙන්නේ ආණ්ඩුවට. එතකොට ආණ්ඩුව පත් කරන ලද නියෝජිතයන්ට තමයි දඬුවම් දීමේ බලය තිබෙන්නේ. අපි හිතමු, Pandora Papersවල නිරුපමා රාජපක්ෂ නෝනාගේ සල්ලි මෙච්චර ගණනක් ඩොලර්වලින් තිබෙනවා කියලා. ලංකාව තුළ ඒක ඔප්පු වෙලා නැහැ. ඒ නිසා එතුමියගේ කීර්තිනාමයට හානියක් වෙලා කියලා යම් නඩුවක්

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

දමන්න මේ ආණ්ඩුවේ අයට පුළුවන්. මේ ආණ්ඩුවේ අයමනේ දත්ත ආරක්ෂණ අධිකාරියේ ඉන්නේ. මේ පනත් කෙටුම්පතෙන් ජනමාධ්‍ය control කරන්න යන්න එපා කියන එක තමයි අපි කියන්නේ.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු මන්ත්‍රීතුමනි, යම්කිසි කෙනෙකුට නඩු දාන්න ඕනෑ නම්, දැනුත් දාන්න පුළුවන්. ඒකට මේ පනත් කෙටුම්පත සම්මත වෙන්න ඕනෑ නැහැ. *[බාධා කිරීමක්]* ඔබතුමා පටලවාගෙන ඉන්නේ. ඔබතුමන්ලා මේ පටලවාගෙනයි තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනතේ තිබෙන්නේ පෞද්ගලික දත්ත ආරක්ෂාව - personal data protection - ගැන. එහෙම නැතුව මාධ්‍යවේදීන් මර්දනය කිරීමවත්, තවත් මාධ්‍යයක ගිය එකක් නැවත වතාවක් ලිවීමට බැහැ කියන කාරණයවත් නොවෙයි. මේ මන්ත්‍රීතුමා ඒවා පටලවාගෙන ඉන්නේ. මේක පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත - Personal Data Protection Bill එක. මේක පටලවාගන්න එපා. ඔබතුමන්ලා ඉතිහාසය ගැන කථා කරනවා. ලසන්ත වික්‍රමතුංග මැතිතුමා ගැන කියනවා. ඒ කාරණා මේ පනත් කෙටුම්පතත් එක්ක මෙලෝ සම්බන්ධයක් නැහැ. කිසිම සම්බන්ධයක් නැහැ. පෙට්‍රල්, ඩීසල්වලට සම්බන්ධයකුත් නැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ඔබතුමා ශ්‍රී ලංකා කර්තෘ සංසදය එවලා තිබෙන ලිපිය බලන්න. ඒකේ තිබෙනවා, "දත්ත සැකසුම් කාර්යයේදී ජනමාධ්‍යවේදී අරමුණ නිදහස් කිරීම අන්තර්ජාතික හා සංසන්දනාත්මක ප්‍රමිතීන්හි පිළිගැනීමට ලක්ව ඇති බවත්, අසල්වැසි රටවල පවා එම කාර්යය ඒ ආකාරයෙන් සිදු කර ඇති බවත්..." කියලා. අපට අධිකරණයට යන්න පුළුවන්. අධිකරණය පිළිබඳව අපට විශ්වාසයක් තිබෙනවා. ස්වාධීන අධිකරණයක් අපට තිබෙනවාය කියන විශ්වාසය තවම අපේ රටේ ජනතාව තුළ තිබෙනවා.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,-

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මම කථා කරලා ඉවර වෙනකල් ඔබතුමා පොඩ්ඩක් අහගෙන ඉන්න. *[බාධා කිරීමක්]*

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු මන්ත්‍රීතුමනි, මම තර්ක කරනවා නොවෙයි. මම ඔබතුමාගේ වැරදි මතය නිවැරදි කරනවා. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Member, the Hon. Namal Rajapaksa is given time from the time allotted for the Government side and being the Cabinet Minister in charge of the subject, he has the right to clarify it.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

මම විෂය භාර ඇමතිවරයා නේ. *[බාධා කිරීමක්]* You cannot mislead the House. මොකද, ඔබතුමා වැරදි මතයක් ඉදිරිපත් කරන්නේ. අනිත් එක, ඔබතුමා අධිකරණය විශ්වාසයි කියලා අධිකරණය ගැන කථා කළා. ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරුන් දෙදෙනෙක් ජිනීවා මානව හිමිකම් කොමිසමට ගිහිල්ලා පැමිණිල්ලක් දැම්මා නේ අධිකරණය විශ්වාස නැහැ කියලා. දැන් ඔබතුමා කියන්න කෝ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

අධිකරණය ගැන අපට යම් දුරක විශ්වාසයක් තිබෙනවා. ඔබතුමා මට චෝදනා කරනවා, මම මේ House එක mislead කරනවා කියලා. නමුත් ඔබතුමන්ලා මේ රටේ සම්පූර්ණ ජනතාවම mislead කළා කියලා මතක තියාගන්න. හැටනවලක්ෂයක් ජනතාව රැවැට්ටුවා. අපි අද දුක් විඳිනවා. මගේ ගමේ පන්සලට - කැලණි විහාරයට - නාගයෙක් ඇවිල්ලා ධාතු වැඩම කළා කියලා මුළු බෞද්ධ සංස්කෘතියම විනාශ කළා. බලය අරගෙන මුළු රටම mislead කරලා තමයි කථා කළේ. මම මේ House එක mislead කරනවා කියලා අද කියන්න එනවා. එම නිසා මම විශේෂයෙන් මේ කාරණය කියන්න කැමැතියි. අපට අධිකරණයට යන්න පුළුවන්. දැන් තිබෙන්නේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව විසින් පත් කරන ලද අධිකරණයක්. අන්න ඒකයි මේකේ තිබෙන ප්‍රශ්නය. එහි සාමාජිකයෝ පත් කරන්නේ, අධිකාරිය පත් කරන්නේ ඔබතුමන්ලාගේ රජය. ඔබතුමන්ලා හිතන්න එපා, හැමදාම ඔබතුමන්ලා ඇවිල්ලා,-

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම පැහැදිලි කරන්න ඕනෑ. මොකද, එතුමා කියන්නේ සම්පූර්ණ වැරදි මතයක්. මේ තනතුර ආණ්ඩුවෙන් පත් කරන්නේ නැහැ. හොඳම උදාහරණය ගමු කෝ. ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ "සුවසැරිය" ගෙනාවා. "සුවසැරිය" ගෙනාවාම අතිගරු ජනාධිපතිතුමා තමයි ඒකේ Board එක පත් කළේ. අපේ ජනාධිපතිතුමා හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමන්ලාම පත් කරපු Board එක නැවත පත් කළේ නැද්ද? හොඳට වැඩ කරගෙන ගිය නිසා ජනාධිපතිතුමා ඒ Board එකම පත් කළා. ඒ වාගේම තමයි, අදටත් මේ රටේ ජනාධිපතිවරයාට තමයි සමහර පත්වීම් කරන්න පුළුවන්. ජනාධිපතිවරයා ඒ පත්වීම් කරනකොට අදාළ පනතේ සඳහන් කර තිබෙනවා, ඒ පත් කරන කෙනාගේ සුදුසුකම් මොනවාද කියලා. ඒ සුදුසුකම්වලට අනුව පත්වීම් කරන්න පුළුවන්. ඔබතුමන්ලාගේ පක්ෂයට ඉතිහාසයක් තිබෙනවා, පාතාලයේ අය ගෙනැල්ලා තනතුරුවලට පත් කළා කියලා. ඒක වෙනම කාරණයක්. අපි වග කීමකින් කියනවා, මේ පනතට ලබා දී තිබෙන සංශෝධන ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමාට පත් කළ හැක්කේ සුදුසුකම් තිබෙන අය පමණයි. අපි ඒ සංශෝධන ඔබතුමන්ලාට ලබා දී තිබෙනවා. මෙය ජනාධිපතිවරයා විසින් කරනු ලබන ලංකා ඉතිහාසයේ පළමුවැනි පත්වීම නොවෙයි. ජනාධිපතිතුමා TRC එකට පත් කරනවා, වෙනත් සභාපතිවරු පත් කරනවා, විශ්වවිද්‍යාල සඳහා පත්වීම් කරනවා, අධිකරණයට නඩුකාරවරු පත් කරනවා. ඒ නිසා මෙතැනදී මහා බිල්ලෙක් මවන්න එපා. ගරු මන්ත්‍රීතුමනි, පත් කරන්නේ කවුද, මොන ක්‍රමවේදයකටද කියන එක පිළිබඳව මේ පනත් කෙටුම්පතේ සඳහන් කරලා තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා කියන විධියේ දේශපාලන බිල්ලෙක් කිසිසේත් මේ තුළ නිර්මාණය කරන්න එපා. මොකද, දේශපාලනය කරන අපි අද බලයේ ඉන්නවා, ඔබතුමන්ලා හෙට බලයට එන්න පුළුවන්. ඒ

වාගේම ජනාධිපතිවරු මාරු වෙනවා. ඒ එන ඕනෑම ජනාධිපතිවරයෙකුට මේ පත් කිරීම් කරන්න පුළුවන්. එහෙම නම් අපටත් කියන්න පුළුවන් නේ, ඊළඟට එන ජනාධිපතිවරයාට මේකෙන් දේශපාලන වාසි ගන්න පුළුවන් කියලා. මේකෙන් කිසිසේත්ම දේශපාලන වාසියක් ලබා ගන්න බැහැ. අනෙක් එක, මේ තොරතුරු සහ දත්ත නියාමනය - regulate - කරන එකෙන්, licences issue කරන එකෙන් මොන දේශපාලන වාසියක්ද ලබා ගන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? මෙතුමා පටලවාගෙන.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතැන දේශපාලන වාසියක් කියලා කියන්නේ මේකයි. අපි කියන්නේ, මෙච්චර කාලයක් මේ රටේ වෙච්ච හොරකම්, වංචා හෙළි කළේ ජනමාධ්‍යවලින්. ලසන්ත වික්‍රමතුංග වැනි අය මැරුණේ ඒවායේ ප්‍රතිඵල වශයෙන්. නමුත්, නීතිමය වශයෙන් ඔබතුමන්ලා අධිකාරියක්, -

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පතේ මාධ්‍යවේදීන්ගේ නිදහස සීමා කරලා තිබෙන වගන්තිය පෙන්වන්න කියලා මම නැවතත් එතුමාට කියනවා. එතකොට අපි ඒ ගැන සාකච්ඡා කරමු. ගරු මන්ත්‍රීතුමනි, ඒ වගන්තිය කියවන්න කෝ; වගන්තිය පෙන්වන්න කෝ. Mike එක ගන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු ඇමතිතුමනි, ඔබතුමා මා එක්ක සාකච්ඡා කරන්න ඕනෑ නැහැ. අද "ලංකාදීප" පත්තරය අරගෙන බලන්න. අද "ලංකාදීප" පත්තරයේ විශේෂයෙන්ම සඳහන් කරලා තිබෙනවා, මාධ්‍යවේදීන්ට තිබෙන ප්‍රශ්නය පිළිබඳව.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Yes, Hon. Namal Rajapaksa?

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා සම්පූර්ණයෙන්ම මේ ගරු සභාව නොමඟ යවනවා. මේ සම්බන්ධයෙන් consultations ලබා ගැනීමට මාධ්‍යවේදීන්, සිවිල් සංවිධාන ඇතුළු මීට සම්බන්ධ සියලු ආයතනවල නියෝජිතයන් සහ අපි හත් වතාවක් හමු වුණා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මට ගරු ඇමතිතුමා කථා කරන්න දෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ඒ වාගේම අපි ජාත්‍යන්තර සංවිධාන එක්ක මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළා. මේ පනත් කෙටුම්පත, ලෝක ඉතිහාසයේ පළමුවැනි වතාවට ලංකාවට විතරක් හඳුන්වා දෙන පනත් කෙටුම්පතක් නොවෙයි. මේ විෂය සම්බන්ධව යුරෝපීය සංගමයට වෙනම පනතක් තිබෙනවා; ලෝකයේ බොහෝ රටවලටත් වෙනම පනත් තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා ඉස්සෙල්ලා මේ පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත කියවලා ඉන්න. *[බාධා කිරීම්]* මේ පනත් කෙටුම්පත කියවන්නේ නැතිව පත්තර කැල්ලක් අරගෙන ඇවිල්ලා, එතුමා මේ ගරු සභාවේ විවාද කරන්න හදනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Thank you, Hon. Minister.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Harshana Rajakaruna, what is the point of Order?

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ගරු අමාත්‍යතුමාට කියන්න තිබෙන කාරණා පිළිතුරු කථාවේදී කියන්න පුළුවන්. එතුමා නිසා මේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවට බාධා වනවා; එතුමාට කථා කරන්න ලැබෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]* මට ඊළඟට කථා කරන්න තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Member, that is not a point of Order. Hon. Ajith Mannapperuma, please continue with your speech.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මිනිසුන්ගේ අදහස් තේරුම් ගන්නේ කොහොමද අපට පාර්ලිමේන්තුවේදී කථා කරන්න දෙන්නේ නැතිව?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Yes, Hon. Johnston Fernando?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මට නිවැරැදි කිරීමක් කරන්න අවශ්‍යයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඇමතිවරයෙකුට ඕනෑ වෙලාවක නැඟිටලා කථා කරන්න පුළුවන්. හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමනි, ඔබතුමා ඇමති කෙනෙක් වෙලා හිටියේ නැහැ නේ? ඇමතිවරයෙකුට පනත් කෙටුම්පතක් සම්බන්ධව ඕනෑම වෙලාවක කථා කරන්න පුළුවන්. ඇමතිවරයෙක් පනත් කෙටුම්පතක් සම්බන්ධව විවාද කිරීමේදී ගරු සභාවේ වැඩ කටයුතු අවසන් වනතුරුම වාඩිවෙලා ඉන්නේත් ඒ සම්බන්ධ කරුණු පැහැදිලි කරන්නයි. ඔබතුමා මම කියන කාරණය අහගන්න, ගරු මන්ත්‍රීතුමනි. ඒ අයිතිය - right එක - සම්පූර්ණයෙන්ම ඇමතිවරයෙකුට තිබෙනවා. නාමල් රාජපක්ෂ ඇමතිතුමා ඒ ගරු මන්ත්‍රීතුමාට අභියෝග කළේ පනත් කෙටුම්පත කියවන්න කියලායි. පනත් කෙටුම්පත කියවන්නේ නැතිව එතුමා පත්තර කෑල්ලක් අරගෙන ඇවිල්ලා ඒක කියවනවා. ඔබතුමා පනත් කෙටුම්පත කියවන්න කෝ, ගරු මන්ත්‍රීතුමනි. ගරු ඇමතිතුමා ඔබතුමාට අභියෝග කරන්නේ මාධ්‍යවේදීන්ගේ ප්‍රශ්නය පිළිබඳව පනත් කෙටුම්පතේ සඳහන් වන්නේ කුමන වගන්තිය යටතේද කියලා සඳහන් කරන ලෙසයි. ඔබතුමා ඒ පනත් කෙටුම්පත කියවන්න කෝ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මගේ වැඩේ මම කරන්නම්.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඔබතුමා පනත් කෙටුම්පත කියවන්න, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා කියවන්න දන්නේ නැහැ. ඒක තමයි ඇත්ත තත්ත්වය.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Ajith Mannapperuma, please continue with your speech.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමනි, මම පාර්ලිමේන්තුවට එවලා තිබෙන්නේ ඔබතුමා නොවෙයි, මේ රටේ ජනතාව. ඔබතුමා කියන දේ කරන්න මම මේ ගරු සභාවට ඇවිල්ලා නැති බව මතක තියාගන්න. අපි කථා කරන්නේ රටේ ජනතාව වෙනුවෙන්. මේ රට විනාශ වෙලා තිබෙන්නේ හොරකම් නිසායි.

ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ සභාපති පත් කළේ කවුද? පසුගිය දිනවල ගෑස් ආශ්‍රිත පිපිරීම් සිදු වුණා. මොනවාද දීපු දඬුවම්? ජනාධිපතිතුමා නේ, ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ සභාපති පත් කළේ. ජනාධිපතිතුමා ගිහිල්ලා, ගෑස් ආශ්‍රිත පිපිරීම් නිසා අලාභ සිදු වූ මිනිසුන්ට වන්දි ගෙව්වාද? මැරුණු මිනිස්සු වෙනුවෙන් වන්දි ගෙව්වාද? අසූචි නැව ගෙන්වපු කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරීන් පත් කළේ කවුද? ජනාධිපතිතුමා නේ? ඒකට ඩොලර් හැටනව ලක්ෂයක් වන්දි ගෙවද්දී, ඒ මුදල ගෙව්වේ ජනාධිපතිතුමාද? ඒ මුදල ගෙව්වේ මේ රටේ අහිංසක මිනිස්සු නේද? පොහොර ප්‍රශ්නය සම්බන්ධයෙන් කමිටු පත් කර ගත්තේ කවුද? ඒ කමිටු පත් කළේ ජනාධිපතිතුමා නේද? ගොවියෝ කොච්චර කෑ ගැහුවාද කුඹුරට ගිහිල්ලා? *[බාධා කිරීමක්]*

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Namal Rajapaksa?

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තරහ ගියා නම් අපට සමාවෙන්න. ඒ කාරණා කිසිවක් මේ පනත් කෙටුම්පතට අදාළ නැහැ. මේ පනත් කෙටුම්පත පෞද්ගලික දත්ත ආරක්ෂණය පිළිබඳ පනත් කෙටුම්පතක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි කථා කරන්නේ තාක්ෂණ ලෝකය එක්කයි. තාක්ෂණ ලෝකයක ජීවත් වන දරුවන්ට මේ කාරණා අදාළ නැහැ. මේ පනත් කෙටුම්පත මේ රටේ අනාගතය ගැන හිතලා ගෙනා පනත් කෙටුම්පතක්. මේ පනත් කෙටුම්පතේ ප්‍රශ්නයක් තිබෙනවා නම්, අපි ඒ පිළිබඳව සාකච්ඡා කරමු. අවුරුදු එක හමාරක් අපි මේ පිළිබඳව සාකච්ඡා කළා. අද ඔබතුමා මේ පනත් කෙටුම්පත කියවන්නේ නැතිව පත්තර කෑල්ලක් අරගෙන ඇවිල්ලා කියවනවා. ඔබතුමා සංශෝධන කියෙව්වාද ගරු මන්ත්‍රීතුමනි? සංශෝධනවත් කියවන්නේ නැතිව එතුමා මේ පනත් කෙටුම්පත විවේචනය කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එතුමා කරන වැඩේ වැරැදියි නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Ajith Mannapperuma, you have one more minute.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ ජනාධිපතිතුමා විසින් සිදු කරන පත් කිරීම් පිළිබඳව අපට විශ්වාසයක් නැහැ. මේ තනතුරුවලට පත් කරන්නේ කවුද කියලා අපි දන්නවා. ඒ ආයතනවලට පත් කරපු නිලධාරීන් බොහෝ දෙනෙක් හොරකම් කළා. මේ රට මේ තත්ත්වයට පත් වුණේ ජනාධිපතිතුමා විසින් මෙවැනි නිලධාරීන් මේ තනතුරුවලට පත් කිරීම නිසායි. ඒ නිසා අපි ස්වාධීන වෙන්න නම්,- *[බාධා කිරීමක්]*

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Namal Rajapaksa?

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රටේ විධායක ජනාධිපතිවරයා විසින් සිදු කරන පත්වීම් පිළිබඳව එතුමාට ගැටලුවක් තිබෙනවා නම්, ඒ පිළිබඳව ව්‍යවස්ථා සංශෝධනයකදී

කථා කරමු. ඒ පිළිබඳව කථා කරන්න ඕනෑ, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත - Personal Data Protection Bill - පිළිබඳව විවාද කරන අවස්ථාවේදී නොවෙයි. ජනාධිපතිවරයාගේ බලතල පිළිබඳව ව්‍යවස්ථා සංශෝධනයකදී කථා කරමු. ඒ පිළිබඳව මේ අවස්ථාවේදී කථා කරන එක වැරැදියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please speak relevant to the Debate.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
දැන් ගරු ඇමතිතුමා කිව්වා, ජනාධිපතිවරයා තමයි ඒ කාර්ය මණ්ඩලය පත් කරන්නේ කියලා. නඩු කියන, දඬ ගහන උසාවියටත් නිලධාරින් පත් කරන්නේ ජනාධිපතිතුමා නම්, උසාවිය පිළිබඳව මේ රටේ ජනතාවට තිබෙන විශ්වාසය මොකක්ද?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
උසාවිවල තිබෙන තත්ත්වය මොකක්ද? උසාවිවල කටයුතු පිළිබඳව අපට විශ්වාසයක් තිබෙනවා. ජනාධිපතිතුමා කරන පත් කිරීම් ගැන අපට තිබෙන විශ්වාසය මොකක්ද? අපි කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්න කියලා නොවෙයි. කාර්ය මණ්ඩල පත් කිරීමේ විෂයයෙන් ජනාධිපතිතුමාට ඉවත් වෙන්න කියලයි අපි කියන්නේ. ඒ කටයුත්ත ස්වාධීන කරන්න. ඒ කටයුත්ත ස්වාධීන කළාම ඒ විනිශ්චය අපට පිළිගන්න පුළුවන්. එහෙම නැතිව ජනාධිපතිතුමාගේ අතකොළු පත් කරලා, ඒ අතකොළුවලින් ලබා දෙන තීන්දු ද ක්‍රියාත්මක කරන්න වෙන්නේ? මේ රටේ හොරකම් කරන ඇමතිවරු ඉන්නවා; මන්ත්‍රීවරු ඉන්නවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, your time is up. Please wind up.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඒ අය පිළිබඳව ජනමාධ්‍යයෙන් හෙළිදරව් කරන්නේ කොහොමද? ඒ අයට දඬුවම් දෙන්නේ කවුද? ජනාධිපතිවරයා පත් කරපු,- *[බාධා කිරීමක්]*

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Namal Rajapaksa?

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමාගේ හිතේ තිබෙන වේදනාව මට තේරෙනවා. පසුගිය ආණ්ඩුව කාලයේ හිටපු ජනාධිපතිවරයා සිංගප්පූරුවේ සිටි අර්ජුන මහේන්ද්‍රන් ලංකාවට ගෙනැල්ලා, මහ බැංකු අධිපතිවරයා හැටියට පත් කළා කියන චෝදනාව තමයි එතුමා මේ කරන්නේ. අපි මෙහෙම කරමු. ඔබතුමා ඒ වෙනුවෙන් ලබා දෙන යෝජනාව මොකක්ද කියලා අපට කියන්න. *[බාධා කිරීම්]* ඔබතුමාගේ යෝජනාව මොකක්ද කියලා අපට දැන් කියන්න කෝ?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අපි කියන්නේ මේ කටයුත්ත කලබලේ පටන් ගන්න එපා කියලායි.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ඒක නේ, දැන් ඔබතුමාට යෝජනාවක් නැහැ නේ? ඔබතුමා පැය ගණනක් කෑ ගහනකොට මම හිතුවේ යෝජනාවක් තිබෙනවා කියලායි. දැන් ඔබතුමාට මේ සම්බන්ධ යෝජනාවක් නැහැ නේ?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු ඇමතිතුමනි, යෝජනාවක් තිබෙනවා. අපි ඒ යෝජනාව අදාළ කමිටුවට ඉදිරිපත් කළා. අපි ඒ යෝජනා ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා හරහා ඒ අදාළ කමිටුවට ඉදිරිපත් කළා. ඒවාට ඇහුම්කන් දෙන්න; ඒවා ගැන බලන්න. හිතුවක්කාර වෙන්නේ නැතිව ඒ යෝජනා බලන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මම මේ ගැනත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. එදා ගොවියා උද්ඝෝෂණය කරද්දී, කෑ ගහද්දී ඒවාට ඇහුම්කන් නොදී රසායනික පොහොර ගෙන්වීම තහනම් කළා වාගේ, මේ පනත් කෙටුම්පතත් මේ විධියට ගේන්න එපා කියන එක මම වගකීමෙන් කියනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Harshana Rajakaruna. You have eight minutes.

[අ.භා. 2.24]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බොහොම ස්තුතියි.

පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීම හරහා ලෝකයේ බොහෝ රටවල් ඉදිරියට යද්දී මේ වාගේ පනත් තුළින් පුද්ගලයන්ගේ පෞද්ගලික තොරතුරු -දත්ත- ආරක්ෂා කිරීම සිදු වෙනවා. අපේ රටේත් මේ ආකාරයට ඉදිරියට යෑම පිළිබඳව අපි සතුටු වෙනවා. කෙසේ වෙතත් මේ වෙලාවේ විපක්ෂයේත්, වෙනත් කොටස්කරුවන්ගේත් -stakeholders- ඇතුළු අනෙක් සියලු දෙනාගේත් අවධානය මේ සම්බන්ධයෙන් තවත් යොමු කරන්න කියලා මාධ්‍යවේදීන්ගේ සංවිධාන ඉල්ලා සිටිනවා.

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

මේ වෙලාවේ මගේ අතේ තිබෙනවා, ශ්‍රී ලංකා තරුණ මාධ්‍යවේදීන්ගේ සංවිධානය - Sri Lanka Young Journalists' Association - නිකුත් කර තිබෙන වාර්තාවක්. ඔවුන් මේ වෙනකොට අපේ පාර්ලිමේන්තුවත්, ගරු ඇමතිතුමාත් දැනුවත් කර තිබෙනවා, යෝජිත පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පතේ ඇතැම් විධිවිධාන මඟින් මූලික අයිතිවාසිකම් කඩවීම පිළිබඳව. අපි ඉල්ලීමක් කරන්නේ වෙන කාරණාවක් ගැන නොවෙයි. අපි ඉල්ලන්නේ, කරුණාකරලා මේ ගැන වැඩි අවධානයක් යොමු කරන්න; ඒ අවශ්‍ය අයත් සමඟ සාකච්ඡා කරන්න කියලායි. මේ පිළිබඳව විශේෂ ඉල්ලීමක් මාධ්‍යවේදීන්ගෙනුත් තිබෙනවා. මාධ්‍යවේදීන්ගේ ඒ ඉල්ලීම ඉටු කරන්න කියන එක තමයි අපි මේ වෙලාවේදී කියන්නේ.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Minister, Namal Rajapaksa?

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු ඇමතිතුමනි, කරුණාකරලා මගේ කථාවට බාධා කරන්න එපා.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් අහගන්න කෝ. ඔබතුමා දැන් කියපු කාරණය පිළිබඳව ගරු ඩලස් අලහප්පෙරුම අමාත්‍යතුමා ඊයේත් මාත් එක්ක සාකච්ඡා කළා. අද කණ්ඩායම් රැස්වීමේදීත් ඒ ගැන සාකච්ඡා කළා. මමත්, අපේ අධිකරණ අමාත්‍යතුමාත්, ගරු ඩලස් අලහප්පෙරුම අමාත්‍යතුමාට තහවුරු කළා, ඒ සියලු සංවිධාන -එතුමාත් ඇතුළුව- ඉදිරි කාල සීමාව තුළදී අපි හමුවන බවට. දැනට අපට ගෙන එන්න පුළුවන්, අපට උපරිම ලෙස ගැළපෙන පනත් කෙටුම්පත මේකයි. පනතක් කිව්වාම ඒකට යථා කාලයේදී සංශෝධන ගේන්න පුළුවන්. ඒ සංවිධානවල සාමාජිකයන්ගේ ප්‍රායෝගික අත්හදා බැලීම් තුළ ඔවුන්ට ප්‍රායෝගික ගැටලුවක් තිබෙනවා නම්, අධිකරණ අමාත්‍යතුමාත්, මමත් ඒ ගැන සලකා බලා අවශ්‍ය සංශෝධන ඉදිරියේදී ගේන්නම්. ඒ පිළිබඳව මේ වෙනකොටත් අපි ගරු ඩලස් අලහප්පෙරුම අමාත්‍යතුමා දැනුවත් කර තිබෙන්නේ.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ වෙලාව මට ලබා දෙන්න. ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමා, මට පෙර කථා කරපු විපක්ෂයේ අපේ ගරු මන්ත්‍රීතුමාටත් නිතර නිතර බාධා කළා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
For the Hon. Minister, time is given from the Government side.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
He can clarify, but he cannot take my time. That is what I am saying. So, please be kind enough to do that.

ගරු නාමල් රාජපක්ෂ මැතිතුමනි, ඔබතුමාගේ අදහස් කරුණාකරලා පිළිතුරු කථාවේදී කියන්න. අපේ කථාවලින් මතුවන ප්‍රශ්නවලටත් ඒ වෙලාවේ උත්තර දෙන්න. ඔබතුමා දිගින් දිගට අපේ කථාවලට බාධා කරන්න එපා. ඒක නිසා පොඩ්ඩක් පරිණත විධියට ඉන්න. අපේ අධිකරණ ඇමතිතුමාගෙන් ඒ ගැන පොඩ්ඩක් ඉගෙන ගන්න. අධිකරණ ඇමතිතුමා නිහඬව අපේ අදහසුත්, විවේචනත් අහගෙන ඉඳලා, බලාගෙන ඉඳලා එතුමාගේ කථාවේදී පිළිතුරු ලබා දෙනවා. ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමනි, ඔබතුමා හැම වෙලාවේම පැන පැන කථා කරන්න යන්න එපා. කරුණාකරලා සද්ද නොකර පොඩ්ඩක් අහගෙන ඉන්නත් පුරුදු වෙන්න. කරුණාකරලා මගේ කථාවට බාධා නොකර ඉන්න. ඇත්තටම තව පොඩි කාලයක් අපට මේ වෙනුවෙන් ලබා දුන්නා නම් හරි නේ? මේ වෙනුවෙන් අපට තව මාසයක් කල් නොදී මේ පනත් කෙටුම්පත සම්මත කළා කියලා මේ රටේ තිබෙන ප්‍රශ්න ටික විසඳෙන්නේ නැහැ නේ? මේ රටේ ප්‍රධාන ප්‍රශ්න ටිකක් තිබෙනවා.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Minister Namal Rajapaksa?

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණය ඔබතුමාගෙන් අහන්න කැමැතියි. මේ පනත් කෙටුම්පත 2019 මාර්තු මාසේ ඉඳන් තිබුණා. ඔබතුමා එතකොට කොහේද හිටියේ? එදා ඉඳන් ඇයි මේ සම්බන්ධයෙන් අදහසක් ප්‍රකාශ කළේ නැත්තේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමන්ලා අවුරුදු දෙකක් විතර මේ පනත් කෙටුම්පත කල් දමලා, දැන් අපි මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු දවසේත් කියනවා, "කල් දමන්න" කියලා. මේක අසාධාරණයි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Harshana Rajakaruna, please continue with your speech.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
Please, I am asking you not to be biased. මූලාසනයට අපේ තිබෙන ගරුත්වය නැති කරගන්න එපා. නිතර නිතර නාමල් රාජපක්ෂ ඇමතිවරයාට නැඟිටින්න දෙන්න එපා. එතුමාට මේ අවස්ථාව ලබා දෙන්නේ එතුමා 'නාමල් රාජපක්ෂ' හින්දායි. කරුණාකරලා ඒ කටයුත්ත කරන්න එපා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආකාරයට වෙන කෙනෙකු නැඟිට්ටා නම්, ඔබතුමා මේ වාගේ අවස්ථාව දෙන්නේ නැහැ.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Minister Namal Rajapaksa?

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා කියන කාරණය නිවැරදි කරන්න ඕනෑ. නැත්නම් ඒක ඔබතුමාට හොඳ නැහැ. විෂය භාර අමාත්‍යවරයා විධියට මේ Debate එක යන ඕනෑම වෙලාවක එතුමන්ලාගේ ප්‍රශ්නවලට මට උත්තර දෙන්න පුළුවන්.

ඒ නිසා කරුණාකරලා මූලාසනයට චෝදනා කරන්න එපා. ප්‍රශ්නයක් තිබෙනවා නම් මාත් එක්ක කථා කර ගන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you, Hon. Minister. Hon. Member, the Hon. Minister has the right to make clarifications during the Debate.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
පොඩි බබෙක් නොවෙයි නේ. ඒ නිසා කරුණාකරලා කියන කියන හැම එකටම නැගිටින්න එපා. ඒ ගෞරවය රකින්න. කරුණාකරලා මට අවස්ථාව ලබා දෙන්න.

මේක 2016, 2017දී ගෙනාපු කෙටුම්පතක්. 2016 ඉඳන් මේ වෙනතෙක් ඉන්න පුළුවන් නම් තව මාසයක් ඉන්න බැරි මොකද? මේ අවශ්‍යතාව පිළිබඳව කරුණාකරලා අවධානය යොමු කරලා, ඒ අය එක්ක සාකච්ඡා කරලා මේක නිවැරදි කරන්න. තමුන්නාන්සේලාගේ අතේ තමයි ඒ කටයුත්ත තිබෙන්නේ. අපට තුනෙන් දෙකේ බලයක් නැහැ. ඒක ඔබතුමන්ලාගේ අතේ තිබෙන්නේ. ඔබතුමන්ලාට කරන්න අවශ්‍ය දේවල් තිබෙනවා. හැබැයි, මේ රටේ මීට වඩා ලොකු ප්‍රශ්න තිබෙනවා. අද මිනිසුන්ට ජීවත් වෙන්න බැරුවයි ඉන්නේ. දවස් තුන හතරක් ඉන්න ඕනෑ, පෙට්‍රල් ලීටරයක් ගන්න, ඩීසල් ලීටරයක් ගන්න, භූමිතෙල් ගන්න. හරිද? තව සතියක් යනකොට පැය දහය නොවෙයි, පැහ පහළොවක් විදුලිය කපයිද දන්නේත් නැහැ. මෙන්න මේවා තමයි අද රටේ තිබෙන ප්‍රශ්න. ඒ විතරක් නොවෙයි, මේ රටේ දැන් ඖෂධ හිඟයක් තිබෙනවා. මේවා තමයි රටේ තිබෙන ප්‍රශ්න. ලබන සතිය වෙනකොට ඖෂධ තියෙයි ද දන්නේ නැහැ. දැන් පැනඩෝල් පෙත්තක් ගන්න නැහැ. ඔබතුමා ප්‍රශ්න ගැන කථා කරනවා නම්, මම කියන්නම් ප්‍රශ්න ගැන. ඒවා මේ පනත් කෙටුම්පතේ ප්‍රශ්න නොවෙයි. [බාධා කිරීමක්] ඔව්, ඒක ඇත්ත. මේ පනත් කෙටුම්පතේ නැහැ. නමුත් මේ පනත් කෙටුම්පතට සම්මත කරනවාට වඩා වඩා ලොකු ප්‍රශ්න මේ රටේ තිබෙනවා. මේ පනත් කෙටුම්පත හොඳයි. මේ පනත් කෙටුම්පතේ තිබෙන අඩුපාඩු, මේ සංශෝධන සහ තවත් සංවිධානවලින් මේ පනතට කරන යෝජනා පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන්න. මොකද, අපට ලොකු විශ්වාසයක් නැහැ මේ ආණ්ඩුව කෙරෙහි. 69 ලක්ෂයක් ජනතාව ලොකු විශ්වාසයකින් තමුන්නාන්සේලාට ඡන්දය ලබා දුන්නා. ඒක ඇත්ත. ඒ ඡන්ද ගත්ත විධිය ගැන මම කථා කරන්නේ නැහැ. නමුත් ඇත්තටම දැන් විශ්වාසය නැති වෙලා තිබෙන තරම ගත්තාම, මේ වාගේ දේවල් කරනකොට තවත් මේ ආණ්ඩුවට ඒක හොඳ දෙයක් නොවෙයි, නරක දෙයක්. අපි ආණ්ඩුව ආරක්ෂා කරන්න මේවා කියනවා නොවෙයි. නමුත් අපේ රටේ ජනතාව ආරක්ෂා වෙන්න ඕනෑ. අපි වගකියන්නේ මේ රටේ ජනතාවට. ජනතාව අප මෙතැනට පත් කරලා තිබෙන්නේ තමුන්නාන්සේලා නැගිටින නැගිටින විධියට, කෑගහන කෑගහන විධියට නිහඬව ඉන්න නොවෙයි. අපි ජනතාව වෙනුවෙන් පෙනී සිටින්නේ. ඒ නිසා අපි බයක් සැකක් නැතිව කාගේ කවුරු වුණත් අපි ඒ ගැන කථා කරනවා. ඒක නතර කරන්න බැහැ. ඒක නතර කරන්නේත් නැහැ. ඒ නිසා කරුණාකරලා පොඩ්ඩක් නම්‍යශීලී වෙලා මේ අය වෙනුවෙන් මේ අයගේ අදහස්වලට ඇහුම්කන් දෙන්න. ඒක තමයි සාමාන්‍යයෙන් විනයක් තිබෙන පුද්ගලයකු හැටියට කළ යුතු දේ. ඒ හින්දා මේවාට කලබල වෙන්න දෙයක් නැහැ. කරුණාකරලා මේ සාකච්ඡා තව මාසයක්, වැඩි කාලයක් නොවෙයි, මාසයක් කල් දමන්න. මට ලොකු විශ්වාසයක් තිබෙනවා, ඩලස් අලහප්පෙරුම අමාත්‍යතුමා මේකට මැදිහත් වෙයි කියලා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා මේ පනත් කෙටුම්පත මාසයකින් කල් දමන්න කියනවා. කල් දමා ගන්න තිබුණා, Parliamentary Business Committee එකේදී, ඒ කියන්නේ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ කථා කළා නම්. ඔබතුමාගේ පක්ෂය නියෝජනය කරන නායකයන් ඇවිල්ලා එකඟ වුණා, අද මේ පනත් කෙටුම්පත විවාදයට ලක්කරලා සම්මත කර ගන්න. ඉතින් ඔබතුමා වැරදි තැනට ඇවිල්ලා තමයි කියන්නේ මේ පනත් කෙටුම්පත සම්මත කිරීම මාසයකට කල් දාන්න කියලා. ඔබතුමා ඉස්සෙල්ලාම කිරිඇල්ල මන්ත්‍රීතුමා හමු වෙලා මේ ගැන අහන්න; ජ්‍යෙෂ්ඨයාගෙන් අහන්න. ඒක තමයි ඇත්ත තත්ත්වය. මෙතැනට ඇවිල්ලා බොරුවට කෑගහලා වැඩක් නැහැ, මාසයක් කල් දාන්න මාසයක් කල් දාන්න කියලා. තමුන්නාන්සේලා තමුන්නාන්සේලාගේ නායකයන් කරන දේවල් දන්නේ නැහැ. ඒ තීන්දුව අපි අරගෙන ඉවරයි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please continue.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක මගේ අදහස් ප්‍රකාශ කරන්න තිබෙන අවස්ථාව. මේ වෙලාවේ මගේ මතය තමයි ප්‍රකාශ කරන්නේ. පක්ෂයේත්, අපේ පක්ෂය නියෝජනය කරන සියලු කරීකයන්ගේ මතයත් මේකමයි. මීට වඩා දේවල් තමුන්නාන්සේලාට ඕනෑ නම් කරන්න හැකියාව තිබෙනවා. ඒ නිසා දැන් අපේ පිටින් දාන්න දෙයක් නැහැ. මෙතැන සැබෑවට යම් ගැටලුවක් තිබෙනවා නම්, ඒ ගැන අවධානය යොමු කරන්න අවශ්‍ය නම්, කරුණාකරලා ඒ ගැන අවධානය යොමු කරන්න. අපි මේ කරන්නේ ඉල්ලීමක්. තමුන්නාන්සේලාට තුනෙන් දෙකක බලය තිබෙනවා. මේ පනත් කෙටුම්පත නොවෙයි, මේ රටේ ව්‍යවස්ථාව වෙනස් කරන්නත් තමුන්නාන්සේලාට බලය තිබෙනවා. ඒ නිසා ඒ ගැන තර්ක කරන්නේ නැහැ.

මම මේ වෙලාවේ විශේෂයෙන් ඉල්ලීම කරන්නේ පාර්ශ්ව ගණනාවකින් මේ පනත් කෙටුම්පත පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලීම් තිබෙන නිසා. ඒ නිසා ඒ පිළිබඳව සාකච්ඡා කරලා මාසයක හෝ සති දෙකක හෝ මාස දෙකක හෝ කාල පරිච්ඡේදයකදී ඒ අවිනිශ්චිතතා පිළිබඳ සාකච්ඡා කරලා එකඟතාවකට ඇවිල්ලා, වඩාත් හොඳ පෞද්ගලික දත්ත

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

ආරක්ෂණ පනතක් මේ රටට ගෙනාවොත් එය වඩා හොඳයි කියලා පෞද්ගලිකව මම හිතනවා. කරුණාකරලා ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න. මොකද, අද මේ රටේ විසඳන්න ඇත්තටම මීට වඩා ප්‍රශ්න තිබෙනවා. ඒ ප්‍රශ්නවලට මේ එක පනතකින්වත් කිසිම විසඳුමක් ලැබෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සාකච්ඡා කරන විෂයයට අදාළ නොවුණත් මම අවසාන වශයෙන් මේ කාරණය කියන්න ඕනෑ. මේ රටේ අහිංසක ජනතාවට අද ජීවත් වෙන්න විධියක් නැහැ. එම නිසා මේ ආණ්ඩුවට විරුද්ධව පෙළ ගැහෙන්න ඕනෑ. මේ ආණ්ඩුවට විරුද්ධව පෙළ ගැහෙන්න 15වැනි දා කොළඹට එන්න කියලා රටේ ජනතාවට මම මේ වෙලාවේ නැවතත් ආරාධනා කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු සභාවේ සිදු වන සියලු කටයුතු Parliamentary Business Committee එකේදී තමයි තීන්දු කරන්නේ. ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාත්, ගයන්ත කරුණාතිලක මැතිතුමාත් Parliamentary Business Committee එකේ ඉන්නවා. මේ මන්ත්‍රීතුමන්ලා කියනවා, සමගි ජන බලවේගය නියෝජනය කරන්නේ නැහැ කියලා. ඒ නිසා මෙතුමන්ලා එක පැත්තක් ද, අනෙක් අය තව පැත්තක් ද කියලා අපට පැහැදිලි කරලා දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order, Hon. State Minister.

Next, the Hon. (Dr.) Upul Galappaththi, please. - *[Not in the Chamber.]*

Then, the Hon. (Mrs.) Diana Gamage, please. You have ten minutes.

Order, please! Before she starts, will an Hon. Member propose the Hon. Harshana Rajakaruna to the Chair?

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி - நீதி அமைச்சர்)
(The Hon. M.U.M. Ali Sabry - Minister of Justice)
Sir, I propose that the Hon. Harshana Rajakaruna do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹர்ஷன ராஜகருணா அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. HARSHANA RAJAKARUNA *took the Chair.*

[අ.භා. 2.36]

**ගරු ඩයනා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே)
(The Hon. (Mrs.) Diana Gamage)
Hon. Presiding Member, මම සිංහලෙන්ම කථා කරන්නම්. ඒක හොඳයි.

අද අපි කථා කරන subject එක තමයි, Personal Data Protection Bill එක. පෞද්ගලික දත්ත ආරක්ෂණ නීතියක අවශ්‍යතාව ඇත්තටම මතු කරන්නේ, ලෝකයට පළමුවරට හඳුන්වා දෙන්නේ යුරෝපා සංගමය තුළින්. 1981දී යුරෝපා සංගමය විසින් දත්ත ආරක්ෂණය පිළිබඳ සම්මුතියක් මුල්වරට සම්මත කරගෙන තිබෙනවා. මෙම නීතිය ක්‍රියාත්මක කිරීම පටන් අරගෙන අදට අවුරුදු 41ක් වනවා. අපේ රට තුළත් data protection සම්බන්ධ law එක මෙතුවක් කාලයක් තිබුණත්, ඇත්තටම ඒක ක්‍රියාත්මක වුණා ද, රටේ ජනතාවට ඒකෙන් ආරක්ෂාවක් ලැබුණා ද? මම දකින විධියට මෙතුවක් කාලයකට ඒකෙන් කිසිම ආරක්ෂාවක් ලැබුණේ නැහැ. කෙනෙකුගේ පෞද්ගලික දත්ත අල්ලසක් දීලා ඕනෑම තැනකින් ගන්න පුළුවන් තත්ත්වයක් පසුගිය කාලයේ තිබුණා. ඒ සම්බන්ධව මා පෞද්ගලිකව ලබපු අත්දැකීම් තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමාට බලය ලබා දෙන්න මම විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂව ඡන්දය දුන්නා. මම කලින් සඳහන් කළ හේතුව නිසා ගුවන් ගමන් බලපත්‍රය, උප්පැන්න සහතිකය, National Identity Card එක කියන මගේ පෞද්ගලික ලියවිලි එක එක පුද්ගලයන්ගේ FB pagesවල පළ වුණා. මේ ලියවිලි අතිශයින් පෞද්ගලිකයි, private and confidential. මේවා තමයි Personal Data Protection Act එකකින් අපි රැකගත යුත්තේ. නමුත්, පසුගිය කාලයේ ඒ දේවල් සිද්ධ වුණේ නැහැ.

පසුගිය ආණ්ඩුවලත් ඩිජිටල් විෂයය භාරව ඇමතිවරු සිටියා. එක ඇමතිවරයෙක් experiments, Loon Balloons යැවීම වාගේ දේවලුත් කරන්න පටන් ගත්තා. නමුත්, එක වරම balloon එක කැඩිලා ගියා. එතුමන්ලාගේම ආණ්ඩුව තුළ එතුමාට ඒ වැඩකටයුතු කර ගන්න බැරි වුණා. ඒ නිසා එතුමා සැහෙන කලකිරීමකින් හිටියේ. ඩිජිටල්කරණය සහ technology ගැන කථා කළාට ඒ ආණ්ඩුව තුළ ඒ දේවල් කර ගන්නත් බැරි වුණා. නමුත්, ගරු නාමල් රාජපක්ෂ අපේ තරුණ ඇමතිතුමා අද මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම ගැන ඇත්තටම මම ආඩම්බර වනවා. මෙම විෂයය ගැන එතුමාට ඇත්තටම හොඳ දැනුමක් තිබෙනවා. එතුමා මේ ගැන හොඳට study කර තිබෙනවා. දත්ත ආරක්ෂණ පද්ධතියක් නොමැති වීමේ ප්‍රශ්න එතුමා දැකලා, ඒ ගැන අධ්‍යයනය කරලා එතුමා තීරණය කර තිබෙනවා, මෙම නීතිය රටට අත්‍යවශ්‍ය බව. මොකද, අල්ලපු ගෙදර ජෝඩුවක් ඉන්නවා නම්, ඒ ජෝඩුව කසාද බැඳලාද නැද්ද කියන එක මේ පැත්තේ ගෙදර ඉන්න මනුස්සයාට වැඩක් නැහැ. ඒක අතිශය පෞද්ගලික දෙයක්. නමුත්, පසුගිය කාලයේ ඒ සියලු දේවල් මිනිසුන්ගේ අතට ගියා. ඒ විධියට ඕනෑම කෙනෙකුගේ දත්ත ලබා ගන්න පුළුවන්. නමුත්, අද මේ ගෙනෙන පනත් කෙටුම්පතින් මේ සියලු දෙයටම තිත තැබෙනවා. අපේ ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමා සහ ගරු අධිකරණ ඇමතිතුමා විසින් ගෙනෙන මේ පනත් කෙටුම්පතින් ඒ සියලු දේවලට තිත තැබෙනවා. ඒකෙන් මේ පක්ෂ, විපක්ෂ සියලුදෙනාගේම පමණක් නොවෙයි, මේ මුළු රටේම ජනතාවගේ පෞද්ගලිකත්වය රැකෙනවා. ඒකයි මම මේ තුළින් දකින්නේ. අනික් කාරණය තමයි, මේ Personal Data Protection Bill එක යටතේ අපට මේ රට තුළ තිබෙන බොහෝ දූෂිත තැන් සොයාගන්න පුළුවන්කම ලැබෙනවා. කොතැනද මේ දූෂිත තැන් තිබෙන්නේ? ඒ දේවල් අපට සොයාගන්න පුළුවන්. ඒවාට තිත තබන්නට පුළුවන්. එවැනි තත්ත්වයක් තුළ මේ පනත් කෙටුම්පත ගෙන ඒම අතිශයින්ම වැදගත්. ඒ නිසා මම හිතනවා, අද මේ ගෙනැවිත් තිබෙන පනත් කෙටුම්පතට අනිවාර්යෙන්ම

පක්ෂ පාට භේදයකින් තොරව සියලුදෙනා සහයෝගය දක්වයි කියලා. අපි සියලුදෙනාගේම පෞද්ගලිකත්වය රැකීමට සහ මේ රට සංවර්ධනය කරා යන ගමනේදී අපේ රටට මේ දේවල් අත්‍යවශ්‍යයි කියා මා හිතනවා.

අනික් කාරණය තමයි, ඩිජිටල්කරණය සහ technology. අද ලෝකය technology පැත්තෙන් අපට වඩා බොහෝ ඉදිරියෙන් සිටිනවා. නමුත්, මොකක් හෝ යම්කිසි හේතුවක් නිසා බොහෝ තැන්වල අපි යම් පසුබෑමකට ලක්වෙලා තිබෙනවා. මම දන්නවා outsourcing ගැන. එය පසුගිය කාලයේ අපේ රටට ලබා ගන්නට පුළුවන්කම තිබුණු දෙයක්. අද ඉන්දියාවේ පූනේවල තමයි මේ outsourcing වැඩියෙන්ම සිදු කෙරෙන්නේ. අපි කොහේ හෝ රටක සිට අපේ credit card එකක් ගැන හෝ ඒ හා සම්බන්ධ දෙයක් ගැන කථා කළොත්, ඒ telephone call එක යන්නේ ඒ සම්බන්ධව කටයුතු කරන ආසියාතික රටකට. අද ඒ ගොල්ලන් මේකෙන් ඩොලර් මිලියන ගණනක් හම්බ කරනවා. නමුත්, අවාසනාවකට අපට තවම ඒ තත්ත්වයට එන්න බැරිවෙලා තිබෙනවා. මම හිතන හැටියට මේකට එක් හේතුවක් තමයි, ජාත්‍යන්තරය - international community එක - තුළ data protection laws තිබුණත්, මේ රට තුළ ඒක හරියට ක්‍රියාත්මක වෙන්නේ නැති නිසා, ඒ ගොල්ලන් කවදාවත් මේ වාගේ දේවල් අපට outsource කරලා මේ confidentiality එක මේ රට තුළට ගෙනෙන්න බැරි තත්ත්වයක් උදාවෙලා තිබෙන එක. නමුත්, අද අපි ගෙනෙන Personal Data Protection Bill එක තුළින් අපි ඇත්තටම ඒ තත්ත්වය steady කර ගන්නවා, and we will create a concrete situation in the country. මේ Personal Data Protection Act එකෙන් කෙනෙකුගේ confidentiality එක රැකෙන පරිදි හරියටම ක්‍රියාත්මක වන බව අපි පෙන්වන්න ඕනෑ. එතකොට අපට ජාත්‍යන්තරයෙන් මේ වාගේ outsourcing කරන දේවල් ගන්න පුළුවන්. Outsource කරලා මේ වාගේ දේවල් ලංකාවට අපි ගත්තොත්, මේ රටට ඩොලර් මිලියන ගණන් ගෙන්වන්න පුළුවන්. මොකද, labour force එක ගත්තාම පිටරටවල labour force එක ඉතාම expensive. ලංකාව තුළ අපට ඒ දේවල් අඩුවෙන් ලබාගන්න පුළුවන්. මම හිතන විධියට අද වනවිට HSBC එකේ එක කොටසක calling centres දමා තිබෙනවා. ඒ වාගේ තවත් දේවල් අපට ලබාගන්න පුළුවන්.

ඒ වාගේම තමයි, අද ඩිජිටල්කරණයෙන් වෙන gig economy එක. මේ gig economy කියන එක හරිම වැදගත් දෙයක්. අද ලෝකයේ ගොඩක් පිළිගෙන තිබෙන දෙයක් තමයි gig economy කියන්නේ. මේ හරහා ගෙදර ඉඳගෙන තමන්ගේ ආර්ථිකය හදාගන්න පුළුවන්. මේක තරුණ, මහළු, කාන්තා සියලුදෙනාටම රැකියා ලබාගන්න පුළුවන් ඉතාම වැදගත් දෙයක්. මම ඊයේ අපේ ගරු පියල් නිශාන්ත රාජ්‍ය ඇමතිතුමා විසින් සංවිධානය කළ ලෝක කාන්තා දින වැඩසටහනකට සහභාගි වුණා. එතුමා ඇත්තටම "SpareTime" කියලා හරිම ප්‍රයෝජනවත් app එකක් පටන් අරගෙන තිබෙනවා. ඒ "SpareTime" app එක තුළින් කාන්තාවන්ට සහ ඕනෑම කෙනෙකුට තමන්ගේ නිවසේ සිට කරන්න පුළුවන් බොහෝ ස්වයං රැකියා ගැන අවබෝධයක් ලබා ගන්නට පුළුවන්.

අද අපි සිටින්නේ global village එකක. ඒ නිසා අපි මේවාට හැඩ ගැහෙන්න ඕනෑ. ඒ වාගේම අපි නිවැරදි දේ කරන්න ඕනෑ. ඒ නිසා අපේ නාමල් රාජපක්ෂ ඇමතිතුමා, ගරු අධිකරණ ඇමතිතුමා සමඟ එක්ව ගෙනැල්ලා තිබෙන මේ පනත් කෙටුම්පත ඊට අදාළ සංශෝධන සියලු දේ එක්ක අනිවාර්යයෙන්ම අපි සම්මත කරගත යුතුයි කියන තැන මම ඉන්නවා. මේක technology එකත් එක්ක ඉදිරියට ගෙන යා යුතුයි. මොකද, ඉස්සරහට අපි සියලුදෙනාට වැඩ කරන්න වෙන්නේ information technology, Internet සහ technology එක්කයි. එයින් තොරව මින් ඉදිරියට ගමනක් නැහැ. අපි දකිනවා, අද පුංචි ළමයෙකුගේ අතේ පවා smartphone එකක් තිබෙන බව. කොරෝනා වසංගතය නිසා අපට ලැබුණු online system එකත් එක්ක අද ඉස්කෝලවල ළමයින්ට ඒක අවශ්‍ය දෙයක් බවට පත් වෙලා තිබෙනවා. අද universitiesවල education system එක පදනම් වෙලා තිබෙන්නේ online හරහා. ඒ නිසා අපේ රට තුළ technology එක අනිවාර්යයෙන්ම තව තවත් වැඩි දියුණු විය යුතුයි. එතැනදී මේ රජය, ගරු ඇමතිතුමා හරි path එකකට ඇවිල්ලා තිබෙනවා කියලා මා හිතනවා. ඒක අපි තවත් වැඩි දියුණු කළ යුතුයි. අපි එතුමාට අපේ සහයෝගය දක්වන්න ඕනෑ. අපි රටක් විධියට ඉස්සරහට යන්න ඕනෑ. විපක්ෂය මේ රජය කරන්න හදන සියලු දේවල්වලදී කකුලෙන් අදින එක නොවෙයි කළ යුත්තේ. ඒවාට සහයෝගය දෙන්න. එක මන්ත්‍රීවරයෙක් මේ දේවල්වල අඩුපාඩු කථා කළා. හැබැයි, උත්තරයක් නැහැ. මේ ගැන යෝජනාවක් දෙන්න කිව්වාම, ඒකට උත්තරයක්, යෝජනාවක් නැහැ. අපි බොරුවට මෙතැන උගුර ලේ රහ වෙනකල් කෑ ගහලා වැඩක් නැහැ. මේ සඳහා යෝජනා දෙන්න. විපක්ෂයටත් පුළුවන් යෝජනා ගෙනෙන්න. විපක්ෂය කියලා පැත්තකට වෙන්න බැහැ. ආණ්ඩුවේ හැම දෙයම විවේචනය කර කර ඉන්න බැහැ. මොකද මේ රට ඔබතුමන්ලාටත් අයිතියි. මේ රට ඉදිරියට යන්න ඕනෑ. මේ නැව ගිලුණොත්, අපි ඔක්කොම ගිලෙනවා. එහෙම නැතුව නැවේ captain, engineersලා ඇතුළු staff එක විතරක් ගිලෙන්නේ නැහැ. අපි ඔක්කොම passengersලා. අපි ඔක්කොම ගිලෙනවා. ඒ නිසා මේ ගිලෙන්න යන නැවේ රුවල් ටික හරියට ඇද ගන්න අපට විපක්ෂයත් අවශ්‍යයි; ඔබතුමන්ලාගේ සහයෝගය අවශ්‍යයි. ඒ නිසා ඒ සහයෝගය ලබා දෙන්න. ඒකයි මගේ ඉල්ලීම. දේශපාලන වශයෙන් අපට කථා කරන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, නියමිත කාලය අවසන්.

**ගරු ඩයනා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே)
(The Hon. (Mrs.) Diana Gamage)
දේශපාලන වශයෙන් විවේචන කරන්න පුළුවන්. නමුත් අවශ්‍ය සහයෝගයත් ලබා දෙන්න. අද රට ආර්ථික වශයෙන් ඉතාම පහළ මට්ටමකයි තිබෙන්නේ. අපි හැමදාම ප්‍රශ්න ගැන කථා කරන එකෙන් වැඩක් නැහැ. ඒ සඳහා ජනතාවට විසඳුම් ඕනෑ. ජනතාවට සහන සහ විසඳුම් ඕනෑ. අපි විසඳුම් හොයමු. අද තිබෙන ප්‍රශ්න අපි ඔක්කොම දන්නවා. නමුත් විසඳුමයි අපට හොයා ගන්න අවශ්‍ය. අපි ඒවාට විසඳුම් හොයමු කියලා ඉල්ලා සිටිමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. (Dr.) Upul Galappaththi. You have 10 minutes.

[අ.භා. 2.46]

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන්, කැබිනට් අමාත්‍යවරයා විධියට ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා අද මේ රටට වැදගත් පනත් කෙටුම්පතක් මේ සභාවට ඉදිරිපත් කර තිබෙනවා.

[ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා]

ඒ පිළිබඳ විවාදයට සම්බන්ධ වීමට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. අද මේ පනත් කෙටුම්පත ගැන සාකච්ඡා කරනකොට, ඒ ගැන අධ්‍යයනයකින් තොරව කථා කරන තත්ත්වයක් අපි දුටුවා. මේ පනත් කෙටුම්පත අවුරුදු එකහමාරක් තිස්සේ සාකච්ඡාවට බඳුන් කරමින්, මේ රටේ ජනතාවගේ අදහස් ලබා ගනිමින්, විශේෂඥයන්ගේ අදහස් ලබා ගනිමින්, මේ රටේ නොයෙකුත් ක්ෂේත්‍රවලින් -සෞඛ්‍ය, ස්වදේශ කටයුතු, රටට ආදායම් ගෙනෙන ආයතනවලින්- අදහස් ලබා ගනිමින්, එකට එක්ව ගෙනාපු පනත් කෙටුම්පතක්. නමුත් කනගාටුවට කාරණය, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම තව මාසයකින් කල් දමා ගන්න පුළුවන්ද කියලා විපක්ෂය ප්‍රකාශ කිරීමයි. මෙච්චර කාලයක් දීලා, නඩු පවරන්න අවස්ථාවත් දීලා, අධිකරණයට යන්න අවස්ථාවත් දීලා තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ. ඒ වාගේම පක්ෂ නායකයන්ගේ රැස්වීමේදී අද මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම ගැන එකඟතාවට ආවා. නමුත් තමන්ගේ පක්ෂයේ නායකයන්ගේ මතයවත් නොදැන, මෙතැනට ඇවිල්ලා තම තමන්ගේ මතය අනුව, පනත් කෙටුම්පත ගැන අනවබෝධයෙන් කථා කිරීම පිළිබඳව මා කනගාටු වෙනවා. පනත් කෙටුම්පතට සංශෝධන ගෙනෙනවා නම් ගෙනෙන සංශෝධන මොනවාද කියලා අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමාගෙන් ඇහුවාම, එතුමාට කියා ගන්න බැරි වුණා. රන්ජන් රාමනායක හිටපු මන්ත්‍රීතුමා අධිකරණයට අපහාස කිරීම නිසා හිරේට යනකොට මෙතුමා පාර්ලිමේන්තුවට ආවාම අපි හිතුවේ, ඉංජිනේරුවෙකු විධියට ඊට වඩා යමක් පාර්ලිමේන්තුවට, ජනතාවට කරයි කියලා. නමුත් අද කනගාටුදායක තත්ත්වයක් උදා වුණා.

අද වන විට ශ්‍රී ලංකාවේ පරිගණක සාක්ෂරතාව රටේ ජනගහනයෙන් සියයට 33යි. තරුණ පරම්පරාවේ පරිගණක සාක්ෂරතාව සියයට 70කට වැඩියි. අද ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය ඉතාම ඉහළ තැනකට ඇවිල්ලා තිබෙනවා. ඒ හරහා 2007 වනකොට මේ අපනයන ආදායම, එහෙම නැත්නම් ලංකාවේ ඉඳලා පිට රටට මේ සේවා ලබා දීමෙන් ලබන ආදායම ඇමෙරිකානු ඩොලර් මිලියන 213ක් පමණ වුණා. ඒක 2019 වෙනකොට ඇමෙරිකානු ඩොලර් මිලියන 1,083ක් බවට පත් වෙලා තිබෙනවා. අද ඊටත් වඩා වැඩියි. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා, ලංකාව ඉක්මනින්ම ඩිජිටල්කරණයට යා යුතුයි කියලා. ඒ හරහා මේ රට තුළ තොරතුරු තාක්ෂණවේදීන්ගේ රැකියා සුරක්ෂිතතාව, ඔවුන්ට රැකියා උත්පාදනය කිරීමේ හැකියාව වාගේම තරුණ පරම්පරාවට ඒ රැකියා ලබාදීම පිළිබඳව "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා. අපේ රජයේ බලාපොරොත්තුව 2022 වසරේ ඇමෙරිකානු ඩොලර් බිලියන පහක ආදායමක් තොරතුරු තාක්ෂණවේද ක්ෂේත්‍රය හරහා මේ රටට ලබා ගැනීමයි; ඒ හරහා නව රැකියා ලක්ෂ දෙකක් පමණ බිහි කිරීමයි. ඒ නිසා මේ පනත් කෙටුම්පත සම්මත කිරීම තවදුරටත් කල් දැමීමෙන් සිදු වන්නේ අපේ ඉලක්කය සම්පූර්ණ කරගැනීම ප්‍රමාද වන එකයි. ඒක තමයි විපක්ෂයේ වුවමනාව. ඒ ලෝකය ගෝලීයකරණය වන මේ අවස්ථාවේ, රාජ්‍ය හා පෞද්ගලික අංශ ඩිජිටල්කරණය කරන අතරේ ජනතාවගේ තොරතුරු ටික ආරක්ෂා කිරීම සඳහායි මේ පනත් කෙටුම්පත ගෙන එන්නේ. එහෙම නැතුව වෙනත් පෞද්ගලික අරමුණක් හෝ දේශපාලන අරමුණක් නොවෙයි මෙතැන තිබෙන්නේ.

ජනතාවගේ තොරතුරු ආරක්ෂා කර ගැනීමෙන් ජනතාවට විශ්වසනීයත්වය, විනිවිදභාවය ඇති වනවා වාගේම, ඔවුන්ගේ තොරතුරුවල සුරක්ෂිතභාවයත් ඇති වනවා. අපි මේ පනත් කෙටුම්පත හරහා එය පැහැදිලිව තහවුරු කර තිබෙනවා. මම වෛද්‍යවරයෙක්. ඔබතුමන්ලා දන්නවා ඇති, investigation එකක් කරලා result එකක් දෙන කොට “private and confidential” විධියටයි දෙන්නේ. එය අපේ හිපොක්‍රටීස් දිවුරුමේත් පැහැදිලිව සඳහන් වන කාරණයක්. කුමන පුද්ගලයෙකුගේ වුවත් ජීව දත්ත තොරතුරු වාගේම සෞඛ්‍ය තොරතුරු ආරක්ෂණය කළ යුතුයි. අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයත් ඩිජිටල්කරණයට ලක් වෙනවා. ඕස්ට්‍රේලියාව, එංගලන්තය වාගේ රටක බෙහෙතක් නියම කළාම ඒ පිළිබඳ වාර්තා කොහේ ගියත් බලා ගන්න පුළුවන්. මෙල්බර්න් ඉඳලා බ්‍රිස්බේන්වලට ගියත් කෙනෙකුගේ ජීවදත්ත තොරතුරු හරහා මොකක්ද නියම කළ බෙහෙත කියලා දැන ගන්න පුළුවන්කම තිබෙනවා. එවැනි තත්ත්වයක් ලංකාවේ නැහැ. හැබැයි, අපි දැනට pilot projects කිහිපයක්ම ක්‍රියාත්මක කරනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රය ඩිජිටල්කරණය කිරීම තුළින් අපේ රටේ තිබෙන ඖෂධ අවභාවිතය වැළකෙනවා වාගේම රෝගියාගේ සුරක්ෂිතතාව තවදුරටත් තහවුරු වෙනවා.

අපි විශ්වාස කරනවා, විශේෂයෙන් මේ රටට ආදායම් ගෙනෙන ආයතන ඩිජිටල්කරණය කරන්න ඕනෑ කියලා. සියයට 90ක් විතර රටට ආදායම් ගෙනෙන්නේ සුරාබදු දෙපාර්තමේන්තුව, රේගුව සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව. ඒ දෙපාර්තමේන්තු ඩිජිටල්කරණය කිරීමත් සමඟ ආදායම් ගෙනෙන සහ ආදායම් බදු ගෙවන පුද්ගලයාගේ දත්ත සුරක්ෂිතතාව හරහා, විනිවිදභාවය හරහා ඔවුන් තවදුරටත් තමන්ගේ කැමැත්තෙන් ආදායම් බදු ගෙවන තත්ත්වයකට පත් කරන්න පුළුවන්කම ලැබෙනවා. ඒ නිසා මේ පනත් කෙටුම්පත ගෙනාවේ පෞද්ගලික හෝ දේශපාලන අරමුණක් නිසා නොවෙයි. මේ පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවේ අද සම්මත කරන්නේ මේ රටේ ජනතාවගේ දත්ත ආරක්ෂා කිරීම සඳහායි.

අද බොහෝදෙනා මේ පනත් කෙටුම්පත ගැන කථා කරන ආකාරයක් නොවෙයි අපි දැක්කේ. වෙන වෙන කාරණා කියමින් අපහාසාත්මකව කථා කරන්නයි කාලය වැය කළේ. ඒ වාගේම අපේ ඇමතිතුමා උත්තර දෙන්න හදන කොට ඒක වළක්වන්නත් කටයුතු කළා. ගැටලු ගැන කථා කරන කොට, විපක්ෂයේ මන්ත්‍රීවරු නොදන්නා දේවල් ගැන එතුමා උත්තර දෙන්න හදන කොට මූලාසනයට චෝදනා කරමින් පාර්ලිමේන්තුව නොමඟ යන ආකාරයෙන් විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු හැසිරුණා. පනත් කෙටුම්පතක් ගැන විවාද කරන කොට ඒ පනත් කෙටුම්පත ගැන අධ්‍යයනය කරලා එන්න ඕනෑ. මේවා ගැන මේ පාර්ලිමේන්තුවේ විවාද කරන්නේ මේ රටේ ජනතාවගේ ධනය වැය කරමින්. පාර්ලිමේන්තුව තුළ පනත් කෙටුම්පතක් ගැන විවාද කරන කොට විපක්ෂය එයින් පිට කරුණු කථා කරලා මේ ගරු සභාව නොමඟ යවන්න කටයුතු කිරීම ගැන අපි ඉතාම කනගාටු වෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු අද අදහස් දැක්වූ ආකාරය පිළිබඳව අපි කනගාටු වෙනවා. මේ පනත් කෙටුම්පත හරහා මේ රටේ ආදායම් ගෙනෙන ආයතනවල කටයුතු, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කටයුතු වේගවත් වෙනවා. එමෙන්ම පුද්ගලයෙකුගේ Identity Card එක, ගුවන් ගමන් බලපත්‍රය, driving licence එක ලබා ගැනීමේදී කාලය කළමනාකරණය කර ගනිමින් දවසකින් දෙකකින්, පැය ගණනකින් ජනතාවට ඒවා ලබා දීමේ වැඩ පිළිවෙළක් මේ හරහා ක්‍රියාත්මක කරන්න පුළුවන්.

ඒ හරහා දත්ත ආරක්ෂා කරගැනීමට, කාලය කළමනාකරණය කරගැනීමට හැකි වනවා වාගේම, ආර්ථික වශයෙන් විදේශ විනිමය ඉපැයීමේ කටයුතු ආරක්ෂා වීම, මේ රටේ රැකියා සුරක්ෂිතභාවය -මේ සියල්ල- සිදු වෙනවා. ඒ නිසා මෙය වැදගත් පනත් කෙටුම්පතක් බව මම අවධාරණය කරනවා.

මේ පනත් කෙටුම්පත ගෙන ඒම ගැන ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.55]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත පිළිබඳව කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ රටේ ජනතාවගේ නිදහස වෙනුවෙන් වාගේම රට ඉස්සරහට ගෙන යන්න ඕනෑය කියන මතයක් ඇතිකරගෙන මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ගැන එක පැත්තකින් අපි සතුටු වෙනවා. දැන් මේ ගැන කරුණු කාරණා ඉදිරිපත් කරද්දී ගරු අමාත්‍යතුමාට සමහර වෙලාවට නැඟිට නැඟිට උත්තර දෙන්න සිද්ධ වුණේ මේ සම්බන්ධව ඔබතුමන්ලා සාකච්ඡා කරපු කණ්ඩායමට අමතරව, රටේ තව කණ්ඩායමක් විශාල වශයෙන් මේ ගැන ප්‍රශ්න නඟන නිසායි. විශේෂයෙන් සමාජ මාධ්‍ය සේවා සපයන කණ්ඩායම්, පුවත් පත් ක්ෂේත්‍රයේ කටයුතු වෘත්තීය කොට ගත් කණ්ඩායම් වාගේම, තරුණ වෘත්තීයවේදීන් යනාදී මේ සියලුදෙනාම මේ ගැන ප්‍රශ්න නඟනවා. විශේෂයෙන් දත්ත සැකසීම, තොරතුරු සැපයීම, දත්ත සැපයීම පිළිබඳ ඒ කණ්ඩායම් ඇතුළේ විශාල මතයක් ගොඩනැඟිලා තිබෙනවා. මොකද, මේවාට අදාළව තිබෙන දඩය, වන්දිය ඉතා විශාලයි. බරපතළ ගණනක් තිබෙන්නේ. ඒ නිසා මෙතැනදී ආණ්ඩුව මාධ්‍ය මර්දනයට යනවා ද කියන ප්‍රශ්නයක් පැහැදිලිවම තිබෙනවා. ඒක නිසා තමයි මේ දිගින් දිගටම ප්‍රශ්න කරන්නේ. මේ තුළ මාධ්‍ය මර්දනයක් වෙනවා ද? මාධ්‍ය මර්දනය කරන්න අවශ්‍ය කාරණා ටික මේ පනත් කෙටුම්පත ඇතුළේ ගැබ් වෙලා තිබෙනවා. අවශ්‍ය නම් මර්දනය කරන්න පුළුවන්. ඒකට අවශ්‍ය කරුණු කාරණා ටික මේ පනත් කෙටුම්පත ඇතුළේ තිබෙනවා. ගරු ඇමතිතුමනි, මෙන්න මේවා ගැන ඔබතුමා හිතන්න කියලායි මේ හැම මන්ත්‍රීවරයෙක්ම කථා කරමින් කිව්වේ. මේ ගැන මතු වෙලා තිබෙන මතය ගැන විපක්ෂයට විතරක් ඇඟිල්ල දිගු කරන්න එපා. මේක සමස්ත රටේ මාධ්‍ය සම්බන්ධව මාධ්‍යවේදීන් සියලුදෙනා අතර අද පැන නැඟිලා තිබෙන ප්‍රශ්නයක්. ඔබතුමා යම් කණ්ඩායමක් එක්ක මේ ගැන කතිකාවක යෙදෙන්න ඇති; සාකච්ඡාවක යෙදෙන්න ඇති. හැබැයි, මේ ගැන සාකච්ඡාවක යෙදිලා නැති කණ්ඩායම් ගොඩක් ඉන්නවා.

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)

Sir, I rise to a point of Order.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු මන්ත්‍රීතුමනි, නිකම් බොරුවට points of Order නම් ගන්න එපා.

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)

ගරු මන්ත්‍රීතුමනි, මට දැන ගැනීම සඳහායි මේ අහන්නේ. මම කියවපු පනත් කෙටුම්පතේ නම් එහෙම දෙයක් තිබුණේ නැහැ. එහෙම දෙයක් තිබෙනවා නම් ඔබතුමා පොඩ්ඩක් කියවන්නකෝ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

අනේ! දොස්තර මහත්තයෝ, මේ ගරු සභාවේ කාලය අරගෙන නාස්ති කරන්න එපා. තමුන්නාන්සේ දැන් කථා කළා ඉංජිනේරුවෙක් ගැන. තමුන්නාන්සේ දොස්තර මහත්තයෙක් නේ? ඉංජිනේරු මහත්තයා ගැන කථා කරපු දොස්තර මහත්තයා මොනවාද කිව්වේ? ඒවා කියන්න කණ්ණාඩියක් ඉස්සරහාට ගිහිල්ලා. හැමදේම දන්නවා තමුන්නාන්සේ. ඒකනේ හැම තිස්සේම නැඟිටින්නේ, පිටිපස්සේ ඉඳගෙන.

විශේෂයෙන් මේ පනත් කෙටුම්පතට අදාළව තිබෙන ප්‍රශ්න ගැනයි මම කථා කළේ. කරුණාකර, මේ කාරණයේ දී ඒකාධිපති වෙන්න එපා. ඇඟිල්ල දිගු කරලා අනෙක් මිනිස්සුන්ට තර්ජනය කරන්න එපා. මෙහිදී අපි බලාපොරොත්තු වෙන්නේ මේ රටේ හැම දෙනාටම එක හා සමානව සලකන වැඩ පිළිවෙළක්. පාර්ලිමේන්තුවේ අපි යම් පනත් කෙටුම්පතක් අනුමත කරනවා නම්, සම්මත කරනවා නම් එය රටේ ජනතාවගේ යහපත සඳහා වූ පනත් කෙටුම්පතක් වෙන්න ඕනෑ. මේකෙන් හොඳ දෙයකුත් සිද්ධ වෙනවා. ඒ ගැන අපට කිසි විවාදයක් නැහැ. අපි දන්නවා මේ පනත් කෙටුම්පත රටට අත්‍යවශ්‍යයි කියලා. හැබැයි, මේකට අවශ්‍ය අනෙකුත් කාරණා ටික ඇතුළත් වන්නත් ඕනෑ.

කලින් කථා කළ ගරු මන්ත්‍රීවරයකු සඳහන් කළා, අනුරාධපුරයේ කෙනෙකුට මේ තුළින් සිදු වන සේවය ගැන. අනුරාධපුරයේ කෙනෙකුට විදේශ ගමන් බලපත්‍රයක් සකස් කරන්න යනකොට විතරක් නොවෙයි, සමහර වෙලාවට ඔහුගේ Identity Card එකේ, උප්පැන්නයේ ප්‍රශ්න තිබෙන්න පුළුවන්. ඉස්සෙල්ලාම ඒ ප්‍රශ්න ටික විසඳලා ඉන්න ඕනෑ, ඒ තොරතුරු ටික ඩිජිටල්කරණයට ගන්න නම්. ඒ තොරතුරු ටික ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ඉස්සෙල්ලාම ගමේ හදන්න ඕනෑ. ඒ වෙනුවෙන් විශාල වැඩ සටහනක් කළ යුතුව තිබෙනවා.

මීට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමිය කියපු විධියට තමුන්නාන්සේලාට සහයෝගය දෙන්න අපටත් පුළුවන්. හැබැයි, ඒ සඳහා වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම විනිවිදභාවයක් තිබෙන්න ඕනෑ. මේ කාරණා දෙක සම්බන්ධයෙන් තමයි කථා කරන්නේ. එහෙම නැතිව කවුරුත් මේ පනත් කෙටුම්පතට විරුද්ධ නැහැ. ගරු ඇමතිතුමනි, පළමුවෙන්ම මතක තියා ගන්න මේ පනත් කෙටුම්පතට කවුරුවත් විරුද්ධ නැහැ කියන එක. මේ පනත් කෙටුම්පත ගැන ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මෙහි අඩංගු වෙලා තිබෙන තොරතුරුවලට අනුව යම් කෙනකුට "ගේම්" ගහන්න පුළුවන් කියන ප්‍රශ්නයයි තිබෙන්නේ.

යම්කිසි නිලධාරියෙකු හෝ අමාත්‍යවරයෙකු හෝ ආණ්ඩුව හෝ එතැනදී ගේම් ගහන්න ගත්තොත් රටේ ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ ගැන තමයි අපි දිගින් දිගටම කථා කරන්නේ. අද අපි දත්ත ආරක්ෂණය පිළිබඳව කථා කරනවා. නමුත්, මෙතැන තිබෙන ප්‍රශ්නය මොකක්ද? අද දත්ත ආරක්ෂා කරන්නත්, මොනවා කරන්නත් රටේ ආර්ථිකය යහපත් වෙන්න ඕනෑ. නමුත්, අද රටේ තිබෙන ආර්ථික තත්ත්වය දිහා බලන්න. අද ආර්ථිකය සම්පූර්ණයෙන් කඩාගෙන වැටිලා; ජන ජීවිතය කඩාගෙන වැටිලා. අද විදුලිය නැහැ; තෙල් ටික නැහැ; බෙහෙත් ටික නැහැ; ගෑස් ටික නැහැ. ඒ විතරක් නොවෙයි, කෑමට ගන්න ආහාරවල මිල ගණන් බලන්න. ඩොලර් එක පා කර හැරියාම භාණ්ඩවල මිල කොච්චරක් නම් වැඩි වෙනවාද? ඒ මිල වැඩි වුණාට පසුව අපි මොකක්ද කරන්න යන්නේ? අපි මොනවාද රටේ ජනතාවට දෙන්න යන සහන? එවැනි වැඩ පිළිවෙළකුත් ක්‍රියාත්මක කළොත් තමයි මේ කටයුතු සාර්ථක වෙන්නේ. රටේ ජනතාව ජීවත් වෙන්න බැරිව, අසහනයෙන්, රට ගැන කලකිරිලා, දේශපාලනය ගැන කලකිරිලා, පාර්ලිමේන්තුව ගැන කලකිරිලා, ආණ්ඩුව ගැන කලකිරිලා ඉන්න කොට දත්ත නොවෙයි මොනවා ආරක්ෂා

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

කරන්න හැදුවත් වැඩක් වෙයිද? අපි පෞද්ගලික දත්ත ආරක්ෂා කරලා දෙන්නේ කාටද? ජනතාවට. ඒ වාසිය දෙන්න යන්නේ ජනතාවට. නමුත්, අද ඒ වාසිය ජනතාවට දෙන්න විධියක් නැහැ.

හැබැයි, අපි අද එක පැත්තකින් සතුටු වෙනවා, ආණ්ඩුව ෆේල් කියලා පිළිගැනීම ගැන. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කණ්ඩායම ගිහිල්ලා සාකච්ඡා කළාට පසු, ඔවුන් කියපු සියලු යෝජනාවලට ආණ්ඩුව එකඟ වෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියනවා සර්ව පාක්ෂික සමුළුවක් කැඳවන්න කියලා. අපිත් මෙච්චර කල් ඒක කිව්වත්, ඇහුවේ නැහැ. හැබැයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගිහිල්ලා එහෙම කිව්වාම, "අපි ඒ සමුළුව කැඳවන්නම්" කියනවා. "විද්වතුන් කැඳවන්න" කිව්වාම, ඔන්න විද්වතුන් කැඳවන්නත් වැඩ පිළිවෙළක් හැදුවා. ආර්ථික කටයුතු පිළිබඳ කමිටුවක් හදලා තිබෙනවා. විද්වතුන් ඒකේ නැහැ. එහිදී විද්වතුන්ට පයින් ගහලා එළවලා. හැබැයි, සාකච්ඡාවට විද්වතුන් කැඳවා තිබෙනවා. මා අහන්නේ මේකයි. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ප්‍රමුඛ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කණ්ඩායම ගිහිල්ලා කිව්වාම ද අතිගරු ජනාධිපතිතුමාට මේ කාරණා ටික තේරුණේ? මෙච්චර කාලයක් එතුමාට තේරුණේ නැද්ද මේ රට කරන විධිය? එතුමා ෆේල් වුණාට පස්සේ, ඒ බව පිළිගෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ යෝජනා ටික පිළිගෙන තිබෙනවා.

ඊළඟ ප්‍රශ්නය මේකයි. ආණ්ඩුවේ ඉන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි, පොහොට්ටුවයි කියන දෙගොල්ලන්ම එකතු වෙලා විමල් වීරවංශ මැතිතුමාටයි, ගම්මන්පිල මැතිතුමාටයි හොඳ ගේමක් දුන්නා කියලා තමයි අපට දැන් පෙනෙන්නේ. ඒ දෙන්නාත් එක්ක, 'අපි ඕනෑම දෙයකට ඉන්නවා, එකට එකතු වෙලා සටනක් දෙන්නම්' කියලා, අවසාන මොහොතේ ඒ දෙන්නා ගෙදර යවලා මේ ගොල්ලන් ගිහින් ජනාධිපතිතුමා ළඟ වාඩි වුණා. ඉතින්, මේ රට ගැන, මේ රටේ දේශපාලන නායකයන් ගැන කවුද විශ්වාස කරන්නේ? රටේ සමස්ත ජනතාව අපට ඇඟිල්ල දිගු කරන්නේ මෙවැනි වැඩ නිසායි.

ගරු ඇමතිතුමනි, අපි ඔබතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. අද ඔබතුමන්ලා මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්නවා. ඒක අපි දන්නවා. හැබැයි, කරුණාකර දෙවැනි වටයේදීවත් ඒ අදාළ අයත් එක්ක මේ ගැන සාකච්ඡා කරන්න. සාකච්ඡා කරලා ඒ අයගේ ප්‍රශ්න ටික හරි විධියට හඳුනා ගෙන ඒවාට ඉදිරි කාලයේදී අපි පිළිතුරු සපයමු.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු මන්ත්‍රීතුමනි, ගරු ඩලස් අලහප්පෙරුම අමාත්‍යතුමා ඒ පිළිබඳව අප දැනුවත් කළා. ගරු අධිකරණ ඇමතිතුමාත්, මමත්, අමාත්‍යාංශ නිලධාරිනුත් ඉදිරි කාල සීමාව තුළ ඒ අය හමු වෙලා සාකච්ඡා කරන්නම්. අපි අවුරුදු එකහමාරක කාලයක් ඒ අයට දුන්නා. හැබැයි අපි නැවත වතාවක් ඒ අය හමු වෙලා සාකච්ඡා කරලා, ඒ අයගේ කාරණාත් සලකා බලා, යම් සංශෝධනයක් කිරීමට අවශ්‍ය නම් ඉදිරි කාල සීමාව තුළ ඒ කටයුතු කරන්නම්.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු ඇමතිතුමා, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමාත් ඉල්ලා සිටියේ ඒක තමයි.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ගරු මන්ත්‍රීතුමනි, සංශෝධනයකුත් අවශ්‍ය නැහැ. පනත් කෙටුම්පතේ 5 වගන්තිය සමඟ I වන උපලේඛනය කියවා බලන්න. ඒ අනුව, ගරු ඇමතිතුමාට පුළුවන් රෙගුලාසි හදන්න. ඒ රෙගුලාසිවලට අනුවත් පළමුවෙනි උපලේඛනයට යම් වෙනසක් කළා නම් ඒක කරන්න පුළුවන්. ඒක අවශ්‍ය නම්, අපට ඒක කරන්න පුළුවන්. අපි ඒක කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
අධිකරණ අමාත්‍යතුමනි, ඔබතුමා හොඳ අදහසක් ඉදිරිපත් කළේ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. රෙගුලාසි හදන්න පුළුවන් කිව්වා නේ. ඒවාට තමයි මාධ්‍ය ආයතන බය. ඒකත් කියන්න ඕනෑ නේ. දේශපාලනඥයාට බයයි, මාධ්‍ය ආයතන. මොකද, දේශපාලනඥයා ගහනකොට අරහේටත් කරකවලා, මෙහේටත් කරකවලා -දෙපැත්තටම- ගහන්න පුළුවන්.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හදන රෙගුලාසි publish කරන්න ඕනෑ. Publish කරලා ගැසට් කරන්න කලින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, මාධ්‍යවේදීන් දේශපාලනඥයන්ට බය නැහැ. මාධ්‍යවේදීන් හරි දේ ලියනවා නම් කාටවත් බය වෙන්න ඕනෑත් නැහැ. හැබැයි, යම්කිසි කෙනෙකුගේ පෞද්ගලිකත්වය ගැන ලියනවා නම්, ඒ පුද්ගලයාට පුළුවන් දැන් තිබෙන නීතිය අනුව වුණත් අධිකරණයට යන්න. ඒ නිසා ඒක අලුතින් ගෙනෙන කාරණයක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු අමාත්‍යතුමා, මෙහිදී දඩයක් සහ වන්දි ක්‍රමයක් වෙනම නීතිගත කරනවා. ඒ කියන්නේ, එක්වරම ඔළුවටම ගහන්න වැඩේ මේ මඟින් හදලා තිබෙනවා. එහෙම ඉඩක් නැතුවා නොවෙයි. ඒ කතන්දරය මේ පනත් කෙටුම්පත තුළ තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එක එක ව්‍යවස්ථා නිර්වචනය කරද්දී ඒවා එක එක විධියට නිර්වචනය කරගන්න පුළුවන්. අපේ අධිකරණ අමාත්‍යතුමා හොඳට දන්නවා, එක එක විධියට ඒ වගන්ති නිර්වචනය කරගන්න පුළුවන් අවස්ථා තිබෙනවා කියලා. එහෙම නිර්වචනය කරගන්න පුළුවන් විධියේ අවස්ථා මේ පනත් කෙටුම්පතේත් තිබෙනවා. යමෙකු මාධ්‍යවේදියකු හැටියට ඉදිරි කාලය තුළ රටේ ජනතාව දැනුවත් කරන්න, ජනතාවට දැනුම දෙන්න හැදුවාම, ඒකෙන් ප්‍රශ්නයක් ඇති වෙයිද කියලා තමයි මේ අයට තිබෙන බිය. ඒ ගැන දිගින් දිගටම කථා කළ නිසා මාත් ඒ ගැන දිගින් දිගටම කථා කරන්න අවශ්‍ය නැහැ.

ගරු ඇමතිතුමනි, මා ඔබතුමාට කියන අනෙක් විශේෂ කාරණාව මෙයයි. මෙහි කියන දේවල් කරන්න අවශ්‍ය පහසුකම් ටික රටේ නැහැ. අපේ රටේ පහසුකම් ගොඩක් අඩුයි. ඩිජිටල්කරණය සඳහා ගම ඇතුළට ගියාම, අඩු පාඩු රාශියක් තිබෙන බව පෙනෙනවා. කොළඹ වෙන්න පුළුවන්, අනෙක් ප්‍රධාන නගර වෙන්නත් පුළුවන්, ඒ ප්‍රධාන නගරවල මේ සියලු පහසුකම් තිබෙනවා. හැබැයි, ඊට එහාට යනකොට පහසුකම්

නැහැ. ගරු ඇමතිතුමනි, ඒ නිසා ඔබතුමා මේ කටයුත්ත පළමුවෙන්ම ගමෙන් පටන් ගන්න ඕනෑ කියා මම හිතනවා. ඩිජිටල්කරණයේ මූලික අඩිතාලම ඉස්සෙල්ලාම දමන්න ඕනෑ ගමට. ගමෙන් ඒ අඩි තාලම දමලා, ගම හදාගෙන ඇවිල්ලා තමයි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළ යුත්තේ. මොකද, මෙය ක්‍රියාත්මක කරලා සමස්ත ශ්‍රී ලංකාවට මෙයින් යහපතක් සිද්ධ වුණේ නැත්නම්, එය පාවිච්චි කරන්නේ එක කොටසක් පමණක් නම් පලක් නැහැ. සමහර විට ඒ සම්බන්ධ දැනුම නැතිව තවත් කෙනෙකු යම් විධියකින් අසරණභාවයට පත් වෙන්නත් පුළුවන්. මේ පනත් කෙටුම්පත සම්මත කළත්, දැනුවත් වීම සඳහා අපි යම්කිසි කාල සීමාවක් දෙන්න ඕනෑ. මොකද, මේ ගැන නොදන්නා කෙනෙකු යම් විධියකින් ගැටලුවකට මුහුණ පෑවොත්, ඔහුට වන්දියක් නියම කරන්න, දඩයක් ගහන්න පුළුවන්. එවිට ඔහුට ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙනවා.

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු මන්ත්‍රීතුමා ඇහුවේ ඉතාම හොඳ ප්‍රශ්නයක්. මේ පනත් කෙටුම්පතේම තිබෙනවා, මේ පනත ක්‍රියාත්මක වීම සඳහා මාස 18ත්, මාස 36ත් අතර කාල සීමාවක් ගත වන බව. ඒ, විශේෂයෙන්ම Data Protection Authority එක පිහිටුවලා, Regulations සකස් කරලා, ඒවා publish කරලා, Parliament එකට ගෙනැල්ලා අනුමත කරන්න ඕනෑ නිසායි. මාස 18ත්, මාස 36ත් අතර කාල සීමාවක් තිබෙනවා, මෙය ක්‍රියාත්මක කරන්න.

ගමට පහසුකම් දෙන්න ඕනෑ කියලා ඔබතුමා කියපු කාරණය නිවැරැදියි. "ගමට සන්නිවේදනය" වැඩසටහන යටතේ සන්නිවේදන කුලුනු ඉදි කිරීමේ ව්‍යාපෘතිය තුළිනුත්, පාසල් 10,000 සම්බන්ධ කිරීම තුළිනුත් තාක්ෂණයේ connectivity එක ගමට යනවා. ඒ තුළින් තමයි digitalization කටයුතු සාර්ථක වෙන්නේ.

ඒ විතරක් නොවෙයි. තව පැහැදිලි කිරීමක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, 'e-Grama Niladhari Project' වෙන්න පුළුවන්, National Identity Card එක වෙන්න පුළුවන්, මේ data collectionsවලට යන්න කලින් data protect කරලා ඉන්න ඕනෑ. ඒ නිසා තමයි, මේ පනත් කෙටුම්පත අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
Data protect කරන කොට, ඒ protect කරන එක ගැන කියලා දෙන එක අපි සියලුදෙනාගේ පළමු වගකීම වෙනවා. මොකද, protect කරන්නේ කොහොමද කියන එක නොදැනගත්තාම, ඒ අය අතින් වැරැද්දක් වෙන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
තව විනාඩියක්ද, විනාඩි භාගයක්ද තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? තත්පර කීපයක්වත් නැද්ද?

අවසාන වශයෙන්, මා තවත් එක කාරණයක් කියන්න ඕනෑ. අපේ ගරු මන්ත්‍රීතුමියක් කථා කළා පෞද්ගලික දත්ත ආරක්ෂණය ගැන. මේ කාරණයත් මතක තබා ගන්න. හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මැතිනියගේ නිවස ඉස්සරහට ගිහින් කෑ ගහපු අය එතැන මල පහ කරලා තිබෙනවා. ඒ photos ටික අපි ළඟ තිබෙනවා. මම දැන් ඔත්තුවක් දෙනවා. ඒ මල පහ කළ කෙනාගේ හැඩ රුව, වමුදිත මාධ්‍යවේදියාට අශුචි ගහන්න ගිය කෙනාගේ හැඩ රුවට සමානයි. ඔහු CCTV කැමරාවලින් අපි දැකපු කෙනා හා සමානයි. ඒ සිද්ධිය සම්බන්ධවත් යම්කිසි පියවරක් ගන්න කියලා මා මේ අවස්ථාවේදීම ඉල්ලා සිටිනවා, දත්ත ආරක්ෂා කරද්දී අපි එවැනි සිදුවීම් වළක්වා ගත යුතුයි කියන පණිවුඩය ලබා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට බොහොම ස්තුතියි, මට මේ අවස්ථාව ලබා දුන්නාට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.07]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நன்றி! இன்று விவாதிக்கப்படுகின்ற இந்தத் தனிப்பட்ட தரவுப் பாதுகாப்புச் சட்டமூலம் சம்பந்தமாகக் குறிப்பாகப் பலவாறான விடயங்கள் இங்கே பேசப்பட்டாலும் அரச தரப்பினர் இதனை எவ்வாறாயினும் நிறைவேற்றிக் கொள்வதற்கான வாய்ப்புக்கள் அதிகம் இருப்பதாகவே நான் நினைக்கின்றேன். ஆனால், இப்பொழுது நாங்கள் இருக்கின்ற இந்தச் சூழ்நிலையிலே யார் என்ன சொன்னாலும் எதனை முதன்மைப்படுத்த வேண்டும் என்பதில்தான் எங்களுடைய பிரச்சினை காணப்படுகின்றது. குறிப்பாக, இப்பொழுது எங்களுடைய நாட்டினுடைய நிலைப்பாட்டைக் கருத்திற் கொள்ளவேண்டிய ஒரு சூழ்நிலையில் நாங்கள் இருக்கின் றோம். அதாவது, நாங்கள் என்னதான் சட்டமூலங்களைக் கொண்டுவந்தாலும் அல்லது என்னதான் புதுமையான விடயங்களை ஏற்படுத்துவதற்கான நடவடிக்கைகளை மேற்கொண்டாலும் தற்போது எங்களுடைய நாட்டிலே காணப் படுகின்ற நிலைமைகளைக் கருத்திற்கொள்ள வேண்டிய ஒரு சூழ்நிலையில் நாங்கள் இருக்கின்றோம்.

குறிப்பாக, யார் அரசாங்கம் அமைத்தாலும் அந்தச் சந்தர்ப்பத்தில் எதிர்க்கட்சியினால் கொண்டுவரப்படுகின்ற விடயங்கள் விமர்சிக்கப்படுகின்ற சந்தர்ப்பங்களை நாங்கள் பார்த்திருக்கின்றோம். குறிப்பாக, நல்லாட்சி அரசாங்கத்திலே மின் தட்டுப்பாடு ஏற்பட்ட சந்தர்ப்பத்தில், அன்று முன்னாள் ஜனாதிபதியாக இருந்தவர், "எங்களுடைய ஆட்சிக் காலத்தில் 10 நிமிடமேனும் மின்சாரம் துண்டிக்கப்படாமல் நாங்கள் பார்த்துக்கொள்வோம்" என்ற ஓர் உத்தரவாதத்தை வழங் கியிருந்தார். அவ்வாறு உத்தரவாதம் வழங்கி ஆட்சிக்கு வந்த இந்த அரசாங்கம் இன்று ஏழரை மணித்தியாலங்கள் மின்சாரத்தைத் துண்டிக்கின்ற ஒரு நிலை காணப்படுகின்றது. ஆகையால், பேச்சளவில் எதையும் பேசிவிடலாம். ஆனால், ஓர் அரசாங்கத்தை எவ்வாறு வழிநடாத்த முடியும் என்பதை நடைமுறையில் நாங்கள் விளங்கிக்கொள்ள வேண்டும்.

அதுமாத்திரமல்ல, தற்போதைய இந்த அரசாங்கத் தினுடைய சில செயற்பாடுகள் அச்சத்தை ஏற்படுத்துகின்ற வகையில் காணப்படுகின்றது. 2015ஆம் ஆண்டுக்கு முன்னர் காணப்பட்ட அடாவடித்தனத்தை மீண்டும் அது கையில் எடுத்திருக்கின்றதா? என்ற சந்தேகம் எங்கள் மத்தியிலே

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

எழுந்திருக்கின்றது. சில நாட்களுக்கு முன்னர் பிரதான எதிர்க்கட்சிக் காரியாலயம் தாக்கப்பட்டிருக்கின்றது. இந்தத் தாக்குதல் ஏன் நடைபெற்றது? இவ்வாறான தாக்குதலின்மூலம் எதிர்க்கட்சியைப் பயமுறுத்துகின்றார்களா? அல்லது இப்பொழுது இருக்கின்ற நிலைமை காரணமாக மக்கள் வீதிகளுக்கு இறங்குகின்ற அந்த நிலைப்பாட்டை இடைநிறுத் துவதற்கான ஒரு செயற்றிட்டமா? என நாங்கள் சிந்திக்க வேண்டியிருக்கின்றது. ஆகையால் இவ்வாறான விடயத்திலே கவனமெடுத்து, அவற்றைத் தடுக்கின்ற நிலைப்பாட்டை நாங்கள் முன்னெடுக்க வேண்டும்.

இன்று இந்த அரசாங்கத்திலே பிரச்சினையாகக் காணப் படுகின்ற எல்லா விடயங்களையும் நாங்கள் பட்டியலிட்டுப் பார்க்கின்றபொழுது, அதில் பிரதான ஒரு விடயம்தான் இந்த டொலர் தட்டுப்பாடு. அந்த டொலரைப் பெறுவதற்கான எத்தகைய வேலைத்திட்டங்கள் இந்த அரசாங்கத்தால் முன்னெடுக்கப்படுகின்றது? என்று நாங்கள் பார்க்க வேண்டும். இன்று எரிபொருள் இல்லாமல் மக்கள் வீதிக்கு இறங்குகின்ற சந்தர்ப்பத்திலே அரசாங்கத்திடம் காணப்படுகின்ற டொலர்களை அது எரிபொருளுக்காகச் செலவழித்தால் அடுத்த நாள் மீண்டும் சீமெந்து, மருந்துப் பொருட்களுக்கான தட்டுப்பாடு ஏற்படுகின்றது; அவற்றைப் பெறுவதற்காக மக்கள் மீண்டும் வரிசையிலே நின்றுகொண்டிருக்கின்றார்கள். ஆகையால் மீண்டும் அதற்காக டொலரை வழங்கினால் இன்னுமொரு பொருளுக்குத் தட்டுப்பாடு ஏற்படுகின்றது. எனவே, சரியான ஒரு கொள்கை இல்லாத காரணத் தினால்தான் இன்று அரசாங்கம் இவ்வாறான ஒரு நிலையிலே சென்றுகொண்டிருக்கின்றது என்பதை நாங்கள் விளங்கிக் கொள்ள வேண்டும்.

இந்த டொலர் பிரச்சினை சம்பந்தமாக எங்களுடைய ஐக்கிய மக்கள் சக்தியைச் சேர்ந்த கௌரவ பாராளுமன்ற உறுப்பினர் ஹர்ஷ த சில்வா அவர்கள் 2020ஆம் ஆண்டு டிசம்பர் மாதம் இந்தச் சபையிலே சொன்னபோது, அதை ஒரு வேடிக்கையாக கௌரவ அஜித் நிவாட் கப்ரால் அவர்கள் எடுத் துக்கொண்டார். "அவ்வாறான ஒரு தட்டுப்பாடு ஏற்படாது" என்றார். இப்பொழுது எல்லாவற்றையும் அனுபவிக்க வேண்டிய ஒரு நிலையிலே அரசு இருந்துகொண்டிருக்கின்றது. இப்பொழுது நான் கூறிய டொலர் தட்டுப்பாடு கடந்த நல்லாட்சி அரசாங்கத்தின் காலத்தில்தான் ஏற்பட்டுள்ளதாக இன்று இந்த நாட்டினுடைய ஜனாதிபதியும் அரச தரப்புப் பாராளுமன்ற உறுப்பினர்களும் பேசுகின்ற ஒரு நிலைக்குத் தள்ளப்பட்டிருக்கிறார்கள். உண்மையில் இவர்களுக்கு வெட் கமில்லையா அல்லது ஆடைகளை அணிந்துகொண்டா இவ்வாறு கூறுகிறார்கள்? என்பதை நாங்கள் இந்த இடத்திலே கேட்க விரும்புகின்றோம். குறிப்பாக, 1994ஆம் ஆண்டிலிருந்து இன்றுவரை யார் ஆட்சியிலே அதிக காலம் இருந்திருக்கின்றார்கள் என்று நாங்கள் யோசிக்க வேண்டும். இந்த நாட்டிலே 18ஆவது திருத்தம், 20ஆவது திருத்தம் போன்றவற்றைக் கொண்டுவந்து சர்வாதிகார சனாதிபதி ஆட்சி முறையை வலுப்படுத்தி எந்த அரசாங்கத்தினுடைய கட்சியைச் சார்ந்தவர்கள் ஆட்சி செய்தார்கள் என்பதை நாங்கள் சிந்திக்க வேண்டும். இவர்கள் சிங்கப்பூர் போன்று வளர்ச்சியடைந்த நிலைக்கு மாற்றிய நாட்டையா 2015ஆம் ஆண்டு தொடக்கம் நான்கரை வருடத்திற்குள்ளான எங்களுடைய நல்லாட்சி அரசாங்கத்தின் கீழான ஆட்சிக் காலத்தில் நாங்கள் பாதாளத்திற்குள் தள்ளிவிட்டோம்? என்பதை இந்த இடத்திலே நாங்கள் கேட்க விரும்புகின்றோம். ஆகையால், வெட்கமில்லாமல் இவ்வாறு பேசுவதை இவர்கள் உடன் நிறுத்தவேண்டும் என்பதை நாங்கள் கேட்டுக் கொள்கின்றோம்.

2015ஆம் ஆண்டிலே ஆட்சியமைத்த எமது நல்லாட்சி அரசாங்கத்தைப் பற்றி யார் என்ன குறை சொன்னாலும் அந்தக் காலப்பகுதியிலே மேற்கொள்ளப்பட்ட சில செயற்பாடுகளை இன்று நாங்கள் ஞாபகமூட்டவேண்டும். எங்களுடைய அரசாங்கத்தின் காலத்திலே பெற்றோல் 117 ரூபாய்க்கு வழங்கப்பட்டது. அதேபோல, எரிவாயுவை 1,300 ரூபாய்க்கு வழங்கியிருந்தோம். அரச ஊழியர்களுக்கான சம்பளத்தை 10,000 ரூபாயாக நாங்கள் அதிகரித்து வழங்கினோம். சமுர்த்திக் கொடுப்பனவுகளை அதிகரித்து வழங்கினோம். தற்போது நீங்கள் திறந்து வைத்திருக்கின்ற சீமெந்துத் தொழிற்சாலைகூட எங்களுடைய நல்லாட்சி அரசாங்கத்திலே உருவாக்கப்பட்டது. அன்று அந்தத் தொழிற் சாலையை உருவாக்குகின்றபொழுது ஹம்பாந்தோட்டையிலே பாரிய புரளிகளை ஏற்படுத்தியவர்கள் இன்று அமைச்சர்களாக அந்த இடத்திற்குச் சென்று ribbon வெட்டுகின்ற ஒரு நிலை காணப்படுகின்றது. அதேபோன்று, மன்னாரிலே திறந்து வைக்கப்பட்ட காற்றாலை மின் உற்பத்தி நிலையம் மற்றும் iRoad Project மூலமாகக் 'கார்பெட்' வீதிகள் போடுகின்ற செயற்பாடுகள் போன்ற எத்தனை வேலைத்திட்டங்கள் சென்ற அரசாங்கத்திலே ஆரம்பிக்கப்பட்டன! இவற்றையெல்லாம் மறந்துவிட்டு, இன்று ஓரிரு வருடத்திற்குள் அந்த அரசாங்கத்தினுடைய செயற்பாடுகளை மறக்கடிப்பதற்காகச் சில விடயங்களை முன்வைப்பது உண்மையிலேயே வேடிக்கையானதாகக் காணப்படுகின்றது.

இந்த அரசாங்கத்தை உருவாக்கும்பொழுது இந்த நாட்டினுடைய ஜனாதிபதி, பிரதமர், நிதி அமைச்சர் போன்றவர்கள் எவ்வாறு சொல்லிச் சொல்லி இந்த ஆட்சியைக் கைப்பற்றினார்கள். மஹாதீர் முஹம்மது, லீ குவான்யூ, விளாடிமிர் புடின் போன்றவர்களை உதாரணமாக எடுத்துச் சொன்னவர்களெல்லாம் இன்று 'மிஸ்டர் பீன்'களாகவும் 'சார்லி சப்லின்'களாகவும், தமிழ் நகைச்சுவை நடிகர்களைச் சொல்வதானால் செந்தில், கவுண்டமணி போன்றும் மாறி, அதனை ஒரு நகைச்சுவை நாடகமாக்கியிருக்கின்றார்கள். இவற்றையெல்லாம் புரிந்தவர்களாகத்தான் இன்று இந்த அரசாங்கத்தை வழிநடத்த வேண்டிய ஒரு நிலைப்பாட்டிலே நீங்கள் இருந்துகொண்டிருக்கின்றீர்கள் என்பதை விளங்கிக் கொள்ள வேண்டும். அன்று ஏழாவது அறிவுள்ள அமெரிக்கப் பிரஜை ஒருவரை இந்தப் பாராளுமன்றத்திற்குக் கொண்டுவர வேண்டுமென்று அவருக்குப் பின்னால் சென்றவர்களே இன்று இந்தப் பொருளாதார நெருக்கடிக்குப் பிரதான காரணமே அவர்தான் என்று சொல்லுகின்றார்கள். அவரைப் பாராளுமன்றத்திற்குக் கொண்டுவருவதற்காக அவர்களுடைய கட்சியும் அவர்களுடைய தலைவர்களும் அரசியலமைப்புக் கான இருபதாவது திருத்தத்தைப் பாராளுமன்றத்திலே அரங்கேற்றினார்கள். அந்தச் சாபக்கேட்டில் அவர்களுடைய பங்களிப்பும் இருந்ததென்பதை மறந்தவர்களாக இன்று அவர்கள் கதைத்துக்கொண்டிருப்பது உண்மையிலேயே ஒரு வேடிக்கையான விடயமாகக் காணப்படுகின்றது.

இன்று இந்த அரசாங்கத்தினுடைய நிலைப்பாட்டைக் கருத்திற்கொண்டு, இந்த அரசாங்கத்திற்கு ஆதரவு வழங் குகின்ற சில ஊடகங்களால் அவ்வப்போது சில கருத்துக்கள் வெளியிடப்படுகின்றன. உண்மையிலேயே அந்தக் கருத் துக்கள் மிகவும் வேடிக்கையானவையாக இருக்கின்றன. குறிப்பாக, அரசாங்கத்தின் நடவடிக்கைகள் fail ஆகும் நேரத்தில் இந்த ஊடகங்கள், "கௌரவ ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் இந்த நாட்டினுடைய பிரதமராக வருவார்" - "ஐக்கிய மக்கள் சக்தியிலிருக்கின்ற பல பாராளுமன்ற உறுப்பினர்கள் அரசாங்கத்திற்கு ஆதரவு வழங்குவார்கள்" என்பது போன்ற பல கருத்துக்களைத் தெரிவிக்கும். இது ஒன்றும் புதுமையான விடயமல்ல. இந்த இக்கட்டான நிலையில் நாங்கள் இந்த அரசுக்குச் சொல்லுகிறோம், நீங்கள் தனித் தேசிய

அரசாங்கத்தை அமைத்துக் கொள்ளுங்கள்! தனி மொட்டு அரசாங்கத்தை உருவாக்கிக்கொள்ளுங்கள்! ஆனால், அதிலே ஐக்கிய மக்கள் சக்தியின் உறுப்பினர்கள் யாரும் இணைய மாட்டார்கள் என்பதை நாங்கள் தெளிவுபடுத்த வேண்டும். ஏனென்றால், மூழ்குகின்ற அல்லது மூழ்கிய ஒரு கப்பலில் பயணிப்பதற்கு யாரும் தயாரில்லை என்பதை நீங்கள் விளங்கிக்கொள்ள வேண்டும்.

அண்மையில் எமது கட்சித் தலைமைக் காரியாலயம்மீது ஓர் ஆளும் கட்சிப் பாராளுமன்ற உறுப்பினரின் தலைமையின்கீழ் முட்டை எறிந்து தாக்குதல் நடாத்தப்பட்டிருக்கின்றது. முட்டை எறிதல் என்பது இந்த அரசாங்கத்தினுடைய தொடர்ச்சியான ஒரு செயற்பாடாகவே காணப்படுகிறது. உண்மையிலேயே இவ்வாறான நடவடிக்கையானது நாட்டில் பலமிக்க ஓர் எதிர்க்கட்சி இருக்கின்றது என்பதற்கான சாத்தியத்தை ஏற்றுக்கொள்வதை அல்லது அதற்கான ஓர் அங்கீகாரத்தை இந்த அரசாங்கம் வழங்கியிருப்பதைத்தான் காட்டுகின்றது என்பது எங்களுடைய கருத்தாகக் காணப்படுகின்றது. அந்த வகையில், இந்த அரசாங்கத்தினால் இப்பொழுது மக்களுக்கு ஏற்பட்டிருக்கின்ற இக்கட்டான சூழ்நிலையைக் கருத்திற் கொண்டு எதிர்வரும் 15ஆம் திகதி கொழும்பிலே ஒரு பேரணியை நடாத்துவதற்கான நடவடிக்கைகளை மேற் கொண்டிருக்கின்றோம். ஆகையால், மக்களுக்கு கஷ்டத்தைக் கொடுக்கின்ற கடும்போக்கான இந்த அரசாங்கத்தை வீட்டுக்கு அனுப்புகின்ற அந்தப் பேரணியில் - அந்தச் செயற்றிட்டத்தில் மக்கள் அனைவரும் திரண்டு பங்கெடுக்க வேண்டுமென்பதைக் கூறி, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා. Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්* **ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා** *මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு ஹர்ஷன ராஜகருணா அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. HARSHANA RAJAKARUNA *left the Chair, and* THE HON. (DR.) SUREN RAGHAVAN *took the Chair.*

[අ.භා. 3.17]

**ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා**
(மாண்புமிகு நாலக பண்டார கோட்டேகொட)
(The Hon. Nalaka Bandara Kottegoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමා පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත ගැන නොවෙයි කථා කළේ. එතුමා වෙනත් වැල් වටාරම් ගොඩක් කියමින් මේ රජයට චෝදනා කළා. ඊට පස්සේ එතුමා හෙට අනිද්දා තිබෙන දේශපාලන රැස්වීමකට එන්න කියලා ආරාධනය කරමින් කථාව අවසන් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත අපේ රටට මේ මොහොතේ අත්‍යවශ්‍ය, කාලෝචිත පනතක්. විශේෂයෙන්ම මේක ගරු නාමල් රාජපක්ෂ අමාත්‍යතුමාගේ ඩිජිටල්කරණ වැඩ පිළිවෙළ සඳහා අත්‍යවශ්‍ය පනතක්. ඒ නිසා මේක කඩිනමින් සම්මත කර ගත යුතු පනතක් කියලා මම විශ්වාස කරනවා. විශේෂයෙන්ම ඩිජිටල්කරණය හරහා ලංකාවේ අංශ රාශියක කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළ නැංවීමට අපි බලාපොරොත්තු වෙනවා. ඩිජිටල්කරණ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය කරන නීතිමය පසුබිම සකස් කිරීමට තමයි අපි මේ පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත අවශ්‍ය වන්නේ.

ලෝකයේ රටවල් ගණනාවක ඩිජිටල්කරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට උත්සාහ කිරීමේදී ඔවුන්ට හරහට හිටියේ, බාධාවක් වුණේ එම රටවල පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතක් හරියට ක්‍රියාත්මක නොවීමයි. ඉදිරිය දකින තරුණ නායකයකු විධියට ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා ඩිජිටල්කරණ ක්‍රියාවලියේ මූලික අඩියර විධියට පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත අද පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ රටේ රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව ඉහළ නංවන්න වාගේම, මේ වෙද්දී මේ රටේ යම් යම් ගැටලු මතු වෙලා තිබෙන ඉඩම් පිළිබඳ කාරණා, බලපත්‍ර ලබා දීම, ග්‍රාම නිලධාරි සහතික, උප්පැන්න සහතික ආදිය ලබා දීම වැනි කටයුතු රාශියක් ඩිජිටල්කරණය හරහා අපට ඉතාම සරල ආකාරයට ක්‍රියාත්මක කර ගන්න පුළුවන්. ඒ වාගේම මේ තුළින් දත්ත ගබඩා කිරීමට යන වියදම් අවම කර ගන්නත් පුළුවන්. අනෙක් පැත්තෙන්, දත්ත අතුරුදහන් වීම් වළක්වා ගන්නත් පුළුවන්. පසුගිය කාලයේ hard copy විධියට තිබෙන දත්ත අතුරුදහන් වීම් ගණනාවක් අපි දැක්කා. විශේෂයෙන්ම ඉදිරියේ දී අධිකරණ පද්ධතිය සම්පූර්ණයෙන්ම ඩිජිටල්කරණය කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. අන්න ඒ වාගේ අවස්ථාවල තමයි අපට මේ පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත අවශ්‍ය වෙන්නේ. මොකද, ජනතාවගේ පෞද්ගලික දත්ත ඔවුන්ට අවශ්‍ය පරිදි, ඔවුන්ගේ අභිමතය පරිදි ආරක්ෂා කරගන්න අවශ්‍ය නීති රීති පිළිබඳව මේ පනත් කෙටුම්පතේ සඳහන් කර තිබෙනවා. එම දත්ත කොපමණ කාලයක් පවත්වාගෙන යන්න ඕනෑද, එම දත්තවලින් ඉදිරියට පවත්වාගෙන යා යුත්තේ මොන දත්තද, නැත්තේ මොනවාද කියලා තීරණය කරන ආකාරය මෙම පනත් කෙටුම්පත තුළ පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. එම නිසා මෙම පනත් කෙටුම්පත කඩිනමින් සම්මත කර ගත යුතුය කියලා මම විශ්වාස කරනවා.

අද විපක්ෂයෙන් කථා කළ ගරු මන්ත්‍රීතුමන්ලාගේ ඉල්ලා සිටි එක කාරණයක් තමයි, මේ පනත් කෙටුම්පත සම්මත කිරීම කල් දමන්න කියන එක. මේක සම්මත කිරීම තව මාසයක් කල් දමන්න කියලා එතුමන්ලා කිව්වා. මේ පනත් කෙටුම්පත ඉස්සෙල්ලාම ඉදිරිපත් කර තිබෙන්නේ 2019 මාර්තු 30වෙනි දා. ඒ වාගේම මේ සඳහා උනන්දුවක් දක්වන සියලු පාර්ශ්ව ඉදිරිපත් වෙලා ලිඛිත යෝජනා, - written submissions - 30කට අධික ප්‍රමාණයක් ලබා දීලා, වසර දෙකහමාරකට අධික කාලයක් ඒවා සාකච්ඡා කරලා තමයි මේ කෙටුම්පත සම්පාදනය කරලා තිබෙන්නේ.

විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා අද කථා කළේ මේ පනත් කෙටුම්පතට අදාළව නොවෙයි. එතුමන්ලා කොහෙන් හරි කැරකිලා ඇවිල්ලා බලශක්ති අර්බුදය ගැන රජයට චෝදනා කරන්න තමයි පටන් ගන්නේ. මේ බලශක්ති අර්බුදය ආරම්භ කළේ කවුද? මේ බලශක්ති අර්බුදයට වග කිව යුත්තේ කවුද? 2014 දී නම්බපවනි බලාගාරයට හිටපු ජනාධිපති, වර්තමාන අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මුල් ගල තිබ්බාට පස්සේ පසුගිය වසර 5 තුළ මොන බලාගාරයේද වැඩ ආරම්භ කළේ? යහ පාලන රජයේ පසුගිය වසර 5 ඇතුළත කිසිම බලාගාරයක් ආරම්භ කරලා නැහැ, කිසිම බලාගාරයකට මුල් ගල්

[ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා]

තියලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් අද එතුමන්ලා මේ අවුරුදු එකහමාරේ ආණ්ඩුවට චෝදනා කරනවා මේ බලශක්ති අර්බුදයේ වගකීම භාර ගන්න කියලා. මේ අවුරුදු එකහමාරේ ආණ්ඩුව නොවෙයි, වසර හැත්තෑතුනක් තිස්සේ තිබුණු සියලු ආණ්ඩු විසින් ක්‍රියාත්මක කරන ලද බලශක්ති පිළිබඳ තීන්දු-තීරණ වර්තමානයේ ඇති වෙලා තිබෙන අර්බුදයට වග කිව යුතුයි.

හැබැයි, 2015 වනකල් මේ රටේ ක්‍රියාත්මක වූ සියලු ආණ්ඩු මේ රටේ ජාතික විදුලිබල පද්ධතියට විදුලිය කිලෝවොට් එකක් හෝ අලුතෙන් එකතු කරන්න කටයුතු කර තිබෙනවා. නමුත්, 2015 සිට 2019 වනකල් පැවැති ආණ්ඩුව කිසිදු බලාගාරයක් ආරම්භ කරන්න කිසිම පියවරක් අරගෙන නැහැ, කිසිම අනුමැතියක් දීලාත් නැහැ. ඊයේ දිනයේ ලංකාවේ ජනනය කළ විදුලි ප්‍රමාණය ගිගාවොට් 43යි. එම ගිගාවොට් 43න්, ගිගාවොට් 19.54ක් ගල්අඟුරු හරහා නිෂ්පාදනය වෙලා තිබෙනවා. ඒ කියන්නේ, ඊයේ දිනයේ මේ රටට සියයට 48ක බලශක්ති ප්‍රමාණයක් සපයා තිබෙන්නේ ගල්අඟුරුවලින්. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේදී ඉදිකළ ඉහළ කොත්මලේ, නොරොච්චෝලේ, ඒ වාගේම තම්බපවනි බලාගාරය නැත්නම්, අද දවසේ පැය 24න්, පැය 23ක් විදුලිය කප්පාදු කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා තමන්ගේ අතේ වැරැද්ද තබාගෙන වසර එකහමාරේ මේ ආණ්ඩුවට චෝදනා කරන්න උත්සාහ කරන්න එපා. ඔබතුමන්ලා මෙම පනත් කෙටුම්පත කල් දමන්න කියලා පාර්ලිමේන්තුවේ කියනවා. එදා බලශක්තිය පිළිබඳ තීන්දු-තීරණ ගැනීම කල් දැමූ නිසා තමයි, පසුගිය වසර පහට විදුලිය කිලෝවොට් එකක්, මෙගාවොට් එකක් ජාතික විදුලිබල පද්ධතියට එකතු නොවුණේ. ඔබතුමන්ලා ජාතික විදුලිබල පද්ධතියට කිසියම් හෝ ප්‍රමාණයක් අලුතෙන් එකතු කළා නම්, විදුලිය සම්බන්ධයෙන් අද මේ අර්බුද ඇති වන්නේ නැහැ.

අපේ ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා ඉදිරියේදී අපට මුහුණ දීමට තිබෙන ප්‍රශ්න සඳහා දැන්ම විසඳුම් හොයමින්, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත සම්මත කර එය ක්‍රියාත්මක කරන්න, අපේ රට ඩිජිටල්කරණය කරා ගෙන යන්න උත්සාහ කරන මේ වැඩ පිළිවෙළ පිළිබඳව එදා ඔබතුමන්ලා හිතුවා නම්, බලශක්ති අර්බුදය ගැන පවා අද මේ ගරු සභාවට ඇවිල්ලා චෝදනා කරන්න වෙන්නේ නැහැ. එහෙම නම්, අද අපේ රටේ සියලු ජනතාව මීට වඩා ඉතාම පහසු තත්ත්වයක ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කලින් කථා කළ මන්ත්‍රීතුමා ආරාධනා කළා, හෙට-අනිද්දා දවසක කොළඹ තිබෙන රැස්වීමකට එන්න කියලා. මම එතුමාට එක දෙයක් මතක් කරනවා. ඔබතුමන්ලා ගිහිල්ලා කණ්ණාඩියකින් බලන්න, මේ අර්බුදය ඇති කළේ කවුද කියලා. එතකොට ඒ කවුද කියලා දැකගන්න ලැබේවි. රාජපක්ෂවරු මේ රට පාලනය කළ කාලයේදී මේ රටේ කුමන හෝ විදුලි බලාගාරයක් ඇති කර කිලෝවොට් එකක් හෝ ජාතික පද්ධතියට එකතු කර තිබෙනවා. විශේෂයෙන්ම වසර පහක් තිස්සේ නවතාගෙන හිටපු සූර්ය විදුලි බලාගාර, rooftop solar power systems, ඒ කියන්නේ නිවාසවල වහල මත ඉදිකරන, පෞද්ගලික අංශයට ලබාදෙන සූර්ය විදුලි බලාගාර ආදී සියල්ලම ක්‍රියාත්මක කරන්න කියලා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා පසුගිය සතියේ දැනුම් දුන්නා. ඒ වාගේම, විවිධ කරුණු කාරණා ඉදිරිපත් කරමින්, මෙතෙක් නවතා තිබූ සියලු ජල විදුලි බලාගාර, සියලුම කුඩා විදුලි බලාගාර ඇතුළු සියලු බලාගාර ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනත උපයෝගී කරගනිමින් ක්‍රියාත්මක කරන්න කියලා එතුමා අද නියෝග කර තිබෙනවා.

මෙම පනත් කෙටුම්පත සම්මත කිරීම තව මාසයක්, දෙකක් කල් දමන්න කියලා, රටට අවශ්‍ය මොහොතේ අවශ්‍ය තීරණ ගන්න දෙන්නේ නැතිව මේ රට අරාජික කරන්න ඔබතුමන්ලා උත්සාහ කළාට, තුනෙන් දෙකේ බහුතරයක් තිබෙන, මේ රට ගැන හිතන ආණ්ඩුවක් විධියට අපි ඔබතුමන්ලාගේ ඒ මතයට ඇහුම්කන් දෙන්නේ නැහැ කියන කාරණය මම නැවතත් මතක් කරනවා. අපි ශක්තිමත් රජයක් විධියට රටට අවශ්‍ය නිවැරදි තීරණ අරගෙන ඒවා ක්‍රියාත්මක කර, ඉදිරියේදී ඩිජිටල්කරණය හරහා අපේ රටේ වැඩ කටයුතු තවත් කාර්යක්ෂම කරලා රට තවත් දියුණුවට ගෙන යන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.25]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද මේ පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත ඉදිරිපත් කරපු එක ඉතාම හොඳයි. මොකද, අවුරුදු ගණනාවක්ම මේ පිළිබඳව සාකච්ඡා වෙමින් තිබුණා. 2019න් පස්සේ මේ රජය බලයට පැමිණි පසුත්, මේ රජය බලයට එන්න ප්‍රථමයෙනුත් මේ ගැන සාකච්ඡා වුණා. නමුත්, රජයට සලකා බලන්න කියා මම කරුණු කිහිපයක් ඉදිරිපත් කරනවා. මම පළමුවෙන්ම කියන්න ඕනෑ, මේ පනත් කෙටුම්පත නිර්මාණය කරන්න සෑහෙන කාලයක් ගිහිල්ලා තිබෙන බව. එතකොට ඒකට විශේෂයෙන්ම ICTA එකේ නීති පැත්තෙන් ඉන්න ජයන්ත ප්‍රනාන්දු මහතා වාගේ නිලධාරින්, එහි ලේකම්තුමා -වාසනාවකට මේ ක්ෂේත්‍රය පිළිබඳ දන්නා ලේකම්තුමකු ඉන්නවා.- වාගේම තව බොහෝ නීතිඥ මහත්වරු සම්බන්ධ වෙලා තිබෙනවා. එනමුත්, මට මෙහි ගැටලුවක් තිබෙනවා. ඒ තමයි, මේ පනත් කෙටුම්පත දිහා අපි පුළුල් ලෙස බලන්න ඕනෑය කියන එක. පුළුල් ලෙස බලන්න කියන්නේ, මෙය දත්ත ආරක්ෂා කිරීම පිළිබඳව වූ පනත් කෙටුම්පතක්. ඇත්තටම එතකොට හිතන්නේ පුරවැසියාගේ අයිතිවාසිකම් ආරක්ෂා වෙන්න ඕනෑ ඒ දත්ත තිබෙන අයගෙන් කියලා.

ඇත්තටම මේකේ තව පැත්තක් තිබෙනවා. ඒ තමයි, පුරවැසියා ආරක්ෂා කිරීම රජයෙන් කරන්න ඕනෑ කියන කාරණය. බොහෝ වෙලාවට අපි මේ ගැන කල්පනා කරන්නේ නැහැ. මොකද, එක්කෝ අපි රජයේ කටයුතු කරනවා; නැත්නම් විපක්ෂයේ කටයුතු කරනවා. ඒ විධියට කාලයෙන් කාලයට මාරු වෙනවා; වෙනස් වෙනවා. නමුත්, පුරවැසියා ආරක්ෂා කිරීම රජයෙන් කරන්න ඕනෑ. මහජන උපයෝගීතා කොමිසම වෙන්න පුළුවන්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත - PTA - වෙන්න පුළුවන්, ඒවා එක එක විධියට භාවිත වෙලා තිබෙනවා.

ත්‍රස්තවාදය නැති වුණත් බොහෝ අය අත්අඩංගුවට ගත් බවළඟදී අපි දැක්කා. රාජ්‍ය නිලධාරින්, CID එකේ අය, මුස්ලිම් ජාතිකයන් වැනි නොයෙක් අය අත්අඩංගුවට ගත්තා. නමුත්, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය - ICCPR - යටතේ වන පනතකුත් රට තුළ තිබෙනවා. අපි ඒ පනතත් පාවිච්චි කර තිබෙනවා, රජයට විරුද්ධ අයට -විරුද්ධවාදීන්ට- වධ හිංසා කිරීමට. ඒකයි, මම මේ කරුණු ඉදිරිපත් කරන්නේ. මේ පනත් ගැන කථා කරනකොට, පුරවැසියා ආරක්ෂා කිරීම රජයෙන් කරන්නේ කොහොමද කියලාත් අපට හිතන්න වෙනවා. අන්න ඒක තමයි, මේකේ තිබෙන අඩු පාඩුව. මෙහි ප්‍රධාන කරුණු තුනක් තිබෙනවා. අද දවස තිස්සේම මේ ප්‍රධාන කරුණු තුන ගැන සාකච්ඡා වෙලා තිබෙනවා. මම අහගෙන හිටියා, "ඊයේ පැවැති උපදේශක කාරක සභාවට සමහර අය ආවේ

නැහැ." කියලාත් මෙතැනදී කිව්වා. මම මේකත් ප්‍රසිද්ධියේම කියන්න ඕනෑ. දවස් දෙකකට උඩදී දැනුම් දුන්නා, එම කාරක සභාව දහවල් දෙකට තිබෙනවා කියලා. දන්නවා නේ, පාර්ලිමේන්තුවේ හැටි. වෙන වෙන meetings පවා ඒ වෙලාවටම පවත්වන්නත් කටයුතු කර තිබෙනවා.

මම අද මේ සභා ගර්භයේ සිටියේ නැති වුණත්, මෙහි සිදු කළ කථා මම අහගෙන සිටියා. මම ගරු ඇමතිතුමාගේ කථාවත් අහගෙන සිටියා. දැන් ඇමතිතුමාත් මෙතැන නැහැ නේ? ඒ කියන්නේ ඇමතිතුමා මෙතැන නොසිටියත්, මෙතැන සිදුවන කථා එතුමා අහගෙන ඉන්නවා. මම ඒ ගැන දන්නවා. මොකද, වග කියන අය බලන්නේ "අපි මේක දියුණු කරන්නේ කොහොමද?" කියන එකයි. අද උදේ මේ ගරු සභාවේ පැවැත් වූ කථා සියල්ලම මම අහගෙන සිටියා.

මෙහි තිබෙන ප්‍රධාන කරුණු තුනෙන් පළමුවැනි එක තමයි, ජනමාධ්‍ය කෙරෙහි තිබෙන බලපෑම. මෙතැන balance කිරීමේ ප්‍රශ්නයක් තිබෙනවා. මම දන්නවා, මේ වාගේ පනත් කෙටුම්පත් හදනකොට අයිතිවාසිකම් හා පොදුවේ කරන්න තිබෙන දේ අතර balance කිරීමක් කරන්න ඕනෑ බව. එතකොට, ජනමාධ්‍යවේදීන්ට මේක ප්‍රශ්නයක් කියලා ඒ අය කරුණු ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන් තරුණ ජනමාධ්‍යවේදීන් මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළා. කවුද කෙනෙක්, නැඟිටලා කිව්වා, "ඒ අය උසාවියට ගියේ නැහැ." කියලා. ඔව්, ඒගොල්ලන්ට දවස පහු වුණු නිසා උසාවියට යන්න බැරි වුණා. ඒක ඇත්ත. ඒ වුණාට ඒ අය කියපු දේත් සලකා බලන්න ඕනෑ. මොකද, මාධ්‍ය කියන දේ ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන කුලුනක්.

දවසක් මම CID එකට අරගෙන ගියා. එහෙම අරගෙන ගිහිල්ලා, පාස්කු ඉරුදින ප්‍රහාරයේ මහ මොළකරු ගැන මගෙන් ප්‍රශ්න කළා. එසේ CID එකෙන් ප්‍රශ්න කළාට පසු සමාජ මාධ්‍යවල පළ කළා, මම සහරාන්ගේ බිරිඳට සල්ලි දීලා කියලා. මම ආයෙත් CID එකට ගිහිල්ලා කිව්වා, මේ ගැන සොයා බලන්න කියලා. පසුව CID එකෙන් කිව්වා, "Facebook එකේ දත්ත දෙන්න බැහැ" කිව්වා කියලා. ඒ කියන්නේ ඒ ගොල්ලන් කියනවා, අධිකරණ තීරණයක් අරගෙන එන්න කියලා. ඉතින් මම තව statement එකක් දීලා කිව්වා, අධිකරණ තීරණයක් ගන්න කියලා. මම අවුරුද්දක් තිස්සේ බලාගෙන ඉන්නවා, අධිකරණ තීරණය අරගෙන කවුද ඒක පළ කළේ කියා කියනකම්. නමුත්, මාධ්‍යයට හිරිහැර කරන්න බැහැ. මොකද, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂාවීමට නිදහස් මාධ්‍යයක් තිබිය යුතුයි කියා මා විශ්වාස කරනවා. අපි ඔක්කෝටම මාධ්‍යයෙන් නොයෙක් අන්දමින් පහරගහලා තිබෙනවා. මමත් මේ පිළිබඳව බලාගෙන ඉන්නේ. නීතිය අනුව එය ක්‍රමානුකූලව යා යුතුයි. මාධ්‍ය පාලනය කරන එක රජය කරන්න ගියොත්, ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා. සාමාන්‍යයෙන් අපිත් ඒකට විරුද්ධයි. මාධ්‍යයෙන් තමයි බොහෝ දේවල් ඉදිරිපත් කර තිබෙන්නේ. මේ පනත් කෙටුම්පත තුළ දත්ත පාලකවරු ගැන, දත්ත සකසන්නන් ගැන කථා කරනවා. නමුත්, ජනමාධ්‍යට අරමුණක් තිබෙනවා. ඒ අරමුණ ඉෂ්ට කරන්න ඉඩ තිබෙන්න ඕනෑ. ඒ අය කියන්නේ ඒක පිළිගෙන ක්‍රියා කළා නම්, මේ පනත් කෙටුම්පතට තවත් දේවල් ඇතුළත් කරන්න තිබුණු බවයි. නමුත්, ඒ දේවල් මේ පනත් කෙටුම්පතට ඇතුළත් කර නැහැ. ඒකයි මෙතැන ඇති වෙලා තිබෙන ගැටලුව.

2019දී ඉදිරිපත් කළ කෙටුම්පතෙහි තිබුණා, ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත තොරතුරු දැනගැනීමේ අයිතිය සුවිශේෂී අයිතියක් ලෙස මේ පනතේ කෙටුම්පතේ හඳුන්වන්න කියලා. සමහර නීතිඥ මහත්වරු තර්ක කළා, ඒක පනත් කෙටුම්පතට ඇතුළත් කරන්න ඕනෑ නැහැ, මොකද ඒක වෙනම තිබෙන්නේ කියලා. මම කියන්නේ ඒක ඇතුළත් කළා නම්, ජනමාධ්‍යයට ඒකෙන් ආරක්ෂාවක් තිබෙනවා කියා ඒ අය සතුටු වෙයි කියන එකයි. අපි මේ පනත් කෙටුම්පත සම්මත කරනකොට, අපි ඒ අයගේ අදහසුත් මේකට ගේන්න එපා යැ. ඒ නිසා නීතිඥ මහත්වරු තර්ක කළාට හරියන්නේ නැහැ, ඇත්තටම ඒක මේ පනත් කෙටුම්පතට ඇතුළත් කරන්න තිබුණා. 2019දී ඉදිරිපත් වූ පනත් කෙටුම්පත තුළ ඒ ගැන සඳහන් කර තිබුණා. නමුත්, අවාසනාවකට ඒක මෙහි ඇතුළත් කළේ නැහැ.

ඊට පසු, පනත බලාත්මක කිරීමට ස්වාධීන කොමිසමක් ඇති කරනවා කියාත් මේකේ සඳහන් කර තිබෙනවා.

ඔව්, කොමිසමක් අවශ්‍යයි. නමුත් අද හුඟක් සාකච්ඡා වුණා කොමිසම පත් කරන්නේ කවුද කියලා. ඇත්තටම ඇමතිතුමායි, ජනාධිපතිතුමායි තමයි කොමිසම පත් කරන්නේ. ඒක තමයි වෙලා තිබෙන්නේ. නමුත් මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. ප්‍රශ්නය තමයි, විධායකය කොමිසම පත් කිරීම. එතකොට ඒ කොමිසම විධායකයෙන් ස්වාධීන නැහැ. විධායකයෙන් ස්වාධීන නැහැ. අන්න ඒක තමයි මෙතැනදී කල්පනා කරන්න වෙන්නේ. එතකොට හැම දාම විධායකය නම් යෝජනා කරනවා; විධායකයෙන් පත් කරනවා. නමුත් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබුණේ ඒ පුද්ගලයන් සුදුසුද, නැද්ද කියලා ස්වාධීන කොමිෂන් සභාවකින් සොයා බලා විධායකයට දැන්විය යුතු බවටයි. සුදුසු නැත්නම් ඒ නම අස්කර ගන්නවා. එතකොට විධායකය අලුත් නමක් ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ අනුව යෝජනා කිරීමේත්, පත් කිරීමේත් අයිතිවාසිකම විධායකය අරගෙන නැහැ. නමුත් සුදුසුද, නැද්ද කියලා සොයලා බලන ඒ මූලධර්මය විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අහෝසි කළා. කවුරු හරි මෙතැනදී තර්ක කරලා කිව්වා, "ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රශ්නයක්. මේ පනත් කෙටුම්පතට අදාළ නැහැ" කියලා. පනත් කෙටුම්පතට අදාළයි. මේ පනත් කෙටුම්පත ඇතුළේ දමන්න තිබුණා, ඒ යෝජනා කරන නම් පිළිබඳ ස්වාධීනව සොයලා බලන ක්‍රමවේදයක්. මීට ඉස්සෙල්ලා Draft එකක දමලා තිබුණා, ඕනෑ කෙනෙකුට ඒ සඳහා ඉල්ලන්න පුළුවන් කියලා. ඒකත් අයින් කරලා තිබෙන්නේ දැන් තිබෙන පනත් කෙටුම්පත අනුව. ඉතින් ඒ නිසා මේ කොමිසම ස්වාධීනයි කියලා කියන්න බැහැ. ඒක විධායකයට බද්ධයි. මෙතැන මූලධර්ම ප්‍රශ්නයක් තිබෙන්නේ. මම කියන්නේ මේ කොමිසම ස්වාධීන වෙන්න ඕනෑ කියලායි. ඒ ස්වාධීනත්වය පිළිබඳ ගැටලුවක්, ප්‍රශ්නයක් මෙතැන තිබෙනවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබුණ මූලධර්මයත් මෙතැන නැහැ. ලංකාවේ Constitutional right එකක් නැහැ. පුද්ගලික ආරක්ෂාවට - privacy - ව්‍යවස්ථාදායක අයිතියක් නැහැ. ඒ ප්‍රශ්නය තිබෙනවා. මම කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නැති වුණත් අපි ඒක පුළුවන්, පුළුවන් හැමතැනටම දමන්න අවශ්‍යයි කියලායි. ඒක දමන්න අවශ්‍යයි. මේ පනත් කෙටුම්පතටත් අපට ඒ ස්වාධීනත්වය දමන්න තිබුණා. දැන් මෙහෙම නේ. එක එක ගැටලු, ප්‍රශ්න තිබෙනවා. මන්ත්‍රීවරු, ඇමතිවරු හොරකම් කරනවා කියලා කියනවා. එතකොට කියනවා, "ආ, මේවා එක එක අය මාධ්‍යයේ දමනවා. එතකොට ඒක මගේ පෞද්ගලික ප්‍රශ්නයක්." කියලා. මගේ පෞද්ගලිකත්වයටත් ඒ වාගේ ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මම කියපු කථාවේත් ප්‍රශ්නයක් තිබෙනවා, මගේ පුද්ගලිකත්වයට. ඉතින්, balance එකක් නේ මෙතැන තිබෙන්නේ. මේ balance එකේදී අපි විශේෂයෙන්ම මාධ්‍ය ආරක්ෂා කළ යුතුයි කියලායි. මම මේ කරුණු කාරණා කියන්නේ මේ පනත අවශ්‍ය නිසායි. පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතක් අවශ්‍යයි, ආයෝජන මේ රටට ගේන්න. ඒ අතින් මේ පනත අවශ්‍යයි. විපක්ෂයටයි, රජයටයි එකතු වෙලා මේ පනත සම්මත කරන්න අවස්ථාව තිබුණා නම්, ඇත්තටම ඒක ආයෝජනයට බලපානවා කියලා මම හිතනවා. අද අපි මේකට විරුද්ධ වෙලා රජය විතරක් මේ පනත් කෙටුම්පත සම්මත කළොත්, ඒක අනිවාර්යයෙන්ම ආයෝජනයට බලපානවා.

මේ රටේ පනත්වල හිඟයක් නොවෙයි තිබෙන්නේ. මේ රටේ විශ්වාසයේ හිඟයක් තිබෙන්නේ. ආණ්ඩුවටයි, විපක්ෂයටයි එකතු වෙලා එක පනතක්වත් සම්මත කර ගන්න බැරි වෙලා තිබෙනවා.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

මම මේ යෝජනා කරන්නේ මේ පනත් කෙටුම්පත සලකා බලන්න කියලායි. ආණ්ඩුවට මේක සම්මත කර ගන්න පුළුවන්. මම අහගෙන හිටියා, හුඟක් මන්ත්‍රීවරු මේ ගැන කථා කළා. ඒ අය කිව්වා මේකට ටිකක් කල් දෙන්න කියලා. එතකොට කිව්වා, අපි හුඟක් කල් දුන්නා කියලා. කල් දුන්නාට තිබෙන ගැටලුව මේකයි. අද එක එක දත්ත, එක එක ලිපින එහෙම සහාගත කළා නේ. ඒ අය කැඳවලා, ඒ අයත් එක්ක සාකච්ඡා කරලා මේ කෙටුම්පතේ වෙනස්කම් දෙක, තුනක් කළොත් හොඳයි. මම ඊයේ නීතිඥ මහත්වරු එක්ක පාන්දර 2.00 වෙනකම් කථා කළා. මම ඒ අය එක්ක සාකච්ඡා කළා. ඒ අය කියන නිසා මේ සංශෝධන ඇතුළු කළා නම් හොඳයි කියලායි මම කියන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මම කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දෙවනුව මම කියනවා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි වෙච්ච නිසා, මේ පත්වීම් ගැන ප්‍රශ්නයක් තිබෙන නිසා, අපට මේ පනත් කෙටුම්පත තුළ පත්වීම් ගැනත් යම් කිසි ආරක්ෂාවක් දමන්න තිබුණා කියලා. ඒක කරන්න පුළුවන් වුණොත්, විපක්ෂයටත් එකතු වෙලා මේ පනත් කෙටුම්පතට සහයෝගය දෙන්න පුළුවන් කියලායි මම හිතන්නේ. මමත් රජයෙන් ඉල්ලා සිටිනවා, රටේ අනාගතය සඳහා මේ පනත් කෙටුම්පත අද සම්මත නොකර කල් දමලා මේ කරුණු ගැන සලකා බලා සම්මත කර ගන්න කියලා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මැතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.37]

**ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා**
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත රටට වැදගත්ම පනත් කෙටුම්පතක් කිව්වොත් නිවැරදියි. ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා අපේ රට අලුත් තැනකට ගෙනියන්න ලැහැස්ති වෙනවා. ඒක ඉතා වැදගත් අවස්ථාවක්. මේ පෞද්ගලික දත්ත සැකසුම නියාමනය ආරක්ෂා කිරීම වෙනුවෙන් මේ කරනු ලබන්නේ ඉතා වැදගත් දෙයක්. අපේ හැමෝටම තිබෙන ගැටලුවක් නිරාකරණය කිරීමක් තමයි එතුමා මේ කරන්න සූදානම් වෙන්නේ. අපි හැමෝම දන්නවා, ඩිජිටල්කරණය කියන්නේ කළ යුතු දෙයක් බව. අපට තිබෙන අපහසුතා මඟ හරවා ගන්න අවශ්‍ය කටයුතු අපි කරන්න ඕනෑ. නිලධාරින් කොහොමද වැඩ කරන්නේ, අපේ වෙලාව නාස්ති වෙන්නේ කොහොමද ආදී හැම දෙයක්ම කාර්යාලයකට ගියාම අපි දකිනවා. මේවා දැක දැක අපි කථා කර කර ඉන්නවා; බැණ බැණ ඉන්නවා. මොන දේ කළත්, මොන දේ කරන්න ගියත්, හැම වෙලාවේම ඒවාට විරුද්ධවීම තමයි විපක්ෂය කරන කාර්යභාරය විධියට අපි දකින්නේ. නමුත් ඒක නොවෙයි විය යුත්තේ. අපි හැමෝම එකතු වෙලා මේ රට ඉස්සරහට ගෙනියන්න ඕනෑ. විදේශ රටකට ගියාම අපි දකිනවා, අපේ රට කොච්චර පිටිපස්සෙන්ද ඉන්නේ කියලා. ඩිජිටල්කරණය කර තිබෙන දියුණු විදේශ රටවලට ගියාම අපි දකිනවා ඒ තත්ත්වය. ඒ රටවල කොච්චර ලේසියෙන් වැඩක් කර ගන්න පුළුවන්ද කියලා අපි දකිනවා. අපේ රටේ කාර්යාලයකට ගියාම අපි දකිනවා, කොච්චර පරක්කු වෙනවාද කියලා. සමහර වෙලාවට එක වැඩක් කර ගන්න දහ සැරේ, පහළොස් සැරේ, විසි සැරේ ආව මිනිස්සු ඉන්නවා; සමහර documents නැති වෙනවා. ප්‍රශ්න ගොඩක් එක්ක මේ කටයුතු වෙන්නේ. ඒ නිසා මේ කටයුතු ඩිජිටල්කරණය කරන්න ගරු නාමල් රාජපක්ෂ තරුණ අමාත්‍යතුමා ඉතා ඉක්මනින් පෙළඹීම පිළිබඳ අපි එතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ රජයේ කාර්යාලයකට ගියාමත්, ග්‍රාම නිලධාරි කාර්යාලයකට ගියාමත්, වෙනත් නිලධාරියෙකුගේ කාර්යාලයකට ගියාමත් -licence එකක් ගන්න ගියත්, මොකක් හරි දෙයක් කරගන්න ගියොත්- අපේ රට ගොඩක් පිටුපසින් ඉන්නේ කියන එක අපි දකිනවා. දවස් ගණන් රස්තියාදු වෙලා ඒ කටයුතු කර ගන්න බැරි අවස්ථා අපි දකිනවා; ඒ තොරතුරු නැතිකම දකිනවා. ඒක නිසා මේක ඉතා වැදගත් යෝජනාවක්. Typewritersවලින් වැඩ කරන හැටි අපි පොඩි කාලයේ දැක්කා. පසුව ටිකෙන් ටික ටිකෙන් ටික අපි පරිගණකවලට ආවා. නමුත් දැන් handphone එක ඇවිල්ලා අපේ දරුවෝ අපට වඩා ගොඩක් ඉස්සරහින් ඉන්නවා. අපට වඩා ගොඩක් ඉස්සරහින් තමයි අපේ දරුවෝ ඉන්නේ. අපි එතැනට යන්න ඕනෑ. මේ ලෝකය ගමන් කරන තැනට අපි යා යුතුයි. ඒක නිසා තමයි මේ තරුණ අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා මේ වැඩේ කරන්න මීට මාස කිහිපයකට කලින් ඉඳන්ම, අපේ රජය පත් වුණ දවසේ ඉඳන්ම උත්සාහ කළේ. එතුමා ඒකට අවශ්‍ය කටයුතු සූදානම් කළා. ඒක නිසා තමයි මේ පනත් කෙටුම්පත හදන්න කමිටුවක් පත් කළේ. ඒ සඳහා ඒ පාර්ශ්වකරුවන්ගෙන් අදහස් ලබා ගත්තා. ඒ නිසා මේ ගැන දන්නේ නැහැ කියලා කියන්න බැහැ. සාකච්ඡා වට 7ක් පැවැත්වුවා. බැංකු ක්ෂේත්‍රයේ නිලධාරින්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරින් සහ සෞඛ්‍ය දත්ත විශ්ලේෂකයන් සමඟ කථා කළා. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ නියෝජිතයන් සමඟ කථා කළා. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ඇතුළු ක්ෂේත්‍ර ගණනාවකගෙන් තොරතුරු විමසලා, සාකච්ඡා කරලා ගත්ත තීරණ අනුව තමයි මේ පනත් කෙටුම්පත සැකසෙන්නේ.

ඊට අමතරව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ඔම්බුඩ්ස්මන් සහ හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු කේ.ජී. විත්‍රසිරි මැතිතුමා ප්‍රධානත්වය දරන ස්වාධීන විශ්ලේෂණ මණ්ඩලයක් විසින් මේ පනත් කෙටුම්පත ගැන විමසා බැලුවා. ඉතින්, මේක ඉතා වැදගත්. දත්ත ආරක්ෂණය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජනාධිපති විශේෂඥ කෘත්‍යාධිකාරී කමිටුවක් 2021 ජනවාරි මාසයේදී පත් කළා. ඒක නිසා කාටවත් කියන්න බැහැ, "අපි මේ ගැන දන්නේ නැහැ. අපි දැක්කේ නැහැ. අපිට අදහස් එකතු කරන්න බැරි වුණා" කියලා. ඒ කථා කියන්න බැහැ. මේ පනත් කෙටුම්පත ඉතා වැදගත් දෙයක්. අපේ රට ඉස්සරහට යන්න ඕනෑ නම්, මේ ඩිජිටල්කරණය කරන්න ඕනෑ. මේක කරන්න පටන් ගත්ත එක ගැන හැමෝම එකතු වෙලා ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මීට පෙර පනත් සංශෝධනය වෙලා නැද්ද මේ රටේ? මේ රටේ ඕනෑ තරම් පනත් සංශෝධනය වෙලා තිබෙනවා. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසිවරක් සංශෝධනය වෙලා තිබෙනවා. අපි මොකක් හරි start එකක් ගන්න ඕනෑ. කවුරුහරි මේ කටයුතු පටන් ගන්න ඕනෑ. ඒ පටන් ගැනීම තමයි මේ කරන්නේ. පටන්ගෙන ඉස්සරහට යනකොට ගැටලු එද්දී අන්න ඒවා ගැන සාකච්ඡා කරලා, ඕනෑ වෙලාවක ඒ සංශෝධන කරන්න පුළුවන්. සංශෝධන කරන්න

පුළුවන් ඕනෑ වෙලාවක. හැබැයි අපි දකින්නේ නැහැ එහෙම තත්ත්වයක්. මොකක් හරි ඉදිරිපත් කරනකොට ඒකට විරුද්ධත්වය පළ කරන එක, ඒකේ තිබෙන අඩුපාඩු ගැන කථා කර කර ඉන්න එක පමණයි අපි දකින්නේ. ඒ වෙනුවට හොඳ යෝජනා කරලා, හොඳ දේවල් මේවාට එකතු කරන්න. මම විපක්ෂයෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මේවාට හොඳ දේවල් එකතු කරන්න කියලා. සංශෝධනයක් අවශ්‍ය නම්, ඒකත් කරන්න පුළුවන්. ඒකටත් කමක් නැහැ. ඒ ඔක්කොම එකතු කරලා, තව යෝජනා කරලා සංශෝධන ගෙනෙන්න. ඒත් කමක් නැහැ. අපි මේ පටන් ගන්නයි යන්නේ. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා අපි පටන් ගන්නයි යන්නේ. ඒක ඉතා වැදගත්.

විශේෂයෙන්ම ඩිජිටල්කරණයත් එක්ක අපේ වියදම අඩු වෙනවා වාගේම, තව කොච්චර දේවල් පහසු වෙනවාද? අපට දැන් කොච්චර පහසුද බලන්න. අපි දැන් බැංකුවට යන්නේ නැතුව online තමයි මුදල් transfer කරන්නේ. අපි දැන් බැංකුවලට යන්නේ නැහැ. ඒ නිසා දැන් අපේ රස්තියාදුව නැතිවෙලා. දැන් බොහෝ දෙනෙක් ඒකට පුරුදුවෙලා. අපි මේක තව තවත් ප්‍රචලිත කරන්න ඕනෑ. අපි දැන් හැම අවස්ථාවකම මුදල් transfer කරන්නේ online විධියටයි. එහෙම නැත්නම් අපි බිල්පත් ගෙවන්නේ online. කොවිඩ්-19 වසංගතයත් එක්ක online වැඩ කරන එකේ තිබෙන වාසිය මේ සැරේ අපට හොඳින්ම තේරුණා. අපේ දරුවෝ අවුරුදු දෙකක් පාසල් ගියේ නැහැ. හැබැයි, දරුවෝ ඉගෙන ගත්තා. Online තමයි ඔවුන් ඉගෙන ගත්තේ. ඒකයි මම කිව්වේ, දැන් ගොඩක් ඉස්සරහින් දරුවෝ ඉන්නේ. එහෙම නම් අපි එතැනට යා යුතුයි. ඒවාට අවශ්‍ය නීතිමය පසුබිම සකස් කරන්න ඕනෑ. ඒ හරහා වෙනත් වැඩත් කරනවා. ප්‍රශ්න තිබෙනවා. නමුත්, ඒ ගැටලු විසඳාගෙන අපි ඉස්සරහට යන්න ඕනෑ. ඒක තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. නියාමනයක් කරන්න ඕනෑ. එම නියාමනය කිරීම සඳහා තමයි මේ නීති රීති අවශ්‍ය වෙන්නේ.

අපි Facebook එකට ගියාම නොයෙකුත් දේවල් දකිනවා. අපට හිතාගන්න බැරි දේවල් Facebook එකේ දකිනවා. අපි කවදාවත් අහලා නැති දේවල් දකිනවා. සම්පූර්ණ බොරු චෝදනා, අසත්‍ය දේවල් විශාල ප්‍රමාණයක් දකිනවා. හැබැයි, නිසි නියාමනයක් නැති නිසා අපට ඒ සඳහා action ගන්න බැරිවෙලා තිබෙනවා. මේක තමයි අවශ්‍යතාව. අපි ඒවා නියාමනය කරලා අපේ රටට අවශ්‍ය විධියට, රටට ගැළපෙන විධියට ඒ සියල්ලම සකස් කළ යුතුයි. ඒකට තමයි මේ සූදානම් වෙන්නේ.

විශේෂයෙන්ම කොවිඩ්-19 වසංගතයෙන් බේරෙන්න අපි අපේ ජනතාව එන්නත්කරණය කළා. අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත් වීම නිසා දැන් මේ මුළු රටම ආරක්ෂා සහිතයි. දැන් අපි එන්නත්කරණයත් එක්ක ආරක්ෂා සහිතව ඉන්නවා. හැබැයි, විදේශ රටවලට යනකොට අපට ප්‍රශ්නයක් එනවා. ඒ ප්‍රශ්නය තමයි, ඔවුන් අපට කියනවා, කොවිඩ් මර්දනය සඳහා වන එන්නත ලබාගෙන තිබෙනවාද කියලා ඔවුන්ව දැනුවත් කරන්න කියලා. එහෙම නැත්නම් ඒ සඳහා වන වාර්තාවක් ලබා දෙන්න කියලා කියනවා. එතකොට internet එකට ගිහිල්ලා අපේ ID number එකයි, නමයි ගැහුවාම එන්නත්කරණය කරලා තිබෙනවා කියලා අපට ඒ වාර්තාව එනවා. අපි කොහොමද ඒක පිට රටකට ගිහිල්ලා කියන්නේ? අපි පිට රටකට යනකොට කොහොමද කියන්නේ, "මම එන්නත් තුනම ගහලා තිබෙනවා", "මම එන්නත් දෙකක් ගහලා තිබෙනවා" කියලා. අන්න ඒ විස්තරත් ඒ විධියට internet එකට ඇවිල්ලා තිබෙන නිසා දැන් ඒ පහසුකමත් සැලසිලා තිබෙනවා. මේකෙන් අපි හොඳ දෙයක් ඉගෙන ගත්තා.

මම විශේෂයෙන් මේ කාරණය මතක් කරන්න ඕනෑ. දැන් මේ රටේ software developersලා -මෘදුකාංග ශිල්පීන්- විශාල සංඛ්‍යාවක් ඉන්නවා. අලුත් මෘදුකාංග හදන මෘදුකාංග ශිල්පීන් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. ඒක නිසා ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමා Technoparks පටන් ගත්තා. දැන් දිස්ත්‍රික්ක පහක Technoparks 5ක් පටන් අරගෙන තිබෙනවා. මේක ඉතාම වැදගත් දෙයක්. බදුල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් මම බදුල්ල දිස්ත්‍රික්කය තුළ software developersලා විශාල පිරිසක් දකිනවා. දැන් මේ software developersලා රටට විශාල වශයෙන් විදේශ විනිමය ගේනවා. Dollars විශාල ප්‍රමාණයක් ගේනවා. එය අපට පෙනෙන්නේ නැති කර්මාන්තයක් බවට පත්වෙලා තිබෙනවා. ඔවුන් විශාල මුදල් ප්‍රමාණයක් ගේනවා; අපට හිතාගන්න බැරි තරම් විදේශ විනිමය ප්‍රමාණයක් රටට ගේනවා.

මම දන්න software developer කෙනෙක් බණ්ඩාරවෙල ඉන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔහු තමයි Toyota Company එකේ වාහනවල dashboard එකේ digital screen එක හදලා තිබෙන්නේ. ඔහු බණ්ඩාරවෙල කෙනෙක්. අපි දන්නේත් නැහැ, ඒ අය ලෝකයේ දේවල් වෙළාගෙන; අපේ දරුවෝ ලෝකයේ දේවල් වෙළාගෙන. ඒ අය රටින් එළියට ගිහිල්ලා. හැබැයි, නියාමනය කරන්නේ නැතුව, හරියට හදා ගන්නේ නැතුව අපි කොහොමද මේක කරන්නේ? ඔවුන්ට අපි අත්වැලක් සපයන්න ඕනෑ. ඔවුන් තනිවම සොයාගෙන ගිහිල්ලා තමයි software develop කරන්නේ. ඔවුන් තනිවම තමයි software වැඩියෙන් develop කරන්නේ. ඒ ගොල්ලෝ games හදනවා. ඒ ගොල්ලෝ කරපු තව ගොඩක් දේවල් තිබෙනවා. ඒක නිසා තමයි දැන් techno parks වාගේ තැන් හදන්නේ. Colomboවල TRACE Expert City කියලා තැනක් තිබෙනවා. ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමාත් එක්ක එකතු වෙලා ඒකේ branch එකක් - TRACE Uva Chapter එක - පටන් ගන්න අපි සූදානම් කරනවා. මේ කණ්ඩායමේ හැම කෙනෙක්ම ගෙවල්වලට වෙලා, එහෙම නැත්නම් කොහේ හෝ තැනකට වෙලා තමයි මේ වැඩ කරන්නේ. ඒ අය සියලුදෙනාම එක තැනකට ගෙනැල්ලා මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න තමයි අපි දැන් බලාපොරොත්තු වෙන්නේ. එතකොට අපට මේ රටට විශාල වශයෙන් විදේශ විනිමය ගේන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ තවත් බලාපොරොත්තුවක් තිබෙනවා. ඇල්ල ප්‍රදේශයේ සංචාරකයන් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. දැන් ලංකාවට සංචාරකයන් විශාල සංඛ්‍යාවක් ඇවිල්ලා ඉන්නවා. ඒ වාගේම එනවා. ඒ අයටත් එම අවස්ථාව ලබා දෙන්න අපට පුළුවන්. අපි Techno park වාගේ තැනක් establish කළොත්, ඔවුන්ට ඇවිල්ලා මෙහේ කාර්යයන් කර ගන්න අවස්ථාව දෙන්න පුළුවන්. මෙය ඉතාම වැදගත් කටයුත්තක්.

දැන් Ukraine - Russia ප්‍රශ්නය ඇවිල්ලා තිබෙනවා. ඒ රටවල බොහෝ දෙනෙක් දැන් ලංකාවේ ඉන්නවා. ඒ ගොල්ලන්ට කරගන්න දෙයක් නැහැ. ඒ ගොල්ලන්ගේ banksවල cards ඔක්කෝම block කරලා. දැන් ඒ අයට මුදල්වල ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි, ඒ ගොල්ලන්ට පුළුවන් අපේ Technopark වලට ඇවිල්ලා වැඩ කරන්න. ඒ ගොල්ලෝ හොඳ software developersලා. ඒ වාගේම පරිගණක විශේෂඥයන් විශාල සංඛ්‍යාවක් ඇවිල්ලා ඉන්නවා. ඒ ගොල්ලන්ට පුළුවන්, ඒ තැන්වලට ගිහිල්ලා වැඩ කරන්න. ඔවුන්ට මේ අවස්ථා ලබා දෙන්න ඕනෑ. ඒ ගොල්ලන් අපේ රටට ඩොලර් ගෙනෙනවා. ඔන්න, අපේ රටට විදේශ විනිමය ලැබෙන ක්‍රම. ඒ නිසා අපි තනිවම, පුළුවන් විධියට කරගෙන ගිය සමහර දේවල් එක තැනකට අරගෙන, රජයේ නියාමනයක් එක්ක ඒවා ක්‍රියාත්මක කළ යුතුයි. ඒකට තමයි අපි මේ සූදානම් වන්නේ. ඒ කටයුත්ත තමයි ගරු නාමල් රාජපක්ෂ ඇමතිතුමා මේ ක්‍රියාත්මක කරන්න සූදානම් වන්නේ. අපි අද ඉතා වැදගත් අවස්ථාවකට ඇවිල්ලා ඉන්නවා. අපි හැමෝටම පුළුවන්, මේ පනත් කෙටුම්පත සම්මත කිරීම සඳහා උදව් කරන්න. මේක තමයි අපි බලාපොරොත්තු වන්නේ. හැමෝම ඒ සඳහා උදව් කළ යුතුයි. හැබැයි, මේ වාගේ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළාම හැමෝම අපිට උදව් කරයි, කථා කරයි කියා මම බලාපොරොත්තු වනවා. අඩුපාඩු තිබෙනවා

[ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා]

නම් ඒ අඩුපාඩු පෙන්වා දුන්නාට කමක් නැහැ. ගරු මන්ත්‍රීතුමන්ලා මේ පනත් කෙටුම්පත දිහා හොඳ ආකාරයෙන් බලලා කථා කරයි කියා මම විශ්වාස කරනවා. ඒ නිසා අද ඉතා වැදගත් දවසක්. හැබැයි, විපක්ෂය අද වෙනත් දේවල් පිළිබඳව කථා කරන්න පටන් ගත්තා. ඒක මම හිතන විධියට එච්චර හොඳ, සුබදායී දෙයක් නොවෙයි. අඩුපාඩු තිබෙනවා නම් ඒ අඩුපාඩු ගැන කථා කරන්න පුළුවන්. හැබැයි, නොයෙක් මත ප්‍රචාරය කරලා මේ පනත් කෙටුම්පත පහතට ඇද දමන්න විපක්ෂය උත්සාහ කරනවා. මුළු රටටම වැරදි මත ප්‍රචාරය කරන්න තමයි මෙතුමන්ලා උත්සාහ කරන්නේ. නමුත් එලෙස කටයුතු කරන්න එපා කියලා මම එතුමන්ලාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම හැඳුනුම්පතක්, passport එකක් ගන්න ගියාම ජනතාවට ඒ ආයතනවල විශාල වෙලාවක් ඉන්න සිදු වන බව අපි දකිනවා. දැන් ඒ තදබදය ටිකක් අඩුවෙලා තිබෙනවා. ඩිජිටල්කරණය එක්ක දැන් ඒ තදබදය ටිකක් අඩුවෙලා තිබෙනවා. ඒක හොඳ නැද්ද? මේවා කරන්න ඕනෑ නැද්ද? අපේ කාර්යාල එහෙම වෙන්න ඕනෑ නැද්ද? අපේ කාර්යාල එහෙම විය යුතුයි. මම නම් කියන්නේ අපට ලබා දෙන මේ පොත් පත්වල තිබෙන තොරතුරු වුණත් අපේ tab එකකට හෝ දාලා දෙනවා නම් ඉතා වැදගත් වනවාය කියායි. මගේ ගෙදර කාමරයෙන් භාගයක විතර මේ වාගේ පොත් පත් තිබෙනවා. මේ වාර්තා අපිට එහෙම refer කරන්න අමාරුයි. හැබැයි, වාර්ෂික කාර්ය සාධන වාර්තා -Annual Performance Report- internet භාවිත කරලා, tab එකෙන් හෝ පරිගණකයෙන් බලන්න පුළුවන් විධියට හදලා තිබුණා නම් අපට අවශ්‍ය වෙලාවට ඒ තොරතුරු දැනගන්න පුළුවන් වනවා. මේ කටයුත්ත කරන්න කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේවා තමයි අපට අවශ්‍ය වන දේවල්. මේ වාගේ දේවල් කරන්න අවශ්‍යයි. අපි පොත් මිටි අරගෙන යනවාට වඩා එලෙස කිරීම ඉතා වැදගත් වනවා. හැම දාම අපි පොත් මිටියක් ගෙදර අරගෙන යනවා.

ඊළඟට, ආකෘති පත්‍ර පිරවීමත් අපි හැම දාම දකින දෙයක්. අපි ඉස්කෝලේ යන්න පටන් ගත් දිනයේ පටන් ආකෘති පත්‍ර පුරවනවා. අපි කාර්යාලයකට ආවාම ආකෘති පත්‍ර පුරවනවා. University එකකට යනකොට ආකෘති පත්‍ර පුරවනවා. හැබැයි, ගොඩක් වෙලාවට අපි අතින්ම තමයි ආකෘති පත්‍ර පුරවන්නේ. මේ සම්ප්‍රදායය වෙනස් විය යුතුයි. මේ තොරතුරු auto එන විධියට අපිට system එකක් හදා ගන්න පුළුවන්. විදේශ රටවල වීසා එකක් apply කළාම ඒක fill වෙන්නේ කොහොමද කියන එක අපි දකිනවා. Passport එක scan කරලා දුන්නාට පස්සේ ඒවා auto fill වන විධියක් විදේශ රටවල තිබෙනවා. හැබැයි, අපේ රටේ තවම එහෙම දේවල් නැහැ. අපිත් ඒ තත්ත්වයට යන්න ඕනෑ. අපි අනිවාර්යයෙන්ම එතැනට යන්න ඕනෑ. දරුවන් තමයි අපේ රටේ අනාගතය. ඔවුන් අපට වඩා ගොඩක් ඉදිරියෙන් ඉන්නවා. "තාත්තේ, මොකක්ද මේ කරන්නේ? අපිට මේ විධියට කරන්න බැරි ඇයි?" කියලා චූටි දරුවන් අපෙන් අහනවා. එතැනට අපි යා යුතුයි. ඒ නිසා තමයි ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ධුරයට පත් කරලා තිබෙන්නේ. එතුමා මේ රට වෙනුවෙන් ඉතා වැදගත් තීන්දු තීරණ ගන්න දවසක් තමයි අද දවස. වැදගත්ම තීන්දුවක් තමයි එතුමා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම හරහා අද සිදු කර තිබෙන්නේ. රට ඉස්සරහට ගෙන යන්න, රටේ සංවර්ධනය මනින්න අපි මේ දේ කළ යුතුමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ සඳහා නියාමනයක් තිබෙන්න ඕනෑ. ඒ කටයුත්ත කරන්න කියලා මම ගරු ඇමතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. පෞද්ගලික දත්ත ආරක්ෂණ අධිකාරියක් අනාගතයේදී පිහිටුවනවා. මේවාටත් සියලු දෙනාම එකතුවෙලා උදව් කරන්න. අඩුපාඩු තිබෙනවා නම් පෙන්වා දෙන්න. මොනවා හෝ යෝජනාවක්, චෝදනාවක් තිබෙනවා නම් අනාගතයේදී ඒ සඳහා සංශෝධන ඉදිරිපත් කරන්න පුළුවන් බවත් ඔබතුමන්ලාට මම නැවත වතාවක් මතක් කරනවා. මේ පනත් කෙටුම්පත ඕනෑ නම් සංශෝධනය කරන්න පුළුවන්. මේ කටයුත්තට සහයෝගය දෙන්න කියලා ඔබ සියලුදෙනාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමා යෝජනා කරන ආකාරයට "Paperless Parliament" කියන project එක දැනටමත් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. එම යෝජනාව ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කර තිබෙනවා. පරිසර ඇමතිතුමාත්, තාක්ෂණ ඇමතිතුමාත් එකතු වී සිදු කරන එම යෝජනාව මේ වසර අවසානයේදී ක්‍රියාත්මක කිරීමට නියමිත බව මම මේ ගරු සභාවට දැනුම් දීමට කැමැතියි.

அடுத்ததாக, கௌரவ எம்.ஏ. சுமந்திரன் அவர்கள்! உங்களுக்கு பத்து நிமிடங்கள் உண்டு.

[3.52 p.m.]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Thank you, Hon. Presiding Member for the opportunity to speak on this important Bill before Parliament today.

I followed the Debate from morning and constantly, from the Opposition, speakers have been asking for certain changes, certain amendments. It is true that they also asked for time to consider certain provisions of this Bill, so that some changes could be made, enabling them to support the adoption of this Bill today.

There are some concerns only with regard to some of the provisions. This is a salutary move. The whole idea is most welcome. But I find on the table that the Government has placed the proposed Committee Stage amendments today and there are many amendments that have been proposed running into several pages. The amendments in Sinhala goes up to 28 pages; Tamil goes up to 42 pages and the English goes up to 23 pages and so on - which indicates that even at the last minute, the Government itself is moving amendments.

Those are not just typos or things like that, but substantial amendments are to be moved and I might mention one which was a concern and the Government is actually removing that. In Clause 28, we found a very strange provision and I was trying to recollect if there was any other statute that had this provision. Originally in the Bill that is before us Clause 28 (1) of the Bill states, I quote:

> "The Minister may, by Order published in the Gazette, designate a public corporation, statutory body or any other institution established by or under any written law and controlled by the government-"

It says, "... and controlled by the government... ". It is explicitly stating, " controlled by the government". That seemed like a very strange provision, but I find that in the

proposed Committee Stage amendments that have been given to us, that phrase has been left out and that is a welcome thing. So, this is one of the things that I was concerned and I was going to raise, and I find that that is to be corrected during the Committee Stage.

If that is what is happening - that is a good thing- why can the other concerns that have been raised also not be taken into account and dealt with, without speaker after speaker from the Government Benches saying, “This has been very long in coming. You had ample time, you did not go to the Supreme Court challenging this. You did not come for this committee, that committee or other committee and why are you coming here and making these suggestions”? If the Government itself has looked at it in the eleventh hour and is proposing Committee Stage amendments dealing with some of the objections that have been raised, why is it not possible to constructively engage with the concerns that are raised and make those amendments? That is all that we ask.

This House is supposed to be a deliberative assembly. It is not just trading insult at each other. Sadly, that is what it has been reduced to most of the time. But when issues are raised, the Minister concerned will be there and will take it into account. If you look at how this was conducted, years past that is what happened. The Hon. Minister immediately on his feet says, ‘Yes, that is a legitimate concern. We will move an amendment on that at the Committee Stage.” But, here you are stuck in a groove. All that you are able to say is, “Why did you not tell us early? Why did you not do this and why did you not go and challenge it.” That is not the spirit with which a debate, a discussion or a deliberation should happen in this House.

Having said that, Sir, may I raise just three issues? The independence of this Authority is a serious concern. Yes, it is true that you are removing those words, “ controlled by the government ”. It is there now in your proposed Committee Stage amendments and I thank the Hon. Minister for doing that. But yet, the substance is that it is going to be controlled by the Government. You are just taking the words out but in effect it is going to be controlled by the Government. Therefore, I would urge that while you make that change, make that change a substantive actual change - that it is not controlled by the Government. Do not only remove the words, change the nature of the Authority and make it independent. That is one concern.

The other is with regard to Right to Information. The RTI Law is now hailed as one of the important achievements of this Parliament. We have got that. We have even amended the Constitution to include that as a fundamental right. Then, to make certain laws, particularly the Right to Information Law -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
These are the last two minutes of your time, Hon. Member.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
How much more time?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Two more minutes.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Thank you.

To make that also subject to the provisions of this Act seriously undermine the gain that we had by adopting the Right to Information Law and indeed even making it a fundamental right. So, I would urge the Government to consider exempting that Law from the operation of this.

The other matter is, of course, - I am sure the Government knows; the concerned Minister knows - the journalistic purposes. Several journalists’ associations have urged the Government to address that issue. They want journalistic purposes also included in data processing and it is not too late. We have had serious amendments done in the Committee Stage at the eleventh hour. I remember, in the Debate on the Nineteenth Amendment to the Constitution, the Debate was put off for half an hour and serious amendments were made. It was adopted. Even now, it is possible for you to make these three important changes to this Bill so that we will all together congratulate the Government on a well achieved feat.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you, Hon. Member. Concluding remarks on the Second Reading of the Data Protection Bill to be made by the Hon. Minister, M.U.M. Ali Sabry. You have 22 minutes.

[4.01 p.m.]

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி - நீதி அமைச்சர்)
(The Hon. M.U.M. Ali Sabry - Minister of Justice)
Hon. Presiding Member. First of all, let me thank all of you who have come up with constructive views on this important Bill. But we must first say that we have not adopted a confrontational attitude in this. The fact that we are moving a number of Committee Stage Amendments in regard to the establishment of the Data Protection Authority itself, while giving it specific powers, restrictions as well as qualifications, shows that we are willing to listen. But, the Hon. M.A. Sumanthirran and all of us know that there is nothing called "a perfect law”. If you wait for that “perfect law”, just like you waited during the last Parliament for the PTA and the counter-terrorism law, it will never come. Therefore, let us take this and move on.

[ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

Let me also take you very carefully through these concerns. Most of these concerns that we are expressing today are not really founded. With due respect, I know the Hon. Sumanthiran did not articulate in that precision because I presume that he has read it and therefore there is no such a huge concern about journalistic rights because there is nothing called "journalistic rights." In this country, journalists' rights and the people's rights - freedom of expression -are one and the same. The journalists do not have a special right or anything beyond that. They have certain amount of privileges.

Let me quote from the famous judgment of Victor Ivon v. Sarath N. Silva, Attorney-General and Another. I states,

1. මෙහි උපව්‍යාපෘතියක් වන වී ඔය ව්‍යාපෘතිය ඇතුළු අනෙකුත් අදාළ උපව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් සංවාදයක් මෙම ව්‍යාපෘතියෙන් බලපෑමකට ලක්වන ජනතාව සමඟ සිදු කර තිබේද? එය තහවුරු කළ හැකිද? ඊට අදාළ ඉඩම් අත්පත් කර ගැනීම සැලසුම් කර ඇත්තේ කෙසේද?
2. මෙම ව්‍යාපෘතිය යටතේ යෝජනා කර තිබෙන තවත් එක් උපව්‍යාපෘතියක් වන ඉහළ දැරණියගල ජලාශය නිසා දැරණියගල නගරයටත්, ඒ අවට වෙසෙන ජනතාවටත් එල්ල වන බලපෑම කෙසේද? ඒ සම්බන්ධයෙන් වන ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේද?

කැලණි ගඟ ද්‍රෝණිය වටේ ජීවත් වන සාමාන්‍ය ජනතාවට ගංවතුරින් එන විශාල පීඩනයට මේකෙන් සහනයක් ලබා ගන්නට අවස්ථාව ලැබේවි කියන ඉලක්කයෙන් තමයි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න සැලසුම් කරලා තිබෙන්නේ. හැබැයි, මේ ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට, මා නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කය තුළ බහුකාර්ය ජලාශ දෙකක් සෑදීමට නියමිතව තිබෙනවා. මේ බහුකාර්ය ජලාශ දෙක ඉදිකිරීම හරහා කොළඹ ආසන්න කැලණි ගඟ ද්‍රෝණිය පරිසරය තුළ ජීවත් වන අයට ආරක්ෂණය ලබාදෙන අතර, මෙයින් මා නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට බරපතළ බලපෑමක් සිදුවන බව අපට පෙනී යනවා. හදන්න යන ජලාශ දෙක, ඉහළ දැරණියගල ජලාශය ලෙස දැරණියගල ප්‍රදේශය මුල් කරගෙනත්, වී ඔය ජලාශය යටියන්තොට ප්‍රදේශය මුල් කරගෙනත් ඉදිකරන්න බලාපොරොත්තු වෙනවා. මේ ඉදිකරන ජලාශ දෙක හරහා යටියන්තොට සහ දැරණියගල ප්‍රදේශවල වෙසෙන ජනයාට ඇතිවන බලපෑම, පාඩුව, විනාශය තක්සේරු කර ඇද්ද? ඒ ගැන ඒ අය එක්ක සාකච්ඡාවක්, සංවාදයක් සිදු කර තිබෙනවාද? 2018-

2019 සමයේ යහ පාලන ආණ්ඩුව තිබෙනකොට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරු -අද ඇමතිවරු හැටියට සිටින අය- මේ ව්‍යාපෘතිය නතර කරන්න කියලා, මරාගෙන මැරෙනවා කියන තැනට ඇවිල්ලා පාරට බැහැලා උද්ඝෝෂණ කළා. මේකට විරුද්ධව ලොකු විරෝධයක් කළා. එතකොට මේ සම්බන්ධ ගිවිසුම් අත්සන් කරලාවත් තිබුණේ නැහැ. නමුත්, අද වන විට නිත්‍යානුකූලව ගිවිසුම් අත්සන් කරලා තිබෙන ඒ ව්‍යාපෘතිය ගැන කිසිම සද්දයක් නැහැ. ඒ වෙලාවේ හාමුදුරුවරු පවා පාරට බැස්සුවා. 2019දී මේ ගිවිසුම අත්සන් කළේ නැහැ. නමුත්, දැන් අත්සන් කරලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, දැන් මේ නිසා කෑගල්ල දිස්ත්‍රික්කයේ ඒ ප්‍රදේශ දෙකට සිදුවන හානිය පිළිබඳව ඔබතුමා දන්නවාද? මේ ප්‍රශ්නය ගිය වසරේදීත් ගරු සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා සහ මා විසින් ඇසුවා. හැබැයි, අපට එයට සුදුසු උත්තරයක් ලැබුණේ නැහැ. මෙයින් සිදුවන හානිය ගත්තාම, දැරණියගල ප්‍රදේශයේ බලපෑමට ලක්වන ස්ථාන වශයෙන් අංහෙට්ටිගම විදුහල නැති වෙනවා, නක්කාවිට විදුහල නැති වෙනවා, ගංගාරාම විහාරස්ථානය නැති වෙනවා, ලස්සේගම ජිනේද්‍රාරාම විහාරය නැති වෙනවා. මේවා ඔක්කොම යටවෙනවා. අංහෙට්ටිගම උපතැපැල් කාර්යාලය යටවෙනවා. නාලන්ද පිරිවෙන, නක්කාවිට යටවෙනවා. දැරණියගල ප්‍රදේශයේ බලපෑමට ලක්වන ගම්මාන ලෙස ගත්තාම, ලස්සේගම, නක්කාවිට, අංහෙට්ටිගම, යටිලේල්වල, පනාකුර, බරලන්තොට යන ප්‍රදේශ යටවන බව ප්‍රදේශවාසීන් මේ වාර්තාව තුළින් පෙන්වා දෙනවා. භූමියෙන් අක්කර 1,420ක් මේකට යටත් වෙනවා. දැරණියගල ප්‍රදේශයේ නිවාස 367ක්, පුද්ගලයන් 1,835ක්, ව්‍යාපාරික ස්ථාන 80ක් ජලයට යටවනු ඇති බව මේ වාර්තාවෙන් සනාථ වෙනවා. මේ අය එක්ක තවම කථා කරලා නැහැ. ඒ නිසා පැරණි ඉතිහාසයක් ඇති දැරණියගල නගරයට මේ ව්‍යාපෘතියෙන් ලොකු විනාශයක් ඇති වෙයි. 50,000කට ආසන්න අවට පදිංචිකරුවන්ට හානි වෙනවා. පාරවල් යට වෙනවා. සමාජ ගැටලු ඇති වෙනවා.

අනික් අතට, යටියන්තොට ප්‍රදේශයේ වී ඔය ව්‍යාපෘතිය 2020-2021 කාල සීමාව තුළ පටන් ගන්නවා කියලා 2001 දෙසැම්බර් මාසයේ ප්‍රකාශ කර තිබුණා. 2020-2022 කාල සීමාව තුළ ජනතාව අයින් කරන බවත් එහි ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයකු විසින් දැනුවත් කර තිබුණා. හැබැයි, දෙසැම්බර් මාසය වනකොට සාකච්ඡා කළාට, වන්දි ගෙවීම් ගැන කථා කරනවා කිව්වාට, විකල්ප ඉඩම් ගැන කථා කරනවා කිව්වාට අද වනතෙක් ඒ සම්බන්ධව කිසිම පණිවුඩයක් ඒ ප්‍රදේශවාසීන්ට දීලා නැහැ. ප්‍රාදේශීය ලේකම්තුමිය, දිසාපතිතුමා, ප්‍රදේශයේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට කථා කළත් ඒ ගොල්ලන් මේ ගැන දන්නේත් නැහැ. මේ රටේ ඒ ප්‍රදේශවල ජීවත් වන ජනතාව අසරණයි. වී ඔය ප්‍රදේශයේ ගෙවල් 205ක් අයින් කරන්න යනවා කියනවා. හෙක්ටෙයාර 165ක වගා ඉඩම් අයින් වන බවත්, කුඹුරු ඉඩම්, තේ ඉඩම් අයින් වන බවත් සඳහන් කරලා තිබෙනවා. මොකක්ද වෙන්නේ කියලා දන්නේ නැති නිසා ඒ ගොල්ලන්ට මේ අවුරුද්ද තුළ ඒවා වගා කරන්න බැහැ. ඔවුන් අස්ථාවරයි. හැබැයි, කවුරුත් මේ ගැන කථා කරන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ඒ නිසා මේ ගැන අපට පැහැදිලි පිළිතුරක් ලබාදෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු චමල් රාජපක්ෂ මහතා (වාරිමාර්ග අමාත්‍ය, ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ - நீர்ப்பாசன அமைச்சரும் பாதுகாப்பு இராஜாங்க அமைச்சரும் மற்றும் உள்நாட்ட லுவல்கள் இராஜாங்க அமைச்சரும்)
(The Hon. Chamal Rajapaksa - Minister of Irrigation, State Minister of Defence and State Minister of Home Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නයට රාජ්‍ය ඇමතිතුමා පිළිතුරු ලබා දෙනවා ඇති.

**ගරු අනුරාධ ජයරත්න මහතා (ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுராத ஜயரத்ன - கிராமிய வயல் நிலங்கள் மற்றும் அண்டியுள்ள குளங்கள், நீர்த்தேக்கங்கள் மற்றும் நீர்ப்பாசன அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Anuradha Jayaratne - State Minister of Tanks, Reservoirs and Irrigation Development Related to Rural Paddy Fields)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා විසින් අසන ලද සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

1. දේශගුණික බලපෑම අවම කිරීමේ බහු අදියර වැඩසටහනේ ප්‍රවේශ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ගිවිසුම ශ්‍රී ලංකා රජය සහ ලෝක බැංකුව අතර 2021 සැප්තැම්බර් මස 17 වන දින අත්සන් කරන ලදී.

   මෙම ව්‍යාපෘතිය අදියර තුනකින් සමන්විත වී ඇත. ව්‍යාපෘතියේ පළමු අදියර සඳහා වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 93කි. ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ වී ඔය ජලාශය සඳහා වන ඉංජිනේරු සැලසුම් සකස් කිරීමට නියමිතය. කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් වන වී ඔය ජලාශය ඉදිකිරීම මෙම ව්‍යාපෘතියේ දෙවැනි අදියර යටතේ සිදු කිරීමට නියමිතය. වී ඔය ජලාශය පිළිබඳව ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් මීට වසර දෙකකට ප්‍රථම CECB ආයතනය විසින් අවසන් කර ඇති අතර, දළ වශයෙන් පවුල් 204ක් පමණ එම ඉදිකිරීම් හේතුවෙන් බලපෑමට ලක් වන බව හඳුනා ගෙන ඇති අතර, ඔවුන් නැවත පදිංචි කරවීමට සිදු වේ. ශක්‍යතා අධ්‍යයනයෙන්ද ඒ සඳහා සුදුසු ඉඩම් හඳුනාගෙන ඇති අතර, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව මූලික සංවාදයක් ශක්‍යතා අධ්‍යයනය සකස් කරන අවධියේදී බලපෑමට ලක් වන ජනතාව සමඟ සිදු කර ඇත. ඉදිරියේදී තවදුරටත් ඔවුන් දැනුවත් කිරීමට තීරණය කර ඇත. නැවත පදිංචි කිරීමේ සැලසුම් සකස් කරන අවධියේදී මේ සම්බන්ධයෙන් බලපෑමට ලක් වන සෑම පවුලක් සමඟම වෙන් වෙන් වශයෙන් සාකච්ඡා කිරීමට හැකි වන පරිදි හා ඔවුන් සෑහීමකට පත් වන පරිදි නව ඉඩම් ලබා දීම හා වන්දි ලබා දීම පිළිබඳව එකඟතාව ලබා ගැනීමට හැකි වනු ඇත.

2. මෙම ව්‍යාපෘතිය යටතේ ඉහළ දැරණියගල ජලාශයක් ඉදිකිරීමට යෝජිත වී ඇති අතර, ඒ පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය මේ වන විට සිදු කර නැත. එවැන්නක් සිදු කරන අවස්ථාවේදී හෝ සිදුකොට ඒ පිළිබඳ වාර්තාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමි.

   මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා කියපු ආකාරයට දැරණියගල ජලාශය පිළිබඳව අනියත බියක් ජනතාව තුළ ඇති කිරීමට අවශ්‍යතාවක් නැහැ. ශක්‍යතා අධ්‍යයනය සිදු කරනකොට ඒ සියලු පාර්ශ්වවලට ඇවිල්ලා තමන්ගේ අදහස් ඉදිරිපත් කරන්න පුළුවන්; නැත්නම් විරෝධතාව පළ කරන්න පුළුවන්. නගරය යට වීම වාගේ ප්‍රශ්න තිබෙනවා නම්, ඒ පිළිබඳ සියලු කාරණා ඉදිරිපත් කරන්න පුළුවන්. ඒකට සුදුසු ශක්‍යතා අධ්‍යයනයකින් පසුව තමයි දැරණියගල ජලාශය ඉදිකිරීමේ කටයුතු සිදු වෙන්නේ. ඒ නිසා ඒ පිළිබඳව අනියත බියක් ඇති කර ගැනීමට අවශ්‍යතාවක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු තවරාජා කලෙයි අරසන් මහතා.

## කල්මුණේ - උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යෑම
## கல்முனை வடக்குப் பிரதேச செயலகத்தை தடையற்று இயக்குதல்
## MAINTAINING FUNCTIONS OF KALMUNAI NORTH DIVISIONAL SECRETARIAT WITHOUT IMPEDIMENT

[பி.ப. 5.37]

ගරු තවරාජා කලෙයි අරසන් මහතා
(மாண்புமிகு தவராஜா கலை அரசன்)
(The Hon. Thavaraja Kalai Arasan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் பின்வரும் ஒத்திவைப்புவேளைப் பிரேரணையை முன்மொழி கின்றேன்:

"1989ஆம் ஆண்டிலிருந்து இன்றுவரையான 33 வருடங்கள், அரச நிர்வாக ஒழுங்குவிதிகளின் அடிப் படையில், உள்நாட்டலுவல்கள் அமைச்சால் அங்கீகரிக் கப்பட்ட தனித்த ஓர் அலகாக அம்பாறை மாவட்டத்தின் கல்முனை வடக்குப் பிரதேச செயலகம் இயங்கி வருகிறது. எனினும், சில முஸ்லிம் அரசியல்வாதிகளின் தலையீட்டி னால் இப்பிரதேச செயலகத்தை உப பிரதேச செயலக மாகத் தரமிறக்குவதற்கான முனைப்புக்களும் அச் செயலகத்தின் இயங்குதிறனை முடக்கும் செயற்பாடுகளும் தொடர்ச்சியாக மேற்கொள்ளப்பட்டு வருகின்றன.

அம்பாறை மாவட்டத்தின் 29 கிராம அலுவலர் பிரிவுகளையும் முப்பத்தொன்பதாயிரத்துக்கும் அதிகமான மக்கள் தொகையையும் கொண்ட தனித்தியங்குவதற் கான நிலப்பரப்பையும் அங்கீகரிக்கப்பட்ட ஆளணித் தொகுதியையும் கொண்டுள்ள கல்முனை வடக்குப் பிரதேச செயலகம் 1993.07.28ஆம் திகதிய, 93/60/034(1) ஆம் இலக்க அமைச்சரவைத் தீர்மானத்தின் மூலம் அனைத்து நிர்வாக அதிகாரங்களையுமுடைய தனித்த பிரதேச செயலாளர் பிரிவாக அங்கீகரிக்கப்பட்டு முப்பது ஆண்டுகள் நிரம்புகின்ற நிலையில், இன்றளவும் அப்பிரதேச செயலகத்தைத் தனித்து இயக்க முடியாம லுள்ளமைக்கு அரசியல் தலையீடுகளே முழுமையான காரணமாக உள்ளது.

மட்டக்களப்பு மாவட்டத்தில் 8 கிராம அலுவலர் பிரிவுகளைச் சேர்ந்த முஸ்லிம் மக்களை உள்ளடக்கிய கோறளைப்பற்று மத்தி, கோறளைப்பற்று மேற்கு ஆகிய இரு பிரதேச செயலகங்களும், 12 கிராம அலுவலர் பிரிவுகளைச் சேர்ந்த முஸ்லிம் மக்களை உள்ளடக்கிய ஏறாவூர் நகர் பிரதேச செயலகமும், அம்பாறை மாவட்டத்தில் 12 கிராம அலுவலர் பிரிவுகளைச் சேர்ந்த முஸ்லிம் மக்களை உள்ளடக்கிய இறக்காமம் பிரதேச செயலகமும், 17 கிராம அலுவலர் பிரிவுகளைச் சேர்ந்த முஸ்லிம் மக்களை உள்ளடக்கிய சாய்ந்தமருது பிரதேச செயலகமும், வவுனியா மாவட்டத்தின் 20 கிராம அலுவலர் பிரிவுகளைச் சேர்ந்த சிங்கள மக்களை உள்ளடக்கிய வவுனியா தெற்குப் பிரதேச செயலகமும், முல்லைத்தீவு மாவட்டத்தில் 9 கிராம அலுவலர் பிரிவு களைச் சேர்ந்த சிங்கள மக்களை உள்ளடக்கிய வெலி ஓயா என்ற பெயரில் மணலாறு பிரதேச செயலகமும் உருவாக்கப்படவும் தனித்து இயங்கவும் அனுமதிக்க முடியுமெனில், புதிய பிரதேச செயலகமாக அன்றி ஏற்கனவே உருவாக்கப்பட்டு, அமைச்சரவையால் அங்கீகரிக்கப்பட்டு, பொதுநிர்வாக உள்நாட்டலுவல்கள் அமைச்சு, தேர்தல்கள் திணைக்களம், பதிவாளர் நாயகத் திணைக்களம், தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரவியல் திணைக்களம், ஆட்பதிவுத் திணைக்களம், காணி ஆணையாளர் நாயகத் திணைக்களம், ஓய்வூதியத் திணைக்களம், மோட்டார் போக்குவரத்துத் திணைக்களம், சமுர்த்தி அபிவிருத்தித் திணைக்களம் உள்ளிட்ட அதிகாரத்துவமுடைய அத்தனை அரச திணைக்களங் களாலும் தத்தமது நிர்வாக நடைமுறைகளின் பொருட்டு, தனித்த பிரதேச அலகாகக் கருதப்படும் கல்முனை வடக்குப் பிரதேச செயலகத்தை மட்டும் சுயாதீனமாக இயங்கவைப்பதில் என்ன தடையுள்ளது என்பதை நான் இவ்விடத்தில் கேட்க விரும்புகிறேன்.

இதனடிப்படையில், கல்முனை வடக்குப் பிரதேச செயலகத்தை எந்தவித அரசியல் தலையீடுகளுமற்ற வகையில், சுயாதீனத் தன்மையோடும் சகல நிர்வாக அதிகாரங்களோடும் முழுநிறைவான பிரதேச செயலக மாக இயங்குவதற்கு துரித நடவடிக்கை மேற்கொள்ளப் பட வேண்டும்"

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! கல்முனை வடக்குப் பிரதேச செயலகம் என்பது, நீண்ட காலமாக ஒரு சமூகத்தின் அடக்குமுறைக்குள் இருந்துவருகின்ற ஒரு பிரதேச செயலகமாகும். இதனால், அங்குள்ள அரச அதிகாரிகள் நிர்வாகத்தை உரிய முறையில் மேற்கொள்ளும் போது பல சிரமங்களுக்கு முகங்கொடுக்கின்றார்கள். குறிப்பாக, அந்தப் பிரதேசத்திலுள்ள அரச காணிகளைப் பாதுகாப்பதில் பாரிய சவால்களை எதிர்கொள்கின்றார்கள். அதேபோன்று, மயானங்களாக இருக்கின்ற இடங்களைக்கூட பாதுகாக்க முடியாத சூழல் இருக்கின்றது. முஸ்லிம் அரசியல் வாதிகள் திட்டமிட்டு அந்தப் பிரதேச செயலகத்தைச் சுயமாக இயங்கவிடாமல் தடுத்து நிறுத்துவதோடு, அந்தப் பிரதேசத்திலுள்ள அரச காணிகளை கபளீகரம் செய்கின்ற நடவடிக்கையிலும் தொடர்ச்சியாக ஈடுபட்டு வருகிறார்கள்.

தமிழர்கள் கல்முனையில் மாத்திரம் வாழ்ந்தவர்கள் அல்லர். 1983ஆம் ஆண்டுக்கு முற்பட்ட காலத்திலே சாய்ந்தமருதிலும் அவர்கள் வாழ்ந்திருக்கிறார்கள். அங்கிருந்த தமிழர்கள் விரட்டியடிக்கப்பட்டு, இன்று அது ஒரு முழுமையான முஸ்லிம் கிராமமாக மாற்றப்பட்டிருக்கிறது. அதேபோன்று, கல்முனைக் குடியிலும் தமிழர்கள் வாழ்ந்ததற்கான பதிவுகள் இருக்கின்றன. அங்கிருந்த தமிழர்கள் 1983ஆம் ஆண்டு விரட்டியடிக்கப்பட்டு, அதுவும் ஒரு முழுமையான முஸ்லிம் கிராமமாக மாற்றப் பட்டிருக்கிறது. அந்தச் சிந்தனையின் அடிப்படையில், இன்று கல்முனை வடக்குப் பிரதேச செயலகத்துக்கு இருக்கின்ற அதிகாரங்களை முடக்கி, அந்தப் பிரதேசத்தில் தமிழர்களுடைய சனச்செறிவைக் குறைத்து, முஸ்லிம் ஆதிக்கம்கொண்ட ஒரு பிரதேசமாக அதை மாற்றுவதற்கு சில முஸ்லிம் அரசியல்வாதிகள் மும்முரமாகச் செயற்பட்டுக் கொண்டிருக் கிறார்கள். இவ்விடயம் தொடர்பில் நாங்கள் சம்பந்தப்பட்ட அமைச்சர் அவர்களோடு பல தடவை பேசியிருக்கிறோம். அதேபோல், இந்த உயரிய சபையிலும் பேசியிருக்கிறோம்.

அங்கே சிங்கள மக்கள் வாழ்கின்றார்கள்; தமிழ் மக்கள் வாழ்கின்றார்கள்; முஸ்லிம் மக்கள் வாழ்கின்றார்கள். கிட்டத்தட்ட 29,000 மக்கள் வாழ்கின்ற அந்தப் பிரதேசம், ஒரு முழுமையான நிர்வாகக் கட்டமைப்பைக் கொண்ட பிரதேச மாகக் காணப்படுகின்றது. எனினும், தற்போது அங்கு பல நிர்வாக ரீதியான அடக்குமுறைகள் இடம்பெறுகின்றன. ஒரு கிராம சேவையாளர் தான் பொறுப்பாக இருக்கும் கிராமத்துக்குச் சென்று நிர்வாக நடவடிக்கைகளைச் சிறப்பாக முன்னெடுக்க முடியாமலுள்ளது. "உங்களுக்கு இங்கு என்ன

அதிகாரம் இருக்கின்றது?" என்று கேட்டு, முஸ்லிம் நபர்களால் அவர்கள் துன்புறுத்தப்படுகிறார்கள். இந்த நிலைமை நீடித்தால், நிச்சயமாக அந்தப் பிரதேசத்தில் தமிழர்கள் வாழமுடியாத ஒரு சூழ்நிலை ஏற்படும். எனவே, கௌரவ அமைச்சர் அவர்களே, அங்கு அரச நிர்வாகத்தைச் சிறப்பாக முன்னெடுக்கவும் அங்கு வாழ்கின்ற மக்கள் சிறந்த முறையில் அபிவிருத்திகளைப் பெறுவதற்கும் நீங்கள் உதவி செய்ய வேண்டும்.

2020.11.30ஆம் திகதி அந்தப் பிரதேச செயலகத்துக்கு ஒரு கணக்காளர் நியமிக்கப்பட்டார். அதே ஆண்டு டிசம்பர் மாதம் 03ஆம் திகதி அவரின் நியமனம் இரத்துச்செய்யப்பட்டது. இது அந்த மக்களுக்கு இழைக்கப்படுகின்ற அநீதியாகவே நாங்கள் பார்க்கிறோம். நீங்கள் நியாயமாகச் சிந்தித்துச் செயற்படுகின்ற ஓர் அமைச்சர்! ஆகையால், கட்சி பேதங்களுக்கப்பால் அந்த மக்களின் நியாயபூர்வமான கோரிக்கைகளை ஏற்று, முதற் கட்டமாக ஏற்கெனவே நியமிக்கப்பட்டிருந்தபடி அந்தக் கணக்காளரை மீளவும் நியமித்து, அந்தப் பிரதேச செயலகம் தனித்துவத்துடன் இயங்குவதற்கு நீங்கள் உதவி செய்யவேண்டும். நாங்கள் அபிவிருத்தி சார்ந்த ஒவ்வொரு வேலைக்கும் முஸ்லிம் பிரிவுக்குச் சென்று அனுமதியைப் பெற்றுத்தான் அந்த மக்களுக்குச் சேவைகளை வழங்க வேண்டியிருக்கின்றது. தமிழ்ப் பிரதேசங்களிலே ஒரு விடயத்தை முன்னெடுப்பதென்றால்கூட, அது மிகவும் கஷ்டமான ஒரு பணியாகத்தான் இருக்கின்றது. அந்த அடிப்படையிலேதான் நாங்கள் 33 வருடங்களாக இயங்கிக் கொண்டிருக்கின்ற ஒரு பிரதேச செயலகத்தைச் சுயமாக இயங்குவதற்கு அனுமதி தரவேண்டும் என்று கோருகிறோம். நாங்கள் புதிதாக ஒரு பிரதேச செயலகத்தைக் கேட்கவில்லை. இலங்கையிலே இவ்வாறு சுயமாக இயங்கமுடியாமல் இருக்கின்ற ஒரேயொரு பிரதேச செயலகம் என்றால் அது இதுவாகத்தான் இருக்கும் என்று நான் நினைக்கின்றேன். எனவே, சில முஸ்லிம் அரசியல்வாதிகளின் தான்தோன்றித் தனமான செயற்பாட்டினூடாக அந்தப் பிரதேசம் கபளீகரம் செய்யப்படுவதைத் தடுத்து நிறுத்துவதோடு, அந்தப் பிரதேச செயலகத்தின் நிர்வாக நடவடிக்கைகளைச் சிறப்பாக முன்னெடுப்பதற்கு கணக்காளர் ஒருவரை அங்கு நியமித்துத் தருமாறு கேட்டு அமர்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Charles Nirmalanathan to second the Motion. You have five minutes.

[பி.ப. 5.45]

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

கௌரவ உறுப்பினர் தவராஜா கலை அரசன் அவர்களால் முன்மொழியப்பட்ட கல்முனை வடக்கு பிரதேச செயலகத்தைத் தரமுயர்த்தல் தொடர்பான பிரேரணையை நான் வழிமொழிகின்றேன். குறிப்பாக இந்தப் பிரதேச செயலகம் தொடர்பான கோரிக்கை நீண்ட காலமாக ஒரு விடையில்லாக் கேள்வியாக அரசாங்கங்களிடம் முன்வைக்கப்பட்டு வருகின்றது. ஆனால், தமிழர்கள் தங்களுடைய உரிமைசார் விடயங்களைப் பெற்றுக் கொள்வதற்கு அரசாங்கத்தில் அங்கம் வகிக்காததன் காரணத்தினால், அரசாங்கத்தில் அங்கம் வகிக்கின்ற ஒருசில அரசியல்வாதிகளுடைய கோரிக்கைக்கு அமைவாக அரசாங்கம் தொடர்ச்சியாக அதைப் பிற்போட்டுக்கொண்டு வருகிறது. குறிப்பாக கௌரவ அமைச்சர் சமல் ராஜபக்ஷ அவர்கள் இந்த விடயம் தொடர்பாக நன்கு அறிந்திருப்பார். ஏனென்றால், அவரிடம் நாங்கள் சென்று இந்தக் கோரிக்கையை விடுத்துத் திரும்பும்போது, ஒருசில அரசியல்வாதிகள் சென்று "இதைச் செய்யவேண்டாம்" என்று அமைச்சரிடம் சொல்லுவார்கள்; இதுதான் தொடர்ச்சியாக நடைபெறுகிறது.

கௌரவ அமைச்சர் அவர்களே, கல்முனை வடக்கு பிரதேச செயலகம் தொடர்பாக நான் இதற்கு முன்னர் இந்தச் சபையிலே கேள்வி எழுப்பியபோது, எல்லை நிர்ணயத்தின் போது இதற்குரிய தீர்வு கிடைக்கப்பெறும் என்றும் அதற்கு முன்பாகக் கணக்காளரை நியமிக்க நடவடிக்கை எடுப்பதாகவும் நீங்கள் கூறியிருந்தீர்கள். அதற்கமைவாக 2020.11.30ஆம் திகதி அம்பாறை மாவட்டச் செயலாளரினால் கணக்காளர் ஒருவர் நியமிக்கப்பட்டார். அதன் பிற்பாடு ஒருசில அரசியல்வாதிகளினுடைய அழுத்தம் காரணமாக 2020.12.03ஆம் திகதி அந்தக் கணக்காளர் நியமனத்தை அம்பாறை மாவட்டச் செயலாளர் இரத்துச் செய்துள்ளார். இதுதான் இங்கிருக்கின்ற ஒரு பிரச்சினையாக இருக்கின்றது.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் நியாயமாக நடந்து கொள்ளக்கூடிய ஓர் அமைச்சர். ஆகவே நான் உங்களிடம் விநயமாகக் கேட்டுக்கொள்வது, 29 கிராம அலுவலர் பிரிவுகளை உள்ளடக்கிய இந்தக் கல்முனை வடக்கு பிரதேச செயலகம் நிதி, காணி அதிகாரங்கள் உள்ளடங்கலாக முழு அதிகாரத்துடன்கூடிய பிரதேச செயலகமாகத் தங்களுடைய காலத்தில் தரமுயர்த்தப்பட்டு அந்தப் பிரதேசத்தில் வாழ்கின்ற மக்களுக்கு முழுமையான சேவையை வழக்கவேண்டுமென்பது என்னுடைய தாழ்மையான ஒரு கோரிக்கையாக இருக்கின்றது. அதேநேரத்தில் கடந்தமுறை இது சம்பந்தமான விவாதம் நடைபெற்றபோது நீங்கள் வாக்குறுதியளித்தவாறு மீண்டும் கணக்காளரை நியமிக்கத் தாங்கள் உடனடியாக நடவடிக்கையெடுக்க வேண்டுமென்ற கோரிக்கையை இந்தச் சபையினூடாக, கல்முனை வடக்குத் தமிழ் மக்கள் சார்பாக நான் உங்களிடம் முன்வைக்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have five minutes.

[අ.භා. 5.48]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Thank you.

ගරු අමාත්‍යතුමනි, නවවන පාර්ලිමේන්තුවේ දෙවැනි වතාවට තමයි, කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සම්බන්ධව අපි මේ Adjournment Motion එකක් හරහා proposal එකක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඔබතුමා තමයි පසුගිය වතාවේත් මේ ප්‍රශ්නයට අපට පිළිතුරු ලබා දුන්නේ. ගරු ඇමතිතුමනි, මා හිතන විධියට මේ ප්‍රශ්නය පිළිබඳව ඔබතුමා දැනුවත්; ආණ්ඩුවේ ඉන්න සියලුදෙනාම දැනුවත්; මන්ත්‍රීවරු දැනුවත්. මේක ඉතාම basic need එකක්. ගරු ඇමතිතුමනි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට accountant කෙනෙක් නැති වුණාම, එම කාර්යාලයේ වැඩ ටික කරගෙන යන්නේ කොහොමද? ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක accountant කෙනෙක් නැත්නම්, ඒ ප්‍රාදේශීය ලේකම්තුමා කොච්චර අපහසුතාවකට පත් වෙනවාද කියලා අපි බලන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා පින් පඩි ලබා දීම පවා කරන්න බැරි තත්ත්වයක් තමයි දැන් අවුරුදු තිහක් තිස්සේ තිබෙන්නේ. පසුගිය ආණ්ඩුව කාලයේත් අපි consensusවලට ආවා. සියලු දේශපාලනඥයන් එකතු වෙලා,

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

මේක අනිවාර්යයෙන්ම කරන්න ඕනෑ දෙයක් කියලා consensusවලටත් ආවා. ඒ සම්බන්ධව cadre creation එකක් කරපු ලිපිය, ඊට අමතරව Delimitation Committee එකෙන් දීපු ලිපිය - ඒ අදාළ ලිපි ඔක්කොම- තිබෙනවා. මා දන්නවා, ඔබතුමා ළඟත් මේ ලිපි ටික තිබෙනවා කියලා. ගරු ඇමතිතුමනි, මේවා තියාගෙන සමහර මන්ත්‍රීවරු දේශපාලනය කළාට, අපි ඇත්තටම මේ කරන්නේ genuine request එකක්. එහෙම නැතුව unfair දෙයක් නොවෙයි. වෙන කාගේවත් අයිතිවාසිකමක් නැති කරන්නවත්, තව කාගේ හෝ දෙයක් බලහත්කාරයෙන් ගන්නවත්, තව එක් කෙනෙක් නැති කරන්නවත් කරන දෙයක් නොවෙයි, මේක. ඒ ජනතාවට සේවය ලබා දෙන්න ඒ ප්‍රාදේශීය ලේකම්ට ඉඩ සලස්වා දෙන්න කියන ඉල්ලීම තමයි මේ කරන්නේ. මේ පිළිබඳව වැඩිදුර අධ්‍යයනය කරන්න පුළුවන්. ඕනෑ නම් මේ සම්බන්ධයෙන් කමිටුවක් පත් කරන්න පුළුවන්. අපි දෙවැනි වතාවට තමයි මේ Adjournment Motion එකක් හරහා ඔබතුමාගෙන් මේ ඉල්ලීම කරන්නේ. අපි මේ සම්බන්ධයෙන් ලිඛිතවත් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ Adjournment Motion එක හරහා අපි මෙවැනි ඉල්ලීමක් කරන්නේ අත්‍යවශ්‍ය කාරණයක් වෙනුවෙන්. "මේ ගැන අපි සොයා බලන්නම්. අනාගතයේ කරමු. අපි සොයා බලමු. එහෙම නැත්නම් කමිටුවක් පත් කරන්නම්" කියන ඒ ඕනෑ දෙයකට අපි එකඟයි. හැබැයි, cadre creation එකේ create කරලා තිබෙන Accountant වහාම පත් කරන්න කියලා අපි බොහොම කාරුණිකව ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ ගැටලුව ජාතීන් අතර අසමඟියක් ඇති වන තත්ත්වයකට පවා පසුගිය කාලයේදී ගියා. මේ පිළිබඳව හැම පැත්තෙන්ම උද්ඝෝෂණ කරලා තිබෙනවා. ඒ නිසා මේක කාටවත් අසාධාරණයක් නොවන විධියට විසඳන්න ඕනෑ ප්‍රශ්නයක්. අසාධාරණයක් නොවන විධියට විසඳන්න කියලා එක පැත්තකින් කියන අතරේ, අපේ ඉල්ලීම වන්නේ Accountant කෙනෙක් ලබා දෙන්න කියන එකයි, ගරු ඇමතිතුමනි.

Accountant කෙනෙක් නැතිව කටයුතු කරද්දී ඒ ප්‍රාදේශීය ලේකම්ට මුහුණ දෙන්න වන තත්ත්වය ගැන පොඩ්ඩක් හිතලා බලන්න, ගරු ඇමතිතුමනි. Accountant නැති වුණාම පොඩි payment එකක් වුණත් approve කරගන්න වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට යවන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඒක කොච්චර අසාධාරණද කියන එක පිළිබඳ පොඩ්ඩක් හිතලා බලන්න. ජාතීන් අතර ගැටලුවක් ඇති නොවන විධියට අපි මේ ප්‍රශ්නය විසඳා ගන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් සියලු දෙනාටම ගැළපෙන විධියේ තීන්දුවක් ගන්නවා නම් අපි කැමැතියි.

ඊට අමතරව, Delimitation Commission එකේ රැස්වීමක් "Zoom" තාක්ෂණය ඔස්සේ මඩකලපුව දිස්ත්‍රික්කයේ හෙට දවසේ පැවැත්වෙන බව දැනගන්න ලැබී තිබෙනවා. ඒ රැස්වීම පිළිබඳ එම දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු හැටියට අපට කිසිම දැනුවත් කිරීමක් කර නැහැ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තිබුණු District Coordinating Committee meetingsවලදී අපේ proposals අපි ලබා දුන්නා. දිස්ත්‍රික් කාර්යාලයටත් ඒ proposals ලබා දුන්නා. හෙට එක්වරම තීරණයක් ගන්න යනවා කියා අපට දැන ගන්න ලැබුණා. අපේ පළමු කාරුණික ඉල්ලීම තමයි කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට Accountant කෙනෙක් ලබා දෙන්නය කියන එක. අද ඔබතුමා පිළිතුරු ලබා දෙනකොට "හෙටම Accountant කෙනෙක් ලබා දෙන්නම්" කියන පිළිතුර දෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා. ඊළඟට, ගරු ඇමතිතුමනි, පුළුවන් නම් හෙට "Zoom" තාක්ෂණය ඔස්සේ පැවැත්වීමට නියමිත රැස්වීම සති දෙකකට විතර කල් දමා, ඒ කාරණය සම්බන්ධයෙන් ගෙන ඇති පියවර සම්බන්ධයෙන් අපව දැනුවත් කිරීමෙන් අනතුරුව ඒ රැස්වීම පැවැත්වුවා නම් හොඳයි කියන කාරණයත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චමල් රාජපක්ෂ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.53]

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු තවරාජා කලෙයි අරසන් මන්ත්‍රීතුමා අද දිනයේ සභාව කල් තබන අවස්ථාවේ ගෙන ආ යෝජනාව සම්බන්ධයෙන් ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමාත්, මඩකලපුව දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමාත් ඉදිරිපත් කළ අදහස්වලට මා සවන් දුන්නා. අපි 2021 සැප්තැම්බර් 06 වැනිදා පත් කර තිබෙන සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් මේ වන විට බොහෝ දුරට ලංකාව පුරාම තිබෙන ප්‍රශ්න ගැන අධ්‍යයනය කර තිබෙනවා. සමහර වෙලාවට 50ක්, 100ක් වාගේ ජනගහනයක් සිටින ප්‍රදේශත් ග්‍රාම නිලධාරි කොට්ඨාස ලෙස කඩා තිබෙනවා, යම් යම් අයගේ වුවමනා අනුව. සමහර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ තිබෙනවා ග්‍රාම නිලධාරි කොට්ඨාස තිබෙන්නේ 8යි, නැත්නම් 10යි. නමුත්, සමහර වෙලාවට ග්‍රාම නිලධාරි කොට්ඨාස 85කට, 65කට, 70කටම එක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් පමණක් තිබෙන ප්‍රදේශත් තිබෙනවා. මේක සාධාරණ නැහැ. ඒ නිසා ඒ පිළිබඳ ඉතා ඉක්මනින්ම කොමිසම විසින් සොයා බලමින් යනවා. ඒ අනුව ඉදිරියේදී සාධාරණයක් ඉටු වෙනවා. කල්මුණේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය උප කාර්යාලයක් නිසා දැනට Accountant කෙනෙක් පත් කරන්න පුළුවන්කමක් නැහැ කියලායි කියන්නේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙක අතර දුර මීටර් 300ක්වත් නැහැ. රජයේ මුදල්, ජනතාවගේ මුදල් ප්‍රයෝජනවත් නොවන ආකාරයට වියදම් කරන්නත් අපට පුළුවන්කමක් නැහැ. හැබැයි, සියලු ජාතීන්ට සාධාරණයක් වන පරිදි ඉදිරියේදී මේ කටයුතු සිදු කරන බව මම සඳහන් කරන්න කැමැතියි. සංහිඳියාව ඇති කිරීම ගැන නේ හැමෝම කථා කරන්නේ. ඒ නිසා අවංකව සියලු දෙනාටම සාධාරණව එය ඉෂ්ට කිරීමයි මගේ බලාපොරොත්තුව. ඒ නිසා හැම ප්‍රශ්නයක්ම අපි ඔක්කොම එකට එකතු වෙලා විසඳා ගන්න ඕනෑ. තමුන්නාන්සේලා බොහොම කලක සිට, මම මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු භාරගත් දවසේ ඉඳන්ම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරනවා. වැඩි කල් යන්න කලින් සීමා නිර්ණය කොමිසමේ වාර්තා ලබා දෙයි. තමුන්නාන්සේලාගේ යෝජනා කොමිසම විසින් අරගෙන තිබෙනවා. ඒවා සැලකිල්ලට භාජන කරලා ජනතාවගේ අදහසුත් අරගෙන කටයුතු කරන්නයි බලාපොරොත්තු වන්නේ. හෙට දිනයේ සාකච්ඡා කරන්නේ කුමක්ද කියන එක ගැන නම් මා දන්නේ නැහැ. "Zoom" තාක්ෂණය ඔස්සේ තමයි සහභාගී වෙන්න උත්සාහ කරන්නේ. සීමා නිර්ණය කොමිසමේ තීරණය ආපු ගමන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් දෙන්නම්. අපි දැනට ජනගහනය 1,000කට එක ග්‍රාම නිලධාරි කොට්ඨාසයක් වන විධියට තමයි එම කොට්ඨාස කඩා ගෙන යන්නේ. මොකද, සමහර ග්‍රාම නිලධාරි කොට්ඨාස තිබෙනවා, ඒවායේ වැඩි වශයෙන් තිබෙන්නේ කුඹුරු යායවල්, වනාන්තර. පවුල් 25යි, 50යි ඒවායේ පදිංචි වෙලා ඉන්නේ. තමුන්නාන්සේලාගේ ප්‍රශ්නය මම හොඳින් අවබෝධ කරගෙනයි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා. එම නිසා, ඉදිරියේදී කිසිම අසාධාරණයක් සිදු වෙන්න අපි ඉඩ තබන්නේ නැහැ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු ඇමතිතුමනි, අපි ඉල්ලන්නේ මේකයි. ඒ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට ග්‍රාම නිලධාරි වසම් 29ක් අයිතියි. ඔබතුමා කිව්වා වාගේ, සමහර දිස්ත්‍රික්කවල මිනිස්සු 100ක්, 150ක් ඉන්න ප්‍රදේශයට ග්‍රාම නිලධාරි වසමක් හදලා තිබෙනවා. ග්‍රාම නිලධාරි

වසම් 12ක් තිබෙන ප්‍රදේශ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බවට පත් කර තිබෙනවා. එහෙම හදලා තිබෙන්නේ ඒ ප්‍රදේශවල ඉන්න ජනතාවගේ අවශ්‍යතා නිසායි. අපි කවදාවත් ඒවාට විරුද්ධ වෙලා නැහැ, ගරු ඇමතිතුමනි. අපි ඉල්ලන්නේ කල්මුණේ-උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට Accountant කෙනෙකු දෙන්න කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමා යටතේ තිබෙන ආයතනයක - ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක- වුණත් Accountant කෙනෙක් පත් කරන්න තිබෙන අපහසුව බලන්න. මේකෙදි delimitation වාගේ දේවල් අපි පිළිගන්නවා. ඒ වාර්තා එනකල් අපි බලාගෙන ඉන්නම්. එතෙක් මේ කාර්යාලයට Accountant කෙනෙක් පත් කරලා දෙන්න කෝ.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
දැනට මේක උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් නිසා තමයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. අපි ඉස්සෙල්ලා ඒක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් කරගන්න එපා යැ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු ඇමතිතුමනි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස තිබුණු එක 2020 අලුත් පාර්ලිමේන්තුවෙන් පස්සේ තමයි උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් කියලා ලියුමක් ආවේ. 1989 ඉඳන් එය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වශයෙන් තිබුණේ. ගරු ඇමතිතුමනි, 2019 ඡන්දය කාලයේදී ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා අම්පාරට ආපු වෙලාවේත් කිව්වා, "ඒක අනිවාර්යයෙන්ම කරන්න ඕනෑ දෙයක්. ඒක අපි පැය 24ක් තුළ කරලා දෙනවා" කියලා. ඒක ඒ ප්‍රදේශයේ හිටපු මන්ත්‍රීවරුනුත් කිව්වා. කරුණා අම්මාන් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා -හිටපු නියෝජ්‍ය ඇමතිතුමා- ඡන්දය ඉල්ලන කොට පොරොන්දුවක් හැටියට ඒක කිව්වා. ඒක ඒ දිස්ත්‍රික්කයේ ජනතාවට දුන්නු පොරොන්දුවක්. ඒක උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වශයෙන් තිබුණේ නැහැ, ගරු ඇමතිතුමනි. 2020 අගෝස්තු මාසයේ පත් වුණු අලුත් පාර්ලිමේන්තුවෙන් පස්සේ ලියුමක් ආවා, ඒක උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් කියලා. ඒක 1989 ඉඳන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් හැටියටයි තිබුණේ. ගරු ඇමතිතුමනි, ඒ ප්‍රදේශයේ ද්‍රවිඩ ජනතාව 31,300ක් ජීවත් වෙනවා. ඔක්කෝම 35,751දෙනෙක් එහි ජීවත් වෙනවා. මීටර් 300ක් ඇතුළත තවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ඇති වුණේ පසුවයි. මේ කියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තමයි original ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
අපි එක තැනක් මුල්කරගෙන බලලා හරි යන්නේ නැහැ. සමස්ත භූමි ප්‍රදේශයම බලලා, ඉන්න ජනගහනය අනුව කටයුතු කරනවා. සීමා නිර්ණය කොමිෂන් සභාවේ වාර්තාව ආපු ගමන්ම තමුන්නාන්සේලාගේ ඉල්ලීම වෙනුවෙන් ඒ අයට මමත් කරුණු ඉදිරිපත් කරන්නම්. ඒ වාර්තාව අනුව සමහර විට මුළු රටේම දැනට තිබෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංඛ්‍යාව අඩුවෙන්න පුළුවන්; ග්‍රාම නිලධාරි කොට්ඨාස සංඛ්‍යාවත් අඩු වෙන්න පුළුවන්.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
ගරු ඇමතිතුමනි, මම පසුගිය වතාවේ මේ ගැන ඉල්ලීම කරපු වෙලාවේ ඇමතිතුමා මේ සභාවේදී පොරොන්දු වුණා, එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට Accountant කෙනෙක් ලබා දෙනවා කියලා. ඒ නිසා තමයි අම්පාර දිස්ත්‍රික් ලේකම්තුමා ඒ සඳහා ලියුමක් ලිව්වේ. දවස් තුනකට පස්සේ ඒක cancel කළා. ගරු ඇමතිතුමනි, මෙන්න මේ කාරණය ඔබතුමාට කියන්න ඕනෑ. Vavuniya Town එකේ තිබෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඳලා මීටර් 200ක් ඇතුළේ Vavuniya South ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තිබෙනවා. එතකොට එකම බල ප්‍රදේශයේ තමයි ඒ දෙකම තිබෙන්නේ.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ගරු මන්ත්‍රීතුමනි, එක එක කාලයට එක එක අයගේ අවශ්‍යතා අනුව ඒවා කරලා තිබෙනවා. නමුත් ඒ වෙනුවෙන් අතිවිශාල මුදලක් වියදම් කරනවා. ඒ ඔක්කෝම ජනතාවගේ සල්ලි. ඒක නිසා අපි බලන්න ඕනෑ, මුළු රටේම එකම නීතියක් අනුව කටයුතු කරන්න.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ සම්බන්ධයෙන් පොරොන්දු වුණා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
මම දැනටත් ඉන්නේ ඒ පොරොන්දුව පිටම තමයි.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
දැන් වෙනත් ප්‍රශ්නයක් ඇවිල්ලා තිබෙන්නේ. "support දෙන්නම්, අරකයි මේකයි" කියලා මොනවා හරි කියපු නිසා කල් දැම්මාද දන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, මේක ඉක්මනින් කරලා දෙන්න.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ගරු මන්ත්‍රීතුමනි, ඕනෑම දේකට පක්ෂ වන අයත් ඉන්නවා. ඒ වාගේම විරුද්ධ වන අයත් ඉන්නවා. අපේ අමාත්‍යාංශයට මේ පිළිබඳව විවිධ අදහස් ඇවිල්ලා තිබෙනවා. ඒවා ගැන සලකා බලා තමයි අපේ නිලධාරින් ඒක කරලා තිබෙන්නේ. තව මාස තුනක් ඇතුළත අපට සීමා නිර්ණය කොමිෂන් සභාවේ වාර්තාව ලැබෙනවා. ඒ, මුළු රටේම විස්තර සහිත වාර්තාවක්. ඒ අනුව විශේෂයෙන්ම ඔය ඉල්ලීමත් සලකා බලා කටයුතු කරන්න පුළුවන්. සම්පූර්ණ බලතල සහිත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ඒ ප්‍රදේශවලට ලැබෙයි.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
ගරු ඇමතිතුමනි, අපි ඒක පිළිගන්නවා. Accountant කෙනකු නැති එක තමයි ප්‍රශ්නය.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ගරු මන්ත්‍රීතුමනි, කාර්යාල දෙකක් තිබෙන්නේ මීටර් 300ක් විතර ඈතින්.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
වවුනියාව දිස්ත්‍රික්කයේත් එහෙම තිබෙනවා, ගරු ඇමතිතුමනි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ඒවා තමයි දැන් නිවැරදි කරන්න හදන්නේ.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකම තිබෙනවා. ඒ ළඟම තිබෙන ආයතන, - *[බාධා කිරීමක්]*

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
කොළඹ දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි මහත්මයෙකුට අයත් වනවා, පවුල් 85,000කට වැඩිය.

එතකොට ඒ නිලධාරියාට ඒ තොරතුරු මොන විධියකටවත් ගන්න බැහැ. තවත් ප්‍රදේශයක ග්‍රාම නිලධාරි වසමක ඉන්නේ පවුල් 50ක් පමණයි. ඒවා විවිධ යුගවලදී එක එක අය සතුටු කරන්න දේශපාලන වශයෙන් කළ දේවල්. අපේ රටේ සියලු ජාතීන් සමස්තයක් හැටියට එකට එකතුවෙලා රට හදන්න ඕනෑ නේ. අපි එක පැත්තක්වත් ගන්නේ නැතිව කටයුතු කරන්නම්.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
අනේ ගරු ඇමතිතුමනි, අපට අවුරුද්දකට හම්බ වෙන්නේ Adjournment Motion එකයි, නැත්නම් දෙකයි. පසුගිය අවුරුද්දේ අපේ Adjournment Motion එකකුත් අපි මේ ප්‍රශ්නය කථා කරන්න පාවිච්චි කළා. මේ අවුරුද්දේ Adjournment Motion එකකුත් අපි දැන් මේ වෙනුවෙන්ම පාවිච්චි කළා. ගරු ඇමතිතුමනි, අපි ඉල්ලන්නේ Delimitation Committee එකේ Report එක එනකල් තාවකාලිකව Acting Accountant කෙනෙකු හෝ දාලා දෙන්න කියලා. ඒක 39,000ක ජනතාවකගේ බලාපොරොත්තුවක්. ගරු ඇමතුමනි, ඒ Committee එකේ Report එක එනතුරු, ඔබතුමාගේ බලතල පාවිච්චි කරලා, create කළ cadre එකට Accountant කෙනෙකු මාස තුනකට දාලා දෙන්න. Delimitation Committee එකෙන් කියනවා නම් "ඔහු එපා" කියලා,- *[බාධා කිරීමක්]*

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
මම ඒ ගැන සලකා බලන්නම්. හැබැයි ඒ, මම අනාගතයේදී හිරේ නොයන විධියට. *[බාධා කිරීමක්]*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ඔබතුමා හිරේ යන්නේ නැති වේවි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
මම දන්නවා, ඔබතුමා කියන කාරණය. එය සාධාරණ ඉල්ලීමක්. මම ඒ ගැන බලන්නම්. මට ඕනෑ, තීරණය කමිටුවකින්- *[බාධා කිරීමක්]*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු ඇමතිතුමනි, එදා ඇමතිතුමා පොරොන්දුවක් දුන්නා ඒක කරනවා කියලා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
කමිටුවකින් නිර්දේශය ගත්තාම ඒක වෙනස් කරන්න කාටවත් බැරි වෙනවා. එහෙම නැත්නම් හිතනවා, ඒවා දේශපාලන කාරණා නිසා ගන්නා තීන්දු කියලා. මම ඉක්මන් කරලා ඒ කටයුත්ත කරන්න බලන්නම්. *[බාධා කිරීමක්]*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු ඇමතිතුමා, හෙට පැවැත්වීමට නියමිත ඒ Zoom meeting එක පොඩ්ඩක් delay කරලා දෙන්න පුළුවන්ද?

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
එහෙම කරන්න කියලා කොමිෂන් සභාවකට කියන්න පුළුවන් වෙයිද කියා මම දන්නේ නැහැ. ඒක කොමිෂන් සභාවක් නේ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sitting day එකක තිබෙන්නේ. *[බාධා කිරීමක්]* මන්ත්‍රීවරු කවුරුවත් දන්නේ නැහැ ඒ ගැන.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
ගරු මන්ත්‍රීතුමා, මම ඉල්ලීමක් කරන්නම්. ඒ කමිටුවේ සභාපතිතුමා මහින්ද දේශප්‍රිය මහත්මයා. එතුමාට ඔබතුමා කථා කරන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ඔබතුමාගෙන් පණිවිඩයක් ගියොත් නම් හොඳයි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
මමත් කථා කරන්නම්.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

***එකල්හි වේලාව අ. භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.03ට, 2022 මාර්තු 10වන බ්‍රහස්පතින්දා පූ. භා. 10.00 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.03க்கு, பாராளுமன்றம் 2022 மார்ச் 10, வியாழக்கிழமை மு.ப.10.00 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*And it being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.03 p.m. until 10.00 a.m. on Thursday, 10th March, 2022.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන
නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා
**හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.